# දෙවැනි කොටස

## දෙවැනි කොටස

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | | පිටුව |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 50 |
| 3. | බැංකු විද්‍යා පියෙස (බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය) | 54 |
| 4. | සන්නිවේදන | 54 |
| 5. | ව්‍යවහාර මුදල් | 56 |
| 6. | දේශීය කටයුතු | 58 |
| 7. | ආර්ථික පර්යේෂණ | 62 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 64 |
| 9. | විනිමය පාලන | 69 |
| 10. | මූල්‍ය බුද්ධි ඒකකය | 72 |
| 11. | මූල්‍ය පද්ධති ස්ථායිතාව | 74 |
| 12. | අධිපති ලේකම් | 75 |
| 13. | මානව සම්පත් කළමනාකරණය | 75 |
| 14. | තොරතුරු තාක්ෂණ | 80 |
| 15. | ජාත්‍යන්තර මෙහෙයුම් | 82 |
| 16. | කළමනාකාරීත්ව විගණන | 84 |
| 17. | ගෙවීම් හා පියවීම් | 85 |
| 18. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 89 |
| 19. | පරිශ්‍ර | 90 |
| 20. | පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු | 90 |
| 21. | රාජ්‍ය ණය | 91 |
| 22. | ප්‍රාදේශීය සංවර්ධන | 96 |
| 23. | ලේකම් | 100 |
| 24. | ආරක්ෂක සේවා | 101 |
| 25. | සංඛ්‍යාන හා ක්ෂේත්‍ර සමීක්ෂණ | 101 |
| 26. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 104 |
| 27. | සුභසාධන | 108 |

## I. ගිණුම්කරණ සහ මූල්‍ය

### මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටු වාර්තාව.

මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද විගණන කමිටුව, සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් මණ්ඩලයේ පත්කල සාමාජිකා මනෝ රාමනාදන් මහත්මිය (විගණන කමිටු සභාපති), එම්. ආර්. මිහුලාර් මහතා (කේ.පී.එම්.ජී, ෆෝඩ්, රෝඩ්ස්, තෝර්ටන් සහ සමාගමේ හවුල්කරු) සහ ඒ.එම්.ජේ. පැට්‍රික් මහත්මිය (එස්.ජේ.එම්.එස්. ආශ්‍රිතයේ හවුල්කරු) කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කළ අතර පී.ඩී.ජේ.ප්‍රනාන්දු මහතා (2010 පෙබරවාරි මාසය දක්වා), බී.ඩී.ඩබ්.ඒ. සිල්වා මහතා (2010 මාර්තු මාසය දක්වා) ආචාර්ය ඩබ්.එම්.හේමචන්ද්‍ර (2010 මාර්තු මාසයේ සිට) යන සහකාර අධිපතිවරු 2010 වර්ෂය තුළ දී කමිටුවේ ලේකම්වරු වශයෙන් කටයුතු කරන ලදී.

2010 මුදල් වර්ෂය තුළ කමිටුව සභාවාර 7ක් පැවැත් වූ අතර පහත දැක්වෙන කාර්යයන් ක්‍රියාවට නංවා තිබේ.

- විගණකයන් විසින් අත්සන් කිරීමට ප්‍රථම 2009 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ කෙටුම්පත් කළ අවසාන ගිණුම නැවත සමාලෝචනයට ලක්කිරීම සහ සමහර හෙළිදරව් කිරීම පිළිබඳව එකඟත්වය පළ කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ 2009 ගිණුම් සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් ඔවුන්ගේ අන්තර් ගැටලු පත්‍රයෙන් සහ කළමනාකාරීත්ව ලිපියෙන් අවධානයට ලක්කර තිබූ කරුණු පිළිබඳව පසු විපරම් කරන ලදී.
- අන්තර් ගැටලු පත්‍රයෙන් සහ කළමනාකාරීත්ව ලිපියෙන් අවධානයට යොමුකර තිබූ කරුණු පිළිබඳ පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
    - ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය තොරතුරු කාර්යාංශය (CRIB) කොටස් ආයෝජන 19.9% ට වඩා වැඩි ප්‍රමාණයක් 2010 ප්‍රථම කාර්තුව තුළ විකිණීම.
    - බැංකුව සඳහා මුරපද පිළිවෙතක් හඳුන්වාදීම සහ සියලුම පද්ධතීන් සහ එය යොදා ගැනීම.
    - ජා.මු.වා.ප්‍ර. 9 (IFRS 9) කලින් අදාළ කර නොග ැනීමට එකඟවීම.
    - 2010 ආයු ගණන ඇගයීම පිළිබඳව ආයුගණකයින්ගේ ඉදිරිපත් කිරීම නිරීක්ෂණය කිරීම.
    - මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රම විමර්ශනය කිරීමට සහ බැංකුවේ කාර්ය මණ්ඩලය සමග කාර්ය කිරීමට කුලී පදනම මත බාහිර පාර්ශ්වයන් යොදා ගැනීම.
    - ලොයිඩ්ස් ගොඩනැගිල්ල දේපළ පිරියත හා උපකරණ යටතේ සටහන් කිරීමට තීරණය කිරීම.
    - සියලු ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) යාවත්කාලීන වීම සඳහා ජා.ගි.ප්‍ර.ම. (IASB) ජාල සේවය දායක වීම.

- අවදානම පදනම් කරගත් විගණන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වරලත් ගණකාධිකාරීවරුන් තෝරාගැනීමේ දී විමර්ශනය කළයුතු විෂය ක්ෂේත්‍රය පිළිබඳව නිර්දේශ කිරීම.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සුරැකිතා තක්සේරුකරණ අවශ්‍යතාවයන් සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සඳහා අතිරේක පැවරුමක් ක්‍රියාත්මක කිරීම සඳහා අර්නස්ට් සහ යංග් ආයතනයට එකඟතාව පළ කිරීම.
- 2009 වර්ෂය සඳහා වූ විගණනයේ දී ආයු ගණන තක්සේරුව සඳහා උපකල්පනයන්හි අනුකූලතාවය, දේශීය භාණ්ඩාගාර බිල්පත් කළ ලංසු වට්ටම් පිළිබඳ හෙළිදරව් කිරීම. සංශෝධිත හා වැඩි වර්ධනය වූ ජා.මු.වා.ප්‍ර. සඳහා අදාළ විශුද්ධිකරණ ප්‍රතිපත්තීන් හි අදාළ බව සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සඳහා අර්නස්ට් සහ යංග් ආයතනය සමග එකඟවීම.
- බැඳියා ගැටුම් වළක්වා ගැනීම සඳහා බාහිර විගණකයන්ට, විගණනයට බාහිර සියලුම කාර්ය පැවරීම සඳහා කමිටුවේ එකඟත්වය අවශ්‍ය බව නිර්දේශ කිරීම.
- ආයු ගණකාධිකාරීන්ගේ ඉදිරිපත්කිරීම සම්බන්ධයෙන් නැවත සළකා බැලීම.
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ විගණන ප්‍රතිපත්තිය හා ආචාර්ය ධර්ම පද්ධතිය අනුමත කළ අතර, විෂය පදනම් කරගත් විගණන ක්‍රමවේදයන් හඳුන්වා දීම සඳහා සකස් කළ කමිටු පත් ක්ෂේත්‍රයන්ට අදාළ කාර්ය කර ගෙන යාම අනුමත කිරීම.
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව පිළිබඳ කොලොම්බස් උපදේශක සේවා ආයතනය එක්ව පිළියෙළ කළ ගුණාත්මක තක්සේරුකරණ සංශෝධන වාර්තාවේ නිර්දේශයන් සටහන් කිරීම.
- විවෘත තත්ත්ව (open position) ගනුදෙනු වෙළෙඳපොළ අගය කිරීම, සුරැකුම්පත් ණයට ගැනීම, මූල්‍ය නොවන වත්කමක් ලෙස රන්වලින් දක්වා නැති සුරැකුම්පත් ප්‍රාදේශීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය මුදල්වල සාධාරණ අගය තක්සේරු කිරීම සේවක ප්‍රතිලාභ සැලසුම සඳහා වූ ආයුගණන තක්සේරුකරණයන් සඳහා ගිණුම්කරණය සහ ආයුගණන ලාභය හෝ අලාභය

අදායම ප්‍රකාශයන්හි හඳුනාගැනීම, අතිරේක ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමේ පිරිවැය කල්තැබීම. (මූල්‍ය නීති පනතේ 40 වගන්තිය) සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු හෙළිදරව් කිරීම. කෘෂිකාර්මික අංශය සඳහා අනිවාර්ය ණය සැපයීම, අනිවාර්ය තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය, ඉඩම් හා ගොඩනැගිලි සහ ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සහ ගිණුම්කරණ ගැටලු සාකච්ඡා කිරීම.

- පුහුණු සේවක පිරිසකගේ අවශ්‍යතාව ඇති බැවින්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සේවක මාරුකිරීමේ ක්‍රමය එම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් නැවත සලකා බැලිය යුතු බව විගණන කමිටු සභාපති මූල්‍ය මණ්ඩලය මාර්ගයෙන් මුදල් මණ්ඩලයට දැනුම්දීම ඉල්ලා සිටීම.
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් කාර්තුමය ප්‍රකාශය සම්බන්ධයෙන් නිකුත් කරන ලද වාර්තා පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.
- මුදල් මණ්ඩලය සඳහා කාලීන වාර්තා කිරීමේ අරමුණින් විගණන කමිටු රැස්වීම් හි වාර ගණන සහ වාර්තාකරණ කාර්ය පටිපාටිය පිළිබඳව විගණන කමිටු ලේකම් හට උපදෙස් සැපයීම.
- 2011 වර්ෂය සඳහා බඳවාගත් විගණනයේ කාර්යසාධනය විමසා බැලීම.

**කලමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය.**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව  මූල්‍ය නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී.  එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල  සඵලතාවය විනා, එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන, මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන් වන්නේය. පොලී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහබැංකුව සතු බැවින්, එය ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම්, ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත.  එබැවින් මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායිතා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කලමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මූල්‍ය නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ.  ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } ඊඑෆ්/ජේ/සීබී/එෆ්ඒ/10

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2011 මාර්තු 29 දින

## විගණකාධිපති වාර්තාව

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අනෙකුත් පැහැදිලි කිරීම් සටහන් (අංක 1 සිට 41) වල සාරාංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කරන ප්‍රමිතීන්වලට අනුකූල වීම පිළිබඳව වූ විගණනය මා විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගමක් විසින් සිදුකරන ලදී.

### 1:2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කරන ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම් වේ. උචිත පරිදි සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීමේදී හා යොදා ගැනීමේදී සහ අවස්ථානුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

### 1:3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන්ට අනුකූලව මෙම විගණනය සිදුකරන ලදී. විගණන ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට අනුකූලවීම සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කළයුතු බවට මෙම ප්‍රමිතිවලින් අවශ්‍ය කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා හා හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ විගණන සාක්ෂි ලබා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. වංචා හෝ වැරදි හේතුකොටගෙන මූල්‍ය ප්‍රකාශන වල වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් පිළිබඳ අවදානම ඇගයීමද ඇතුළුව විගණකගේ විනිශ්චය මත පරිපාටි තීරණය කර ඇත. මෙම අවදානම තක්සේරු කිරීමේදී ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේදී අවස්ථානුකූලව අදාලවන විගණන පරිපාටි සැලසුම් කිරීම සඳහා වූ අභ්‍යන්තර පාලනයන් විගණක සැලකිල්ලට භාජනය කරන නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායකත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණෙන් කරනු නොලබයි. භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ, කළමනාකරණය විසින් සිදුකරන ලද වැදගත් ඇස්තමේන්තු ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනයන්හි සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම විගණයට ඇතුළත්වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

### 1:4 මතය

2010 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ, ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කරන ප්‍රමිතිවලට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මව, සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1:5 පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කෙරෙනු ඇත.

අත්.කළේ/එච්.ඒ.එස්.සමරවීර
වැඩ බලන විගණකාධිපති.

නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව

சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை

INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone } 2691151

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ - மெயில் / E-mail } oaggov@sltnet.lk

# ශ්‍රී ලංකා මහ බැංකුව

## දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | | **189,664,726** | 147,871,157 |
| මූදල් වත්කම් | | | |
| - ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 5 | **183,729,813** | 56,275,323 |
| - විකුණුම් සඳහා වූ ආයෝජන | 5 | **346,953,603** | 315,342,452 |
| අනිකුත් විදේශීය ලැබිය යුතු මුදල් | | **8,534,829** | 2,429,319 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | 6 | **71,199,269** | 76,509,781 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **800,064,240** | 598,428,032 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | **20,497,816** | 43,450,557 |
| රජයට දෙන ලද අත්තිකාරම් | 7 | **77,878,823** | 73,880,500 |
| අනිකුත් ආයතනවලට දෙන ලද ණය | 8 (අ) | **2,459,846** | 1,136,596 |
| අනිකුත් දේශීය ලැබිය යුතු මුදල් | 8 (ආ) | **3,274,892** | 595,444 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන | 9 (අ) | **41,236** | 43,855 |
| අනිකුත් වත්කම් | 9 (ආ) | **1,272,621** | 1,497,973 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **105,425,234** | 120,604,925 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **905,489,474** | 719,032,957 |
| | | | |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන්වලින් දක්වා ඇති සුරැකුම්පත් | | **54,007,207** | 84,834,269 |
| | | | |
| **දේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 10 | **2,814,784** | 2,157,200 |
| විවිධ වත්කම් | | **4,170,077** | 4,092,428 |
| දේපල පිරියත සහ උපකරණ | 11 | **9,344,340** | 9,342,947 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | **17,753** | 16,383 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් | 36 | **869,700** | 293,476 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | **71,223,861** | 100,736,703 |
| **මුළු වත්කම්** | | **976,713,335** | 819,769,660 |
| | | | |
| බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | 13 | **3,127,136** | 18,068,841 |
| ආසියානු නිශ්කාෂණ ආයතනයට ගෙවිය යුතු මුදල් | 14 | **65,044,407** | 29,836,531 |
| ජා.මු.අ. සම්බන්ධ බැරකම් | 15 | **275,420.837** | 218,171,021 |
| අනිකුත් විදේශීය ගෙවිය යුතු මුදල් | 16 | **5,014,191** | 5,008,035 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **348,606,571** | 271,084,428 |
| | | | |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 17 | **104,853,445** | 86,085,866 |
| රාජ්‍ය හා රාජ්‍ය නියෝජිත ආයතන ශේෂයන් | 18(අ) | **3,088,659** | 2,347,709 |
| ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත් | 18(ආ) | **113,454,891** | 84,022,645 |
| සේවක සුභ සාධන යෝජනා ක්‍රමවල ශේෂයන් | 19(අ) | **977,154** | 1,050,255 |
| අනිකුත් ගෙවිය යුතු මුදල් | 19(ආ) | **27,779,723** | 25,981,654 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **250,153,872** | 199,488,129 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **598,760,443** | 470,572,557 |
| **අනිකුත් බැරකම්** | | | |
| සංසරණයෙහි පවතින මුදල් | 20 | **255,652,217** | 217,429,835 |
| විලම්භිත ප්‍රදාන | 21 | **4,605** | 567 |
| විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රම | 36 | - | – |
| විවිධ බැරකම් සහ උපචිතයන් | | **74,381** | 66,895 |
| **මුළු අනිකුත් බැරකම්** | | **255,731,203** | 217,497,297 |
| **මුළු බැරකම්** | | **854,491,646** | 688,069,854 |
| | | | |
| **හිමිකම් ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල | 22 | **25,000,000** | 25,000,000 |
| සංචිත | | **97,221,689** | 106,699,806 |
| **මුළු හිමිකම් ප්‍රාග්ධනය** | | **122,221,689** | 131,699,806 |
| **මුළු බැරකම් සහ හිමිකම් ප්‍රාග්ධනය** | | **976,713,335** | 819,769,660 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2011 මාර්තු 07 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන්, නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

අජිත් නිවාඩ් කබ්රාල් - අධිපති

එම්. අයි. සුහියාන් - ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 08 සිට 49 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
### ආදයම් ප්‍රකාශනය

| | සටහන | 2010<br>රු. '000 | 2009<br>රු. '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| **පොලී ආදායම** | **24** | **10,841,880** | 4,595,856 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය / (පාඩුව) | | **(3,484968)** | (4,177,107) |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය / (පාඩුව) | | **27,643,286** | 6,689,834 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | **35,000,198** | 7,108,583 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොලී වියදම | **25** | **(3,881,159)** | (1,832,436) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | | |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය / (පාඩුව) | | **(3,881,159)** | (1,832,436) |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම / (පාඩුව)** | | **(8,659,222)** | 8,842,035 |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | **22,459,817** | 14,118,182 |
| පොලී ආදායම | **24** | **5,904,437** | 28,111,337 |
| පොලී වියදම | **25** | **(10,123,663)** | (2,534,820) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ආදායම** | | **4,219,226** | 25,576,517 |
| අනිකුත් ආදායම් | **26** | **825,681** | 544,217 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / (පාඩුව) මෙහෙයුම් වියදම් :** | | **19,066,272** | 40,238,916 |
| සේවක මණ්ඩල වියදම් : | **27** | | |
| - වැටුප් සහ වේතන | | **(2,224,931)** | (2,128,264) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(305,487)** | (276,101) |
| - පශ්චාත් සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් අතිරේක පිරිවැය | | **262,190** | – |
| | | **(2,268,228)** | (2,404,365) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(278,453)** | (295,759) |
| තොග පිරිවැය | | **(1,621,189)** | (1,350,463) |
| පරිපාලන වියදම් | **28** | **(1,155,182)** | (913,307) |
| බොල් හා අඩමාණ ණය කපා හැරීම් | | **(1,108,000)** | – |
| **මුළු මෙහෙයුම් පිරිවැය** | | **(6,431,052)** | (4,963,894) |
| **ආදායම් බදු වලට පෙර ලාභය / (පාඩුව)** | | **12,635,220** | 35,275,022 |
| ආදායම් බද්ද | **29** | **(891,267)** | (1,636,373) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (පාඩුව)** | | **11,743,953** | 33,638,649 |

පිටු අංක 08 සිට 49 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2010 දෙසම්බර් 31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා
### ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | 2010<br>රු. '000 | 2009<br>රු. '000 |
|---|---|---|
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/පාඩුව | **11,743,953** | 33,638,649 |
| විකුණුම් සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම ලාභ/(පාඩුව) | **(5,889,977)** | (2,887,636) |
| **මුළු විස්තීරණ ආදායම** | **(5,853,976)** | 30,751,013 |

පිටු අංක 08 සිට 49 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා**

**ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය**

| | අයක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන ලෙස විසර්ජනය කළ සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | අනිකුත් සංචිතය (සටහන 22) | සමුච්චිත ලාභ | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු.'000 | රු. '000 |
| 2009 ජනවාරි 01 දිනට | 15,000 | 24,985,000 | 2,706,067 | 68,891,661 | 24,351,065 | 120,948,793 |
| ශුද්ධ ලාභය / (අලාභය) | – | – | – | – | 33,638,649 | 33,638,649 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන් අරමුදලට පැවරීම | – | – | – | 95,043 | (95,043) | – |
| වෙළඳපල අගයකිරීමේ සංචිතයට පැවරීම | – | – | – | 2,211,883 | (2,211,883) | – |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරුකිරීම | – | – | – | 8,842,035 | (8,842,035) | – |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | – | – | – | 269,798 | (269,798) | _ |
| විකුණුම් සුරැකුම්පත් සඳහා ඇති ශුද්ධ සාධාරණ වටිනාකම ලාභ/(පාඩුව) | – | – | – | (2,887,636) | – | (2,887,636) |
| ලාභය රජයට පැවරීම | – | – | – | – | (20,000,000) | (20,000,000) |
| **2010 ජනවාරි 01 දිනට** | **15,000** | **24,985,000** | **2,706,067** | **77,422,784** | **26,570,955** | **131,699,806** |
| ශුද්ධ ලාභය / (අලාභය) | – | – | – | – | 11,743,953 | 11,743,953 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන් අරමුදලට පැවරීම | – | – | – | 107,559 | (107,559) | – |
| පොදු සංචිතයට පැවරීම | – | – | – | 700,975 | (700,975) | – |
| වෙළඳපල අගයකිරීමේ සංචිතයට පැවරීම | – | – | – | (4,177,107) | 4,177,107 | – |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරුකිරීම | – | – | – | (8,659,222) | 8,659,222 | – |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | – | – | – | 206,998 | (206,998) | _ |
| විකුණුම් සුරැකුම්පත් සඳහා ඇති ශුද්ධ සාධාරණ වටිනාකම ලාභ / (පාඩුව) | – | – | – | (5,889,977) | – | (5,889,977) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදයක සහා විශ්‍රාම ආපද සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | – | – | – | _ | (439) | (439) |
| ලාභය රජයට පැවරීම - 2009 | – | – | – | _ | (5,000,000) | (5,000,000) |
| ලාභය රජයට පැවරීම - 2010 | – | – | – | _ | (10,000,000) | (10,000,000) |
| ස්වේච්ඡා තැන්පතු ආරක්ෂණ ක්‍රමය යටතේ ආයෝජනය කළ අරමුදල් ශ්‍රී ලංකා තැන්පතු ආරක්ෂණ ක්‍රමයට මාරු කිරීම | – | – | – | (331,653) | _ | (331,653) |
| පළාත් ණය ක්‍රමයට අරමුදල් මාරු කිරීම | – | – | – | 2,900,000 | (2,900,000) | |
| **2010 දෙසැම්බර් 31 දිනට** | **15,000** | **24,985,000** | **2,706,067** | **62,280356** | **32,235,266** | **122,221,689** |

පිටු අංක 08 සිට 49 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2010<br>රු. '000 | 2009<br>රු. '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය** | | | |
| ලැබුණු පොලිය - විදේශීය මුදල් | | **8,444,272** | 3,620,945 |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - අනිකුත් | | **401,620** | 452,164 |
| ද්‍රවශීලතා කළමනාකරණ, වෙළෙඳ සහ SWAP ආදායම් | | **27,643,286** | 6,992,342 |
| උපලබ්ධි වූ විනිමය වාසිය / (පාඩුව) | | **(2,150,718)** | 673,475 |
| ලැබුණු අනිකුත් ආදායම් | | **657,674** | 468,899 |
| | | **34,996,134** | 12,207,825 |
| **විය පැහැදම්** | | | |
| ගෙවන ලද පොලිය - විදේශීය මුදල් | | **3,695,818** | 1,963,574 |
| ගෙවන ලද පොලිය - දේශීය මුදල් | | **10,481,347** | 2,156,462 |
| සේවකයින්ට ගෙවීම් | | **2,818,927** | 3,747,815 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **4,954,522** | (21,256,640) |
| ගෙවන ලද ආදායම් බදු | | **884,633** | 1,857,983 |
| | | **22,835,247** | (11,530,806) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **30** | **12,160,887** | 23,738,631 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) / අඩුවීම | | **(81,150)** | (1,879,364) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **791,117** | 2,688,756 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණය / මුදාහැරීම | | **2619** | 6,874 |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීම් | | **4,332** | 1,367 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන ආශ්‍රිත ආදායම | | **11,695** | – |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම | | **29,432,245** | 70,279,645 |
| | | **30,160,859** | 71,097,278 |
| **විය පැහැදම්** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **183,338,571** | 286,976,540 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(1,800,539)** | 1,496,343 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(26,948,525)** | 40,717,160 |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(2,861)** | 4,290 |
| ප්‍රදානයන් අඩුකළ, දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනීම් | | **280,027** | 387,795 |
| රන් තොගයේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(29,680,126)** | 75,691,109 |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණයපත් අත්තිකාරම් | | **1,954,823** | 2,203,105 |
| තැන්පතු ආරක්ෂණ අරමුදල් වත්කම් ගිණුමට මාරු කිරීම | | **331,653** | – |
| | | **127,473,024** | 407,476,342 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(97,312,164)** | (336,379,064) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **(260,277,179** | (218,514,268) |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **298,499,562** | 249,845,187 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **38,222,383** | 31,330,919 |
| **අඩුකිරීම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | **31** | **(25,210,557)** | (147,556,788) |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | **32** | **(18,866,241)** | (4,149,819) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | | **(44,076,798)** | (151,706,607) |
| සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම | | **82,299,181** | 183,037,526 |
| **විය පැහැදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **(67,310,167)** | (121,365,370) |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **439** | – |
| අතිරික්තය රජයට ගෙවීම | | **15,000,000** | 20,000,000 |
| | | **(52,309,728)** | (101,365,370) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **134,608,909** | 284,402,896 |
| මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම | | **49,457,632** | (28,237,536) |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන් බලපෑම | | **(7,665,063)** | 8,769,887 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **147,871,157** | 167,338,807 |
| **දෙසැම්බර් 31 දිනට ශුද්ධ මුදල් සහ මුදල් සමානයන්** | **33** | **189,664,726** | 147,871,157 |

පිටු අංක 08 සිට 49 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

### 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරන මූල්‍ය නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරන ස්ථානයේ පිහිටා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2011 මාර්තු 07 වැනි දින අනුමත කරන ලදී.

### 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්තිවලින් හඳුන්වා දී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම්, ගොඩනැගිලි, සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී.

#### වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්‍වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේ දී පුළුල් වශයෙන් එක් එක් වර්ගය යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 4 දරන සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

#### අනුකූලතා ප්‍රකාශනය

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ. මුදල් නීති පනත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර විගණකාධිපති විසින් විගණනය කර නීතිමය අවශ්‍යතා මත ගැසට් කර ඇත. ජා.මූ.වා.ප්‍ර. වල සමහර අවශ්‍යතා මත ගැසට් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවල, ඒවායෙහි වර්ගීකරණය සහ එම නිසා අගයන් මෙම මූල්‍ය ප්‍රකාශන සමග වෙනස් විය හැකිය.

#### වාර්තා කිරීමේ මුදල් ඒකකය

වෙනත් අන්දමකට දක්වා නොමැති නම්, සියළුම සංඛ්‍යා ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

#### 2.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

ගිණුම් ප්‍රතිපත්ති අදාල කිරීමේ දී බැංකුව විසින් ඇස්තමේන්තුවලට අමතරව පහත දැක්වෙන නිශ්චයන් කර ඇති අතර, මෙම ගිණුම් ප්‍රකාශනයන්හි අගය හඳුනා ගැනීම් මත ඒවා සැලකිය යුතු අන්දමින් බලපා ඇත.

#### විකිණීමට ඇති ආයෝජන හානිකරණය

සැලකිය යුතු ලෙස සහ අඛණ්ඩව සාධාරණ අගය එහි පිරිවැයට වඩා පහළට යනවිට, විකිණීම සඳහා ඇති ආයෝජන අගය හානි වී ඇති බව බැංකුව තීරණය කරයි. සැලකිය යුතු බව හා අඛණ්ඩව යන කරුණු තීරණය කිරීමේ දී නිශ්චය කිරීමක් අවශ්‍ය වේ.

#### විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය, ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 36 හි දැක්වේ.

#### 2.3 ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස්වීම් හා අනාවරණය කිරීම්

භාවිතා කරන ගිණුම් ප්‍රතිපත්ති, පසුගිය වසරේ භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් වෙනසක් නොපෙන්වයි. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) වැඩි වර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් ප්‍රමිති සඳහා සිදුකරන ලද සංශෝධනයන් හේතුවෙන්, බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, හෝ මූල්‍ය තත්ත්වය කාර්ය සාධනයට කිසිඳු බලපෑමක් එල්ල වී නොමැත.

ජා.මූ.වා.ප්‍ර. 2 - කොටස් පදනම් කරගත් ගෙවීම් - සමූහ මුදල් බේරුම් කොටස් පදනම් ගෙවීම් ගනුදෙනු 2010 ජනවාරි 10 සිට බලපැවැත්වේ.

ජා.මූ.වා.ප්‍ර. 3 - ව්‍යාපාර ඒකාබද්ධකරණය (සංශෝධිත)

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති - 27 (ජා.ගි.ප්‍ර.) ඒකාබද්ධ සහ වෙන්ව සැකසූ මූල්‍ය ප්‍රකාශන

ජා.මූ.වා.ප්‍ර.2, ජා.මූ.වා.ප්‍ර.5, ජා.මූ.වා.ප්‍ර.7, ජා.ගි.ප්‍ර.7, ජා.ගි.ප්‍ර.21, ජා.ගි.ප්‍ර.28, ජා.ගි.ප්‍ර.31, ජා.ගි.ප්‍ර.39 ට අදාළව කරන ලද සංශෝධන ද ඇතුළුව 2009 ජුලි 01 දින සිට බලපැවැත්වේ.

ජා.ගි.ප්‍ර.39, මූල්‍ය උපකරණ : හඳුනාගැනීම සහ ඇගැයීම - 2009 ජුලි 01 දින සිට බලපැවැත්වේ.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ අර්ථ නිරූපන කමිටුව - 17 (IFRIC - 17 ) මූල්‍ය නොවන වත්කම් හිමිකරුවන්ට බෙදා හැරීම - 2009 ජුලි 01 දින සිට බලපැවැත්වේ.

**අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සිදුකරන ලද එකතු කිරීම.**

2008 මැයි මස නිකුත් කිරීම.

ජා.මූ.වා.ප්‍ර.05 - විකිණීම් සඳහා රඳවාගත් ජංගම නොවන වත්කම් සහ අත්හිටවූ ක්‍රියාකාරකම් 2010 ජනවාරි 01 සිට බලපැවැත්වේ.

2009 අප්‍රේල් මස නිකුත් කිරීම.

ජා.මූ.වා.ප්‍ර.2 - කොටස් පදනම් කරගත් ගෙවීම්.

ජා.මූ.වා.ප්‍ර.1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

ජා.ගි.ප්‍ර. 17 - කල්බදු

ජා.ගි.ප්‍ර. 38 - අස්පෘශ්‍ය වත්කම්

ජා.මූ.වා.අ.ක. අංක 9 - එම්බුණු (Embeded) ව්‍යුත්පන්නයන් නැවත තක්සේරු කිරීම.

**2.4 ප්‍රකාශිත කර ඇති නමුත් මේ වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන්, අර්ථ නිරූපණයන් සහ සංශෝධනයන්**

ප්‍රකාශිත නමුත් බැංකු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරන දිනය වන තෙක් බල සහිත නොවූ ප්‍රතිපත්තීන් පහත පරිදි වේ. මෙම ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් අනාගත දිනක දී අදාළ වන බවට බැංකුව බලාපොරොත්තු වේ. මෙම ප්‍රමිතීන් බල සහිත වූ විට ඒවා අදාළ කර ගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

- **ජා.මූ.වා.ප්‍ර.9 -** **මූල්‍ය උපකරණ** (2013 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වේ.)

- **ජා.ගි.ප්‍ර. - 39** **මූල්‍ය උපකරණ :** හඳුනා ගැනීම සහ මිනුම් කිරීම ප්‍රතිස්ථාපනය කරමින් මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ ඇගයීම සඳහා නව අවශ්‍යතා ජා.මූ.වා.ප්‍ර. - 9 නිරූපණය කරයි.

- **ජා.ගි.ප්‍ර. - 24** **සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය කිරීම (සංශෝධිත):** - සංශෝධිත ප්‍රමිතිය, 2011 ජනවාරි 01 දින හෝ ඊට පසු සිට බල පැවැත්වේ. එම ප්‍රමිතිය සම්බන්ධිත පාර්ශ්වය අර්ථ දැක්වීම මගින් සම්බන්ධිත පාර්ශ්ව හඳුනා ගන්නා ආකාරය විස්තර කරන අතර භාවිතය තුළ දී පැන නගින අන්‍යාවබෝධයන් වලක්වනු ලබයි.
  නව සංශෝධිත ප්‍රමිතිය මගින් රාජ්‍ය - සම්බන්ධිත පාර්ශ්ව සඳහා අර්ධ වශයෙන් නිදහස් කිරීම් සඳහා වන හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කර ඇත. මෙය යොදා ගැනීම මගින් මූල්‍ය තත්ත්වයට හෝ කාර්යය සාධනයට කුමන හෝ බලපෑමක් නොවන බවට බැංකුව අපේක්ෂා කරයි. රජය සම්බන්ධිත ආයතන සඳහා අර්ධ නිදහස් කිරීම හෝ මුළු ප්‍රමිතිය පෙර අදාළ කර ගැනීමට හැකියාව ඇත.

- **ජා.ගි.ප්‍ර. - 32 -** **මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා මිනුම:**
  ජා.ගි.ප්‍ර. 32 ට කරනු ලබන සංශෝධනයන් 2010 පෙබරවාරි 01 හෝ ඊට පසුව ඇරඹෙන වාර්ෂික කාලච්ඡේද සඳහා බලාත්මක වේ. ආයතනයක එම ශ්‍රේණියේම මූල්‍ය නොවන ව්‍යුත්පන්න උපකරණවල දැනට සිටින හිමිකරුවන්ට හිමිකම් සාමානුපාතිකව දෙන අවස්ථාවකදී හෝ තම ස්කන්ධ උපකරණ ස්ථාවර සංඛ්‍යාවක්, ස්ථාවර වටිනාකමට ඕනෑම ව්‍යවහාර මුදලකින් අත්පත්කර ගන්නා අවස්ථාවල, හිමිකම් නිකුතු සහ සමහර විකල්ප හා බලපත්‍ර (Options and warrants) වර්ග කිරීම සඳහා මූල්‍ය වගකීම්හි අර්ථ නිරූපනයන් සංශෝධනය කෙරේ. මූලික අදාල කර ගැනීමෙන් පසුව මෙම සංශෝධනයන්ගෙන් බැංකුවට බලපෑමක් නොමැත.

- **ජා.මූ.වා.ප්‍ර.9 -** **මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මිනුම:**
  ජා.ගි.ප්‍ර. 39 හි ආදේශ කිරීම් පළමු පියවර ලෙස අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) විසින් ජා.මූ.වා.ප්‍ර. 9 නිකුත් කරන ලද අතර මූල්‍ය වත්කම සහ වගකීම් වර්ගීකරණ මිනීම ජා.ගි.ප්‍ර.39 අර්ථ නිරූපණය කරන අන්දමට අදාළ වේ. 2013 ජනවාරි 01 දින හෝ ඊට පසු පැමිණෙන ගිණුම්කරණ කාලපරිච්ඡේද සඳහා මෙම ප්‍රමිතිය බලපැවැත් වේ. ඉන් පසුව ජා.ගි.ප්‍ර.ම. ක්‍රමක්ෂය සහ හෙජ් (Impairment and Hedge Accounting) ගිණුම්කරණය පිළිබඳව මණ්ඩලය විසින් සලකා බලනු ලැබේ. 2011 වර්ෂයේ මැදභාගය වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට බලාපොරොත්තු වේ. මූලිකවම ජා.මූ.වා.ප්‍ර. 09 හි මුල් කොටස අදාළ කරගැනීම සම්බන්ධයෙන් මූලිකව බැංකුව මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මිනීම කෙරෙහි බලපෑමක් එල්ල වේ. බැංකුව විසින් වර්තමානයේ ජා.මූ.වා.ප්‍ර.09 යොදා ගැනීම පිළිබඳව තක්සේරු කරමින් සිටී. කෙසේ නමුත් ජා.මූ.වා.ප්‍ර. 09 යොදා ගැනීමේ බලපෑම අදාළ කර ගැනීම සිදුකරන දිනට බැංකුව සතුව පවතින වත්කම් මත රඳා පවතින හෙයින් එහි බලපෑම ගණනය කිරීම ප්‍රායෝගික නොවේ.

- **ජා.මූ.වා.අ.ක.14-** **අවම අරමුදල් අවශ්‍යතා කලින් ගෙවීම (සංශෝධිත):**
  ජා.මූ.වා.අ.ක. 14 සඳහා සිදුකරන ලද සංශෝධනයන් 2011 ජනවාරි 01 දින හෝ ඊට පසුව පැමිණෙන

ගිණුම්කරණ කාල පරිච්ඡේදයන් සඳහා වලංගු වේ. ශුද්ධ විශ්‍රාමික වත්කම්වල අයකරගත හැකි අගය තක්සේරු කිරීම සඳහා අතීතයට බලපාන ආකාරයට (Retrospective) අදාළ සංශෝධනයන් සිදු කළ යුතු ආකාරය පිළිබඳව මෙමගින් මග පෙන්වයි. අවම අරමුදල් අවශ්‍යතා කලින් ගෙවීම වත්කමක් ලෙස මෙමගින් සැලකීමට අවසර ලබා දී ඇත. අදාළ සංශෝධනය මගින් බැංකුවේ මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් බලපෑමක් එල්ල නොවේයැයි අපේක්ෂා කරයි.

- **ජා.මූ.වා.අ.ක.19 - ස්කන්ධ උපකරණ සහ මූල්‍ය වත්කම් නිර්වාපනය (Extinguishing) :**

  ජා.මූ.වා.අ.ක. 19, 2010 ජූලි 01 දින සිට හෝ ඊට පසු පැමිණෙන මූල්‍ය වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක වේ. අර්ථ නිරූපණය මගින් පැහැදිලි කරන පරිදි ස්කන්ධ උපකරණ ණය හිමියාට නිකුත් කිරීම මගින් මූල්‍ය වගකීම නිදහස් කිරීම සඳහා ගෙවූ ප්‍රතිෂ්ඨාවක් ලෙස සුදුසුකම් ලබයි. ස්කන්ධ උපකරණ ඒවායේ සාධාරණ වටිනාකම මත අගය කරයි. විශ්වාසදායි ලෙස අගය කළ නොහැකි විටක දී, හිලව් කරගත් මූල්‍ය වගකීමේ සාධාරණ වටිනාකම මත අගය කරයි. හඳුනාගත් ලාභය හෝ පාඩුව ආදායම් ප්‍රකාශය තුළ දී එසැනින් හඳුනාගත යුතු වේ. අදාළ ප්‍රමිතිය අදාළ කර ගැනීම මගින් බැංකුවට මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑමක් නොමැත.

- ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්ට සිදු කරන ලද වැඩි වර්ධනයන් (2010 මැයි මස නිකුත් කළ)

  ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතී මණ්ඩලය මගින් ජා.මූ.වා.ප්‍ර. වැඩි වර්ධනයන් ජා.මූ.වා.ප්‍ර. සඳහා පොදු සංශෝධනයන් කිහිපයක් හඳුන්වා දී ඇත.

  2010 ජූලි 01 හෝ 2011 ජනවාරි 01 න් පසුව ඇරඹෙන වාර්ෂික කාලච්ඡේදය සඳහා බලාත්මක වන හෙයින් අදාළ කරගෙන නොමැත.

අදාළ සංශෝධනයන් පහත පරිදි වේ.

ජා.මූ.වා.ප්‍ර. 3 - ව්‍යාපාර ඒකාබද්ධකරණය

ජා.මූ.වා.ප්‍ර. 7 - මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීම්

ජා.මූ.වා.ප්‍ර. 1 - මූල්‍ය වාර්තා ඉදිරිපත්කරණය

ජා.මූ.වා.ප්‍ර. 27 - ඒකාබද්ධ සහ වෙන්ව සැකසූ මූල්‍ය වාර්තා

ජා.මූ.වා.අ.ක.13 - පාරිභෝගික ලැදියා ව්‍යාපෘතීන්

බැංකු අපේක්ෂා කරන පරිදි ඉහත සංශෝධනයන් මගින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ කාර්ය සාධනයට සැලකිය යුතු බලපෑමක් එල්ල වී නොමැත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 විදේශීය මුදල් පරිවර්තනය

බැංකුවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර කෘත්‍යාත්මක මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| | **2010 රු.** | 2009 රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **112.8836** | 101.9909 |
| කැනේඩියානු ඩොලර් 1 | **110.9031** | 109.2914 |
| යුරෝ 1 | **147.5619** | 163.718 |
| ජපන් යෙන් 1 | **1.3611** | 1.2413 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **170.837** | 178.6670 |
| ස්ටර්ලින් පවුම් 1 | **171.4113** | 181.7454 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **110.953** | 114.3844 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

### 3.2 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමණාකරන කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම්, මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මිනුම් පදනම්, පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

**ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම් යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/අවාසිය ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/අවාසිය ලෙස වාර්තා කරනු ලැබේ.

**අලෙවිය සඳහා ඇති විදේශ විනිමය සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශ විනිමය සුරැකුම්පත් පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ විකිණීමට ඇති සුරැකුම්පත්වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගය වෙනස්වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණා, ප්‍රතිග්‍රහණය කර හෝ වෙනත් අයුරකින් අපහරණය කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරන තෙක් හෝ හිමිකරු ප්‍රාග්ධනයේ වෙන ම සංරචකයන් (මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) ලෙස හඳුන්වනු ලබන අතර, එවැනි අවස්ථාවක් උද්ගතවීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මුලින් වාර්තා කළ වාසිය හෝ අවාසිය ආදායමට එකතු කරනු ලැබේ.

**මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි**

මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි පිළිබඳව බැංකුවේ සම්බන්ධතාවය ප්‍රධාන වශයෙන් ඉදිරි විදේශ විනිමය කොන්ත්‍රාත්වලට අදාළ වේ. එවැනි ව්‍යුත්පන්න මූල්‍ය ලියවිලි සාධාරණ වටිනාකමින් ප්‍රකාශිතය. ඒවා සමාන පරිණත නියමයන් සහිත කොන්ත්‍රාත්වලට අදාළව පවත්නා ඉදිරි විනිමය අනුපාතයන්ට යොමු කරමින් ගණනය කර ඇත. ලාභ හෝ පාඩු තත්ත්වයේ පවතින මිල ගිවිසගත් ලියවිලි තිබේ නම්, ශේෂ පත්‍රයෙහි විදේශීය මුදල් වෙළෙඳාම හෝ විකිණීමට තිබෙන සුරැකුම්පත් ශේෂය යටතේ වාර්තා කරනු ලැබේ.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත වි.ගැ.හි. ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. විසින් ශේෂ පත්‍ර දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මූ.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොලිය එසැනින් ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල දායක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, අපහරණයන් හෝ ඒ මත පොලිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 31 සහ සටහන් 32 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මූල්‍ය නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මත

නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

### ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම්වල සහ ප්‍රතිමිලදී ගැනිමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර, වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වුයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

### ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරයි. මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

### ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

බැංකුවේ ආයෝජන කළඹ, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ණය නියෝජනය කෙරෙන බැවින්, එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට සටහන් කරනු ලැබේ.

### රජයට දෙන ලද අත්තිකාරම්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද තාවකාලික අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ.

### අනිකුත් ආයතනවලට දෙන ලද ණය

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ආරම්භයේ දී ප්‍රදානය කළ මුදලින් අයකරගත නොහැකි ප්‍රමාණයක් සඳහා වූ මුදල් අඩුකර, හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාලවීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල් සහ ඇස්තමේන්තු හා අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනාගත් අවස්ථාවේ දී කපාහරිනු ලැබේ.

### සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

### අනිකුත් ආයතනවලට දෙන ලද ණය

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ආරම්භයේ දී ප්‍රදානය කළ මුදලින් අයකරගත නොහැකි ප්‍රමාණයක් සඳහා වූ මුදල් අඩුකර, හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාලවීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල් සහ ඇස්තමේන්තු හා අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනාගත් අවස්ථාවේ දී කපාහරිනු ලැබේ.

### මූල්‍ය වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි බැංකුව විසින් මූල්‍ය තත්ව ප්‍රකාශන දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ.

### ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල

පොලී අනුපාතයත් වට්ටම් කළ අගයත් අතර වෙනසය. වත්කමක ධාරණ අගය සෘජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩුකරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් හා තනිව හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ෂණය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ෂණය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යැයි තීරණය කළහොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව විමර්ෂණය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරු වටිනාකමට අදාලව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමූහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

පසුකාලයේ දී හානිකරණ අලාභයේ අගය අඩුවන්නේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වූ සිදුවීමකට විෂයානුබද්ධව අදාල කර ගතහැකි නම් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ආපසු ගලපයි. පසුකාලයක දී ආපසු ගලපන ලද ඕනෑම හානිකරණ අලාභයක් ආපසු ගලපන ලද දිනට වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

**විකිණීමට ඇති ආයෝජන**

විකිණීමට ඇති වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ගකර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනාගන්නේ නැත. ණය ලියවිලිවල හානිකරණ අලාභ, ලියවිල්ලෙහි සාධාරණ අගයෙහි වැඩිවීම, හානිකරණ පාඩුව හඳුනා ගැනීමට පසුව වූ සිද්ධියකට අදාල වන බවට නිශ්චිත සාක්ෂි තිබේ නම් පමණක්, එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

**විදේශීය මුදල් කාලීන බැරකම්**

විදේශීය මුදල් කාලීන බැරකම්, බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලීන බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලීන බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි සහ අවාසි වහාම අදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම් මගින්) අවස්ථාවන්හිදී එය මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

**මූල්‍ය ඇපකර**

මූල්‍ය වාර්තාවලදී, මූල්‍ය ඇපකර මූලික වශයෙන් සාධාරණ අගය මත අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ හඳුනාගනු ලැබේ. ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව එක් එක් ඇපකරය යටතේ බැංකුවේ වගකීම ගණනය කිරීම, ඇපකරය හේතුවෙන් උද්ගතවන මූල්‍ය බැඳීම් බේරුම් කිරීම සඳහා වන හොඳම ඇස්තමේන්තුව ප්‍රකාර සිදුකරනු ලැබේ.

**වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්**

මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළෙඳ දිනයේ දී හඳුනාගනු ලැබේ.

**3.3 අනිකුත් වත්කම් සහ බැරකම්**

**රන්**

ජාත්‍යන්තර සංචිතයේ සංයුතිය මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, රන් මෙම සංචිතයේ කොටසක් ලෙස දැරිය හැක. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස දරා සිටි රන්වල අගය 2010 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 54 කි. මෙම රන් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් නිසා වන බැවින් ද සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී අලෙවි වන වෙළෙඳ භාණ්ඩයක් ලෙස භාවිතා නොවන බැවින් ද මෙම රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලබයි. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරයි.

**ආශ්‍රිත සමාගම්වල ආයෝජන**

ආශ්‍රිත සමාගම්වල බැංකුවේ ආයෝජන, පසුව අපහරණය සඳහා රඳවාගෙන ඇති ඒවා ද සමග පිරිවැය ක්‍රමයට ගිණුම්ගත කරනු ලැබේ.

**තොග**

තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් වැයවන තොග සඳහා වෙන් කිරීමක් සලසා ඇත.

**දේපල, පිරියත සහ උපකරණ**

දේපල, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපල, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ගොඩනැගිලි සඳහා වූ ක්ෂය සහ ප්‍රත්‍යාගණන දිනයට පසුව අඩුකළ හානිකරණ පාඩු අඩුකර, ඉඩම් සහ ගොඩනැගිලි ගණනය කර ඇත.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල | |
| පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි | |
| ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ |
| පිරියත සහ පිරියත | |
| කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරවාගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක යන්ත්‍ර හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය. පළමුව පිරිවැය මත හඳුනා ගැනීමෙන් අනතුරුව ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පවත්වා ගෙන යනු ලබන අතර, එය වූ කලී පසුකාලීන සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගය වේ.

ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල සාධාරණ අගය, ඒවායේ ධාරණ අගයෙන් විශාල ලෙස වෙනස්වීම මගහරවා ගැනීමට නිරතුරුව අගය කිරීම් කරනු ලැබේ.

ප්‍රත්‍යාගණන අතිරික්ත ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, ශේෂ පත්‍රයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක්, එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම් ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් අපහරණයේ දී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේ දී ම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

**අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘශ්‍ය වත්කම්, වර්ෂ 4 ක ජීවකාලයක් පදනම් කළ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

**ලැබිය යුතු ගිණුම්**

ලැබිය යුතු ගිණුම්, නිශ්චිත සාක්ෂි මත අඩමාන ණය සඳහා වෙන්කිරීම් පිළිබඳ පසුව අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත දක්වනු ලැබේ.

**විවිධ වත්කම්**

**සේවක ණය**

ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන් සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සඳහා හිමිකම් කියනු ලැබේ. මෙම ණය ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිත අංක 39 ට අනුව වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

<u>වට්ටම් අනුපාතය</u>

ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන ලදී. වාණිජ්‍ය පොලී නිර්දේශිත අනුපාතය *(CIRR)* බැංකුවේ විගණන කමිටුව මගින් එකඟ වූ පරිදි වාණිජ්‍ය පොලී නිර්දේශිත අනුපාතය සඳහා සියයට 1 අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය ලෙස භාවිතා කළ අතර එය ණයවල කාලපරිච්ඡේදය සමග වෙනස් වේ (වසර 15 ක් දක්වා 11.22% ක් ද වසර 15 සිට 30 දක්වා 8.91%).

මෙම ණය සහණදායී පොලී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරන ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භක දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය වෙළෙඳපොළ අනුපාතයන්ට දෙනු ලැබුවේ නම් බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක් අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

සාධාරණ අගයකරණය ගණනය සඳහා යොදා ගනු ලැබූ උපකල්පනයන්

- 2008 වර්ෂයේ සිට ලබාදුන් සේවක ණය සලකා බලන ලදී.
- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ පියවීමක් සිදු වී නොමැත.

අනෙකුත් විවිධ වත්කම් අපේක්ෂිත උපලබ්ධි අගයට ගෙනයන ලදී.

**මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි වියහැකි

බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සලකුණක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ.

**ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීම මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම**

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 36 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

**නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

බැංකුව විසින් විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ. ආයුගණන අගය කිරීම් වර්ෂ තුනකට වරක් බැගින් සිදු කරනු ලැබේ.

විශ්‍රාම සේවා වියදම්, ප්‍රතිලාභ හා අත්පත් කරගන්නා තෙක් සාමාන්‍ය කාල සීමාව තුළ සරල මාර්ග ක්‍රමය ප්‍රකාර වියදම් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිලාභ, හඳුන්වා දුන් අවස්ථාවේ ම එය අත්පත් කරගෙන තිබේ නම් හෝ වෙනස් වී ඇත්නම් හෝ විශ්‍රාම සේවා වියදම එසැණින් ම හඳුනාගනු ලැබේ.

අනුභූති ගැලපීම් සහ ආයුගණන උපකල්පනයන් වෙනස්වීම් මත උද්ගත ආයුගණන ලාභ සහ පාඩු නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ සහ සැලසුමේ වත්කම්වල සාධාරණ අගය හෝ වැඩි සංඛ්‍යාව සියයට 10 ඉක්මවන අවස්ථාවල දී ආයුගණන ආදායම් හෝ වියදම් ලෙස හඳුන්වනු ලැබේ. එකී ලාභ හෝ අලාභ, මෙම යෝජනා ක්‍රම සඳහා සහභාගිවන සේවකයන්ගේ අපේක්ෂිත ඉදිරි වැඩ කරන කාලය මත ආයුගණන ලාභ හා අලාභ ක්ෂණිකව හඳුනා ගැනීමට පහසු වන ලෙස විධිමත් ක්‍රමයක් ප්‍රකාර සටහන් කරනු ලැබේ.

**නිශ්චිත දායක යෝජනා ක්‍රම**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් ලෙස වෙනම ම පරිපාලනය කරනු ලැබේ.

**ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම් අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**ක්‍රියාත්මක කල්බදු**

බැංකුව කල්බදු ගැනුම්කරු වන අවස්ථාවන්හි දී, කල්බදු ගත් වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කුලිය එය බල පවත්නා කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**ආදායම් බදු**

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ.

**ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන

ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් වියදම් හැඳින්වීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීමේ උපමානයන් ද සපුරාලිය යුතුය.

**පොලිය**

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව සඵල ඵලදායිත්ව ක්‍රමයට උපචිත පදනම මත පොලී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන සහ සුරැකුම්පත් මත උපයන කූපන් සහ භාණ්ඩාගාර බිල්පත් සහ අනිකුත් වට්ටම් සහ අධිමිල පොලී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොලී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොලී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අපහරණයේ දී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම් අපහරණයෙන් ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**මූල්‍ය තත්ව ප්‍රකාශනයෙන් බාහිර විෂයයන් ඇතුලු අසම්භාව්‍යයන් සහ බැඳීම්**

ශේෂ පත්‍රයෙහි බාහිර විෂයයන් නියෝජනය කෙරෙන ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයන් ලෙස හඳුනාගෙන අදාල ශීර්ෂ යටතේ දක්වා ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

## 4. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරන මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවැරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරගකාරිත්වය සහ ස්ථායීතාවය සැලසීම.
- සුදුසුකම්ලත් මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය.
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සපුරාගැනීම සඳහා පවත්වා ගෙනයන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

**විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල්වලින් පවත්වනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඕස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් හඳුන්වා ඇත.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ස්වෛරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත මිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

**දේශීය මුදල් ක්‍රියාකාරකම්**

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන්

අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) සංසරණයෙහි පවත්නා මුදල් නියෝජනය කෙරෙන බැරකමට ආධාරකව ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් සමන්විත ආයෝජන කළඹක් පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළෙඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

**භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

භාරකාර සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොමැත.

**5. මූල්‍ය වත්කම්**

| | 2010<br>රු. '000 | 2009<br>රු. '000 |
|---|---|---|
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **183,729,813** | 56,275,323 |
| විකිණීම සඳහා ඇති ආයෝජන | **346,935,603** | 315,342,452 |
| මුළු මූල්‍ය වත්කම් | **530,665,416** | 371,617,775 |

**6. ජා.මූ.අ. සම්බන්ධ වත්කම්**

| | 2010<br>රු. '000 | 2009<br>රු. '000 |
|---|---|---|
| විශේෂ ගැනුම් හිමිකම් දැරීම | **273,070** | 2,286,331 |
| ජා.මූ.අ. පංගුව | **70,624,016** | 73,860,938 |
| ජා.මූ.අ. තැන්පතුව | **134,753** | 140,929 |
| කලින් ගෙවූ බැඳීම් ගාස්තුව | **167,430** | 221,583 |
| මුළු ජා.මූ.අ. සම්බන්ධ මුළු වත්කම් | **71,199,269** | 76,509,781 |

**විශේෂ ගැනුම් හිමිකම් දැරීම**

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා වි.ගැ.හි. හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි. දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. වල ඇති විශේෂත්වය ඇති වේ. ආබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

**ජා.මූ.අ. පංගුව**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) වූ කලී සාමාජික රටවල් 187 කින් සමන්විත ජාත්‍යන්තර සංවිධානයකි. ජාත්‍යන්තර මුදල් සහයෝගිතාවය, විනිමය ස්ථායීතාවන් සහ විධිමත් විනිමය සැලසුම් ප්‍රවර්ධනය කිරීමටත්, ආර්ථික වර්ධනය සහ රැකියා තත්ත්වය ඉහළ මට්ටමකට ගෙනඒම අභිවර්ධනය කිරීමටත් ගෙවුම් ශේෂ ගැලපීම් පහසු කරලීම සඳහා රටවලට තාවකාලික ආධාර සැපයීමටත් එය පිහිටුවන ලදි. ජා.මූ.අ. මූලික ප්‍රභවය වන්නේ ප්‍රාග්ධන දායකය නොහොත් පංගුය. ජා.මූ.අ. සම්පත් එහි සාමාජික රටවලින් ලැබේ. පුළුල් වශයෙන් රටක ආර්ථික තත්ත්වය, ඒ හා සමාන රටවල පංගු ද ගණනයට ගෙන එක් එක් රටෙහි දායකය නොහොත් පංගුව නිශ්චය කරනු ලැබේ. ජා.මූ.අ. අරමුදලට බැඳෙන අවස්ථාවේ දී රටක් විසින් එයට අදාල පංගුවෙන් සියයට 25 ක් පුළුල්ව පිළිගත් විදේශීය මුදල්වලින් ගෙවිය යුතු අතර, ඉතිරි සියයට 75 ස්වකීය මුදල්වලින් ගෙවිය යුතු වේ.

යම් සාමාජිකයකුගේ පංගුවෙන්, ජා.මූ.අ. සමග වන මූල්‍ය සහ සංවිධනාත්මක සම්බන්ධතාවය පිළිබඳ මූලික අංගයන් නිරූපනය වන අතර, මේවා ද ඇතුළත් ය.

**දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ මුදල්වලින් ගෙවිය යුතුය.

**ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්ද 250 ක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. මිලියන 0.1 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් බැගින් ද හිමි වේ.

**මූල්‍යකරණය පිවිසීම** - සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම්වලින් (පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව පදනම් වේ. සමීපස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට ප්‍රවර්තනය වාර්ෂිකව පංගුවෙන් සියයට 100 ක් ද සමුච්චිත වශයෙන් සියයට 300 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී සහ නිශ්චිත ගැටළු විසඳා ගැනීම සඳහා ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

**වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

එබැවින් වි.ගැ.හි. පංගුව වත්කමක් වේ. බැංකු විසින් ජා.මූ.අ. සමග සිදුකරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජිතයකු වශයෙන් නොව, තම බලතල අනුව සිදුකරන බැවින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස එහි මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වයි. ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය 15 වැනි සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

**පී.ආර්.ජී.එෆ් - එච්.අයි.පී.සී. භාර ගිණුම**

දැඩි දිළිඳු භාවයට පත්ව සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම අඩුකරලීමේ පහසුකම (PRGF-HIPC – Poverty Reduction Growth Facility for the Heavily Indebted Poor Countries) වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත - Administrated) විශේෂ විලම්භීත ගිණුමක් (Special Contingant Account) SCA 2. 2000 අප්‍රේල් 21 දින වි.ගැ.හි. මිලියන 0.789 ක් පැවැරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව (act as an out right grant) 2018 වසර දක්වා බල පැවැත්වෙන පොලී රහිත තැන්පතුවක් වශයෙනි.

**7. රජයට දෙන ලද අත්තිකාරම්**

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| චක්‍රීය ණය | **77,878,823** | 73,880,500 |
| රජයට දෙන ලද මුළු අත්තිකාරම් | **77,878,823** | 73,880,500 |

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වැනි වගන්ති ප්‍රකාර දෙන ලද සෑම අත්තිකාරමක් මාස හයකට නොවැඩි කාලයකින් ආපසු ගෙවන්නේ නම් සහ ඕනෑම අවස්ථාවකදී පරිශේෂව තිබෙන එම අත්තිකාරම් ප්‍රමාණය අත්තිකාරම් දෙනු ලබන වර්ෂයේ ශ්‍රී ලංකා රජයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 10 ක් නොඉක්මවන්නේ නම්, ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අනුමාන වියදම් මූල්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට (ශ්‍රීලංර) සෘජු තත්කාලීන අත්තිකාරම් දීමට මහ බැංකුවට හැකිය. බැංකුව විසින් එසේ දෙන ලද අත්තිකාරම් ඉහත ශේෂයෙන් දැක්වේ.

**8. (අ) අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| දැනට පවත්නා මුල් මුදල | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **1,758,574** | 45,919 |
| - අනෙකුත් | **1,937,222** | 2,104,829 |
| | **3,695,796** | 2,150,748 |
| සුසහන සුනාමි යෝජනා ක්‍රමය | | |
| යටතේ ලැබිය යුතු මුදල් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **513,788** | 604,632 |
| - අනෙකුත් | **214,058** | 512,558 |
| ලැබිය යුතු පොලිය | **4,217,766** | 4,217,766 |
| *අඩුකළා* - අත්හිටවූ පොලිය | **(4,217,766)** | (4,217,766) |
| අඩමාන ලැබිය යුතු මුදල් | | |
| සඳහා වෙන්කිරීම | **(1,963,796)** | (2,131,342) |
| ශුද්ධ ලැබිය යුතු මුදල | **2,459,846** | 1,136,596 |

අඩමාන ලැබිය යුතු මුදල් සඳහා වෙන්කිරීමේ චලනය මෙසේය.

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ දී | **2,131,342** | 2,178,492 |
| අඩමාන ලැබිය යුතු මුදල් සඳහා වූ චලනය | **(167,546)** | (47,150) |
| වර්ෂය අවසානයේ දී | **1,963,796** | 2,131,342 |

2010 දෙසැම්බර් 31 දිනට පොලිය හඳුනානොගත් අක්‍රීය ණයවල එකතුව රුපියල් මිලියන 1,936.495 ක් විය. (2009 දී රුපියල් මිලියන 2,150.748) එම ණයවලට සම්බන්ධ හඳුනානොගත් පොලිය, 2010 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 4,217.766 ක් විය (2009 දී රුපියල් මිලියන 4,217.766).

**8. (ආ) වෙනත් දේශීය ලැබිය යුතු දෑ**

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **2,377,257** | 63,194 |
| වෙනත් ලැබිය යුතු දෑ | **897,635** | 532,250 |
| | **4,374,892** | 595,444 |

භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ මගින් පෙන්නුම් කරනුයේ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බැංකුව විසින් දරන ලද වියදම් වේ.

**9. මූල්‍ය සහ අනිකුත් ආයතන වල ආයෝජන**

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ, කාර්මික හෝ වෙනත් ආයතනයක ඍජු සම්බන්ධකම් ඇතිවන පරිදි වෙළෙඳ හෝ වෙනත් කටයුතුවල නිරතවීම හෝ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී වෙනත් බැංකුවල කොටස් මිලදී ගැනීම හෝ 1949 අංක 58 දරන මුදල් නීති පනත (සංශෝධිත) ප්‍රකාර නිශ්චිත වශයෙන් තහනම් කරනු ලැබේ. කෙසේ වුවද, මුදල් මණ්ඩලයේ මතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ඇරීමට පනත මගින් බලතල පවරා තිබේ.

(ii) ඉහත සඳහන් අවශ්‍යතාවයන් පදනම්ව බැංකුව විසින් ශේෂ පත්‍ර දිනට පහත සඳහන් ආයෝජන දරනු ලැබේ.

| ආයෝජනය කළ සමාගම | ව්‍යාපාර කටයුතු | දරන ප්‍රතිශතය | | වර්ෂය අවසානය |
|---|---|---|---|---|
| | | 2010 | 2009 | |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **19.66** | 19.66 | මාර්තු 31 |
| සීමාසහිත ෆිච් රේටිංස් ලංකා සමාගම | ණය ශ්‍රේණි කිරීම | **10.00** | 10.00 | දෙසැම්බර් 31 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **7.50** | 7.50 | දෙසැම්බර් 31 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය | ණය තොරතුරු සම්පාදනය | **19.76** | 19.90 | දෙසැම්බර් 31 |
| විකිණීමට රඳවාගත් සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | - | 8.51 | දෙසැම්බර් 31 |

(iii) අදාල ආයතනවල වූ ආයෝජනයන්ගේ ධාරණ වටිනාකම මෙසේය.

| | 2010<br>රු. '000 | 2009<br>රු. '000 |
|---|---|---|
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | **5,986** | 8,605 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | **29,500** | 29,500 |
| සීමාසහිත ෆිච් රේටිංස් ලංකා සමාගම | **3,500** | 3,500 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විස් බියුරෝ ලිමිටඩ් | **2,250** | 2,250 |
| මූල්‍ය සහ අනිකුත් ආයතන වල මුළු ආයෝජනය | **41,236** | 43,855 |

**9. (ආ) අනෙකුත් වත්කම්**

| | 2010<br>රු. '000 | 2009<br>රු. '000 |
|---|---|---|
| අනෙකුත් දේශීය වත්කම් | **1,272,621** | 1,497,973 |
| | **1,272,621** | 1,497,973 |

බැංකුව විසින් වර්ෂය තුලදී ස්වෙච්ඡා තැන්පතු රක්ෂණ ක්‍රමයෙහි වූ ආයෝජන වලින් රුපියල් මිලියන 331.653 ක ප්‍රමාණයක් ගැසට් අංක: 1673/11-2010 සැප්තැම්බර් 28, මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය වෙත මාරු කරන ලදී.

**10. තොග**

| | 2010<br>රු. '000 | 2009<br>රු. '000 |
|---|---|---|
| සංසරණයේ ඇති නෝට්ටු | **1,476,072** | 1,687,046 |
| සංසරණයේ ඇති කාසි | **513,981** | 391,615 |
| මාර්ගස්ථ නෝට්ටු | **668,170** | - |
| මාර්ගස්ථ කාසි | **144,914** | 68,587 |
| | **2,803,137** | 2,147,248 |
| *අඩුකළා :* සෙමින් චලනය වන විෂයයන් සඳහා වෙන්කිරීම් | **(25,000)** | (25,000) |
| | **2,778,137** | 2,122,248 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **36,647** | 34,952 |
| **පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට** මුළු තොගය | **2,814,784** | 2,157,200 |

**11. දේපල පිරියත සහ උපකරණ**

| | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් කියවීම් උපකරණ | අනිකුත් නොනිමි ඉදිකිරීම් | එකතුව 2010 | එකතුව 2009 |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| සමුච්චිත ක්ෂය අඩුකර ජනවාරි 01 දිනට අගය | **8,367,062** | **1,061,420** | **604,440** | **214,713** | **662,793** | **38,248** | **244,763** | **11,193,439** | 10,817,079 |
| එකතු කිරීම් | **171,327** | **7,256** | **42,998** | **64,914** | **33,604** | **548** | **125,904** | **446,551** | 381,722 |
| නැවත වර්ග කිරීම | **-** | **(750)** | **25,176** | **-** | **(25,176)** | **750** | **-** | **-** | - |
| අපහරණයන් මාරු කිරීම | **(3,546)** | **-** | **(3,927)** | **-** | **(911)** | **-** | **(171,327)** | **(179,711)** | (5,362) |
| සමුච්චිත ක්ෂය අඩුකර දෙසැම්බර් 31 දිනට අගය | **8,534,843** | **1,067,926** | **668,687** | **279,627** | **670,310** | **39,546** | **199,340** | **11,460,279** | 11,193,436 |
| ක්ෂය | | | | | | | | | |
| ජනවාරි 01 දිනට | **253,847** | **373,512** | **435,156** | **169,231** | **592,379** | **26,367** | **-** | **1,850,492** | 1,575,031 |
| වර්ෂය සඳහා ක්ෂය | **123,279** | **53,048** | **41,251** | **26,589** | **24,111** | **1,221** | **-** | **269,499** | 279,455 |
| නැවත වර්ග කිරීම් | **-** | **-** | **4,196** | **-** | **(4,196)** | **-** | **-** | - | _ |
| අපහරණයන් | **-** | **-** | **(3,141)** | **-** | **(911)** | _ | _ | **(4,052)** | (3,994) |
| දෙසැ 31 දිනට අගය | **377,126** | **426,560** | **477,462** | **195,820** | **611,383** | **27,587** | **-** | **2,115,939** | 1,850,492 |
| ශුද්ධ පොත් අගය | **8,157,717** | **641,366** | **191,225** | **83,807** | **58,927** | **11,958** | **199,340** | **9,344,340** | 9,342,947 |

ඉඩම් සහ ගොඩනැගිලි සඳහා පොත් වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2007 දෙසැම්බර් 31 දිනට වරලත් තක්සේරුවකු වන පී.බී. කළුගලගෙදර මහතා විසින් සිදු කරන ලද අතර 2007 දෙසැම්බර් 31 දින වාර්තා ගත කර තිබුණි.

ඉඩම් සහ ගොඩනැගිලි සංයුතිය පහත සඳහන් පරිදිය.

| | ධාරණ වටිනාකම 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| සින්නක්කර ඉඩම් | **2,939,202** | 2,942,747 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **5,138,725** | 5,078,799 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **79,791** | 91,668 |
| | **8,157,718** | 8,113,214 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වුයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රුපියල් මිලියන 6,944.193 ක් වේ. (2009 දී රුපියල් මිලියන 6,944.193 කි).

2010 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල පිරිවැය රුපියල් මිලියන 1,475.265 (2009 රුපියල් මිලියන 1,429.305).

2010 වර්ෂය තුළ බැංකුව විසින් මිල දී ගත්, දේපළ පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් සඳහා මුදලින් ගෙවූ වටිනාකම රුපියල් මිලියන 280.027 (2009 - රුපියල් මිලියන 387.795).

**12. අස්පෘෂ්‍ය වත්කම්**

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| පරිගණක මෘදුකාංග | | |
| පිරිවැය - | | |
| ජනවාරි 01 දිනට | **580,794** | 574,082 |
| එකතුකිරීම් | **9,303** | 6,712 |
| දෙසැම්බර් 31 දිනට | **590,097** | 580,794 |
| ක්‍රමක්ෂය සහ හානිකරණය - | | |
| ජනවාරි 01 දිනට | **564,411** | 558,365 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **7,933** | 6,046 |
| දෙසැම්බර් 31 දිනට | **572,344** | 564,411 |
| ශුද්ධ පොත් වටිනාකම - | | |
| ජනවාරි 01 දිනට | **16,383** | 15,717 |
| දෙසැම්බර් 31 දිනට | **17,753** | 16,383 |

**13. බැංකු සහ මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල්**

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **2,598,637** | 17,709,419 |
| අනිකුත් විදේශීය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **528,499** | 359,422 |
| බැංකු සහ මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුළු මුදල් | **3,127,136** | 18,068,841 |

**14. ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල්**

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල | **65,044,407** | 29,836,531 |

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ අනුග්‍රහය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව එක් සහභාගිවන්නකි. බංගලාදේශය, ඉරාන ඉස්ලාම් සමූහාණ්ඩුව, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, භූතානය සහ මියන්මාරය එහි අනිකුත් සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් සියයට 0.18 ක සිට 0.21 ක් දක්වා වූ පොලියක් අමෙරිකා එක්සත් ජනපද ඩොලර් සඳහා ද (2009 දී එය සියයට 0.18 ක් සහ 0.14 ක් විය) යුරෝ සඳහා සියයට 0.28 ක සිට 0.44 දක්වා වූ පොලියක් (2009- සියයට 0.28 සහ සියයට 0.30 ) මෙම පහසුකම් සඳහා ගෙවනු ලැබේ. එය බේරුම් කිරීමේ දිනයන් අතර ශුද්ධ ණය හිමියන්ගේ දෛනික පරිශේෂ ශේෂයන්ට මාරු කරනු ලැබේ. ඉහත ශේෂයන්ගෙන් අදාල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට ආ.නි.ස. වෙත ගෙවිය යුතු ප්‍රමාණය නියෝජනය වේ.

**15. ජා.මූ.අ. සම්බන්ධ බැරකම්**

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| පොලිය දරන ණය - ප්‍රවර්තන නොවන | **144,098,362** | 78,899,615 |
| පොලිය දරන ණය - ප්‍රවර්තන | **1,311,686** | 3,301,811 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **67,559,235** | 70,655,689 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **38,802,123** | 41,627,642 |
| පංගු බැරකම් | **23,649,431** | 23,686,264 |
| | **131,322,475** | 139,271,406 |
| ජා.මූ.අ. සම්බන්ධ මුළු බැරකම් | **275,420,837** | 218,171,021 |

පොලිය දරන ණයවලට, ජා.මූ.අ. සමග වූ දුගීබව අඩුකරලීමේ සහ ආර්ථික වර්ධන පහසුකම සහ වැඩිකරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් මෙන්ම හදිසි ආධාර පහසුකම් ද ඇතුළත් වේ.

**දිළිඳුකම අඩුකිරීමේ සහ ආර්ථික වර්ධන පහසුකම (පී.ආර්.ජී.එෆ්)**

මෙම පහසුකම, අඩු ආදායම් ලබන සාමාජිකයන්ට ජා.මූ.අ. විසින් සපයනු ලබන දිගුකාලීන මූල්‍යකරණ පහසුකමකි. මෙම පහසුකම, මීට ඉහත දී වැඩි දියුණු කළ ව්‍යුහගත ගැලපීම් පහසුකම ලෙස හඳුන්වන ලදී. දුගීබව අඩුකර තිරසාර පදනමක් මත වැඩි වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම මගින් උසස් ජීවන තත්ත්වයක් කරා පිවිසීම මෙම වැඩසටහනේ ඉලක්කය වේ. මෙම පහසුකම යටතේ අය කරන පොලී අනුපාතය වර්ෂයකට සියයට 0.5 ක් වේ. මෙය යටතේ ජා.මූ.අ. විසින් ප්‍රදානය කරනු ලබන ණය ආපසු ගෙවීමේ කාල පරිච්ඡේදය උපරිම වශයෙන් වර්ෂ 10 කි.

**දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම (ඊ.එෆ්.එෆ්)**

මෙය, සාර්ව ආර්ථික අසංතුලනය සහ ව්‍යුහගත ගැටළු මඟින් උද්ගත වන ගෙවුම් ශේෂ අපහසුතාවන් මැඩ පැවැත්වීම සඳහා මධ්‍යකාලීන වැඩසටහන්වලට ආධාර කෙරෙන මූල්‍ය පහසුකමකි. මෙය වැඩිදියුණු කළ ව්‍යුහගත ගැලපීම් පහසුකම්වල ව්‍යාප්තියකි. මේ යටතේ ණය සඳහා අය කෙරෙන පොලී අනුපාතය වර්ෂයකට සියයට 0.5 කි. ජා.මූ.අ. විසින් මේ යටතේ ලබාගත් ණය ආපසු ගෙවීමට සලසා ඇති කාල පරිච්ඡේදය වර්ෂ 4 1/2 ක අනුග්‍රහ කාල පරිච්ඡේදයක් සහිත වර්ෂ 10 කි.

**හදිසි ආධාර පහසුකම (ඊ.ඒ.එෆ්.)**

ස්වභාවික උපද්‍රවයන්ගෙන් පීඩිත වූ සාමාජික රටවල්වලට, හදිසි ගෙවුම් ශේෂ මූල්‍ය අවශ්‍යතා සඳහා සමස්ත ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමේ හෝ නැවත ඇතිකර ගැනීම සඳහා ජා.මූ.අ. විසින් හදිසි ආධාර සපයනු ලැබේ.

ජා.මූ.අ. විධායක මණ්ඩලය විසින් වි.ගැ.හි. මිලියන 103.350 ක මුදලක් ශ්‍රී ලංකාව සඳහා අනුමත කර ඇත. මෙම හදිසි ආධාර පහසුකම, සමාන කාර්තු වාරික 08 කින්, ප්‍රදානය කළ දින සිට අවුරුදු 3 1/4 සිට අවුරුදු 5 අතර කාලයක් තුළ ආපසු ගෙවිය යුතුය.

**සම්පස්ථ ණය පහසුකම**

මාස 20 ක මෙම ණය පහසුකම ශ්‍රී ලංකාවට ලබාදීම සඳහා 2009 ජූලි 24 වන දින පැවති ජා.මූ. අරමුදලේ විධායක කමිටු රැස්වීමේදී තීරණය කරන ලද අතර එය වි.ගැ.හි. බිලියන 1.65ක් එනම් ඇ.ඩො. බිලියන 2.6ක ප්‍රමාණයක් වේ. මෙය ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ කටයුතු වලට සහය ලබාදීම සඳහා සපයන ලදී. මුළු ණය පහසුකමෙන් වි.ගැ.හි. මිලියන 413.4 ක් එනම් ඇ.ඩො. මිලියන 644.4ක් වූ ප්‍රමාණයක් වාරික දෙකක් ලෙස 2009 ජූලි 28 හා 2009 නොවැම්බර් 10 වන දිනවල ලංකාවට ලැබුණි. වි.ගැ.හි.මිලියන 275.6 ක් එනම් එ.ජ.ඩො.මිලියන 407.78 ක් වූ තවත් වාරික දෙකක් 2010 ජුනි 30 හා 2010 සැප්තැම්බර් 28 වන දිනවල ණය පහසුකමේ 3 වන හා 4 වන වාරික ලෙස ලංකාවට ලැබුණි. 2010 සැප්තැම්බර් 28 දිනට පසුව වි.ගැ.හි.

මිලියන 137.8 ක් එනම් ඇ.ඩො. මිලියන 212.47 ක් වන ණය පහසුකමේ 5 වන වාරිකය ද ලංකාවට ලැබුණි. ඉතිරි ප්‍රමාණය රටේ ආර්ථික කාර්ය සාධනය කාර්තුමය වශයෙන් විමර්ශනය කිරීමෙන් අනතුරුව වාරික 3කින් ලංකාවට සපයනු ඇත. මෙම සම්පස්ථ ණය පහසුකම ජා.මූ. අරමුදලේ ශ්‍රී ලංකාවේ පංගුව මෙන් සියයට 400 ක පංගුවට සමාන වේ.

මෙම ණය පහසුකම යටතේ ලබාදෙන අවසාන වාරිකය වර්ෂ 2012 මාර්තු මස ලබාදීමට නියමිතය. මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා වර්ෂ 4 ක කාලසීමාවක් හිමිවන අතර එය 2013 අප්‍රේල් මසින් ආරම්භ වේ. මෙම ණය පහසුකම සඳහා අයකරන පොලී අනුපාතය, සේවා ගාස්තු හා ස්ථාවර අනුපාතය යන කොටස් දෙකකින් සමන්විතය. සේවා ගාස්තුව, විශේෂ ගැනුම් හිමිකම් අනුපාතයට යටත්ව සතිපතා ගණනය කරනු ලැබේ. ස්ථාවර අනුපාතය, නියමිත ණය මුදලින්, ගෙවිය යුතු ණය මුදල සියයට 300 ක් දක්වා වර්ෂයකට 1% කි. නියමිත ණය මුදලින් සියයට 300 ඉක්මවන විට වර්ෂයකට 2% ක් වූ අමතර ගාස්තුවක් අයබදු ලෙස ගෙවිය යුතුය.

**සම්පස්ථ ණය පහසුකමේ ප්‍රධාන අරමුණු**

- රටේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලට සහය වීම
- යුධමය තත්වයට පසු ප්‍රතිසංස්කරණ සහ සහන සැලසීමේ ව්‍යායාමයන් සඳහා ප්‍රමාණවත් සම්පත් ඇතිබව තහවුරු කරන අතරතුර රටේ මූල්‍ය තත්වය ශක්තිමත් කිරීම.
- ලංකාවේ දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම හා විදේශ සංචිත නැවත පිහිටුවීමේ අභිප්‍රාය.
- යුධ වාතාවරණයට පසුව සිදුකරන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගේ මූල්‍ය සහයෝගය ලබාගැනීමට පාලකයන්ට සහය වන ශක්තිමත් සාර්ව ආර්ථික පදනමක් ඇතිකිරීම.
- වර්තමාන නීතිරීති රාමුව හා බැංකු සුපරීක්ෂණය වැඩිදියුණු කිරීම තුළින් බැංකු ක්‍රමය ශක්තිමත් කිරීම.

පොලී දරන ණය සඳහා මාස 12 කට පෙර සහ පසු බේරුම් කිරීම අපේක්ෂිත මුදල් පහත සඳහන් පරිදි වේ.

| | බලපවතින පොලී අනුපාතික % | පරිණත | 2010 රු.'000 | 2009 රු. '000 |
|---|---|---|---|---|
| **ප්‍රවර්තන** | | | | |
| දීර්ඝ කරන ලද | | | | |
| - හදිසි අරමුදල් පහසුකම | | | _ | 307,754 |
| - හදිසි ආධාර පහසුකම | | | _ | 685,903 |
| දිළිඳුකම අඩුකිරීමේ | | | | |
| ආර්ථික වර්ධන පහසුකම 2 | 0.5 | | **1,311,686** | 2,308,154 |
| | | | **1,311,686** | 3,301,811 |
| **ප්‍රවර්තන නොවන** | | | | |
| සම්පස්ථ ණය පහසුකම (SBA) | | 2015 | **141,248,032** | 73,860,937 |
| දිළිඳුකම් අඩුකිරීමේ හා | | | | |
| ආර්ථික වර්ධන පහසුකම 2 | 0.5 | 2013 | **1,967,530** | 4,115,416 |
| දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම | 1.32 | 2013 | **882,800** | 923,262 |
| | | | **144,098,362** | 78,899,615 |
| පොලී දරන මුළු ණය මුදල | | | **145,410,048** | 82,201,426 |

**විශේෂ ගැනීම් හිමිකම් වෙන් කිරීම (වි.ගැ.හි.)**

වි.ගැ.හි. යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයක් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අ. වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි) සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන්ට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොලී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන්, 6 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. එහි ශුද්ධ වෙන්කිරීමට සමාන මුදල් සහ එය වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගීවීමේ හේතුවෙන් ජා.මූ.අ., වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කළ හෝ ඇවර කළ අවස්ථාවේ දී ගෙවිය යුතු අනිකුත් යම් මුදලක් වෙතොත් ඒවා ජා.මූ.අ. වෙත ගෙවීමට සාමාජිකයන් බැඳී සිටී.

**ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්**

මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

**පංගු බැරකම**

අංක 6 දරන සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 16. අනෙකුත් විදේශීය ගෙවිය යුතු මුදල්

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| අනෙකුත් විදේශිය බැරකම් | **2,240,366** | 2,148,425 |
| චීන සංවර්ධන බැංකු අරමුදල | **2,773,825** | 2,859,610 |
| මුළු අනෙකුත් විදේශීය ගෙවියයුතු මුදල් | **5,014,191** | 5,008,035 |

**චීන සංවර්ධන බැංකු ණය මුදල**

ආයතන දෙකෙහිම මූල්‍ය හා ආර්ථික සහයෝගීතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව හා චීන සංවර්ධන බැංකුව, 2009 ජූලි මස 25 වන දින ගිවිසුමකට එළඹුණි. මෙම ගිවිසුම යටතේ චීන සංවර්ධන බැංකුව ශ්‍රී ලංකාවට ඇ.ඩො. මිලියන 25 ක් දක්වා සමස්ථ ණය පහසුකමක් ලබා දීමට කටයුතු කළ අතර, ශ්‍රී ලංකා මහබැංකුව රටේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම, වෙළෙඳපල ද්‍රවශීලතාවය ඉහළ නැංවීම, කෘෂිකාර්මික සංවර්ධනය ඉහළ නැංවීම සහ යටිතල

පහසුකම් සංවර්ධනය ඉහළ නැංවීමේ අරමුණු සඳහා මෙම පහසුකම භාවිතා කරයි.

පොලිය ගණනය කිරීම සඳහා සය මාසික ඇ.ඩො. ලන්ඩන් අන්තර් බැංකු පිරිනැවුම් අනුපාතයට එකතු වූ සියයට 4ක අනුපාතයක් උපයෝගී කර ගනියි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ණය පහසුකම ආපසු ගෙවිය යුතු අවසාන කල්පිරුණු දිනය වන්නේ මෙම පහසුකම ප්‍රයෝජනයට ගත් දිනයෙන් මාස 36 කට පසු එළඹෙන දිනවේ. (2009. 08.14)

## 17. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පත් කිරීම්

තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (*RTGS*) සහභාගිවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල යන ආයතනවලට පොලී රහිත, සම්පූර්ණයෙන් ම සුරැකුම් සහිත දිනක් තුළ සපයනු ලබන ද්‍රවශීල පහසුකම් යටතේ අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ හැකියාව ඇත. එම දිනක් තුළ සපයනු ලබන ද්‍රවශීල පහසුකම යටතේ, ලබාගත් අත්තිකාරම් විකුණුම් කළ හැකි රජයේ සුරැකුම්පත් තැන්පත් (ඔඩපන) කළ යුතුයි. මෙම පහසුකම යටතේ ලබාගත් අත්තිකාරම්, විකුණුම් කළ හැකි රජයේ සුරැකුම්පත්වලට එරෙහිව ලබාගත් අත්තිකාරම් නියෝජනය කරනු ලබන අතර දෙවර්ෂය අවසානයේ දී ශුන්‍ය වටිනාකමක් දැක්වීය.

| | **2010** | 2009 |
|---|---|---|
| | **රු. '000** | රු. '000 |
| **බැංකුව විසින් තැන්පත් කිරීම්** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **55,282,083** | 36,556,496 |
| - අනිකුත් | **49,563,846** | 49,525,894 |
| | **104,845,929** | 86,082,390 |
| **මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම්** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **368** | 132 |
| - අනිකුත් | **7,148** | 3,344 |
| | **7,516** | 3,476 |
| **බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු** | **104,853,445** | 86,085,866 |

## 18.(අ) රජයේ සහ රජයේ ඒකක සමග වූ ශේෂයන්

| | **2010** | 2009 |
|---|---|---|
| | **රු. '000** | රු. '000 |
| රජයේ තැන්පතු | **2,252,713** | 1,414,039 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **835,946** | 933,670 |
| **රජය සහ රජයේ නියෝජිතයන් වෙත වූ මුළු ශේෂ** | **3,088,659** | 2,347,709 |

## 18.(ආ) නැවත මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්

| | **2010** | 2009 |
|---|---|---|
| | **රු. '000** | රු. '000 |
| රජයේ තැන්පතු | **18,400,000** | 6,000,000 |
| මහ බැංකු සුරැකුම්පත් | **95,054,891** | 78,022,645 |
| | **113,454,891** | 84,022,645 |

## 19. (අ) සේවක ප්‍රතිලාභ සැලසුම් සමග වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම්වල බැංකුකරු ලෙස ක්‍රියාකරනු ලැබේ. වෙනම පරිපාලනය කරන සේවක ප්‍රතිලාභ සැලසුම්වල බැරට රඳවා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් මෙසේය.

| | **2010** | 2009 |
|---|---|---|
| | **රු. '000** | රු. '000 |
| සේවක අර්ථසාධක අරමුදල | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **1,190** | 1,083 |
| සේවක විශ්‍රාම යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **(479,902)** | (481,359) |
| වැන්දඹු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **698,177** | 667,955 |
| විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් ගෙවිය යුතු | **15,761** | 19,162 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වෙනුවෙන් ගෙවිය යුතු | **741,928** | 843,415 |
| **අනිකුත් තැන්පතු මුළු ප්‍රමාණය** | **977,154** | 1,050,255 |

## 19. (ආ) අනෙකුත් ගෙවිය යුතු මුදල්

අනෙකුත් ගෙවියයුතු දෑ තුල ඇතුලත් රුපියල් මිලියන 1,175.758 (2009 - ශුන්‍ය) ක මුදල 2009 අංක 5 දරණ බැංකු පණත - බලපත්‍රලාභී බැංකුවල අත්හරින ලද දේපල හඳුනාග ැනීම්, වාර්තා කිරීම්, මාරු කිරීම් හා පවත්වාගෙන යෑම් අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු හා මූල්‍ය ආයතන වල අත්හරින ලද දේපල එකතු කිරීම් සම්බන්ධවයි. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැම්පතු මුදල හා එයට අදාල පොලිය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැම්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතය අනුව ගණනය කරන ලද පොලිය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

## 20. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. අදාල මූල්‍ය ප්‍රකාශන දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| **වර්ගය** | | |
| **කාසි** | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,702** | 5,702 |
| සත 5 | **23,245** | 23,249 |
| සත 10 | **39,212** | 39,220 |
| සත 25 | **121,120** | 120,754 |
| සත 50 | **185,633** | 184,190 |
| රුපියල් 1 | **613,826** | 574,058 |
| රුපියල් 2 | **863,079** | 811,255 |
| රුපියල් 5 | **2,624,778** | 2,501,296 |
| රුපියල් 10 | **645,699** | 447,287 |
| අනිකුත් අනුස්මරණ කාසි | **549,496** | 546,535 |
| | **5,675,421** | 5,257,177 |

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| **නෝට්ටු** | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,699** | 26,699 |
| රුපියල් 5 | **37,206** | 37,208 |
| රුපියල් 10 | **1,856,521** | 1,806,776 |
| රුපියල් 20 | **2,603,008** | 2,068,244 |
| රුපියල් 50 | **3,568,411** | 3,052,438 |
| රුපියල් 100 | **13,333,012** | 12,254,788 |
| රුපියල් 200 | **210,389** | 176,231 |
| රුපියල් 500 | **19,683,291** | 18,171,292 |
| රුපියල් 1,000 | **109,381,997** | 101,922,111 |
| රුපියල් 2,000 | **99,271,281** | 72,651,890 |
| | **249,976,796** | 212,172,658 |
| **සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය** | **255,652,217** | 217,429,835 |

## 21. විලම්භිත ප්‍රදානයන්

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| ජනවාරි 01 වන දිනට | **567** | - |
| ප්‍රදානයන් ලැබීම් | **4,500** | 639 |
| වර්ෂයතුල ක්‍රමක්ෂය | **(462)** | (72) |
| දෙසැම්බර් 31 දිනට | **4,605** | 567 |

වර්ෂය තුළ දී මුදල් අමාත්‍යාංශය විසින් බැංකුව වෙත නොමිලේ වාහනයක් ලබාදෙන ලදී. එම වත්කම අනුරූප ණය සමග සාධාරණ අගයට විලම්භිත ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ලදී. එම විලම්භිත ආදායම, අදාළ වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට උචිත වන ආකාරයට අදාළ කාලච්ඡේදයට ක්‍රමක්ෂය කරන ලදී.

## 22. හිමිකරු ප්‍රාග්ධනය

**හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය**

**ප්‍රාග්ධන අරමුදල්**

*දායක ප්‍රාග්ධනය :* මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි.

*ප්‍රාග්ධනය ලෙස විසර්ජනය කළ සංචිත* - MB/F/22/12/2008 දරන මුදල් නීති මණ්ඩල තීරණය පරිදි 2008 වර්ෂයේ පොදු සංචිතයෙන් රුපියල් මිලියන 24,985 ක් මාරු කිරීම මගින් මෙම සංචිතය සකසා ඇත.

රඳවාගත් ඉපැයීම්වලට අමතරව, සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ.

*පොදු සංචිතය* - පහත සඳහන් සංචිත සඳහා මුදල් මණ්ඩලය විසින් වෙන්කරන ලද මුදල් පොදු සංචිතයට ඇතුළත්ය. ප්‍රාග්ධන දායකය, දිගු සහ මධ්‍ය කාලීන ණය සහ පාලන ගිණුම් සංචිතය. මූල්‍ය හා අනිකුත් ආයතනවලට ආයෝජන සඳහා යොදාගත හැකිවන ආකාරයට, ප්‍රාග්ධන දායකය, අරමුදල් ගොඩනැගෙන සේ සකසා ඇත.

*ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (ජාප්‍රස)* - ජාත්‍යන්තර ප්‍රත්‍යාග ණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයක්ය. මෙම වගන්තිය ප්‍රකාර රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

**විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ අගය/(අලාභය)** විකිණීමට තිබෙන ලෙස නම් කර ඇති සුරැකුම්පත් ප්‍රත්‍යාග ණනයෙන් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

**තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල** - තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල් ගොඩනගා ඇත. මෙම අරමුදල ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන සඳහා සීමාකර ඇත.

**විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බැංකුවේ ආදායම් ඉපැයීමේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා මෙය යොදාගැනීමට අපේක්ෂා කෙරේ.

**තාක්ෂණික අභිවර්ධන සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර මහ බැංකුවේ දැනට භාවිතා කරන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හෝ නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**කලාපීය සංවර්ධන ණය යෝජනා ක්‍රමය** - 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.9 ක අරමුදලක් ගොඩනගා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රදානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය.

**තැන්පතු රක්ෂණ අරමුදල** - ස්වෙච්ඡා තැන්පතු යෝජනා ක්‍රමය යටතේ පිහිටුවන ලද අරමුදල නියෝජනය කරන ආයෝජනයන්, 2010 සැප්තැම්බර් 28 දාතම (සටහන 40 - ඇ.ඉ. 1673/11 දරන ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිහිටුවීමෙන් අනතුරුව බැංකු පරිපාලනය විසින් ගෙවා දමන ලදී. එසේ හුවමාරු කළ අරමුදල් වටිනාකම රුපියල් මිලියන 331.653 කි.

අනිකුත් සංචිතවල චලනය පහත සඳහන් පරිදි විය.

## 22. හිමිකරු ප්‍රාග්ධනය

| | මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිත | වෙළෙඳපල අගයකිරීමේ හා අනෙකුත් සංචිත | ශ්‍රී.ලං.මබැ නිශ්චිත සංචිත | තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල (RTGS) | ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (IRR) | විකිණීම සඳහා තිබෙන සුරකුම්පත්වල ශුද්ධ/ සාධාරණ අගය/ (අලාභය) | විශ්‍රාම අරමුදල් සංචිතය | තාක්ෂණික අභිවර්ධන සංචිතය | පළාත් සංවර්ධන ණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| 2010 ජනවාරි 01 දිනට | **9,425,000** | **16,568,574** | **742,992** | **297,907** | **47,453,545** | **(1.065,235)** | **3,000,000** | **1,000,000** | | **77,422,784** |
| තත්කාලීන දළ පියවුම සංචිතයට මාරුකිරීම | | | | 107,559 | | | | | | **107,559** |
| ශ්‍රී. ලං. ම. බැ. නිශ්චිත සංචිතයට මාරුකිරීම | | | 206,998 | | | | | | | **206,998** |
| ලාභය පොදු සංචිතයට මාරුකිරීම | | 700,975 | | | | | | | | **700,975** |
| වෙළඳපොළ අගය කිරීමේ සංචිතයට | | (4,177,107) | | | | | | | | **(4,177,107)** |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ වාසිය මාරුකිරීම | | | | | (8,659,222) | | | | | **(8,659,222)** |
| විකිණීමට ඇති සුරකුම්පත්වල හා රන් තොගයේ ශුද්ධ සාධාරණ අගය/(පාඩුව) | | | | | | (5,889,977) | | | | **(5,889,977)** |
| පළාත් සංවර්ධන ණය ගිණුමට මාරු කිරීම | (2,900,000) | | | | | | | | 2,900,000 | |
| මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිතය ප්‍රතිපූරණය | 2,900,000 | | | | | | | | | **2,900,000** |
| පළාත් ණය ක්‍රමයට අරමුදල් මාරු කිරීම් | | | (331,653) | | | | | | | **(331,653)** |
| 2010 දෙසැම්බර් 31 දිනට | **9,425,000** | **13,092,442** | **618,337** | **405,466** | **38,794,323** | **(6,955,212)** | **3,000,000** | **1,000,000** | **2,900,000** | **62,280,356** |

## 23. ශුද්ධ ලාභ මාරු කිරීම

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 39(ඇ) වගන්තිය ප්‍රකාර, නිශ්චය කරන ලද ශුද්ධ ලාභ, මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර අවශ්‍ය පරිදි සංචිතවලට විසර්ජනය කිරීමෙන් අනතුරුව රජයට ගෙවිය යුතුය. බැංකුව විසින් මෙම කාලයතුළ 2009 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 5 ක් සහ 2010 වර්ෂයේ ලාභයෙන් රුපියල් මිලියන බිලියන 10 ක් රජයට මාරු කරන ලදී.

## 24. මූල්‍ය වත්කම්වලින් පොලී ආදායම

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| මුදල් හා මුදල් සමානයන් | **1,827,313** | 1,397,611 |
| මූල්‍ය වත්කම් | **9,001,207** | 3,181,686 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වත්කම් | **13,360** | 16,559 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොලී ආදායම** | **10,841,880** | 4,595,856 |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| ආයෝජන කළඹ - | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **5,517,540** | 27,706,386 |
| අනිකුත් ණය සහ අත්තිකාරම් | **386,897** | 404,951 |
| **දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු ශුද්ධ පොලී ආදායම** | **5,904,437** | 28,111,337 |
| **මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ සම්පූර්ණ මුළු පොලී ආදායම** | **16,746,317** | 32,707,193 |

## 25. මූල්‍ය බැරකම් මත පොලී වියදම

| | 2010 රු. '000 | 2009 රු. '000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොලී වියදම** | | |
| ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල | **49,318** | 24,560 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම් | **1,700,366** | 826,617 |
| අමෙරිකානු ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් SWAPs | **1,971,544** | 903,652 |
| වෙනත් විදේශ ගෙවිය යුතු මුදල් | **159,931** | 77,607 |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොලී වියදම** | **3,881,159** | 1,832,436 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ පොලී වියදම** | | |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අලෙවිකරණ ලද සුරැකුම්පත් | **2,069,217** | 1,053,305 |
| අලෙවිකරණ ලද බැඳුම්කර | **1,369,727** | _ |
| ණයට ගත් බැඳුම්කර වෙනුවෙන් ගෙවූ ගාස්තු | **58,735** | _ |
| ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් | **6,625,983** | 1,481,515 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොලී වියදම** | **10,123,663** | 2,534,820 |
| **මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොලී වියදම** | **14,004,822** | 4,367,256 |

SWAPs වියදම - බැංකුව වෙනත් රටක මහ බැංකුවක් සමග අමෙරිකානු ඩොලර් මිලියන 200 ක් සඳහා එළඹ ඇත. ඒ සඳහා වූ රුපියල් මිලියන 794.486 (2009 රුපියල් මිලියන 754.824) ක් SWAP පිරිවැය තුළ අන්තර්ගතව ඇත.

**26. අනිකුත් ආදායම්**

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| ලාභාංශ ආදායම - | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | – | 25,163 |
| අනිකුත් | 7,582 | 863 |
| දේපල, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලාභය | 3,402 | (741) |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණයෙන් උද්ගත වූ ලාභය | 39,304 | 103,143 |
| විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම | 462 | 72 |
| විවිධ ආදායම් | 774,931 | 415,717 |
| **සම්පූර්ණ අනිකුත් ආදායම්** | 825,681 | 544,217 |

**27. සේවක මණ්ඩල වියදම්**

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| සේවායෝජක විසින් ගෙවන ලද උපයනවිට ගෙවීම් බදු ඇතුළුව වේතන සහ වැටුප් | 1,224,931 | 2,128,264 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 305,487 | 276,101 |
| පශ්චාත් සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | (262,190) | – |
| **මුළු සේවක මණ්ඩල වියදම්** | 2,268,228 | 2,404,365 |

**28. පරිපාලන වියදම්**

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| අලුත්වැඩියා සහ නඩත්තු | 480,926 | 472,315 |
| සන්නිවේදන වියදම් | 90,284 | 61,687 |
| මෙහෙයුම් ගමන් වියදම් | 63,071 | 39,210 |
| බදුකුලී වියදම් | 919 | 717 |
| මුද්‍රණ වියදම් | 23,703 | 28,492 |
| විගණන ගාස්තු - | | |
| මෙම වර්ෂයට | 10,077 | - |
| පෙර වසරේ වෙන් කිරීම් යටතේ | 4206 | 7,700 |
| මුදල් මණ්ඩලයේ සාමාජිකයිනට පාරිශ්‍රමිකය | 501 | 509 |
| විවිධ වියදම් | 481,495 | 302,677 |
| **සම්පූර්ණ අනිකුත් මෙහෙයුම් වියදම්** | 1,155,182 | 913,307 |

**29. ආදායම් බදු**

2007 අංක 10 ආදායම් බදු (සංශෝධිත) පනතට අනුව ලාභාංශ සහ පොලී ආදායම් ගෙවීමේ හෝ බැර කිරීමේ අවස්ථාවේ දී සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත් වේ. රජයේ සුරැකුම්පත් සඳහා සාමාන්‍ය බර තබන ලද ඉපැයීම් අනුපාතය මත පොලිය සඳහා රඳවා ගැනීමේ බද්ද නියමිත කල්පිරීමේ කාල වකවානුව ඇතිව ප්‍රාථමික වෙන්දේසිය පදනම් විය.

වර්ෂය තුළ දී රුපියල් මිලියන 7,478.116 (2009 රුපියල් මිලියන 19,013.069) ක පොලී ආදායම හා ලාභාංශ ආදායම වන රුපියල් මිලියන 7.582 (රුපියල් මිලියන 26.026) ක ආදායම මත රඳවා ගැනීමේ බදු ලෙස රුපියල් මිලියන 795.779 (2009 රුපියල් මිලියන 1,516.373) ක වියදමක් දරා ඇත. ඊට අමතරව 2010 වර්ෂය තුළ රුපියල් මිලියන 95.489 (2009 දී රුපියල් මිලියන 120) ක ආර්ථික සේවා ගාස්තුවක් ගෙවා ඇත.

**30. මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම**

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්** | | |
| වාර්තා කෙරුණු ශුද්ධ ලාභය | 11,743,953 | 33,638,649 |
| **මුදල් නොවන විෂයයන්** | | |
| **එකතුකළා / (අඩුකළා)** | | |
| ක්ෂයවීම් | 278,453 | 295,759 |
| ලැබුණු පොලිය | | |
| - දේශීය මුදල් - ආයෝජන කළඹ | (5,517,540) | (27,706,386) |
| බොල් ණය ලැබීම් | (167,545) | (44,945) |
| බොල් ණය සහ වෙනත් විවිධ කපා හැරීම් | 1,108,000 | – |
| උපලබ්ධි නොවූ දළ විදේශ විනිමය (ලාභය) / පාඩුව | 6,508,504 | (8,168,560) |
| අනෙකුත් වෙන් කිරීම් | 323, 525 | 23,042,373 |
| විලම්භිත ප්‍රදාන | (462) | (72) |
| සෙමින් චලනය වන තොග සඳහා වෙන්කිරීම් නැවත ගැලපීම් | – | (30,300) |
| **එකතුකළා / (අඩුකළා) අනිකුත් කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ චලනය** | | |
| තොගවල (වැඩිවීම) / අඩුවීම | (657,585) | (165,213) |
| ලැබිය යුතු පොලිය (වැඩිවීම) / අඩුවීම | (2,394,579) | (927,698) |
| විවිධ බැරකම්වල වැඩිවීම / (අඩුවීම) | 14,120 | (686,675) |
| ගෙවිය යුතු පොලිය වැඩිවීම / (අඩුවීම) | (172,344) | 247,220 |
| අනෙකුත් ලැබීම් වැඩිවීම / (අඩුවීම) | (2,402,277) | 67,373 |
| **එකතුකළා / (අඩුකළා) ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| ආයෝජන වලින් ලද ආදායම | 11,695 | – |
| ශුද්ධ උපලබ්ධි නොවූ වෙළෙඳපොළ අගය වෙනස්වීම | 3,484,968 | 4,177,107 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | 12,160,887 | 23,738,631 |

**31. රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් නිකුතු/(ආපසු ගැනීම්)**

| | **2010** | 2009 |
|---|---|---|
| | **රු. '000** | රු. '000 |
| ආයෝජන කළඹ සඳහා ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම | **(21,279,060)** | (114,576,052) |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - ආයෝජන කළඹ | **(7,191,222)** | (29,451,452) |
| ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් වැඩිවීම / (අඩුවීම) | **3,998,323** | (2,427,200) |
| රජය සහ රජයේ ඒකක සමග ශේෂ (වැඩිවීම) / අඩුවීම | **(738,598)** | (1,102,085) |
| | **(25,210,557)** | (147,556,788) |

**32. බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්)**

| | **2010** | 2009 |
|---|---|---|
| | **රු. '000** | රු. '000 |
| බැංකු හා මූල්‍ය ආයතනයන්ගේ තැන්පතු (වැඩිවීම) / අඩුවීම | **(18,866,241)** | (4,149,819) |
| | **(18,866,241)** | (4,149,819) |

**33. පියවීම් මුදල් සහ මුදල් සමානයන්**

| | **2010** | 2009 |
|---|---|---|
| | **රු. '000** | රු. '000 |
| විදේශීය මූල්‍ය වත්කම් | | |
| අනිකුත් විදේශීය බැංකු සමග මුදල් ශේෂ | **189,664,726** | 147,871,157 |
| අවසාන මුදල් සහ මුදල් සමානයන් | **189,664,726** | 147,871,157 |

**34. අරමුදල්කරණයේ සංකේන්ද්‍රණය වීම**

වර්ෂ අවසානයට බැංකුවේ අරමුදල්කරණයේ සැලකිය යුතු සංකේන්ද්‍රණය වීම පහත සඳහන් පරිදි ය.

| | 2010 එකතුව | ශ්‍රී ලංකා රජය | ශ්‍රී ලංකා මහජනයා | ශ්‍රී ලංකා වාණිජ බැංකු | අධි ජාතික මූල්‍ය ආයතන | අනිකුත් |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු.'000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **2010 දෙසැම්බර් 31 දිනට විදේශීය මුදල් බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | 3,127,136 | – | – | – | 387,905 | 2,739,231 |
| ආසියානු නිෂ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල් | 65,044,407 | – | – | – | 65,044,407 | – |
| ජා.මූ.අ. සම්බන්ධ බැරකම් | 275,420,837 | – | – | – | 275,420,837 | – |
| අනිකුත් විදේශීය ගෙවිය යුතු මුදල් | 5,014,191 | – | – | 1,883,191 | 3,131,000 | – |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | **348,606,571** | **–** | **–** | **1,883,191** | **343,984,149** | **2,739,231** |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ තැන්පතු | 104,853,445 | – | – | 104,853,445 | – | – |
| රජය සහ රජයේ ඒකක සමග ශේෂ | 3,088,658 | 2,252,713 | 835,946 | – | – | – |
| ශ්‍රී.ල.ම.බැ. විසින් නිකුත් කරන ලද දේශීය සුරැකුම්පත් | 95,054,891 | – | – | 95,054,891 | – | – |
| සේවක අර්ථසාධක අරමුදලින් ණයට ගත් බැඳුම්කර වල නාමික අගය හා ගෙවූ කොමිස් ගාස්තු | **108,502,077** | - |
| භාණ්ඩාගාරයෙන් හා අනිකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **2,377,257** | 63,194 |

(අ) දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරන මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2010 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් 17 හා 18 හි දක්වා ඇත. ආයෝජන කළඹ මත උපයාගත් පොලිය 24 සටහනෙහි ඇක්වේ.

(ආ) මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු විධිමත් කිරීම හා සුපරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය තුළ දී රජය මඟින් අරමුදල් සැපයු හෝ රජයේ වැදගත් බලපෑමක් ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු 11 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි මූල්‍ය සමාගම්වල විධිමත්භාවය සහ සුපරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. ඒ අනුව රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුයේ සුපරීක්ෂණය යටතට පැවරේ.

(ඇ) මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා, දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

(ඈ) මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්ගලික) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

(ඉ) රට තුළට හා ඉන් පිටතට විදේශ විනිමය ලැබීම හා ගෙවීම පරිපාලනය හා විධිමත් කිරීම, විනිමය පාලන දෙපාර්තමේන්තුවේ කාර්යයි. එම කටයුතු කරගෙන යාමේ දී පැන වූ දඩ මුදල් රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා මුදල් අමාත්‍යාංශය වෙනුවෙන්, එක්රැස් කිරීම කරනු ලැබේ. 2010 වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 8.943 ක විදේශ විනිමය පාලන දඩ මුදලක් ගෙවිය යුතුව තිබූ අතර 2009 වසරේදී එම අගය රුපියල් මිලියන 17.552 කි.

(ඊ) බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ වැදගත් බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමඟ ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

(උ) බැංකුව භාරකරුවන් සහ අන් විශ්වාසතා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් 40 සටහනේ පැහැදිලි කර ඇති පරිදි රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

(ඌ) බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල ඉකුත් රාත්‍රි විවෘත විදේශ විනිමය තත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි අංශ දෙකෙහි ම නියැලෙන්නේය. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම සුපරීක්ෂණයේ ප්‍රතිඵල නියෝජනය කෙරේ.

(එ) රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුන අතර, ඒ සඳහා ගාස්තුවක් අය නොකෙරුණි.

(ඒ) සටහන් අංක 39.2 දක්වා ඇති පරිදි ණය ඇප වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අරමුදල් සැපයූ ප්‍රතිමූල්‍යකරණ ණය ප්‍රමාණය රුපියල් මිලියන 3,425.470 රුපියල් මිලියන 781.958 ක් වන අතර රජය මූල්‍යකරණය කළ ප්‍රමාණය රුපියල් මිලියන 2,751.978 (2009 - රුපියල් මිලියන 2,970.030) ක් වේ.

(ඔ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව, කෘෂිකර්මාන්තය සඳහා අවම අත්තිකාරම් සීමාව වූ 10% පවත්වාගෙන යනු නොලබන බැංකු විසින්, එම හිඟ මුදල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතුය. ඒ අනුව වර්ෂය තුළ HDFC බැංකුව විසින් රුපියල් මිලියන 389 ක මුදලක් ප්‍රේෂණය කර තිබූ අතර, එයින් රුපියල් මිලියන 72 ක මුදලක් නැවත මාරුකර යවා තිබුණි.

**38.2 බැංකුව සතු අනෙකුත් සැලකිය යුතු ආයෝජන ඇති අනෙකුත් ඒකක සමග වූ ගනුදෙනු**

සටහන් අංක 9 හි විස්තර කර ඇති පරිදි බැංකුවේ ආයෝජන ඇති ආශ්‍රිත ආයතනවලින් එකතුව රුපියල් මිලියන 6.944 ක් වූ (2009 දී රුපියල් මිලියන 25.163 කි) ලාභාංශ ආදායමක් ලැබී තිබුණි.

**38.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමග ගනුදෙනු**

අධිපති, නියෝජ්‍ය අධිපතිවරුන්, සහකාර අධිපතිවරුන් හා කළමනාකරණ විගණන අංශයේ අධ්‍යක්ෂක ඇතුළත්ව මුදල් මණ්ඩලයේ සාමාජිකවරුන් ප්‍රධාන කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් වේ (මෙම තනතුරු සඳහා අධ්‍යක්ෂ නිලධාරීන්, සේවක හෝ කිසිදු බැංකු ආයතනයක් කොටස් හිමියා ලෙස හැඳින්වීම මුදල් නීති පනතේ සීමා කර තිබේ).

**ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ගෙවීම් :**

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 73,833 | 57,641 |

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම් යටතේ මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

**38.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමග වූ වෙනත් ගනුදෙනු**

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට දුන් ණය | 27,123 | 13,536 |

ණය වර්ගය සියයට 2 සිට සියයට 19 දක්වා ණය පොලී පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

**38.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගනුදෙනු**

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | 26,949 | 20,605 |

සටහන් 36 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම්වලට විවිධ මුදල් ප්‍රමාණයන් දායක විය. මෙම 2010 වර්ෂයේ දී පොලී සහනාධාර ලෙස සේවක අර්ථසාධක අරමුදලට දායකත්වයක් නොවූ අතර අතිරික්ත ප්‍රතිලාභයක් වාර්තා කරන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් වලට බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 19 සටහනෙහි දක්වා ඇත.

**39. අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්**

**39.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්**

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2010 දෙසැම්බර් 31 දිනට පරිශේෂ එවැනි ඇප කිසිවක් නොවීය.

**39.2 ණය ඇප**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්ය වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන

මුදල් සහභාගි වන ණය දෙන ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ව්‍යවසායකයින් සඳහා ණය ඇපවීම් නිකුත්කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා ණය ඇපකරු අරමුදල් පරිපාලනය, පශ්චාත් ණය සුපරීක්ෂණය ඇතුළත් වේ. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට එරෙහිව විය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය, ණය පැහැර හැරීම මත ආවරණයන් නොවූ පාඩු සඳහා සහභාගි වන ණය දෙන ආයතනවලට ඇතිවන්නා වූ අලාභ සඳහා කරනු ලබන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

දේශීය වාණිජ බැංකු - ණය ඇප සඳහා :

| ණය ඇප | නොපියවා පැවැති ඇප ප්‍රමාණය | |
|---|---|---|
| | **2010 රු. '000** | 2009 රු. '000 |
| **සම්බන්ධිත පාර්ශ්වයන්** | | |
| ශ්‍රී.ලං.ම.බැ. යෝජනාක්‍රම | **717,273** | 213,659 |
| ශ්‍රී.ලං. රජයේ යෝජනා ක්‍රම | **1,078,177** | 934,594 |
| **අනිකුත්** | | |
| ශ්‍රී.ලං.ම.බැ. යෝජනාක්‍රම | **557,552** | 1,387,591 |
| ශ්‍රී.ලං. රජයේ යෝජනා ක්‍රම | **287,211** | 326,457 |
| **මුළු ණය ඇප ප්‍රමාණය** | **2,640,213** | 2,862,301 |

### 39.3 විශ්වස්ත ක්‍රියාකාරකම්

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා වත්කම් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

### 39.4 නෛතික හිමිකම්

අදාළ ආයතනවල අයිතීන් දරන්නන් විසින් නෛතික පොලිය ද සමග රුපියල් මිලියන 46.194 ක් සඳහා හිමිකම්පාමින් නීති කෘත්‍යයන් 7 ක් බැංකුවට එරෙහිව ගොනු කර ඇත. මෙම නීති කෘත්‍යයන්ට එරෙහිව බැංකුව අභියෝග කරන බැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත. තවද බැංකුවට එරෙහිව නීති කෘත්‍යයන් ගණනාවක් 2010 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණි. මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

### 39.5 බැඳීම්

(අ.) 2010 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 54.134 ක (2009 රුපියල් මිලියන 51.230 ක්) ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට කැපීපෙනෙන ඉදිරි හුවමාරු ගනුදෙනුවක් සිදු නොවූ අතර, 2009 වර්ෂය සඳහා ඇ.ඩො. මිලියන 245 ක් සහ ජපාන යෙන් මිලියන 0.5 ක ඉදිරි ගිවිසුම් සඳහා වූ බැඳීම් ඇතිකරගෙන තිබුණි.

### 39.6 වත්කම් ඔඩපන කිරීම

සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලිය පහසුකරලීම සඳහා ඔස්ට්‍රේලියානු ඩොලර් මිලියන 39 ක් හා එක්සත් රාජධානි පවුම් මිලියන 10 ක් (ධාරණ අගය - ඔස්ට්‍රේලියානු ඩොලර් මිලියන 21.096 හා එක්සත් රාජධානි පවුම් මිලියන 10.031) (2009 - ඔස්ට්‍රේලියානු ඩොලර් මිලියන 39 ක් හා එක්සත් රාජධානි පවුම් මිලියන 10 ක් - ධාරණ අගය මිලියන 36.953 හා මිලියන 10.223) බැංකුව විසින් යුරෝ ක්ලියර් බැංකුවේ ඔඩපන කර ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 35 (2009 ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 35) ණය පහසුකම් ලබා ගෙන ඇත. එම ඔඩපන කරන ලද සුරැකුම්පත් යුරෝ ක්ලියර්හි වෙන ම ගිණුමක රඳවා ඇත.

### 39.7 සවරින් රෙසිඩන්සි සඳහා වූ අසම්භාව්‍ය වගකීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය හා එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම විසින් සවරින් රෙසිඩන්ස් පාලනය කිරීම සඳහා වූ බදු කුලී ගිවිසුමකට එළඹ තිබුණු අතර එහි දී බදු ගැනුම්කරු විසින් කරනු ලබන ආයෝජන/වැඩිදියුණුකිරීම් දෙපාර්ශවයම විසින් සටහන් කළ යුතු බවට එකඟ වී ඇත. ඒ ගිවිසුම අනුව යම් හෙයකින් ශ්‍රී ලංකා මහබැංකුව එම බදු ගිවිසුමෙන් ඉවත් වුවහොත් එම ආයෝජනය සඳහා එම පවත්නා වර්ෂයේ එකඟ වූ අනුපාතිකයන්ට වූ ගෙවීමක් බදු ගැනුම්කරුට ගෙවිය යුතුය. ඒ අනුව 2010 වර්ෂයේ දී පළමු මෙහෙයුම් වර්ෂය සඳහා සියයට 50ක් වූ රුපියල් මිලියන 21.932 (2009 - රුපියල් මිලියන 26.319) අසම්භාව්‍ය වගකීමක් ඇස්තමේන්තු කර ඇත.

## 40. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව සාමාන්‍යයෙන් භාරකරුවන් ලෙස සහ අන් විශ්වසනීය තත්වයන්හි කටයුතු කිරීම මඟින්, රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

(අ) ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) වෙනුවෙන් විවිධ විදේශීය ණය, විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වැය පියවීම් සහ ආපසු ගෙවීම් බැංකුව විසින් කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිරූපක අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

(ආ) බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේඅඅ) භාරකාරත්වය උසුලයි. පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල්, අධිභාර, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පැවැත්වීම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍ර ලත් බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිතිවලට විවෘතව ඇති ස්වේච්ඡා තැන්පත් රක්‍ෂණය යෝජනා ක්‍රමයක් වන තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය බැංකුව විසින් පරිපාලනය කරනු ලැබේ. 2010 ඔක්තෝබර් 01 දා සිට එම අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දාතම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට පවරා ඇත.

(ඈ) ලියාපදිංචි මූල්‍ය සමාගම් විධිමත් කිරීම හා සුපරීක්ෂණ කිරීම බැංකුව විසින් කරගෙන යනු ලබයි. එහිදී මුදල් මණ්ඩලය විසින් නියෝජනය කරන ලද බලතල ප්‍රකාර, අදාල විෂය කරුණුවලට සම්බන්ධව සොයා බලනු ලැබේ. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

(ඉ) 2010 සැප්තැම්බර් 28 දාතම වූ 1673/11 අංක දරන ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නමින් පාලිත තැන්පතු රක්ෂණ ක්‍රමයක් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ගැසට් පත්‍රයේ 5.2 වගන්තිය අනුව විශේෂිත අතහැරීම් සේ රක්ෂණය කර ඇති සියලුම ණය හැර සමාප්ත ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් රක්ෂණය කෙරේ.

රුපියල් මිලියන 331.653 ක් වූ ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රුපියල් මිලියන 282.337 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල නිමවා ඇත. තැන්පතු වටිනාකම රුපියල් මිලියන 0.2 ඉක්මවුවත්, තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල රුපියල් මිලියන 0.2 හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර, පවතින අරමුදල් ප්‍රමාණයට වන්දි මුදල සීමාවේ. නැතහොත් අවසරලත් ණය ගැනීම් හා ලැබුණු දායක මුදල්වලින් තැන්පතු රක්ෂණ අරමුදල ඉහළ දැමිය හැකිය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ඒකකය මගින් සිදුකරන අතර, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් වෙන්වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

(ඊ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ලංකා බැංකුව හා මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා “විස්කම්” ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 2010 දෙසැම්බර් 31 දිනට එසේ රැස්කළ මුළු මුදල රුපියල් මිලියන 732 කි. වර්ෂය අවසන් දිනට ප්‍රා.සං.දෙ. ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ අත්තිකාරම් සපයා නොමැති අතර, රුපියල් මිලියන 780.268 ක රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. තවද රුපියල් මිලියන 48.942 ක් එම ආයෝජනවල ආදායම ලෙස උපයා ඇත.

(උ) බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් විදේශ අරමුදල් සම්පාදිත යෝජනාක්‍රම සඳහා පරම නියෝජිතයා ලෙස කටයුතු කරයි. එහිදී මුදල් මණ්ඩලය බැංකුවේ හිමිකම් හා වගකීම් පැහැදිලිව ගෙනහැර දක්වමින් රජය සමග ගිවිසුමකට එළඹේ.

## රට තුල සියලු අංශ සඳහා නිමකර අවසන් ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘතිය අවට ස්වභාවික පරිසරය සංවර්ධනය | 2550.9 | නියමිත දිනයට සහභාගිත්ව මූල්‍ය ආයතන වලින් ප්‍රතිමූල්‍ය එක් රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම. | වගකීම් හෝ සහතික වීම් නැත. | අවසාන ගිණුම් බාහිර විගණකයින් විසින් විගණනය කළ යුතුය. | අදාල සියලු පාර්ශවයන්ගේ එකඟතාව නොමැතිව ගිවිසුමේ සඳහන් අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම්, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදු කරනු නොලැබේ. |
| බහු වාර්ගික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (අදියර 2 ) | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1453.11 | | | | |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ තේ භෝග කර්මාන්තයේ තේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම. | 5200.00 | | | | |
| සුසහන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 30,000.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර නැවත ආරම්භ කිරීම. | 2750.00 | සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් අයකර ගන්නා අරමුදල් මූල්‍ය පොර්තමේන්තුවට මාරු කළ යුතුය. | | | |
| සුසහන මූල්‍ය හා කල්බදු සමාගම | රුපියල් | 352.69 | සුනාමියේ බලපෑමට ලක්වූ ව්‍යාපාර නැවත ආරම්භ කිරීම. | 351.06 | නියමිත දින සහභාගිත්ව මූල්‍ය ආයතන වලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම. | | | |
| කුඩා ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් නැවත නගා සිටුවීම | 2663.40 | | | | |
| කුඩා ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන නඟා සිටුවීමේ අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසනයන් නැවත ආරම්භ කිරීම | 122.72 | | | | |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුනාත්වයෙන් අනූන ශ්‍රම බලකායක් සහ කථන හැකියා පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම. | 94.59 | | | | |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 4.00 | හැකියා පුහුණු වැඩසටහන්වල ගුණත්වය හා අදාලත්වය වර්ධනය කිරීම හා එමඟින් ගුණත්වයෙන් අනූන කාර්ය බලකායක් ගොඩනැගීම හා කථන හැකියා වර්ධනය. | 369.15 | | | | |

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| නිවාස ණය ඇපකර අඩු ආදායම් නිවාස ආවරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට ආධාර කිරීමට නිවාස ගොඩනැගීම, අලුත්වැඩියාව සහ ඔවුන්ගේ පදිංචිය ව්‍යාප්ත කිරීම. | 1362.00 | නියමිත දිනයට සහභාගිත්ව මූල්‍ය ආයතන වලින් ප්‍රතිමූල්‍ය එක් රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම. | වගකීම් හෝ සහතික වීම් නැත. | අවසාන ගිණුම් බාහිර විගණකයින් විසින් විගණනය කල යුතුය. | අදාල සියලු පාර්ශවයන්ගේ එකඟතාව නොමැතිව ගිවිසුමේ සඳහන් අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම්, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදු කරනු නොලැබේ. |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 15.095 | අඩු ආදායම් කුටුම්භ වල නිවාස සංවර්ධනයට ආධාර කිරීමක් වශයෙන් ප්‍රාග්ධනය සපයාදීම | 1915.76 | | | | |
| උතුරු බටහිර පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 1.80 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථික, සාමාජීය හා පෝෂණ ශුභ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 | | | | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 2.00 | කුඩා පරිමාණ ව්‍යවසාකයින්ගේ ආදායම් ස්ථාවරව නගා සිටුවීම සහ ස්ථාපිත කිරීම. | 249.06 | | | | |
| රට මැද බහුවාර්ගික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදනය නගා සිටුවීම. | 642.00 | | | | |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය | වි. ගැ. හි | 17.052 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු, නැගෙනහිර පළාත් සහ මායිම් දිස්ත්‍රික්ක පහ තුල පවතින මිනිස් ජීවිත හා දේපල නැවත නගා සිටුවීම | 843.00 | | | | |
| කුඩා තේවතු හිමියන් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 12.60 | කුඩා පරිමාණ තේ අයිතිකරුවන් සවංර්ධනය සහ තේවතු පහසුකම් නගා සිටුවීම. | 645.93 | | | | |
| දිළිඳු බව පිටු දැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපයන් යෙන් | 1368.00 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායි ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම. | 1402.45 | | | | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත්, පිරිවැය ඵලදායි සහ ශක්තිමත් ක්ෂුද්‍ර ණය බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම. | 408.24 | | | | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 310.17 | අඩු ආදායම් ලාභීන්ට රැකියා ජනිත කිරීමට හා ඔවුන් අතර ඉතිරි කිරීමේ පුරුදු වැඩිදියුණු කිරීමට, පිරිවැය ඵලදායී සහ ශක්තිමත් බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම. | 408.24 | | | | |
| කෑගල්ල, සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශවල මිනිසුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම. | 148.00 | | | | |
| දකුනු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් මිනිසුන්ගේ ජීවන තත්වය උසස් කිරීම. | 564.00 | | | | |

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම මිලියන | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| "විස්කම්" ජන යෝජනා ක්‍රමය | රුපියල් | 732.00 | ආයෝජන සඳහා ණය පැවැත්ම තහවුරු කර ගැනිම. විවිධාංගිකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම. (වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් සංවර්ධනය) | -<br>- | ව්‍යාපෘතිය අවසානයේදී අධ්‍යක්ෂ / බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු විසින් දෙන ලද උපදෙස් අනුව, සහභාගිත්ව මූල්‍ය ආයතන වලට අරමුදල් මාරුකළ යුතුය. | | | |
| පසු සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සම්පත් කළමනාකරන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.02 | සුනාමියේ බලපෑමට ලක්වූ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා සෘජුව හා වක්‍රව සහාය දීම. | | නියමිත දිනට ස.මු.ආ. වලින් ප්‍රතිමූල්‍ය එකතු කිරීම සහ නියෝජ්‍ය සහ භාණ්ඩාගාර ලේකම්ට මාරු කිරීම. | | | |
| කෘෂි නවෝදය | රුපියල් | 3000.00 | කෘෂිකාර්මය පදනම් කරගත් ආදායම් උත්පාදන මාර්ග වැඩි දියුණු කිරීමට ප්‍රාග්ධනය වෙන් කිරීම. | 2334.85 | සහානාධාර ක්‍රමය (රජය මඟින් ස.මු.ආ. සඳහා ගෙවූ සහනාධාර) | වගකීම් හෝ සහතික වීම් නැත. | අවසාන ගිණුම් බාහිර විගණකයින් විසින් විගණනය කළ යුතුය. | අදාල සියලු පාර්ශවයන්ගේ එකඟතාව නොමැතිව ගිවිසුමේ සඳහන් අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම්, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදු කරනු නොලැබේ. |
| අභිවෘද්ධි ණයයෝජනා ක්‍රමය. | රුපියල් | 5000.00 | දෛනික ගොවිතැන, කිරි සැකසුම් කර්මාන්ත, කෘෂිකාර්මික භෝග සැකසුම් කර්මාන්ත, ශීත ගබඩා සහ අයිස් කුට්ටි නිෂ්පාදන පිරියත සහ කුකුල් කර්මාන්තය සංවර්ධනය කිරීම. | 1163.86 | සහානාධාර ක්‍රමය (රජය මඟින් ස.මු.ආ. සඳහා ගෙවූ සහනාධාර) | | | |
| සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය | රුපියල්. (මූලිකව මාරු කරන ලද) | 500.00 | සුනාමියෙන් හානි වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම, ව්‍යාප්ත කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම. | 463.10 | | | | |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 44.50 | රට තුල පිළිගත් වෘත්තීය පුහුණු ආයතන වලින් සමත් පුහුණු තරුණ, තරුණියන්ට ඔවුන්ගේ ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම. | 10.20 | නියමිත දිනයට ස.මු. ආ. වලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී ප්‍රා. සං. දෙපා. අදාල ගිණුම් වලට මාරු කිරීම. | | | |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය | වි. ගැ. හි. | 1.75 | නුවරඑළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල, දිස්ත්‍රික්කවල අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම. | 28.20 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර I) | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම. | 35.11 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) මාතලේ ප්‍රාදේශීය ආර්ථික අභිවෘද්ධි ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම. | 77.75 | | | | |

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ආර්ථික අභිවෘද්ධි ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය සහ ගොවි පවුල් වල ආදායම ඉහල දැමීම සහ ගොවි නොවන ව්‍යාපාර බිහිකිරීමට මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අරමුදල් සැපයීම සහ මාතලේ දිස්ත්‍රික්කයේ පවතින ව්‍යාපෘති තවදුරටත් ව්‍යාප්ත කිරීම. | 65.42 | නියමිත දිනයට ස.මු. ආයතන වලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම. | වගකීම් හෝ සහතික වීම් නැත. | අවසාන ගිණුම් බාහිර විගණකයින් විසින් විගණනය කළ යුතුය. | අදාල සියලු පාර්ශවයන්ගේ එකඟතාව නොමැතිව ගිවිසුමේ සඳහන් අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම්, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදු කරනු නොලැබේ. |
| තේ සංවර්ධන ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 1100.00 | රට තුල තේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම. | 718.95 | | | | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 1000.00 | රට තුල බහු වාර්ෂික භෝග අංශයට ණය පහසුකම් සපයා දීම. | 913.83 | | | | |
| ETB ගිවිසුම B ජන යෝජනා ක්‍රමය | යුරෝ | 10.00 | සුනාමියෙන් මඟින් ඍජු බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් නැවත නඟා සිටුවීම. | 1339.73 | | | | |
| සුසහන ජල යෝජනා ක්‍රමය (අදියර II) | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර ප්‍රතිස්ථාපනය සඳහා ණය පහසුකම් සපයා දීම. | 105.54 | අරමුදල් මූල්‍ය දෙපා. මාරු කළ යුතුය. | | | |
| පිබිදෙන උතුර විශේෂ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2000.00 | උතුරු පළාතේ පිහිටි ක්ෂුද්‍ර සහ කුඩා ව්‍යාපාර සංවර්ධනය කිරීම. | 1278.00 | නියමිත දිනයට ස.මු. ආ. වලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ ප්‍රා. සං. දෙපා. අදාල ගිණුම් වලට මාරු කිරීම. | | | |
| නැගෙනහිර පළාත් සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 1000.00 | නැගෙනහිර පළාතේ පිහිටි ක්ෂුද්‍ර සහ කුඩා ව්‍යාපාර සංවර්ධනය කිරීම. | 743.40 | | | | |
| කලාපීය සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 2900.00 | රට තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායක අංශයේ මධ්‍ය හා දිගු කාලීන ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධනය වෙන් කිරීම. | 1184.50 | අරමුදල් මූල්‍ය දෙපා. මාරු කළ යුතුය. | | | |

## 41. ශේෂ පත්‍ර දිනට පසුව එළඹෙන සිදු වීම්

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයන්හි හෙළිදරව් කිරීමට අවශ්‍ය වන ආකාරයේ ද්‍රව්‍යාත්මක සිදුවීම් කිසිවක් මූල්‍ය ප්‍රකාශයන්හි දිනට පසු උද්ගත වී නොමැත.

## 2. බැංකු අධීක්ෂණ

මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර ලබා දෙනු ලබන සියලුම බැංකු ආයතන අඛණ්ඩව අධීක්ෂණය කිරීමට සහ සම කාලයකට වරක් පරීක්ෂා කිරීම සඳහා මුදල් පනතෙහි 28(1) වගන්තිය යටතේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික ක්‍රියාකාරකම් ලෙස විචක්ෂණශීලී නියාමනයන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, බැංකුවල සැබෑ තත්ත්වයන් නිශ්චය කර ගැනීමට අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ සම කාලයකට වරක් පරීක්ෂා කිරීම, ව්‍යවස්ථාපිත අනුමැතියන් සඳහා කරනු ලබන ඉල්ලීම් පිළියෙල කිරීම සහ අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමය පරිපාලනය කිරීම හැඳින්විය හැක. බැංකු පද්ධතියේ සුරක්ෂිතභාවය හා ප්‍රශස්ථභාවය තහවුරු කිරීම සහ බැංකුවල තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ඉහත කී අධීක්ෂණ හා නියාමන කාර්යයන් මූලික වශයෙන් යොමු වී ඇත. 2010 වසර අවසාන වන විට, බලපත්‍රලාභී වාණිජ බැංකු 22 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 9 කින් සමන්විතව බලපත්‍රලාභී බැංකු 31 ක් ක්‍රියාකාරීව පැවතුණි. මෙම බැංකුවල නම් ලැයිස්තුව ඇමුණුම් II-1 හි සඳහන් කර ඇත. 2010 වසර තුළදී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත සාරාංශ කොට ඇත.

### 2.1 අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා වූ විචක්ෂණ විධිවිධානයන්

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා නව විචක්ෂණ විධිවිධාන සහ පැවති විධිවිධාන කිහිපයක් සඳහා සංශෝධන 2010 වසර තුළදී හඳුන්වා දෙන ලදී. මෙම විචක්ෂණ විධිවිධාන විස්තරාත්මකව මෙම වාර්තාවේ 111 වන කොටසෙහි අන්තර්ගත වන අතර, ප්‍රධාන සංශෝධනවල සාරාංශයක් පහත දැක්වේ.

**(අ) අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ දැමීම:**

අභ්‍යන්තර හා බාහිර කම්පනයන්ට ප්‍රත්‍යස්ථිකව මුහුණ දිය හැකි, ශක්තිමත් බැංකු පද්ධතියක ප්‍රවර්ධනය උදෙසා, 2014 වසර අවසන් වන විට නව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ නව බලපත්‍රලාභී විශේෂිත බැංකුවල පැවතිය යුතු අවම ප්‍රාග්ධන මට්ටම පිළිවෙලින් රුපියල් බිලියන 5 සහ රුපියල් බිලියන 3 දක්වා ඉහළ දමන ලදී.

**(ආ) බැංකු ආයතන කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීම:**

බැංකුවලට වඩා විනිවිද භාවයෙන් යුක්තව ප්‍රාග්ධනය රැස් කිරීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීමට සහ වෙළෙඳපොළ විනය තුළින් බැංකුවල යහපාලනය සංවර්ධනය කිරීම සඳහා මෙතෙක් ලැයිස්තුගත නොවූ සියලුම දේශීය පෞද්ගලික බැංකු 2011 දෙසැම්බර් 31 වන විට කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත වීම අවශ්‍ය වේ.

**(ඇ) ණය පොලී අනුපාතික අඩු කිරීම:**

2010 ඔක්තෝබර් 31 වන විට නිවාස ණය සඳහා සියයට 14 දක්වාත්, ණය පත් අත්තිකාරම් සඳහා සියයට 24 දක්වාත්, අනෙකුත් ණය සහ අත්තිකාරම් සඳහා සියයට 1-2 කින් වාර්ෂික ණය පොලී අනුපාතයන් අඩු කිරීමට පියවර ගන්නා ලෙසට සියලුම බැංකුවලින් ඉල්ලා සිටින ලදී.

**(ඈ) පොදු වෙන් කිරීම් අවශ්‍යතාවය අවම කිරීම:**

බැංකු අංශයෙහි වර්ධනය සැළකිල්ලට ගෙන, බැංකුවල පොදු වෙන් කිරීම් අවශ්‍යතාවය සියයට 1 සිට සියයට 0.5 දක්වා අඩු කරන ලදී. මෙම අවශ්‍යතාවය, 2011 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ වන ලෙස, 2010 දෙසැම්බර් 31 දින සිට සෑම කාර්තුවකදීම සියයට 0.1 කින් පියවරෙන් පියවර අඩු කෙරේ.

**(ඉ) ණය වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම හා වෙන්කිරීම් අවශ්‍යතාවය ලිහිල් කිරීම:**

ව්‍යාපාරයන්හි හා නව ශක්‍යතාවයකින් යුත් ව්‍යාපෘතීන්හි උන්නතිය සඳහා මෙම විධානය තාවකාලික ලෙස 2011 ජුනි මස දක්වා ලිහිල් කරන ලදී. මෙමගින් ණයගැතියනට තම අක්‍රීය ණය ගෙවීම සඳහා හා ව්‍යාපාර අරමුණු සඳහා නව ණය පහසුකම් සැපයීමට බැංකු වෙත අවසර ලැබෙන අතර, මෙම නව ණය පහසුකම් ඇතැම් කොන්දේසීන්ට යටත්ව අක්‍රීය ණය ලෙස වර්ග නොකිරීමට ද බැංකු වෙත අවසර දෙන ලදී.

**(ඊ) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය හඳුන්වා දීම:**

මූල්‍ය ආරක්ෂක ජාලයෙහි යහපත පිණිස "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය" නමින් අනිවාර්යය තැන්පතු රක්ෂණ ක්‍රමයක්, මුදල් නීති පනත යටතේ 2010 ඔක්තෝබර් මස පළමු දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙම තැන්පතු රක්ෂණ ක්‍රමය, පළමුව තිබූ ස්වේච්ඡා තැන්පතු රක්ෂණ ක්‍රමය ප්‍රතිස්ථාපනය කොට පිහිටුවන ලදී. මෙම රක්ෂණ ක්‍රමයෙහි මූලික ලක්ෂණ පහත පරිදි වේ.

- රක්ෂණ ක්‍රමයෙහි සාමාජිකයන් - සියලුම බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම්.
- යෝග්‍ය තැන්පතු - මෙයට සාමාජික ආයතනයන්හි ඉල්ලුම්, කාලීන සහ ඉතුරුම් තැන්පතු වගකීම් අයත් වන අතර, ණය ලබා ගැනීමේ උපකරණ අයත් නොවේ. සාමාජික බැංකුවල, මූල්‍ය සමාගම්හි, ශ්‍රී ලංකා රජයෙහි, කොටස්කරුවන්ගේ, අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන කළමනාකරණ ක්‍රියාවලියන්හි යෙදෙන නිලධාරීන්ගේ සහ බැංකුව සමග ඍජු සම්බන්ධතා ඇති අනෙකුත් පාර්ශවයන්ගේ තැන්පතු මෙම තැන්පතු රක්ෂණ ක්‍රමයට අයත් නොවේ. ඊට අමතරව, බැංකුව විසින් දී ඇති ණය පහසුකම් සඳහා වූ ඇප සුරැකුම් තැන්පතු, බැංකු පනතේ අත් හරින ලද දේපළ ගණයට අයත් වන තැන්පතු සහ මූල්‍ය සමාගම් පනතට අනුව අක්‍රීය ගිණුම් ද මෙම තැන්පතු රක්ෂණ ක්‍රමයට අයත් නොවේ.

- යෝග්‍ය තැන්පතු සඳහා වූ රක්ෂණ වාරිකය - මෙය වාර්ෂිකව 0.10% සහ 0.15% පරාසයක වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු රක්ෂණ අරමුදල වෙත සියලුම සාමාජික ආයතන මෙම වාරිකය මාසිකව හෝ කාර්තුමය වශයෙන් ගෙවිය යුතු වේ. 2010 දෙසැම්බර් 31 වන විට, සාමාජික ආයතනයන්ගෙන් ලද වාරික මුදල වූ රු. මිලියන 32.3 ක්, බලපත්‍රලාභී වානිජ බැංකු වල අත්හරින ලද දේපලවලින් පවරාගත් රු. බිලියන 1.1 ක් සහ ස්වේච්ඡා තැන්පතු රක්ෂණ ක්‍රමයෙන් මාරු කළ රු. මිලියන 350.2 කින් සමන්විතව තැන්පතු රක්ෂණ අරමුදලෙහි ශේෂය රු. බිලියන 1.48 ක් විය.
- ආයෝජන - තැන්පතු රක්ෂණ අරමුදලෙහි මුදල් රාජ්‍ය සුරැකුම්පත් හා මුදල් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි සාමාජික ආයතනයන් වෙත ණය මුදල් ලෙස ආයෝජනය කළ හැක. 2010 දෙසැම්බර් 31 වන විට රු. බිලියන 1.39 ක් එවැනි රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය කර තිබිණි.
- වන්දි ගෙවීම - මුදල් මණ්ඩලය විසින් සාමාජික ආයතනයක බලපත්‍රය හෝ ලියාපදිංචිය අත්හිටුවීමකදී හෝ අවලංගු කිරීමකදී, එක් තැන්පත්කරුවෙකුට උපරිමය වූ රු.200,000 යටත්ව වන්දි ගෙවීම 2012 ජනවාරි 01 දින සිට ඇරඹීමට නියමිතය.

**(උ) ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සේවා බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගැනීම:**

බැංකු වල මෙහෙයුම් කටයුතු සේවා බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා ගැනීම විධිමත් කිරීම සඳහා විධි විධානයන් නිකුත් කරන ලදී. තැන්පතු භාර ගැනීම, වත්කම් හා වගකීම් කළමණාකරණය, විධිවිධානයන් සමග අනුකූල වීම, ගනුදෙනුකරුවන් පිළිබඳ සොයා බැලීම සහ හඳුනා ගැනීම, භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු අවදානම් කළමණාකරණය සහ පෙර අනුමත කර ගත් (අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත) නිර්මාණයකයන් මත වූ ණය පහසුකම් හැර අනෙකුත් ණය ලබා දීම් ආදී මෙහෙයුම් කටයුතු බාහිර පාර්ශ්ව සේවා මගින් ලබා ගැනීමට අවසර නොදෙන ලදී.

**(ඌ) නිලධාරින්ගේ යෝග්‍යතා ඇගයුම හඳුන්වා දීම:**

බැංකු පනතෙහි අංක 44 A දරන වගන්තිය අනුව බලපත්‍රලාභී බැංකු වල විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගේ යෝග්‍යතාව ඇගයීම සම්බන්ධයෙන් විධි විධානයන් නිකුත් කරන ලදී.

**(එ) වාර්ෂික බලපත්‍ර ගාස්තුව ඉහළ දැමීම:**

විදේශ විනිමය හා අක්වෙරළ යන බැංකු ව්‍යාපාර ද ඇතුළත්ව දේශීය බැංකු ව්‍යාපාරවල නිරත වන බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා රුපියල් මිලියන 1 ක් ලෙසත්, අක්වෙරළ බැංකු ව්‍යාපාරවල පමණක් නිරත බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා රුපියල් 600,000 ක් ලෙසත් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා රුපියල් 300,000 ක් ලෙසත්, පැවති වාර්ෂික බලපත්‍ර ගාස්තුව පහත වගුවෙහි දැක්වෙන පරිදි, බැංකුවෙහි පසුගිය වසර අවසානයේ පැවති මුළු වත්කම් පදනම මත ගෙවීම සඳහා කටයුතු සලස්වන ලදී. ඒ අනුව, 2011 වසර තුළදී ආසන්න වශයෙන් රුපියල් මිලියන 168 ක් වාර්ෂික බලපත්‍ර ගාස්තු ලෙස ලැබීමට අපේක්ෂා කෙරේ.

| පසුගිය වසර අවසන් වන විට පැවති මුළු වත්කම් | බලපත්‍ර ගාස්තුව (රුපියල් මිලියන) |
|---|---|
| රුපියල් බිලියන 75 ට වැඩි | 10 |
| රුපියල් බිලියන 25 ත් 75 ත් අතර | 05 |
| රුපියල් බිලියන 25 ට අඩු | 02 |

## 2.2 බැංකු, බැංකු ශාඛා සහ වෙනත් බැංකු සේවා ස්ථාන සඳහා අවසරදීම

(අ) මේ වසර තුළදී, නව ශාඛා 61 ක් සඳහා ද ව්‍යාප්ති කාර්යාල, ශිෂ්‍ය ඉතිරි කිරීමේ ඒකක වැනි බැංකු සේවා ස්ථාන 95 ක් පිහිටුවීම සඳහා ද, ව්‍යාප්ති කාර්යාල 10 ක් ප්‍රතිස්ථානගත කිරීම සඳහා ද ව්‍යාප්ති කාර්යාල 7 ක් බැංකු ශාඛා බවට උසස් කිරීම සඳහා ද, ශාඛාවලින් පරිබාහිරව පිහිටුවන්නා වූ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 5 ක් සඳහා ද අවසර දෙන ලදී. උතුරු හා නැගෙනහිර පළාත්වල ශාඛා 61 ක් විවෘත කිරීම සඳහා දෙන ලද අවසරයන් ද මෙහි ඇතුළත් වේ. ඒ අනුව, 2010 වසර අවසාන වන විට බැංකු ශාඛා 1,930 ක්ද, වෙනත් බැංකු සේවා ස්ථාන 3,941 ක් ද, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,006 ක් ද ක්‍රියාත්මක වෙමින් පැවතින.

(ආ) පෙර පැවති ප්‍රාදේශීය සංවර්ධන බැංකු හයෙහි ව්‍යාපාර කටයුතු පවරා දීමෙන් රාජ්‍ය අංශයට අයත් "ප්‍රාදේශීය සංවර්ධන බැංකුව" පිහිටුවීම සඳහා 2010 වසරේ ජූලි මස, විශේෂිත බැංකු බලපත්‍රයක් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකාවෙහි බැංකු ශාඛාවක් පිහිටුවීම සඳහා ඉන්දියාවේ මුම්බායි හි පිහිටි "සීමාසහිත ඇක්සිස් බැංකුව" හට නිකුත් කරන ලද තාවකාලික අනුමැතියෙහි වලංගු කාලය 2011 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

## 2.3 බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම

තවදුරටත් විමර්ශනය කිරීමට, පරීක්ෂණය කිරීමට හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය බැංකුවල අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා වන අඛණ්ඩ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියක් ලෙස බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රමවේදය භාවිතා කරනු ලබයි. කුඩා බැංකුවල විශාලතම ආයතනික ගනුදෙනුකරුවන් 20 දෙනා පිළිබඳ තොරතුරු, පරිපාලිත, අනුබද්ධිත සහ ආයෝජිත ආයතන සහ විශාලතම කණ්ඩායම්/ගනුදෙනුකරුවන් 20 දෙනා සඳහා බැංකු කොතරම් අනාවරණය වී ඇත්ද යන්න පිළිබඳ තොරතුරු වැනි විශේෂිත කරුණු සම්බන්ධව වාර්තා පිළියෙල කරනු ලබන අතර, පරීක්ෂණ වලදී හෙළිදරව් වූ ප්‍රධාන අධීක්ෂණ කරුණු සහ ඒ මත බැංකු විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳව සුපරීක්ෂාකාරී විය. තවද, බැංකුවල සිදුවන ප්‍රධාන වෙනස්කම් සහ ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු අවස්ථා දෛනිකව හඳුනා ගැනීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියක් ද මෙම දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලදී. මෙම කටයුතු සඳහා පහසුකම් සැපයීමේ අදිටනින් යුතුව 2010 වසර තුළදී බැංකුවල අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හා බාහිර විගණකවරුන් සමග රැස්වීම් ගණනාවක් පවත්වන ලදී.

## 2.4 බැංකු පරීක්ෂණ සිදුකිරීම

බැංකුවල අවදානම් කවරේදැයි හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය සහ අවදානම් පහත හෙළීම සඳහා පවතින සම්පත් තක්සේරු කිරීම යන කාරණා ඉලක්ක කොට ගත් අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් තුළින් බැංකු සඳහා සම කාලයකට වරක් පරීක්ෂණ පැවැත්වීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කටයුතු කරන ලදී. 2009 වසරේ දී ආරම්භ කෙරුණු බැංකු 18 ක පරීක්ෂණ පවත්වා ගෙන ගිය අතර, 2010 වසරේදී තවත් බැංකු පරීක්ෂණ 16 ක් ආරම්භ කරන ලදී. ඒ අනුව, 2010 වසරේදී ඒ ඒ බැංකුවල කළමනාකාරීත්වය සමග විධිමත් සාකච්ඡා පවත්වමින් හා අදාළ වාර්තා මුදල් මණ්ඩලයට යොමු කිරීම මගින් බැංකු 16 ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ අවසන් කරන ලද අතර, තවත් බැංකු 18 ක පරීක්ෂණ අවසන් වෙමින් පවතී. ඊට අමතරව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් බැංකු විසින් විචක්ෂණශීලී නියාමන සමග අවනත නොවීම වැනි කාලානුරූපීව පැන නැගෙන යම් යම් කාරණා සම්බන්ධයෙන් සීමිත විෂය පථයකින් යුත් පරීක්ෂණ ද පවත්වන ලදී.

## 2.5 බැංකු ප්‍රධාන විධායක නිලධාරින්ගේ රැස්වීම්

මහ බැංකු අධිපතිතුමා සහ බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් අතර පැවැත්වෙන මාසික රැස්වීම් සඳහා ලේකම් කාර්යාලය ලෙස බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරයි. බැංකු ව්‍යාපාරය වෙත බලපාන විචක්ෂණ නියාමනයන්, ප්‍රතිපත්ති, වත්මන් තත්ත්වයන් සහ වෙනත් ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා උපයෝජනය කර ගන්නා සාකච්ඡා වටයක් ලෙස මෙය හැඳින්විය හැක. තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා බැංකු පද්ධතියේ කාර්ය සාධනය හා ආර්ථික සහ මූල්‍ය අංශවල සංවර්ධනයන් පිළිබඳව, මෙම රැස්වීම් වලදී ප්‍රධාන විධායක නිලධාරීවරුන් දැනුවත් කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 44 ට හා 45 ට අනුගත වීම, අභ්‍යන්තර පාලනයන් පිළිබඳ හෙළිදරව් කිරීම, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට ණය සැපයීම ඉහළ දැමීම, විධායක කාර්යයන් හි නියැලෙන නිලධාරීන් සඳහා යථා යෝග්‍ය පරීක්ෂණ ක්‍රියාත්මක කිරීම, අනිවාර්යය තැන්පතු රක්ෂණ ක්‍රමය ක්‍රියාවට නැංවීම, බැංකු ආචාර ධර්ම වැඩි දියුණු කිරීම සහ පෞද්ගලික අංශයට ණය සැපයීම ඉහළ දැමීම හා ණය අනුපාතික පහත හෙළීම යනාදිය ඉහත රැස්වීම් වලදී සාකච්ඡාවලට බඳුන් වූ කාරණා කිහිපයකි.

## 2.6 අනෙකුත් ක්‍රියාකාරකම්

### (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 44 සහ 45 සමග අනුකූල වීම

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති 32 හා 39 ට අනුරූපී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 44 හා 45 සමග අනුකූල වීම සඳහා 2010 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව පහසුකම් සළසන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ නියෝජිතයන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය සහ බැංකු විගණකයින්ගෙන් සමන්විත වූ කමිටුව නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට සංක්‍රමණය වීම හා සම්බන්ධ කරුණු තවදුරටත් සාකච්ඡා කරන ලදී. මහ බැංකුවෙහි ඉල්ලීම මත, ලෝක බැංකුව විසින් අනෙකුත් රටවල් මුහුණ පෑ ප්‍රායෝගික ගැටළු සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 44 හා 45 හා අනුකූල වීමේදී ඇති විය හැකි බඳු සංකූලතා පිළිබඳව තාක්ෂණික දැනුම සපයා දෙන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 44 හා 45 සමග අනුකූල වීමට පහසුකම් සපයන්නා ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ ඓතිහාසික පිරිවැය මත පදනම් වූ මූල්‍යයන් පරිවර්තනය කිරීමේ ඇති අඩුපාඩු පිළිබඳව වැඩමුළුවක් පවත්වන ලදී. තවද, බැංකු නව ගිණුම්කරණ ප්‍රතිපත්ති සමග අනුකූලවීම පහසු කිරීම සඳහා විගණකයින් මඩුල්ලක් පත් කරන ලදී.

### (ආ) කෘෂිකාර්මික අංශයට අනිවාර්යයෙන් දිය යුතු ණය නිරීක්ෂණය කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වසරේ සෑම කාර්තුවකදීම කෘෂිකාර්මික අංශයට අනිවාර්යය අවම 10% ක ණය දීමේ අවශ්‍යතාව පිළිබඳ බලපත්‍රලාභී බැංකුවල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී. 2009 අවසානයේ සිට මෙම ණය ඉලක්කය මුදුන් පමුණුවා ගෙන නොතිබූ බැංකු සඳහා එම හිඟ මුදල, වෙනත් බැංකු හරහා කෘෂිකාර්මික අංශයට ණය ලබා දීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන “කෘෂිකාර්මික අංශයේ අභිවෘද්ධිය සඳහා වූ විශේෂිත ගිණුමට” බැර කරන ලෙස දැනුම් දෙන ලදී. තවද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බැංකුවලට කෘෂිකාර්මික අංශයට ණය ලබා දීම් සෑම කාර්තුවකදීම තක්සේරු කර හිඟ මුදල්, කාර්තුව අවසන් වී දින 15 ක් ඇතුළත විශේෂිත ගිණුමට බැර කරන ලෙසද දැනුම් දෙන ලදී.

### (ඇ) බැංකු පනත සඳහා යෝජිත සංශෝධනයන්

අන්තර්ජාතිකව පිළිගත් පරිචයන් හා ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි, අධීක්ෂණ හා නියාමන රාමුව ශක්තිමත් කිරීමේ අදහසින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකු පනත සංශෝධනය කිරීම ආරම්භ කර ඇත. යෝජිත සංශෝධනයන් මගින් බැංකු පනතෙහි නියෝගයන් 2007 අංක 07 දරන සමාගම් පනතෙහි නියෝගයන් සමග සමගාමී කිරීම මෙන්ම ඒකාබද්ධ වීම් සම්බන්ධ බැංකු අංශයෙහි වත්මන් විකාශයන් පහසු කිරීම, අවදානමට ලක් වූ බැංකුවල කටයුතු නිරාකරණය කිරීමේ රාමුව ශක්තිමත් කිරීම සහ බැංකු විසින් පාලනය වනු ලබන මූල්‍ය සමාගම් සමූහයන් ඒකාබද්ධ අධීක්ෂණ කිරීමට මහ බැංකුවට ඇති හැකියාව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ සලසනු ලැබේ. යෝජිත සංශෝධන බැංකු අංශයත් සමග සාකච්ඡා කර ඇති අතර, මේ පිළිබඳ අවසන් තීරණ ගනිමින් පවතී.

### (ඈ) අන්තර් නියාමන ආයතනික සභාව

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය අන්තර් නියාමන ආයතනික සභාවේ සාමාජිකයෙකු වශයෙන් තවදුරටත් කටයුතු කරන අතර, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂවරයා එහි ලේකම් ලෙස 2010 වර්ෂයේදී පත් කරන ලදී. මූල්‍ය අංශයෙහි ක්‍රමවත් සංවර්ධනයක් ඇති කිරීමට යෝග්‍ය වන්නා වූ ප්‍රතිපත්තිමය නියෝගයන් දියුණු කිරීම තහවුරු කිරීමත්,

පුළුල් මට්ටමේ මූල්‍ය පද්ධති ස්ථායිතාවත් සඳහා සියලුම නියාමන ආයතන අතර සහයෝගීතාව හා තොරතුරු හුවමාරු කර ගැනීම වර්ධනය කිරීමත් මෙම අන්තර් නියාමන ආයතනික සභාවේ වගකීම් වේ. මූල්‍ය අංශ නියාමකයන් අතර තොරතුරු හුවමාරුව සඳහා නව නීති හඳුන්වා දීම, බැංකු පනතේ 12(1සී) වගන්තිය සංශෝධනය කිරීම, ප්‍රාග්ධන වෙළෙඳපොළ දියුණුව හා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගින් හඳුන්වා දුන් නව නියාමන මාර්ග මෙහිදී සාකච්ඡාවට බඳුන් වූ මූලික කරුණු වේ.

### (ඉ) තහනම් යෝජනා ක්‍රම පිළිබඳව ගත් ක්‍රියාමාර්ග හා නඩු කටයුතු

බැංකු පනතේ 83 ඇ වගන්තියට අනුව තහනම් යෝජනා ක්‍රම පිළිබඳ පරීක්ෂා කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කර ගෙන යන ලදී. තහනම් යෝජනා ක්‍රම හඳුනා ගැනීමට, තීරණය හා දඬුවම් දීම පිළිබඳ සුචියක් අතිගරු ඇටර්නි ජෙනරාල්වරයාගේ සහභාගීත්වයෙන් අනුගත කරන ලදී. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මෙවැනි සැක සහිත ආයතන 3 පිළිබඳ එම සුචියට අනුකූලව හා බැංකු පනතේ ප්‍රතිපත්ති අනුව පරීක්ෂණ ආරම්භ කරන ලදී. එසේ හඳුනාගත් සමාගමක් වනුයේ ටියැන්ස් ලංකා හෙල්ත් කෙයාර් පෞද්ගලික ආයතනයයි. මේ පිළිබඳව අනුරාධපුරය, බලපිටිය, මහව, කුරුණෑගල, පන්විල, අත්තනගල්ල හා මිනුවන්ගොඩ යන අධිකරණයන්හි ගොනු කළ නඩු 9 ක් සඳහා නෛතික බල අධිකාරීන් වෙත පහසුකම් සැපයීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, අධිකරණමය කටයුතු සඳහා සහභාගි විය. දිස්ත්‍රික් අධිකරණය, මහාධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය හා කම්කරු විනිශ්චය සභාව යන ආයතනයන්හි ගොනු කරන ලද නඩු කටයුතු 27 ක් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හසුරුවන ලදී. මෙම වර්ෂය තුළ නඩු 04 ක් නිෂ්ප්‍රභා වූ අතර, නඩු 03 ක් පෙත්සම්කරුවන් විසින් ඉල්ලා අස්කර ගනු ලැබීය. 2010 වසර අවසන් වන විට තීන්දු ලැබී නැති නඩු 20 ක් විය.

### (ඊ) දැනුම්වත් කිරීමේ වැඩසටහන්

ස්වකීය වගකීම පිළිබඳ හා නව ප්‍රවණතා සහ අවස්ථාවන් පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන්ගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ අරමුණින් "ඉහළ දියුණු මාර්ගයකට බැංකු අංශය ප්‍රතිස්ථානගත කිරීම" මැයෙන් බැංකු අධ්‍යක්ෂවරුන්ගේ තෙවන සම්මන්ත්‍රණය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. මූල්‍ය ආයතන සමග ගනුදෙනු කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා තොරතුරු ව්‍යාප්ත කිරීම 2010 වසර තුළදී ද නොකඩවා කර ගෙන යන ලදී. ඒ අනුව, මහජනතාවගෙන් තැන්පතු ලබා ගැනීමට බලය ලත් බැංකු ලැයිස්තු හා තහනම් කළ පිරමිඩාකාර යෝජනා ක්‍රමවල වංචාකාරී ක්‍රමවේද පිළිබඳ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ප්‍රවෘත්ති දැන්වීම් රුපියල් මිලියන 21.5 ක වියදමකින් පළ කරන ලදී.

**ඇමුණුම II-1**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්
2. ඉන්දියන් ඕවර්සීස් බැංකුව
3. ඉන්දියන් බැංකුව
4. එම්සීබී බැන්ක් ලිමිටඩ්
5. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී.
6. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් ලිමිටඩ්
7. ඩොයිෂ් බැංකුව ඒජී
8. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
9. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
10. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
11. පබ්ලික් බැන්ක් බර්හාඩ්
12. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
13. මහජන බැංකුව
14. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්
15. ලංකා බැංකුව
16. සම්පත් බැන්ක් පීඑල්සී
17. ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව
18. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
19. සිටිබැන්ක් එන් ඒ
20. සෙලාන් බැන්ක් පීඑල්සී
21. හබීබ් බැන්ක් ලිමිටඩ්
22. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. එම්බීඑස්එල් සේවින්ස් බැන්ක් ලිමිටඩ්
2. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
3. ඩීඑෆ්සීසී බැංකුව
4. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
5. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
6. සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
7. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
8. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
9. ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්

## 3. බැංකු විදු පියෙස (බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය)

2010 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු විදු පියෙස සිය අරමුණ වන දකුණු ආසියානු කලාපයේ දැනුම බෙදා හැරීමේ ප්‍රමුඛ මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපනය වීමේ ගමන් මගෙහි අඛණ්ඩ ගමනක යෙදිණ. දේශීය හා විදේශීය වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු හා වෙනත් දැනුම බෙදා හැරීමේ වැඩසටහන් මෙම වර්ෂය තුළ බැංකු විදු පියෙස විසින් ඉදිරිපත් කරන ලදී. මෙම වැඩසටහන්වල සාර්ථකත්වය සඳහා මූල්‍ය අංශයේ සහ රාජ්‍ය අංශයේ ආයතනවලින් සහභාගි වූ නිලධාරීන්ගේත්, තෘතීය අධ්‍යාපනය හා සම්බන්ධ වූවන් මෙන්ම සාමාන්‍ය මහජනතාවගේත් අනුග්‍රහය ඔවුන්ගේ උද්‍යෝගිමත් සහභාගිත්වය තුළින් නොමඳව ලැබිණ.

දේශීය හා විදේශීය නිලධාරීන් 2962 කගේ සහභාගිත්වයෙන් සාර්ථකව පැවැත්වුණු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 103 ක් වූ අතර, එහි සංයුතිය පුහුණු පාඨමාලා 61 ක්, අනෙකුත් ආයතනවල ඉල්ලීම මත පවත්වන ලද විශේෂිත පුහුණු වැඩසටහන් 34 ක් සහ ජාත්‍යන්තර පාඨමාලා 8 කින් යුක්ත විය. 2010 වර්ෂයෙහි සැලකිය යුතු කරුණක් වන්නේ මූල්‍ය ක්ෂේත්‍රයේ කඩඉම්වලින් ඔබ්බට පැතිරී යන ලෙස සැලසුම් කළ නව වැඩසටහන්වල තිබූ අද්විතීය සාර්ථක භාවයයි. පසුගිය කාලවකවානුව තුළ මූල්‍ය අංශයට පමණක් සීමා වී තිබූ බැංකු විදු පියසෙහි දොරටු බොහෝ පුහුණු වැඩසටහන් සඳහා විවිධ ආයතනගත වෘත්තිකයන් වෙනුවෙන් විවෘත වී තිබේ.

සමාජයීය වගකීම් ඉටු කිරීමේ අරමුණින් යුතුව බැංකු විදු පියෙස 2010 වර්ෂය තුළ දී මහජන දේශන මාලාවක් පවත්වන ලදී. මෙම දේශන මාලාවට මහජන දේශන 11 ක් සහ සැඳෑ දේශන 6 ක් අන්තර්ගත වූ අතර ඒවා බැංකු විදු පියසෙහි ඇරයුමෙන් දේශීය මෙන්ම විදේශීය කීර්තිමත් දේශකයන්ගේ දායකත්වය තුළින් පැවැත්විණි. මීට අමතරව විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හා සිසුන් සහ පාසැල් ගුරුවරුන් හා සිසුන් සඳහා විශේෂ අධ්‍යාපනික වැඩසටහන් 25 ක් දියත් කරන ලදී. මෙම වැඩසටහන්හි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි කාර්යභාරයත්, ආර්ථික හා මූල්‍ය පද්ධති කළමනාකරණය සම්බන්ධවත් සියළුම පාර්ශ්වකරුවන්ගේ දැනුම වර්ධනය කිරීමයි.

2010 වර්ෂය තුළ බැංකු විදු පියසෙහි තවත් ප්‍රධාන සන්ධිස්ථානයක් වන්නේ "The CBS Journal of Multidisciplinary Studies" නමින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිය ප්‍රථම පර්යේෂණ සඟරාව නිකුත් කිරීමයි. 2010 වර්ෂයේ අග භාගයේ දී ප්‍රසිද්ධ කරන ලද මෙම පර්යේෂණ සඟරාවෙහි විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විද්වතුන් විසින් කරන ලද පර්යේෂණ පත්‍රිකාවන් කිහිපයක් අන්තර්ගතය. දැනුම උත්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ අතිවිශිෂ්ඨ මධ්‍යස්ථානයක් ලෙස කලාපය තුළ ස්ථානගත වීමට බැංකු විදු පියෙස යන ගමන් මගෙහි සිය කැපවීම හුවා දැක්වීම සඳහා මෙම පර්යේෂණ සඟරාව වාර්ෂිකව එළි දක්වනු ලැබේ.

වර්ෂය තුළ පවත්වන ලද වැඩසටහන්වල ගුණාත්මකභාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීමද, පසුගිය වසරෙහි පරිශ්‍රය තුළ කරන ලද යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමද, බැංකු විදු පියෙස තුළ මනා ඉගෙනුම් පරිසරයක් ස්ථාපනය කිරීම සඳහා මහත් සේ දායක විය. මූල්‍ය ක්ෂේත්‍රයෙහි මානව ප්‍රාග්ධනය දියුණු කිරීමට බැංකු විදු පියෙස ගත් නායකත්වය පසුගිය වසර තුළ දී එහි පාර්ශ්වකරුවන්ගේ ඇගයීමට ලක් විය. සිංගප්පූරුවෙහි CMO ආසියානු කවුන්සිලය විසින් සංවිධානය කරන ලද ආසියාවේ විශිෂ්ඨ ව්‍යාපාර අධ්‍යයන ආයතන ඇගයීම් සම්මාන උළෙලේ දී (Asia's Best Business School Awards) බැංකු විදු පියෙස පසුගිය වසර තුළ දැනුම් ක්ෂේත්‍රය ඉහළ නැංවීමට කරන ලද දායකත්වය අගය කිරීමක් වශයෙන්, බැංකු හා මූල්‍ය පුහුණු ආයතන කාණ්ඩය යටතේ පිරිනැමෙන ආසියාවේ විශිෂ්ඨතම ව්‍යාපාර අධ්‍යයන ආයතන නායකත්ව සම්මානය (Best Business School Leadership Award) පසුගිය වසරේ දී බැංකු විදු පියෙස වෙත පිරිනමන ලදී.

## 4. සන්නිවේදන

### සන්නිවේදන කාර්යභාරය

**2010 වසර සන්නිවේදන දෙපාර්තමේන්තුවට සුවිශේෂී එකක්** විය. බැංකුවේ 60 වන සංවත්සර සැමරුම් උත්සව සංවිධානය කිරීමෙහිලා එය ප්‍රධාන භූමිකාවක් නිරූපණය කළේය. පාර්ශ්වකරුවන් අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිරූපය නැංවීම සඳහා දෙපාර්තමේන්තුව විසින් මෙම අවස්ථාව උපයෝගී කර ගන්නා ලදී. සැමරුම් වසරේ න්‍යාය පත්‍රයට අයත් අංගවලින් අතිශයින්ම සංවාදයට පාත්‍ර වූ අංගය වූයේ *ශ්‍රී ලංකා මහ බැංකුව 1950 - 2010 ප්‍රත්‍යවලෝකනය* නම් විඩා නිවුම් පුස්තකය ප්‍රකාශයට පත් කිරීම ය. රටෙහි සමාජ ආර්ථික පසුතලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ විකාශය චිත්‍රණය කෙරෙන ආකාරයෙන් 1950 සිට පළ වූ පුවත්පත්වලින් උපුටාගත් ලිපි එකතුවක් ඡායාරූප සමඟින් මෙම පුස්තකයෙහි අඩංගු වෙයි. සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලැබූ සෙසු ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වූයේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමග එක්ව නිෂ්පාදන කළ (Econ-Icon) අන්තර් පාසල් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනයි. ආර්ථික විද්‍යාව සහ මහ බැංකු කටයුතු පිළිබඳව සිසු සිසුවියන්ට ඇති සාමාන්‍ය දැනුම ගෙනහැර දැක්වීමට මෙම ආකර්ශණීය රූපවාහිනී වැඩසටහන ඉවහල් විය. සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් නිෂ්පාදනය කරනු ලැබූ මෙම වැඩසටහනෙහි රූපවාහිනී වට සඳහා තරග වදින පාසල් තෝරා ගනු ලැබුයේ දිවයින පුරා පවත්වනු ලැබූ ලිඛිත පරික්ෂණවලිනි. බැංකුවේ අනෙකුත් සියළුම දෙපාර්තමේන්තු විසින් දක්වන ද සාමූහික සහයෝගය හේතුවෙන් මෙම බරපතල කාර්යයන් දෙකම සාර්ථකව ඉටු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

### බාහිර සන්නිවේදනය

පෙර වසරවල දී මෙන්ම, ස්ථායී මූල්‍ය පද්ධතියක්, මිල ස්ථායිතාවය සහ ඉහළ ආර්ථික වර්ධනයක් මුදුන් පමුණුවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ගනු ලැබූ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග පිළිබඳ තොරතුරු එහි සියළුම පාර්ශ්වකරුවන්ට සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් තත්කාලීනව සපයන ලදී.

සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පවත්වාගෙන යනු ලබන ත්‍රෛභාෂික වෙබ් අඩවිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බාහිර සන්නිවේදනය සඳහා පුළුල් ව යොදා ගත්තේය. තථ්‍ය සරල සම්මේල පහසුකම (RSS) සහ කෙටි වීඩියෝ දර්ශන එක් කිරීමෙන් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය නව මුහුණුවරක් ඇති එකක් බවට වැඩි දියුණු කරන ලදී.

**2009 වසරේ දී මිලියන 53.7 ක් වූ ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවයේ පරිශීලකයන් ගණන 2010 වසරේ දී මිලියන 58.1 ක් දක්වා සියයට 8 කින් ඉහළ ගියේය.** අනවරතව කරනු ලැබූ තොරතුරු සැපයීමට අමතරව, මෙම වෙබ් අඩවිය ඔස්සේ සමරු කාසි සහ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන මංගත ලෙසින් අලෙවි කිරීම ද වසර පුරා ම නොකඩවා සිදු කෙරිණි.

පෙරදී මෙන්ම දෛනික විනිමය අනුපාත, සතිපතා සහ මාසික ආර්ථික දර්ශක, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික, ඉන්ධන මිල ගණන්, පාරිභෝගික මිල දර්ශක හා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වැනි රජයේ සුරැකුම්පත් වෙන්දේසි කිරීම් පිළිබඳ තොරතුරු නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් ක්‍රියා කළේය. පුවත්පත් නිවේදන 1,722 ක් නිකුත් කිරීමට ද, පුවත්පත් දැන්වීම් 490 ක් සහ ගැසට් නිවේදන 15 ක් පළ කිරීමට ද ගත වූ වසර තුළ දී සන්නිවේදන දෙපාර්තමේන්තුව ක්‍රියා කළේය. මෙයට අමතරව, මාධ්‍ය සාකච්ඡා 62 ක් සහ විවිධ වූ ආර්ථික සහ මූල්‍ය ගැටලු පිළිබඳව මහජනයාගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සම්මුඛව පවත්වනු ලැබූ මාධ්‍ය සාකච්ඡා ගණනාවක් ද සන්නිවේදන දෙපාර්තමේන්තුව සංවිධානය කළේය. අධිපතිගේ සියළුම නිල චාරිකා ද සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ඒකකය විසින් ආවරණය කරන ලදී.

## අභ්‍යන්තර සන්නිවේදනය

දේශීය සහ විදේශීය පුවත්, බැංකු සහ මූල්‍ය කටයුතු පිළිබඳ පුවත්, වැදගත් ආර්ථික දර්ශක, දේශන සටහන්, නිවේදන සහ දැන්වීම් ඇතුළත් නවතම තොරතුරු සපයන CBSLdaily වෙබ් බිහිදොර බැංකු කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර සන්නිවේදන අවශ්‍යතා සැපිරීමේ පරමාර්ථය ඇතිව දෙපාර්තමේන්තුව අඛණ්ඩවම යාවත්කාලීන කළේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින් හ බැංකුවේ ක්‍රියාත්මක සංගම් සඳහා විවිධ වූ මාතෘකා යටතේ ඔවුන්ගේ අදහස් සහ උදහස් ප්‍රකාශ කිරීමට අවශ්‍ය අවකාශය "කවුළුව" අභ්‍යන්තර සඟරාවට එක් කරන ලදී.

ආර්ථිකය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් ජාතික පුවත්පත්වල පළ වූ ප්‍රවෘත්ති, ලිපි සහ මහජන අදහස් ඇතුළත් උද්ධෘත එකතුවක් දිනපතාම ඉහළ කළමනාකාරීත්වය වෙත සපයන ලදී. විවිධ වූ ආර්ථික, මූල්‍ය සහ සමාජයීය කාරණා පිළිබඳව පළ වූ ප්‍රවෘත්ති අයිතම 1,714 ක් ද කළමනාකාරිත්වය වෙත සපයන ලදී.

## මහජනයා දැනුම්වත් කිරීම

බැංකු නොවන මූල්‍ය අංශය පිළිබඳව මහජනයාගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම පිණිස ස්ථාපනය කරනු ලැබූ විමසුම් කවුළුවේ සේවා ගත වූ වසර තුළ දී නොකඩවාම පවත්වාගනු ලැබීය. මෙයට අමතරව, දේශීය සහ ජාත්‍යන්තර මූලාශ්‍ර වෙතින් ලැබුණු විද්‍යුත් ලිපි 516 කට සහ දුරකථන ඇමතුම් 6,500 කට වඩා වැඩි ප්‍රමාණයකට විමසුම් කවුළුව ප්‍රතිචාර දැක් වූයේය.

ව්‍යාජ මුදල් නෝට්ටු, වංචාකාරී සහ නීත්‍යානුකූල නොවන ගනුදෙනු සම්බන්ධව මහජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ අදහසින් ව්‍යාජ මුදල් හඳුනා ගැනීම පිළිබඳ වාර්තාමය වීඩියෝ චිත්‍රපටයක් සහ පිරමිඩාකාර ක්‍රම පිළිබඳ වෙළෙඳ වැඩසටහන් දෙකක් ද නිෂ්පාදනය කරනු ලැබීය. පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වූ දැනුම්වත් කිරීමේ වැඩ සටහන් සඳහා කුඩා පුස්තක සහ පත්‍රිකා ද නිකුත් කරන ලදී.

මහ බැංකුව සම්බන්ධ කරුණු පිළිබඳව මහජනයාට කරුණු කියාදීමේ අරමුණින් ආර්ථික විද්‍යාව, බැංකු සහ මූල්‍ය කටයතු පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පාසල් සම්මන්ත්‍රණ 38 ක් ගත වූ වසර තුළ දී පවත්වන ලදී. විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල පාසල් දරු දැරියන්ට සහ ගුරුවරුන්හට, එමෙන්ම, හමුදා සේවාවල පුහුණුවන්නන්ට හා ව්‍යාපාරික ප්‍රජාවට ශ්‍රී ලංකා මහ බැංකුවට පැමිණ දැනුම්වත්වීම සඳහා අවස්ථා කිහිපයක් සන්නිවේදන දෙපාර්තමේන්තුව සංවිධානය කළේය.

ආර්ථික සහ මූල්‍ය පිළිබඳව හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ වගකීම් පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශන සහ අනෙකුත් මහජන උත්සව ගණනාවකට සන්නිවේදන දෙපාර්තමේන්තුව සහභාගි විය. කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ සහ දැයට කිරුළ ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රදර්ශන කුටි විශාල මහජන ආකර්ශනයක් වාර්තා කිරීමට සමත් විය. ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ කාරණා සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමටත් බැංකුවේ ප්‍රකාශන විශාල ප්‍රමාණයක් අලෙවි කිරීමටත් අවකාශයක් මෙම ප්‍රදර්ශනවලට සහභාගි වීම මගින් සැළසිණි. පෙර වසරට වඩා සියයට 20 ඉක්ම වූ ප්‍රතිශතයකින් මහ බැංකු ප්‍රකාශන අලෙවිය සහ බෙදා හැමේ කටයුතු ඉහළ ගියේය. එම කාල පරිච්ඡේදය තුළදීම ප්‍රකාශන අලෙවියෙන් ලැබූ ආදායම රුපියල් මිලියන 6 දක්වා සියයට 36 කින් වර්ධනය විය. මහජන අවධානය ඉහළ නැංවීමේ අදහසින් රාජ්‍ය ආයතන, ජාතික පුස්තකාල, විදේශීය දූත කණ්ඩායම්, පාසල් සහ වෙනත් අධ්‍යාපනික ආයතන අතර මහ බැංකු ප්‍රකාශන කිසිදු ගාස්තුවකින් තොරව බෙදා හරින ලදී. ප්‍රධාන වශයෙන්ම, උතුරු සහ නැගෙනහිර පළාත්වලින් ඇති වූ නව ඉල්ලීම් නිසා පෙර වර්ෂය හා සසඳන කල නොමිලේ බෙදා හැරීම් කටයුතු සියයට 10 කින් ඉහළ ගියේය.

## පරිවර්තන සේවා

දෙමළ පරිවර්තන කාර්යයන් 284 ක් සිදු කරමින් වසර තුළ දී මහ බැංකුවේ පරිවර්තන අවශ්‍යතා සපුරාලීමට දෙමළ පරිවර්තන ඒකකය අඛණ්ඩව ක්‍රියා කළේය. මෙයට අමතරව, මහ බැංකු වෙබ් අඩවියේ දෙමළ සංස්කරණය ද පවත්වා ගෙන ගියේය. සිංහල සහ ඉංග්‍රීසි සංස්කරණවලට අමතරව, වාර්ෂික වාර්තාව, පුවත්පත් නිවේදන, පාර්ලිමේන්තුවට සපයනු ලබන

පිළිතුරු, පනත් සංශෝධන, චක්‍රලේඛ, ගැසට් නිවේදන, විගණකාධිපතිගේ වාර්තා, මූල්‍ය ප්‍රකාශන, වෙබ් පිටු වැනි මහ බැංකු ප්‍රකාශන විශාල ප්‍රමාණයක් දෙමළ සංස්කරනයේ දී සපයන ලදී.

### මුද්‍රණාලය

ශ්‍රී ලංකා මහ බැංකුවේ සියළුම ප්‍රකාශන සඳහා අවශ්‍ය සැලසුම් නිර්මාණය කිරීම, අකුරු ඇමිණීම සහ මුද්‍රණය කිරීම යන සේවා දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. මේ අයුරින් විවිධ දෙපාර්තමේන්තුවලින් පැවරුණු කළු සහ සුදු මුද්‍රණ කටයුතුවල සිට පංචවර්ණ මුද්‍රණ කටයුතු දක්වා වන පරාසයක මුද්‍රණ කාර්යයන් 252 ක් මහ බැංකු මුද්‍රණාලය සම්පූර්ණ කළේය. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වා ගෙනයාම සඳහා මාර්ගෝපදේශ, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාතීන්, නිව්ස් සර්වේ, සටහන, කවුළුව, මාණ්ඩලික පත්‍රිකා, මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම, ප්‍රතිපත්ති ඉදිරි දැක්ම, උපාය මාර්ගික සැලැස්ම, රාජ්‍ය ණය විවරණිකාව සහ පර්යේෂණ ප්‍රකාශන මහ බැංකු මුද්‍රණාලය විසින් මුද්‍රණය කරන ලද ප්‍රධාන ප්‍රකාශනයන්ගෙන් කිහිපයක් වේ. නම්පත්, සුභපැතුම් පත්, සටහන් පොත්, ලිපි ගොනු කවර, මහ බැංකු දිනපොත, පෝස්ටර, කුඩා පුස්තක, පත්‍රිකා, විවරණිකා, කුඩා පත්‍රිකා සහ බැංකු නිලධාරින්ගේ කර්තෘත්වයෙන් පල කළ ප්‍රකාශන ද මුද්‍රණාලය විසින් සම්පූර්ණ කරන ලද අනෙකුත් මුද්‍රණ කටයුතු අතර වේ.

### බැංකුවේ විශේෂ අවස්ථා ආවරණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරනු ලැබූ සියළුම ප්‍රධාන වැඩසටහන් ආවරණය කිරීම සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ඡායාරූප ඒකකය මගින් සිදු කළේය. ඒ අනුව, උතුරු සහ නැගෙනහිර පළාත්වල සංවර්ධන ක්‍රියාකාරකම් ද ඇතුළත්ව එවැනි අවස්ථා 278 ක් සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් ආවරණය කරන ලදී.

### පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය

බැංකු කාර්ය මණ්ඩලයට සහ අනෙකුත් පරිශීලකයින්ට පුස්තකාල සේවා සැපයීම පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය නොකඩවා සිදු කළේය. පොත් සංඛ්‍යාව 23,476 සිට 24,313 දක්වාත් වාර්තා සංඛ්‍යාව 15,229 සිට 17,243 දක්වාත් සංයුක්ත තැටි සංඛ්‍යාව 1,430 සිට 1,603 දක්වාත් ඉහළ නංවා ගැනීමට එය ක්‍රියා කළේය. වසර තුළ දී, බඳින ලද වෙළුම 300 ක් පොත් එකතුවට එක් කෙරිණි. ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් බැංකු අධ්‍යයන කේන්ද්‍රය තුළ පිහිටුවා ඇති පුස්තකාලයේ ද පොත් සංඛ්‍යාව 5,683 සිට 5,777 දක්වා ඉහළ නැංවිණි.

විමසුමට ලක් වූ වසර තුළ ආර්ථික විද්‍යාව, ආර්ථික මිතිය සහ මූල්‍ය කටයුතු විෂයයන් හා සම්බන්ධ සඟරා 100 කට වඩා වැඩි ප්‍රමාණයකට මංගතව ප්‍රවේශවීමේ හැකියාව ලබාදෙන Science Direct දත්ත එකතුව භාවිතා කිරීම ඉහළ ගියේය. විදේශීය සඟරා 118 ක සහ දේශීය සඟරා 51ක දායකත්වය පුස්තකාලය සහ තොරතුරු මධ්‍යසථානය ලබා ගත්තේය. එය Recent Additions (නවතම පොත්) Current Contents News Alerts වැනි විද්‍යුත් ප්‍රකාශන සම්පාදනය කිරීම සහ අන්තර්ජාලය හරහා ඒවා බෙදා හැරීම අඛණ්ඩව සිදු කරන ලදී. තෝරාගත් තොරතුරු බෙදා හැරීමේ සේවය (SDI-Selective Dissemination of Information) ද වසර තුළ නොකඩවා පවත්වාගෙන ගියේය.

මංගත පුස්තකාල පහසුකම් භාවිතා කිරීම සඳහා බැංකු කාර්යය මණ්ඩලය පෙළඹවීමේ අදහසින්, දෙපාර්තමේන්තු 7 ක් ආවරණය වන පරිදි පරිශීලක අධ්‍යාපන වැඩසටහන් 7 ක් මෙහෙයවන ලදී. කාර්යය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා විවිධ වූ වැදගත් මාතෘකා සහ විෂයයන් යටතේ නිෂ්පාදනය කළ වාර්තාමය චිත්‍රපට දෙකක් පුස්තකාල ආලින්දයෙහි දිවා විවේක කාලයේ දී ප්‍රදර්ශනය කරන ලදී. ශ්‍රී ලංකා මූල්‍ය සහ බැංකු පුස්තකාල ජාලය (EbanklibnetSL) පවත්වාගෙන යන ලද අතර විද්‍යුත් තැපැල ඔස්සේ තොරතුරු බෙදා හැරීම මගින් එහි සාමාජික පුස්තකාල 23 විශාල වශයෙන් ප්‍රතිලාභ ලැබීය. රටට සහ විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවට සම්බන්ධ ප්‍රධාන ඓතිහාසික සිද්ධීන්ට අදාළ තොරතුරු පුවත්පත්වලින් එක්රැස් කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ 60 වන සැමරුම් ප්‍රකාශනය වන ශ්‍රී ලංකා මහ බැංකුව - 1950 - 2010 ප්‍රත්‍යාවලෝකනය සම්පාදනය කිරීම සඳහා පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය දායක විය. විද්‍යුත් තැපැල හරහා සිදු කරන ලද ග්‍රන්ථ විචාර තරඟයත් පැන විසඳුම් වැඩසටහනත් ඔක්තෝබර් මාසයට යෙදී තිබුණු ජාතික කියවීමේ මාසය සනිටුහන් කිරීම සඳහා සංවිධානය කරනු ලැබූ ප්‍රචලිත අංග විය.

පුස්තකාලය සහ තොරතුරු මධස්ථානයේ විමර්ශණ අංශයෙහි පවත්වාගෙන යන ස්වයං අධ්‍යයන භාෂා පර්යේෂණාගාරය මහ බැංකු කාර්යය මණ්ඩලය සඳහා විවෘතව පැවතුණි. 2008 වසරේ දී පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානයට පිරිනමන ලද ISO 9001:2000 තත්ත්ව සහතිකයට අනුකූලව පුස්තකාල සේවා පවත්වාගෙන යන ලදී.

# 5. ව්‍යවහාර මුදල්

## 5.1 ව්‍යවහාර මුදල් නිකුතුව සහ කළමනාකරණය

**ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළදී ද, ව්‍යවහාර මුදල් නිකුතුව හා කළමනාකරණය පිළිබඳ සිය ප්‍රධාන වගකීම හා සම්බන්ධ කාර්යයන් වන මූල්‍ය පද්ධතිය සඳහා ප්‍රමාණවත් ව්‍යවහාර මුදල් සැපයුමක් සහතික කරනු වස් මුදල් නෝට්ටු හා කාසි සංසරණය සඳහා නිකුත් කිරීම නොකඩවා සිදු කරනු ලැබීය.** 2010 වසර අවසානයේ සංසරණයේ පැවති මුළු මුදල් ප්‍රමාණයේ වටිනාකම රුපියල් බිලියන 255 ක් වූ අතර, එය 2009 වසරට සාපේක්ෂව සියයට 17.5 ක වැඩිවීමකි. 2010 වසර තුළ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු සඳහා නිකුත් කරනු ලැබූ නව මුදල් නෝට්ටු හා සේවා නිසි මුදල් නෝට්ටුවල වටිනාකම් පිළිවෙලින් රුපියල් බිලියන 88 ක් සහ රුපියල් බිලියන 171 ක් විය. මෙම වසර තුළදී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කළ මුළු මුදල් නෝට්ටුවල වටිනාකම රුපියල් බිලියන 222 කි. ඒ අනුව 2010 වසර තුළ සංසරණය සඳහා නිකුත් කරනු ලැබූ මුදල් නෝට්ටු හා කාසිවල ශුද්ධ

වටිනාකම පිළිවෙලින් රුපියල් බිලියන 37 ක් හා රුපියල් මිලියන 416 ක් විය.

සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් නෝට්ටුවල නියමිත ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සේවා අනිසි මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීම සිදු කරන ලදී. පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සේවා අනිසි නෝට්ටු ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කරන ලෙස වාණිජ බැංකු දිරිමත් කරන ලදී. 2010 වසර තුළදී ආසන්න වශයෙන් සේවා අනිසි මුදල් නෝට්ටු මිටි (මිටියක නෝට්ටු 1000 බැගින්) 128,000 ක් පමණ සංසරණයෙන් ඉවත් කරන ලදී. වාණිජ බැංකු විසින් තැන්පත් කරනු ලබන සේවා නිසි මුදල් නෝට්ටු තෝරා සකස් කිරීම සඳහා සේවා ගාස්තු ලෙස 2010 වසර තුළදී රුපියල් මිලියන 28 ක මුදලක් අයකර ගැණින.

## 5.2. ව්‍යවහාර මුදල් පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම

මුදල් පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම සහ ව්‍යාජ මුදල් නිකුත් කිරීම් අවස්ථා අවම කිරීම යන අරමුණු ඇතිව, ශ්‍රී ලංකා මහ බැංකුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් කාර්යාංශය සමග සමීපව කටයුතු කළ අතර, 2010 වසර තුළ ව්‍යාජ මුදල් නෝට්ටු පිළිබඳ නඩු විභාග 27 කට සහභාගි වී අවශ්‍ය තොරතුරු ලබාදෙන ලදී. 2010 වසර තුළදී හඳුනාගත් හා තහවුරු කිරීම සඳහා බැංකුව වෙත යොමු වූ ව්‍යාජ නෝට්ටු සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් සංසරණයේ පවතින අව්‍යාජ නෝට්ටු මිලියනයකට ව්‍යාජ නෝට්ටු 5 ක් පමණ වූ අතර, එය වෙනත් රටවල්වල ව්‍යාජ මුදල් සම්බන්ධ සිද්ධීන් හා සැසඳීමේදී අඩු මට්ටමකි. මුදල් නෝට්ටුවල අඩංගු ආරක්ෂණ සලකුණු පිළිබඳව නීති ක්‍රියාත්මක කරන නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, මුදල් අයකැමිවරුන් ඇතුළු සාමාන්‍ය මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් දියත් කළ අතර, එම වැඩසටහන් මුදල් නෝට්ටු පිළිබඳව ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට ඉවහල් විය. තවද, ව්‍යාජ මුදල් නිකුත් කිරීම වැළැක්වීමේ අරමුණින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නව මුදල් නෝට්ටු කාණ්ඩය සඳහා වැඩි දියුණු කළ ආරක්ෂණ සළකුණු අන්තර්ගත කිරීමද සිදුකරන ලදී.

## 5.3. පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ප්‍රචලිත කිරීම

මුදල් නෝට්ටුවල ආයු කාලය දීර්ඝ කිරීමටත් එමගින් නව මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා වන පිරිවැය අඩු කිරීමටත් මුදල් නිසි ලෙස පරිහරණය කිරීමේ හොඳ පුරුදු උපකාරී වේ. තවද, මුදල් නෝට්ටු පිරිසිදුව පවතින විට එමගින් ව්‍යාජ සහ අව්‍යාජ මුදල් නෝට්ටු වෙන්කර හඳුනාගැනීම පහසු වන අතර, එය ශ්‍රී ලාංකික ජාතියේ ප්‍රතිරූපය ඔප්නැංවීමට ද උපකාරී වේ. පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ප්‍රචලිත කිරීමේ එක් අංගයක් ලෙස මහ බැංකුව විසින් නව මුදල් නෝට්ටු සංසරණයට එකතු කිරීම සහ ඊට සමගාමීව සේවා අනිසි මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීම නොකඩවා සිදුකරන ලදී. මුදල් නෝට්ටු තේරීම සහ සකස් කිරීම පිළිබඳව මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත සපයා ඇති උපදෙස් නිසි ලෙස ක්‍රියාත්මක කරලීම සහතික කිරීම සඳහා වාණිජ බැංකු විසින් තැන්පත් කරන ලද මුදල් නෝට්ටු මිටි අතරින් තෝරාගත් නියැදි නිතිපතා පරීක්ෂාවට ලක් කිරීමද නොකඩවා සිදු කරන ලදී. මීට අමතරව, මුදල් නෝට්ටු සිතාමතා විකෘති කිරීම වැළැක්වීමට මෙන්ම සාමාන්‍ය මහජනතාව අතර, පිරිසිදු නෝට්ටු භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරණයන් දියත් කරන ලදී.

## 5.4. නව ව්‍යාපෘති

2010 වසර තුළදී සංවර්ධනය, සෞභාග්‍යය හා ශ්‍රී ලංකාවේ නැටුම් ශිල්පීන් යන තේමාව යටතේ නිර්මාණය කළ නව ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩයේ (11 වන කාණ්ඩය) මුද්‍රණ කටයුතු නිම කරනු ලැබිය. 2011.02.04 වන දින මහ බැංකු අධිපතිතුමා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත නිල වශයෙන් නව නෝට්ටු කාණ්ඩයේ නෝට්ටු කට්ටලයක් පිරිනැමීමත් සමග මෙම 11 වන මුදල් නෝට්ටු කාණ්ඩය උත්සවශ්‍රීයෙන් එළි දැක්වීම සඳහා කටයුතු සූදානම් කරන ලදී. විස්තර පත්‍රිකා හා අත්පත්‍රිකා ද ඇතුළුව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා සාමාන්‍ය ජනතාව පුළුල් ලෙස දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද ඊට සමගාමීව දියත් කරන ලදී. බැංකුවල මුදල් අයකැමිවරුන් හා නීති ක්‍රියාත්මක කරන නිළධාරීන් දැනුම්වත් කිරීම සඳහා විශේෂ තොරතුරු ප්‍රකාශනයක්ද පිළියෙල කෙරිණ. මීට අමතරව, නානක විද්‍යාව හදාරන්නන් හා මුදල් පිළිබඳ උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශවයන් සඳහා විශේෂ එකතු කිරීමේ භාණ්ඩ ලෙස ඇසුරුම්වල බහාලූ මුදල් නෝට්ටු හා නෝට්ටු වශයෙන් වෙන් නොකළ මුදල් නෝට්ටු පත්‍රිකා ආදිය සකස් කිරීමට ද කටයුතු සූදානම් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ තෙවන මුදල් කෞතුකාගාරය 2010.05.06 දින මාතර, දකුණු පළාත් කාර්යාලයේ විවෘත කෙරිණ. මෙහි අරමුණ වූයේ පාසල් සිසුන් ඇතුළු සාමාන්‍ය මහජනතාව තුළ මුදල් පිළිබඳ උනන්දුවක් ඇති කිරීම සහ ඊට අදාළ තොරතුරු රැස් කිරීමට පහසුකම් සැපයීමයි.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ පර්යේෂණ කටයුතුවල අවධානය යොමු වූයේ විවිධ වටිනාකමින් යුත් මුදල් නෝට්ටුවල ආයු කාලය ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමත්, මුදල් සඳහා ඇති ඉල්ලුම ඇස්තමේන්තු කිරීමත් පිළිබඳවය. මෙම පර්යේෂණයන්ගේ ප්‍රතිඵල ව්‍යවහාර මුදල් කළමනාකරණය වැඩි දියුණු කිරීමට ඉවහල් විය.

## 5.5. මුදල් පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීම

දේශණ, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීම, පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය සහ කාර්යක්ෂමව කාසි භාවිතය පිළිබඳව බැංකු කාර්ය මණ්ඩල, පොලිස් නිළධාරීන් පාසැල් සිසුන්, රාජ්‍ය නිළධාරීන් ඇතුළු සාමාන්‍ය ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 40 ක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

එසේම, ශ්‍රී ලංකාවේ කාසි හා නෝට්ටු පිළිබඳවත්, එහි ඓතිහාසික විකාශය පිළිබඳවත් මහජන අවබෝධය වැඩිදියුණු කිරීම පිණිස පහත සඳහන් ප්‍රදර්ශන 7 සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සිය දායකත්වය සපයනු ලැබීය.

1) නුවර පල්ලෙකැලේ, "දැයට කිරුළ" ජාතික සංවර්ධන ප්‍රදර්ශනය 2010 -2010 පෙබරවාරි 04 සිට 10 දක්වා.

2) බෙලිහුල්ඔය, සබරගමුව විශ්ව විද්‍යාලය, "පිරිහිඹිනි දියවර" ප්‍රදර්ශනය - 2010 මාර්තු 16 සිට 19 දක්වා.

3) කිරිබත්ගොඩ, විහාරමහාදේවී බාලිකා විද්‍යාලය, "සිසු නිපුණතා" - 2010 ජූනි 21 සිට 24 දක්වා.

4) හොරණ, තක්ෂිලා විද්‍යාලය - 2010 සැප්තැම්බර් 27 සිට ඔක්තෝබර් 03 දක්වා.

5) මාතර, "සවිමත් රටක් - ඉසුරුබර හෙටක්" ප්‍රදර්ශනය - 2010 නොවැම්බර් 19 සිට 22 දක්වා.

6) කෑගල්ල, සාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය - 2010 නොවැම්බර් 26 සිට 29 දක්වා.

7) මොරටුව, වේල්ස් කුමාර විද්‍යාලය "මොරටු උදානය" ප්‍රදර්ශනය - 2010 දෙසැම්බර් 23 සිට 27 දක්වා.

### 5.6. සමරු කාසි හා නෝට්ටු

සමරු කාසි හා නෝට්ටු නිකුත් කිරීම සම්බන්ධව ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපත්තියක් සකස් කළ අතර, එය ක්‍රියාවට නැංවීම සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, සමරු කාසි මුද්‍රණය සඳහා ලැබුණු ඉල්ලීම් නියමිත දිනයට නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිණ. ශ්‍රී ලංකා මහ බැංකුවට 60 වසරක් පිරීම නිමිත්තෙන් රු. 5,000 ක වටිනාකමින් යුතු රිදී (හිමාකාරයෙන් ටංකිත) සමරු කාසියක් නිකුත් කරන ලදී. එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ප්‍රථම බහු-වර්ණ සමරු කාසිය වේ. මහජනතාවට සහ කාසි හා නෝට්ටු එකතු කරන්නන් හට සමරු කාසි, කාසි ඇසුරුම් සහ සමරු නෝට්ටු අලෙවි කිරීම ප්‍රධාන කාර්යාලයේ අලෙවි කවුලුව, කෞතුකාගාර සහ ඉහත සඳහන් කරන ලද ප්‍රදර්ශන කුටි මාර්ගයෙන් ද සිදු කරන ලදී.

## 6. දේශීය කටයුතු

**දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් විවෘත වෙළෙඳ කටයුතු පවත්වාගෙන යාම තුළින් බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත්, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය බලාත්මක කිරීමත්, වාණිජ බැංකුවල හා රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීමත් යන ප්‍රධාන කාර්යයන්හි අඛණ්ඩව නිරත විය.**

ඉහත කාර්යයන්ට අමතරව, රටෙහි විද්‍යුත් ගෙවීම් හා පියවීම් පද්ධතියෙහි මනා ක්‍රියාකාරිත්වය සුරක්ෂිත කිරීම සඳහා උපකාරක සේවාවක් වශයෙන් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම ද දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

### 6.1 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

2010 වසර තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑමට සිදු වූ ප්‍රධාන අභියෝගය වූයේ මූල්‍ය වෙළෙඳපොළ තුළ අඛණ්ඩව පැවති සාපේක්ෂව ඉහළ මට්ටමේ වූ රුපියල් ද්‍රවශීලතාවයයි. ලෝකව්‍යාප්ත මූල්‍ය අර්බුදයේ බලපෑම ලත් රටවල් මන්දගාමී ප්‍රතිසාධන ලක්ෂණ පෙන්නුම් කිරීමත්, වසර 30 ක අභ්‍යන්තර යුද්ධය නිමාවීමෙන් පසු රට තුළ ඇතිවෙමින් පැවැති සීඝ්‍ර සංවර්ධනයත් නිසා වසරේ මුල් කාර්තුව තුළදී රට තුළට ගලා ආ ප්‍රාග්ධන ප්‍රවාහයන්ගේ වර්ධනය නොකඩවාම සිදු විය. ශ්‍රී ලංකා රුපියලෙහි දකින්නට ලැබුණු ස්ථායී විනිමය අනුපාතය සහ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගතකිරීම් හි වර්ධනය ශ්‍රී ලංකාව ආයෝජනයන් සඳහා සුදුසු ස්ථානයක් බවට ආයෝජක විශ්වාසය ගොඩනැංවීමෙහිලා ඉවහල් විය. වර්ධනය වූ අපනයන ආදායම්, පෞද්ගලික ප්‍රේෂණ හා ඉහළ ඵලදාවක් සහිත රාජ්‍ය බැඳුම්කරවල විදේශ ආයෝජනයන්, සහ වර්ධනය වූ කොටස් වෙළෙඳපොළ තවදුරටත් විදේශ ආයෝජන රට තුළට ගලා ඒමට පහසුකම් සලසන ලදී. මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළට සිදුකළ මැදිහත්වීම් තුළින් තියුණු ලෙස රුපියලෙහි අගය වැඩිවීම් (අධිප්‍රමාණයන්) වළක්වා ගත හැකි විය. කෙසේ වෙතත් රට තුළට ගලා ආ ශුද්ධ විදේශ විනිමය ප්‍රවාහයන් දේශීය වෙළෙඳපොළ තුළ රුපියල් ද්‍රවශීලතාවය වර්ධනය කිරීමට පුළුල් ලෙස දායක විය.

දේශීය ආර්ථිකයෙහි පවත්නා යහපත් උද්ධමන තත්ත්වය සහ අපේක්ෂිත උද්ධමන තත්ත්වය මත දේශීය ආර්ථික ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමේ අදහසින් මහ බැංකුව විසින් වර්ෂය තුළදී එහි මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කරමින් ප්‍රතිපත්තිමය පොලී අනුපාතිකයන් දෙවරක්ම පහත හෙලන ලදී. 2010 ජූලි මාසයේදී ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකයත්, ප්‍රතිවිකුණුම් අනුපාතිකයත් පිළිවෙලින් සියයට 7.25 සහ 9.50 දක්වා පාදක අංක 25 කින් පහත හෙලන ලදී. 2010 අගෝස්තු මාසයේදී තවදුරටත් පොලී අනුපාතික කොරිඩෝව පාදක අංක 225 සිට 175 දක්වා පටු කරමින් ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 9.00 දක්වා පාදක අංක 50 කින් අඩු කරන ලදී. වර්ෂය තුළදී මුදල් සැපයුම් ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා පහසුකම් සැලසීමටත්, අන්තර් බැංකු එක් දින වෙළෙඳපොළ අනුපාතිකය පොලී අනුපාතික කොරිඩෝව තුළ පවත්වා ගැනීම සඳහාත් මහ බැංකුව ඇඩි ලෙස විවෘත වෙළෙඳ කටයුතු සඳහා මැදිහත් විය (රූප සටහන II-1). වර්ෂය තුළදී වාණිජ බැංකු සඳහා වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 7.00 ක මට්ටමේ නොවෙනස්ව පැවැතිණි.

**රූප සටහන II-1**
**බරතබන ලද සාමාන්‍ය ඒක්ෂණ වෙළෙඳපොළ අනුපාතිකයේ හැසිරීම - 2010 (මාසික සාමාන්‍යය)**



වර්ෂය මුළුල්ලේම දේශීය බැංකු පද්ධතිය තුළ ද්‍රවශීලතා අතිරික්තයක් පැවැති අතර, එහි උපරිම මට්ටම ඔක්තෝබර් මුල් සතියේ වාර්තා විය (රූපසටහන II-2). මෙම අතිරික්ත ද්‍රවශීලතාවයෙන් වැඩි කොටසක් ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි තුළින් සහ එක්දින පදනම මත නිත්‍ය පහසුකම් යටතේ තාවකාලිකව අවශෝෂණය කර ගනු ලැබිණි. තවදුරටත් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම තුළින් සහ විදේශ විනිමය හුවමාරු (FX swaps) වෙන්දේසි තුළින් සාපේක්ෂව දිගු කාලීන පදනමක් යටතේ අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම සිදුකරනු ලැබිණි. මහ බැංකුව සතු සුරැකුම්පත් ප්‍රමාණවත් මට්ටටමක නොපැවති බැවින්, නිත්‍ය පදනමක් මත අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම සඳහා සුරැකුම්පත් ස්ථිරවම විකුණා දැමීමේ ගනුදෙනු පැවැතියේ ඉතා අවම වශයෙනි. 2010 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාව එ. ජ. ඩොලර් බිලියන 01 ක (රුපියල් බිලියන 112) වටිනාකමකින් යුතු තුන්වන විදේශ බැඳුම්කර නිකුතුව විදේශීය ආයෝජකයන් සඳහා නිකුත් කළේය. මෙම ලබාගත් අරමුදල්වලින් කොටසක් වාණිජ බැංකුවල විදේශ විනිමය බැංකු ඒකක සම්බන්ධ රජයේ වගකීම් පියවීම සඳහාත් තෝරාගත් ආනයන සඳහා වූ රජයේ වගකීම් පියවීම සඳහාත් යොදාගනු ලැබිණි. මහ බැංකුව විසින් මූල්‍ය වෙළෙඳපොළෙන් මිලදී ගන්නා ලද ඉතිරි එ.ජ. ඩොලර් මිලියන 878 තුළින් රුපියල් බිලියන 98 ක අතිරේක ද්‍රවශීලතා ප්‍රමාණයක් බැංකු පද්ධතිය තුළට මුදා හැරීමට කටයුතු කරන ලදී. වර්ධනය වූ ද්‍රවශීලතා තත්ත්වයක් යටතේ කටයුතු කිරීමට සිදුවීම නිසා මහ බැංකුව රුපියල් බිලියන 55 ක අගයෙන් යුතු රාජ්‍ය සුරැකුම්පත් ප්‍රමාණයක් විශ්‍රාම ගැන්වීම හේතුවෙන් වෙළෙඳපොළ ද්‍රවශීලතාවයේ ශුද්ධ වැඩිවීම රුපියල් බිලියන 43 ක් පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔක්තෝබර් මස මුල් සතියේ උපරිම ද්‍රවශීලතා මට්ටම ලෙස රුපියල් බිලියන 173 ක් වාර්තා විය.

මහ බැංකුව විසින් දරන ලද විවිධ උත්සාහයන් මධ්‍යයේ වුවද දේශීය මූල්‍ය වෙළෙඳපොළ තුළ කෙටිකාලීන පොලී අනුපාතිකයන්හි විෂමතාවයන් දක්නට ලැබිණි. බැංකු පද්ධතිය තුළ පැවැති විශාල කෙටිකාලීන අතිරික්ත ද්‍රවශීලතාවය (අරමුදල්) මත විකල්ප ආයෝජනයක් ලෙස අනෙකුත් ආයෝජනයන්ට සාපෙක්ෂව රාජ්‍ය සුරැකුම්හි ආයෝජනය කිරීමට වූ වැඩි නැඹුරුව හේතුවෙන් කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ඵලදා අගයන්හි දිගින් දිගටම පහත වැටීමක් දක්නට ලැබුණි. කෙටිකාලීන මුදල් වෙළෙඳපොළ විෂමතාවය සමනය කරනු වස් මහ බැංකුව විසින් විවට වෙළෙඳ කටයුතු යටතේ වූ එක්දින ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි හා කාලීන පදනම මත මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීමේ වෙන්දේසි පැවැත්වීමෙන් 2010 ඔක්තෝබර් 20 දින සිට වැළකී සිටි අතර ඒ තුළින් වෙළෙඳපොළ කෙටිකාලීන පොලී අනුපාතිකයන් වෙනස්වීම්වලට භාජනය වී පොලී අනුපාතිකයන් අතර ගැලපීම මනාව සිදුවනු ඇතැයි බලාපොරොත්තු විය. මෙම උපාය මාර්ගය තුළින් කෙටිකාලීන පොලී අනුපාතිකයන්හි තිබූ විෂමතාවයන් වේගවත් ලෙස ක්‍රමානුකූල බවට පත් විය. බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන්ට තවදුරටත් තම අතිරික්ත අරමුදල් වර්ෂයකට සියයට 7.25ක පොලී අනුපාතිකයක් යටතේ මහ බැංකුව සමඟ එක් දින නිත්‍ය පහසුකම්වල ආයෝජනය කිරීමට අවස්ථාව ලබාදෙන ලදී. කෙසේ වෙතත් විදේශ විනිමය හුවමාරු වෙන්දේසි කිසිදු අවහිරතාවයකින් තොරව තවදුරටත් නොකඩවා පැවැත්විණි.

**රූප සටහන II-2**

**2010 - වර්ෂයේ මූල්‍ය උපකරණ අනුව වෙළෙඳපොළ ද්‍රවශීලතාව (මාසික සාමාන්‍යය)**




බැංකුව සතුව තිබූ රාජ්‍ය සුරැකුම්පත් තොගය වේගවත් ලෙස ක්ෂය වෙමින් පැවැතියද, මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරමින් ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමේ ක්‍රියාවලිය නොකඩවාම සිදුකරන ලදී.

කෙටිකාලීන ආයෝජන සම්බන්ධව ව්‍යුහාත්මක ගැටළු රැසක් අන්තර් බැංකු වෙළෙඳපොළ තුළ පැන නැගුණු බැවින්, නොකඩවා ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමේ ක්‍රියාවලියේදී සහභාගිත්ව ආයතන විසින් මහ බැංකු සුරැකුම්පත් යොදා ගැනීම සීමිත මට්ටමක පැවැතිණි. එයට අමතරව මෙම ක්‍රියාවලිය තුළින් මහ බැංකු ශේෂ පත්‍රයෙහි ඇති කරන ලද ඉහළ පිරිවැය නිසා ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම සඳහා විකල්ප මාර්ගයක් යොදා ගැනීමට මහ බැංකුවට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ හතරවන කාර්තුවේදී "රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීමේ වැඩසටහන" නම් වූ නව වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන ලදී. මෙම වැඩ පිළිවෙළ යටතේ මහ බැංකුව විශාල ආයතනික ආයෝජකයන්ගෙන් රාජ්‍ය සුරැකුම්පත් (විශාල ලෙස බැඳුම්කර) ණයට ලබාගෙන එම සුරැකුම්පත් විවට වෙළෙඳපොළ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවලදී ඇපකරයක් ලෙස යොදාගනු ලැබිණි. මෙලෙස විශාල ආයතනවලින් බැඳුම්කර ණයට ගෙන විවට වෙළෙඳපොළ කටයුතුවලදී ඇපකරයක් ලෙස යොදා ගැනීම, මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීමේදී දරණ පිරිවැයට සාපේක්ෂව වාසිදායක විය. මෙම නව ක්‍රියා මාර්ගය මහ බැකු ශේෂ පත්‍රය කෙරෙහි පැවති ඉහළ වියදමෙහි බලපෑම අඩු කරලීම සඳහා ද ප්‍රයෝජනවත් විය. එමෙන්ම මෙම ක්‍රියාවලියේදී යොදාගනු ලබන්නේ රාජ්‍ය සුරැකුම්පත් බැවින් වෙළෙඳපොළ සහභාගිවන්නන් අතර ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් වෙනසක් පෙන්නුම් නොකරන ලදී. තවදුරටත් මෙම රාජ්‍ය සුරැකුම්පත් කල් පිරීමේ දිනය දක්වා අභාවිත ලෙස රඳවා තබා ගැනීම වෙනුවට අතිරේක ආදායමක් සුරැකුම්පත් ධාරකයා වෙත ලබාදෙන වැඩ පිළිවෙළක් ද විය. මෙම නව වැඩ පිළිවෙළ දේශීය බැඳුම්කර ණයට දීමේ වෙළෙඳපොළක් ඇතිවීම සඳහා පදනමක් වනු ඇතැයි ද බැංකුව අපේක්ෂා කරන ලදී. 2010

වර්ෂය තුළදී මෙම නව වැඩ පිළිවෙළ නිසා මහ බැංකුවේ ශේෂ පත්‍රයෙහි ඇති කරන ලද ඉතිරිය රුපියල් මිලියන 114 ක් විය.

### 6.1.1 විවට වෙළෙඳ කටයුතු

#### අ. එක්දින ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු

බැංකු පද්ධතියේ අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම සඳහා 2010 ඔක්තෝබර් මස 19 වන දින දක්වා ප්‍රධාන වශයෙන්ම දෛනික පදනම මත මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ එක් දින ප්‍රතිමිලදී ගැනීමේ වෙන්දේසි පවත්වන ලදී. මෙම වෙන්දේසි සඳහා පිරිනමන ලද බිල්පත්වල දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 25 ක් පමණ වූ අතර, එයින් වෙළෙඳපොළ පැවැති ද්‍රවශීලතාවයෙන් සියයට 90 ක් නියෝජනය විය. මෙම වෙන්දේසිවල බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය වර්ෂය මුලදී සියයට 8.24 වුවද වසරේ තුන්වන කාර්තුව වනවිට සියයට 7.68 ක් දක්වා ක්‍රමයෙන් පහත වැටීමක් දක්නට ලැබිණ. වෙළෙඳපොළ ස්ථාවර තත්ත්වයන් පෙන්නුම් කරමින් මෙම කාලය තුළදී බර තබන ලද සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය පොලී අනුපාතික කොරිඩෝව තුළ විචලනය වූයේ ස්ථාවර මූල්‍ය වෙළෙඳපොල තත්ත්වයක් විද්‍යාමාන කරමිනි.

ඉහත 6.1 කොටසේ පැහැදිලි කර ඇති ආකාරයට ශ්‍රී ලංකා මහ බැංකුව නව ඇපකරයක් වශයෙන් යොදා ගැනීම සඳහා සේවක අර්ථ සාධක අරමුදලට අයත් බැඳුම්කර ණයට ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී.

**රූප සටහන II-3**
**2010 - ශ්‍රී.ලං.ම.බ. ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි (මාසික සාමාන්‍යය සහ බරතබන ලද ප්‍රතිමිලදී ගැනීම් අනුපාතික)**




#### ආ. ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු

නිත්‍ය පදනමක් මත අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම සඳහා මහ බැංකුව ස්වකීය භාණ්ඩාගාර බිල්පත් කළඹෙන් ස්ථිර පදනමක් මත විකිණීමට වෙන්දේසි පවත්වනු ලැබිය. 2010 වසර තුළදී මෙම වෙන්දේසි තුළින් විකුණන ලද භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 13 ක් විය. මෙම ස්ථිර ලෙස විකුණා දමන ලද භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරීමේ කාලය දින 8 සිට 57 දක්වා පරාසයක පැවති අතර, බර තබන ලද ඵලදා අනුපාතිකය සියයට 7.8 ත් 8.5 ත් අතර වෙනස් විය.

### 6.1.2 මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම

වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාවය උකහා ගැනීමට ප්‍රමාණවත් තරම් සුරැකුම්පත් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුව සතුව නොතිබීම නිසා එක්දින හා කාලීන පදනම මත ප්‍රතිමිලදී ගැනුම් වලින් ද්‍රවශීලතාවය අවශෝෂණය කරගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරන ලදී. සමස්තයක් ලෙස ඔක්තෝබර් මස 19 වන දින තෙක් දෛනික වෙන්දේසි සඳහා පිරිනමන ලද මහ බැංකු සුරැකුම්පත්වල වටිනාකම රුපියල් බිලියන 39 ක් වූ අතර, එයින් පිළිගත් ප්‍රමාණය රුපියල් බිලියන 35 ක් විය. එහි බරතබන ලද සාමාන්‍යය ඵලදා අනුපාතිකය (බදු රහිතව) සියයට 7.8 සහ සියයට 8.3 අතර පරාසයක විචලනය විය. රාජ්‍ය සුරැකුම්පත් විශාල ලෙස ඇති ධාරකයින්ගෙන් එම සුරැකුම්පත් ණය ලෙස ලබා ගැනීම සඳහා සකස් කරන ලද වැඩ පිළිවෙළ හඳුන්වා දීමට පෙර ඇතැම් අවස්ථාවලදී මහ බැංකු සුරැකුම්පත් නිත්‍ය පහසුකම් යටතේ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය මත නිකුත් කරන ලදී.

මහ බැංකුව කාලීන පදනම යටතේ අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කරගැනීම සඳහා මහ බැංකු සුරැකුම්පත් ද නිකුත් කරන ලදී. 2010 වර්ෂයේ කාලීන පදනම මත පවත්වන ලද වෙන්දේසීන්හි කල්පිරීමේ කාලය දින 11 සිට දින 32 දක්වා විවිධ විය. මේ යටතේ 2010 වසරේ නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම්පත්වල බරතබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 7.8 ත් 8.9 ත් අතර පරාසයක විචලනය විය.

### 6.1.3 විදේශ විනිමය හුවමාරු ගනුදෙනු

අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කරගැනීමේ උපකරණයක් ලෙස 2009 වර්ෂය අග භාගයේදී හඳුන්වා දෙන ලද විදේශ විනිමය හුවමාරු ගනුදෙනු සඳහා වන වෙන්දේසි 2010 වර්ෂය තුළදී වෙළෙඳපොළ සහභාගිවන්නන් අතර වඩාත් ජනප්‍රිය විය. මේ තුළින් අවශෝෂණය කර ගන්නා ලද මුළු ද්‍රවශීලතා ප්‍රමාණය රුපියල් බිලියන 243 (එ. ජ. ඩොලර් මිලියන 2,147) ක් විය.

### 6.1.4 නිත්‍ය පහසුකම්

විවට වෙළෙඳ කටයුතු යටතේ දෛනික වෙන්දේසි තුළින් සිය මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වූ සහභාගිත්ව ආයතන සඳහා ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය යටතේ නිත්‍ය පහසුකම් සැපයීම වර්ෂය තුළදී නොකඩවාම ක්‍රියාත්මක විය. ද්‍රවශීලතාවය අවශෝෂණය කරගන්නා වෙන්දේසි නොමැති වීමත් සමඟ සහභාගිත්ව ආයතන සිය මුළු අතිරික්ත ද්‍රවශීලතාවය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය යටතේ එක් දින පදනම මත යොදවනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ මුල් කාර්තු 3 තුළදී නිත්‍ය පහසුකම් යටතේ සහභාගිත්ව ආයතන සපයන ලද ද්‍රවශීලතාවයේ දිනක සාමාන්‍යය රුපියල් බිලියන 2 ක් පමණ විය. මෙය 2010 අවසන් කාර්තුව තුළ සම්පූර්ණයෙන්ම වෙනස් වී සහභාගිත්ව ආයතන සපයන ලද ද්‍රවශීලතාවයේ

දිනක සාමාන්‍යය රුපියල් බිලියන 94 ක් ලෙස වාර්තා විය. මෙම ක්‍රියාදාමයන්හි ප්‍රතිඵලයක් ලෙස 2010 වසර තුළදී නිත්‍ය පහසුකම් යටතේ සිදුකරන ලද ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සාමාන්‍යයෙන් දිනකට රුපියල් බිලියන 26 ක් පමණ විය. වර්ෂයේ අවසන් භාගය තුළදී විදේශ විනිමය හුවමාරු කර ගැනීමේ වෙළෙඳපොළ උපකරණයෙහි (Fxwap) ආයකත්වය සැලකිය යුතු මට්ටමක පැවතියද නිත්‍ය පහසුකම් යටතේ වූ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු ද්‍රවශීලතාවය උකහා ගැනීමේ ප්‍රධාන උපකරණයක් ලෙස ක්‍රියාත්මක විය.

### 6.1.5 ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගවලට අනුව සෑම වාණිජ බැංකුවක්ම තම තැන්පතු වගකීම් පදනම් කරගෙන මහ බැංකුව සමඟ පවත්වාගෙන යා යුතු සංචිත ගිණුමේ රඳවා තැබිය යුතු අවම සංචිත ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය ලෙස හඳුන්වයි. එම නියෝගවලට අනුකූලව වාණිජ බැංකු විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පවත්වාගෙන යාම සහ ඒ කටයුතු නිරීක්ෂණය කිරීමත් දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. 2010 වසර තුළදී ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය මුළු තැන්පතු වගකීම් වලින් සියයට 7.0 ක් ලෙස පවත්වාගෙන යනු ලැබිණි.

### 6.1.6 බැංකු අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද වාණිජ බැංකු විසින් මහ බැංකුවෙන් ණය ලබාගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවුණු අතර, මෙම බැංකු අනුපාතිකය එහි අධ්‍යාපනික වැදගත්කමට පමණක් සීමා විය. බැංකු පද්ධතිය තුළ අතිරික්ත ද්‍රවශීලතාවයක් පැවතීමත් අන්තර් බැංකු ඒක්ෂණ වෙළෙඳපොළ පොලී අනුපාතිකයන් පහළ මට්ටමක පැවතීමත් හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවිය.

## 6.2 වාණිජ බැංකුවල හා රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ ක්‍රියාකාරිත්වය

### 6.2. 1 මූල්‍ය ආයතනවල ගිණුම්

වාණිජ බැංකුවල බැංකුකරු ලෙස මහ බැංකුව වාණිජ බැංකු වලට කරන කාර්යභාරයේ කොටසක් ලෙස වාණිජ බැංකු වලට ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් සලස්වමින් කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් හා පියවීම් ක්‍රමයක් සහතික කරනු පිණිස, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව වාණිජ බැංකු හා ප්‍රාථමික වෙළෙඳුන් වෙත ජංගම ගිණුම් පහසුකම් සැපයීමෙහි තවදුරටත් නිරත විය. 2010 වර්ෂය අවසානය වනවිට, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් වාණිජ බැංකු සඳහා ගිණුම් 22 ක්ද, ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ගිණුම් 8 ක්ද පවත්වාගෙන යනු ලැබීය. මෙම ගිණුම් මහ බැංකුවේ ස්වයංක්‍රීය පොදු ලෙජර් පද්ධතිය තුළ තත්කාලීන දළ පියවුම් පදනමක් මත ක්‍රියාත්මක විය.

### 6.2.2 රජයේ ගිණුම්

මහ බැංකුවට රජයේ බැංකුකරු වශයෙන් සේවය කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදෙමින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව, රජයේ දෙපාර්තමේන්තු රජයේ නියෝජිත ආයතන සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය බැංකු පහසුකම් සපයමින් ගිණුම් පවත්වාගෙන යාම අඛණ්ඩව සිදු කරන ලදී. 2010 වර්ෂය අවසානයේදී එසේ පවත්වාගෙන යන ලද ගිණුම් සංඛ්‍යාව රජයේ ඉල්ලීම මත වර්ෂය තුළදී විවෘත කරන ලද නව ගිණුම් 3 ක්ද ඇතුළුව ගිණුම් 57 ක් විය. මුදල් නීති පනතේ 89 වන වගන්තියට අනුව මහ බැංකුව රජයට පොලී රහිතව කෙටිකාලීන අත්තිකාරම් ලබාදීම තවදුරටත් සිදුකරන ලදී. මෙම අත්තිකාරම්වල සීමාව දෙන ලද වර්ෂයක රජයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 10 ක් විය. 2010 වර්ෂයේදී මෙම අත්තිකාරම්වල වටිනාකම එම වසර තුළ ඇස්තමේන්තුගත රජයේ ආදායම අඩුවීම හේතුවෙන් රුපියල් බිලියන 3 කින් අඩුවුවත් එසේ සපයන අත්තිකාරම් උපරිමය රුපියල් බිලියන 84 ක් විය.

## 6.3 දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් සැපයීම

තත්කාලීන දළ පියවුම් ක්‍රමය තුළ මෙහෙයුම් කටයුතු සුමට හා කාර්යක්ෂම ලෙස සිදු කිරීම සහතික කරනු සඳහා සහභාගිත්ව ආයතන වෙත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව තවදුරටත් නිරත විය. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම ගාස්තුවකින් තොරව රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් තවදුරටත් සිදු කරනු ලැබීය. සුරැකුම්පත්වල වටිනාකම ඒවායේ වර්තමාන වෙළෙඳපොළ මිල ගණන් අනුව ගණනය කරනු ලබන අතර, එම දිනය තුළ ඇතිවිය හැකි මිල උච්ඡාවචනයන් ආවරණය කරගත හැකි වන පරිදි ප්‍රමාණවත් ගැලපීමක් කරනු ලැබිණි. මෙම ක්‍රමයෙහි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින් 2010 වර්ෂයේදී සහභාගිත්ව ආයතනවලට දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් අවශ්‍ය වන අවස්ථාවලදී අරමුදල් ලබාගැනීමටත් නැවත ගෙවීමටත් හැකිවන පරිදි "සහභාගිවන්නන් විසින් පාලනය කරනු ලබන දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීමේ ක්‍රමයක්" ප්‍රතිෂ්ඨාපනය කරන ලදී.

වර්ෂය තුළ ලබාගත් එක්දින ද්‍රවශීලතා පහසුකම් ප්‍රමාණය සහ දෛනික වටිනාකමේ සාමාන්‍යය පිළිවෙලින් රුපියල් බිලියන 2,747 ක් සහ රුපියල් බිලියන 11 ක් විය. පසුගිය වසරේ මෙම අගයන් පිළිවෙලින් රුපියල් බිලියන 2,725 ක් සහ රුපියල් බිලියන 12 ක් වූ අතර, එයින් මේ වසරේ එක්දින ද්‍රවශීලතා පහසුකම් ප්‍රයෝජනයට ගැනීමේ ආන්තික වර්ධනයක් පෙන්වයි. මහ බැංකු අනුපාතිකය පදනම් වූ දඩ පොලියක් නියම කිරීම සහ නැවත නැවතත් ආපසු ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවලදී මෙම පහසුකම අත්හිටුවීම වැනි දැඩි පියවරයන් ගෙන තීබීම නිසා ලංකා සෙට්ල්හි ව්‍යාපාරික කටයුතු අවසන් කිරීමට පෙර එක් දින ද්‍රවශීලතා පහසුකම් ආපසු ගෙවීම නිසි ලෙස සිදුවීම සහතික වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළදී එක්දින ද්‍රවශීලතා පහසුකම් ගෙවීම් පැහැර හැරීමක් වාර්තා නොවීය.

**රූප සටහන II-4**

**2010 - දවස ඇතුළත ලබාගත් ද්‍රවශීලතා පහසුකම්**




## 7. ආර්ථික පර්යේෂණ

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මහ බැංකුවේ මූලික අරමුණ වන ආර්ථික සහ මිල ස්ථායිතාවයට අදාල ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී සහයෝගය ලබාදෙමින් සිය ව්‍යවස්ථාපිත වගකීම අඛණ්ඩව ඉටු කළේය. සිය වගකීම ඉටු කිරීමේදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් පිළිබඳ පුළුල් විශ්ලේෂණයන් සපයමින් කළමනාකරණයට හා මුදල් මණ්ඩලයට ප්‍රතිපත්ති නිර්දේශ කිරීම අඛණ්ඩව සිදු කළ අතර, රජයේ ආර්ථික උපදේශකවරයා ලෙස මහ බැංකුවේ වගකීම් ඉටු කිරීමට කළමනාකරණයට සහයෝගය දැක්වීය. මීට අමතරව, රටෙහි ආර්ථික සහ මූල්‍ය ප්‍රවණතාවයන් පිළිබඳව ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ප්‍රකාශන, පුවත්පත් නිවේදන සහ මහ බැංකු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම මගින් මහජනතාවට තොරතුරු බෙදාහැරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මෙම වගකීම් ඉටුකිරීමේදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දේශීය හා අන්තර්ජාතික මූලාශ්‍ර දෙකෙන්ම සාර්ව ආර්ථික දත්ත එක්රැස් කිරීම හා සම්පාදනය කිරීම සහ සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ වඩාත් පුළුල් විශ්ලේෂණ සිදු කරමින් සිය ප්‍රතිපත්ති පාදක කරගත් ආර්ථික පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

වසර තුළදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව රජය විසින් පිහිටුවන ලද විවිධ ප්‍රතිපත්ති උපදේශක කමිටු සඳහා සක්‍රිය ලෙස සහභාගි වූ අතර, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු ඉදිරිපත් කළ ගැටළු සඳහා ආර්ථික උපදෙස් හා නිර්දේශ ලබාදෙන ලදී.

### 7.1 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහායවන පර්යේෂණ සිදුකිරීම

ආර්ථික ප්‍රවණතා මෙන්ම තාක්ෂණික වර්ධනයන් හා මූල්‍ය පද්ධතියේ ඇතිවන නව්‍යතාවලට අනුකූලව, පවත්නා මුදල් ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම සඳහා ඊට සිදුකළ හැකි වර්ධනයන් පිළිබඳව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයනය කරන ලදී. මූල්‍ය ප්‍රවාහ සහ මුදල් ඉල්ලුම සඳහා දැඩි වෙනස්කම් සිදුකළ හැකි ආර්ථිකයේ සිදු වූ පුළුල් ව්‍යුහාත්මක වෙනස්කම් සම්බන්ධයෙන් බලනකල මෙය විශේෂයෙන්ම අවශ්‍ය කරුණකි. එම අධ්‍යයනයන්ට අනුව, මුදල් ඉලක්ක රාමුව තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, ආර්ථිකයෙහි කෙටි හා මැදිකාලීන බලපෑම් ඇතිවිය හැකි ආර්ථික හා මුදල් ප්‍රවණතා විශ්ලේෂණයන් (ද්වි විශ්ලේෂණය) කෙරෙහි ඉහළ අවධානයක් යොමු කිරීමට මහ බැංකුව විසින් තීරණය කරන ලදී.

මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ නිර්දේශ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලබන මුදල් ප්‍රතිපත්ති කමිටුවෙහි විචාරණයන් සඳහා සහායවීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩවම සිදුකරන ලදී. මුදල් මණ්ඩලයට සහ මුදල් ප්‍රතිපත්ති කමිටුවට ආර්ථික හා මුදල් විශ්ලේෂණ පිළිබඳ පරිපූර්ණ වාර්තා ක්‍රමානුකූලව සැපයීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී වැදගත් විය හැකි ආර්ථිකයෙහි ණය ගලා යන විවිධ අංශයන් හඳුනාගැනීමේ අරමුණින් පෞද්ගලික අංශයට ලබාදෙන ණය ප්‍රතිවර්ගීකරණය කරමින් වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබාදෙන අත්තිකාරම් පිළිබඳ සමීක්ෂණය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

තවද, 2010 වසරේදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් තෙවන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කළ අතර, ඒ මගින් වර්තමානයේ සිදුකරන ලද පර්යේෂණයන් පිළිබඳව සාකච්ඡා කිරීමට සහ කලාපීය මහ බැංකු පර්යේෂකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් අතර අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව උදාකර දෙන ලදී. පෙර වසරවලදී මෙන්ම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අග්නිදිග ආසියානු මහ බැංකු සංසදය වැනි (සියසන් - SEACEN) අන්තර්ජාතික සංවිධාන සමග ඒකාබද්ධ පර්යේෂණවල නිරත විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර දැනුම හුවමාරු කර ගැනීමේ සහ ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩ සටහනක් ලෙස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සතිපතා සම්මන්ත්‍රණ පවත්වන ලද අතර, කාලීන ගැටළු පිළිබඳව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා විශේෂඥ දැනුම ඇති අයගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පවත්වන ලදී. කාලීන වැදගත්කමක් සහිත මාතෘකා පිළිබඳව පර්යේෂණ සිදු කිරීම ධෛර්යවත් කිරීම පෙරදැරි කොටගෙන, 2010 දී පහත දැක්වෙන පර්යේෂණ පත්‍රිකා නිම කළ අතර, එම පර්යේෂණ මහ බැංකු මාණ්ඩලික පත්‍රිකාවන්හි ප්‍රකාශයට පත් කරනු ඇත.

(අ) "මූල්‍ය හා ආර්ථික වර්ධන සහසම්බන්ධතාවය : ශ්‍රී ලංකාවේ අත්දැකීම්" - එච්.අමරතුංග මහතා

(ආ) "ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළෙහි ප්‍රතිලාභ විචලනය කෙරෙහි අසමමිතික ප්‍රවෘත්තිවල බලපෑම" - සුජීතා ජෙගජීවන් මිය

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වශයෙන් කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණ 2010 වසරේදී ද පැවැත් වූ අතර, කාර්මික අංශයේ කාර්යසාධනය ඇගැයීමට කාර්මික නිෂ්පාදන ප්‍රමාණ දර්ශකය ගණනය කරන ලදී. 2010 වසරේදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් කර්මාන්ත ආයතන සඳහා ක්ෂේත්‍ර සංචාර ගණනාවක් සංවිධානය කළ අතර, පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය තවදුරටත් වැඩි දියුණු කළහැකි ආකාරය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කර්මාන්ත අංශයේ කාර්යසාධනය සහ ගැටළු පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ඇඟළුම් කර්මාන්ත ඒකාබද්ධ සංගමය (JAAF) වැනි විවිධ කර්මාන්ත අංශයන්හි නියෝජිතයන් හමු විය. නිවාස අනුමැතිය පිළිබඳ දර්ශකය සකස් කිරීම සඳහා මහ කොළඹ ප්‍රදේශයේ නිවාස සඳහා අනුමැතිය ලබාදීම පිළිබඳ සමීක්ෂණයක් ද පවත්වන ලදී.

පෞද්ගලික අංශයේ අදහස් ලබාගැනීම තුළින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ස්ථාපනය කරන ලද මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුවෙහි රැස්වීම් සම්බන්ධීකරණය කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මහාචාර්ය ඒ.ඩී.වී. ද එස්.ඉන්ද්‍රරත්න මහතා (සභාපති), සෝලි කැප්ටන් මහතා, යොහාන් පෙරේරා මහතා, මහේන් දයානන්ද මහතා, ආර්.එම්.බී.සේනානායක මහතා, එම්.පී.ජයවර්ධන මහතා, කබී විජේතුංග මහතා සහ අමල් කබ්රාල් මහතා යන සමාජිකයන්ගෙන් 2010 වසරේදී මෙම කමිටුව සමන්විත විය. මෙම කමිටුව මාසිකව රැස් වී සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා දායක විය.

### 7.2 ව්‍යවස්ථාපිත වාර්තා සහ අනෙකුත් වාර්තා සහ ප්‍රකාශන සකස් කිරීම

පසුගිය වසරවලදී මෙන්ම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් දෙපාර්තමේන්තුවල ද සහාය ඇතිව 2009 වසර සඳහා මහ බැංකු වාර්ෂික වාර්තාව, මෑතකාලීන ආර්ථික ප්‍රවණතා - 2010 සුවිශේෂී සිදුවීම් සහ 2011 අපේක්ෂාවන් සහ මාසික විවරණිකාව යන ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී. මුදල් නීති පනතෙහි අංක 116 (1) වගන්තිය යටතේ රජයේ අයවැය සකස් කිරීම සඳහා උපයෝගී කර ගැනීමට හැකිවන පරිදි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා වෙත බාරදිය යුතු රහස්‍ය වාර්තාවක් වන සැප්තැම්බර් 15 වාර්තාවද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී. ආර්ථිකයේ විවිධ අංශවල වැදගත් ආර්ථික දත්ත හා තොරතුරු මහජනතාවට ලබාදීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමක් වේ. මෙම අවශ්‍යතාවයන් සපුරාලමින්, මුදල් ප්‍රතිපත්ති ගෙවුම් ශේෂය හා ජාත්‍යන්තර වෙළෙඳාම සහ වෙනත් වැදගත් ආර්ථික තොරතුරු ලබාදීම සඳහා පුවත්පත් නිවේදන මගින් මහජනතාව දැනුම්වත් කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලදී.

මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "වසර 2010 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම" සකස් කිරීම නොකඩවා හතරවන වතාවටත් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලදී. එය 2010 ජනවාරි 04 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. ප්‍රතිපත්ති පෙර දැක්ම ප්‍රකාශයට පත් කිරීමේ අරමුණ වන්නේ ඉදිරි කාලපරිච්ඡේදය සඳහා පාර්ශ්වකරුවන්ට නව සැළසුම් සහ උපායමාර්ග වඩාත් හොඳින් සකස් කිරීමට උපකාරීවන අයුරින් මහ බැංකුවේ ප්‍රතිපත්ති පුරෝකථන ලබාදීම හරහා විනිවිදභාවය වැඩි දියුණු කිරීමයි. එවැනිම ප්‍රතිපත්ති පෙරදැක්මක් 2011 ජනවාරි 4 වන දින ද ප්‍රකාශයට පත් කරන ලදී.

ආර්ථික හා මූල්‍ය වශයෙන් වැදගත් බලපෑමක් සහිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධයෙන් ස්වාධීන මත ඉදිරිපත් කිරීම ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී. තවද රජය විසින් ලබාගන්නා සියලුම විදේශ ණයවලින් මුදල් සැපයුම කෙරෙහි ඇති විය හැකි බලපෑම ඇගයීමට ලක් කිරීම සහ මුදල් මණ්ඩලයට එම ණය සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීමද සිදුකරන ලදී.

### 7.3 දැනුම වර්ධනය කිරීම සඳහා දායකවීම සහ විශේෂඥතාව බෙදාගැනීම

මහ බැංකුව තුළ සහ ඉන් පිටත ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම පිණිස තම දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ විශේෂඥතාවය ලබාදීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් නොකඩවා සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ සහ විශ්ව විද්‍යාල, පාසැල් සහ රජයේ හා පෞද්ගලික අංශයේ විවිධ ආයතනවල සම්පත් දායකයන් ලෙස කටයුතු කරන ලදී. මීට අමතරව, මහ බැංකුවට පැමිණෙන දේශීය හා විදේශීය දූත මණ්ඩල සඳහා මහ බැංකුකරණය සහ සාර්ව ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම් සිදුකරන ලදී. තවද මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂකයන්ට ඔවුන්ගේ පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ පත්‍රිකා පිළියෙල කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නිරතුරුව සහාය වන ලදී.

විවිධ අභ්‍යන්තර සහ බාහිර කමිටු සහ මණ්ඩල සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සේවය ලබාදෙන ලදී. ජාතික උසස් අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙහි කළමනාකරණ කමිටුව, එම් 7 වර්ගයේ දුම්රිය එන්ජින් සමූහය අළුත්වැඩියා කිරීමේ කමිටුව, පුනර්ජනනීය බලශක්තිය සඳහා වන ජනාධිපති

කාර්යසාධන බලකාය, අන්තර් ප්‍රාදේශීය අසමතුලිතතාවය තුරන් කිරීම සහ ප්‍රාදේශීය සංවර්ධනය ඉහළ නැංවීම සඳහා වන මුදල් කොමිෂන් සභා නියාමන කමිටුව, ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරියෙහි ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති පිළිබඳ කවුන්සිලයේ සමාජ ආර්ථික හා ප්‍රතිපත්ති පර්යේෂණ ජාතික කමිටුව, 2010 වසරේ ශ්‍රී ලංකාවේ කම්කරු හා සමාජ නැඹුරුව විශ්ලේෂණය පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානය කමිටුව, මහජන බැංකුවේ ආර්ථික විවරණ උපදේශන කමිටුව, සෞඛ්‍ය මූල්‍යයනය පිළිබඳ නියාමන කමිටුව සහ ජාතික සෞඛ්‍ය ගිණුම් පිළිබඳ නියාමන කමිටුව යන කමිටු සහ මණ්ඩල මීට ඇතුළත් විය. තවද, වාණිජමය වශයෙන් ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති රජයේ ආයතන සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම හා වාර්තා කිරීම සඳහා රාජ්‍ය සම්පත් හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය මගින් පත් කරන ලද කමිටුවල සාමාජිකයන් ලෙස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කටයුතු කරන ලදී. 2010 නොවැම්බර් 4 - 5 දෙදින තුළ ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවති වෙළෙඳ ප්‍රතිපත්ති සමාලෝචනය සඳහා සහභාගි වූ නියෝජිත කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තු නිලධාරියෙක් සහභාගි විය. මීට අමතරව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඇතුළුව විවිධ අමාත්‍යාංශ මගින් පවත්වන ලද රැස්වීම්වලට ආර්ථික පර්යේසෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි විය.

### 7.4 ජාත්‍යන්තර සබඳතා

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ''සියසැන්'' සංවිධානය හා සියැන්සා සංවිධානය වැනි බහු පාර්ශ්වීය සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව සිදුකරන ලදී. වර්ෂය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් සම්පස්ථ ණය පහසුකම යටතේ සමාලෝචන කටයුතු සිදු කිරීම සඳහා ලංකාවට පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත මණ්ඩල හතරක් සමඟ සමීපව කටයුතු කරන ලද අතර, එම ණය පහසුකම යටතේ නිරතුරුවම දත්ත වාර්තා කිරීමේ වගකීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් නිසි ලෙස ඉටු කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, පිච් රේටින්ස් (Fitch Ralings), එස් ඇන්ඩ් පී රේටින්ස් (S & P Ratings) සහ මූඩී'ස් රේටින්ස් (Moody's Ratings) වැනි අන්තර්ජාතික ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන සමඟ සමීපව කටයුතු කරන ලදී. මීට අමතරව, මුදල් ප්‍රතිපත්ති කලමනාකරණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය යන සියැසන් පුහුණු පාඨමාලා දෙකක් සංවිධානය කිරීම ද බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ සහාය ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

## 8. සේවක අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතට අනුව 2010 වර්ෂය තුළදීත් සේවක අර්ථසාධක අරමුදල් (සේ.අ.අ.) දෙපාර්තමේන්තුව තම වගකීම් සහ කාර්යයන් ඉටු කිරීමේ නිරත වන ලදී. සාමාජික දායක මුදල් සහ අධිභාර රැස්කිරීම, සාමාජික ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම, අර්ථලාභීන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම සහ පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේදී දරණ පිරිවැය අරමුදලේ ආදායමෙන් අයකර ගැනීම යනාදී කාර්යයන් මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දී ඉටු කරන ලදී. ඉහත කාර්යයන් ඉටු කිරීමේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව කම්කරු කොමසාරිස්වරයා සමග සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යන ලදී.

### 8.1 සාමාජිකත්වය, සාමාජික ගිණුම් ශේෂ සහ ප්‍රතිලාභ ගෙවීම්

අරමුදලේ සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව 2010 වර්ෂය අවසානයේ දී මිලියන 13.3 ක් වූ අතර, එය 2009 වර්ෂය අවසානයේ වූ මිලියන 12.8 හා සසඳන විට සියයට 3.9 ක වර්ධනයක් පෙන්නුම් කරයි. අරමුදලේ සක්‍රීය (වර්තමානයේ අරමුදල් එවනු ලබන) සාමාජික ගිණුම් සංඛ්‍යාව 2009 වර්ෂයේ මිලියන 2.1 වූ අතර, 2010 වසර අවසන් වන විට එය මිලියන 2.3 දක්වා වර්ධනය විය. 2009 වර්ෂය අවසන් වන විට මිලියන 10.7 ක් ව පැවති අක්‍රීය (වර්තමානයේ දායක මුදල් එවනු නොලබන) සාමාජික ගිණුම් සංඛ්‍යාව 2010 වර්ෂය අවසාන වනවිට මිලියන 11 දක්වා වර්ධනය විය. එමෙන්ම සක්‍රීය සේවායෝජකයින් සංඛ්‍යාව 2009 වසරේ පැවති 61,396 සිට 2010 වසරේ අවසානය වනවිට 62,000 දක්වා වර්ධනය විය. උතුරු හා නැගෙනහිර පළාත් හි නව සේවක ලියාපදිංචි වීම් මේ සඳහා වැඩි වශයෙන් බලපාන ලදී.

2010 වර්ෂය අවසානයේ දී සේ.අ. අරමුදලෙහි මුළු වටිනාකම රුපියල් බිලියන 900 ක් වූ අතර, එය 2009 වර්ෂයේදී වූ රුපියල් බිලියන 770 හා සසඳන විට සියයට 16.9 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. වර්ෂය තුළ දී රැස් කරන ලද සාමාජික දායක මුදල් ප්‍රමාණයේ වර්ධනය සහ අරමුදල විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම මගින් ඉපයූ ඉහළ ආදායම අරමුදලේ වර්ධනයට හේතු විය. 2009 වර්ෂයේ රුපියල් බිලියන 752.5 ක් ව පැවති සාමාජිකයින් වෙත වූ මුළු වගකීම 2010 වර්ෂය අග වනවිට රුපියල් බිලියන 869.2 ක් දක්වා සියයට 15.5 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-1). සාමාජික ගිණුම් වෙත 2009 හා 2010 වර්ෂය අවසානයේ බැර කරන ලද පොලී ආදායම මෙයට ඇතුළත්ය. වර්ෂයේ ශුද්ධ

දායක මුදල (ලැබුණු දායක මුදල් වලින් ප්‍රතිලාභ ගෙවූ පසු ඉතිරි වන ප්‍රමාණය) රුපියල් බිලියන 20 කි. එය 2009 වර්ෂයේ දී රුපියල් බිලියන 17 ක් විය. වර්ෂය තුළ දී අරමුදල විසින් සිය සාමාජිකයින්ට සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ලෙස රුපියල් බිලියන 34.9 ක මුදලක් ගෙවන ලදී. එය පෙර වර්ෂයේ ගෙවන ලද මුදල වූ රුපියල් බිලියන 31.9 හා සසඳන විට සියයට 9.4 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2010 වර්ෂය තුළදී ප්‍රතිලාභ ගෙවන ලද අයදුම්පත් සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 3.3 ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

**සංඛ්‍යා සටහන II-1**

**අරමුදල පිළිබඳ මූලික දත්ත**

| අයිතමය | 2009 | 2010 (අ) | ප්‍රතිශත වෙනස්වීම |
|---|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 12.8 | 13.3 | 3.9 |
| වර්තමානයේදී දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.1 | 2.3 | 9.5 |
| වර්තමානයේ දී දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන ) | 10.7 | 11.0 | 2.8 |
| දායක මුදල් එවනු ලබන සේවායෝජකයින් | 61,396 | 62,000 | 1.0 |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් මිලියන) | 48,712 | 54,796 | 12.5 |
| ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් මිලියන) | 31,901 | 34,896 | 9.4 |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 108,066 | 104,528 | (3.3) |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රුපියල් බිලියන) | 752.5 | 869.2 | 15.5 |
| අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 769.7 | 899.7 | 16.9 |

(අ) ඇස්තමේන්තුගත

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 8.2 අරමුදල් ආයෝජනය හා ප්‍රතිලාභය

### (i) ආයෝජන කළඹ

2010 වසර අවසානයේ දී අරමුදලේ සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම රුපියල් බිලියන 867.1 ක් (පොත් අගය) ලෙස වාර්තා වූ අතර, එය 2009 වර්ෂයේ පැවති රුපියල් බිලියන 738.1 ට සාපේක්ෂව සියයට 17.5 ක වර්ධනයක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II-2). අරමුදලේ සුරක්ෂිතභාවය ආරක්ෂා කරන අතරම ප්‍රතිලාභ ගෙවීම් සිදුකිරීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින් අරමුදලේ සාමාජිකයන් වෙත දිගුකාලීනව ධන මූර්ත ප්‍රතිලාභයක් ලබාදීම ඉලක්ක කොට ගත් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය 2010 වර්ෂය තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 2010 වසර අවසාන වනවිට අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 94.1 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, ව්‍යාපාර කොටස් සහ සාංගමික ණයකරයන්හි පිළිවෙලින් සියයට 5 ක් සහ සියයට 0.7 ක් ආයෝජනය කර තිබුණි. අරමුදල විසින් සිය දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සඳහා ඉතිරි සියයට 0.2 ක අරමුදල් ශේෂය ප්‍රති විකිණීමේ ගිවිසුම් (Reverse Repo) වැනි ද්‍රවශීල වත්කම් වල ආයෝජනය කොට තිබුණි.

**සංඛ්‍යා සටහන II-2**

**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2009 | | 2010 | |
|---|---|---|---|---|
| | රු.බිලියන | ආයකත්වය (%) | රු.බිලියන | ආයකත්වය (%) |
| භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් | 659.9 | 89.4 | 774.8 | 89.4 |
| රජයේ රුපියල් ණය | 56.6 | 7.7 | 40.9 | 4.7 |
| සාංගමික ණයකර | 8.3 | 1.1 | 6.3 | 0.7 |
| සමාගම් කොටස් | 9.8 | 1.3 | 43.7 | 5.0 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් | 3.5 | 0.5 | 1.4 | 0.2 |
| **එකතුව** | **738.1** | **100.0** | **867.1** | **100.0** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ii) ආයෝජන ආදායම

අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2010 වර්ෂයේ දී රුපියල් බිලියන 121.3 ක් ලෙස සටහන් වූ අතර, එය පෙර වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම වූ රුපියල් බිලියන 109.6 හා සැසඳීමේ දී සියයට 10.6 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. (සංඛ්‍යා සටහන II-3). පසුගිය වසර වලදී මෙන්ම ක්‍රමක්ෂය ලාභ ඇතුළු පොලී ආදායම අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය විය (ආදායමින් සියයට 97.5 ක්). 2010 වසරේ දී මෙම මූලාශ්‍රයන්ගෙන් ඉපයූ ආදායම රුපියල් බිලියන 118.2 ක් වන අතර, එය 2009 වසරේ පැවති රුපියල් බිලියන 107.1 සමඟ සැසඳීමේ දී රුපියල් බිලියන 11.1 ක වර්ධනයක් පෙන්නුම් කරයි. සේ.අ.අ. සතුව පැවති රජයේ සුරැකුම්පත්හි කරන ලද ආයෝජනයන්ගේ බර තබන ලද සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතිකය සියයට 13.4 ක් වූ අතර, සුරැකුම්පත්වල වාර්ෂික ඵලදා අනුපාතය විවිධ කල්පිරීම් කාලපරාසයන් තුළ සියයට 10.6 හා සියයට 14.5 යන අනුපාතයන් අතර විචලනය විය. ව්‍යාපාර කොටස් වල ආයෝජනය කිරීම තුළින් ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ ලෙස 2010 වසර තුළ දී රුපියල් මිලියන 1,664 ක් උපයන ලද අතර, 2009 වසරේ දී එම ආදායම රුපියල් මිලියන 348 ක් විය. කොටස් වෙළෙඳපොළ තුළ ඇති වූ වර්ධනය තුළින් උපයාගත් ප්‍රතිලාභ මෙම වර්ධනයට හේතු විය (සංඛ්‍යා සටහන II-3). සමස්තයක් වශයෙන් 2009 වසරේ දී සියයට 16 ක් වූ ආයෝජන

කළඹ මත වූ ප්‍රතිලාභ අනුපාතිකය, 2010 වසරේ දී සියයට 15 ක් දක්වා පහත වැටුනි. 2010 වර්ෂය තුළ රජයේ සුරැකුම්පත් සඳහා වූ පහළ පොලී අනුපාතික මෙම තත්වයට හේතු විය.

**සංඛ්‍යා සටහන II-3**

**ආයෝජන මගින් ලද ආදයම්**

| ආදායම් මූලාශ්‍රය | 2009 | | 2010 | |
|---|---|---|---|---|
| | රු. මිලියන | දායකත්වය (%) | රු. මිලියන | දායකත්වය (%) |
| පොලී | 79,810 | 72.9 | 89,165 | 73.5 |
| ක්‍රමක්ෂය ලාභ | 27,337 | 24.9 | 29,061 | 24.0 |
| ප්‍රාග්ධන ලාභ - රජයේ සුරැකුම්පත් | 594 | 0.5 | 874 | 0.7 |
| ප්‍රාග්ධන ලාභ - ව්‍යාපාර කොටස් | 215 | 0.2 | 1,054 | 0.9 |
| ලාභාංශ | 133 | 0.1 | 610 | 0.5 |
| වෙළෙඳපොළ මිලට අගය කිරීමේ ලාභ/(පාඩු) | 1,346 | 1.2 | 106 | 0.1 |
| වෙනත් | 182 | 0.2 | 386 | 0.3 |
| **එකතුව** | **109,617** | **100.0** | **121,256** | **100.0** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහබැංකුව

**සංඛ්‍යා සටහන II-4**

**2010 -12-31 දිනට රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹෙහි කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | වටිනාකම රු. මිලියන | දායකත්වය (%) | බර තැබූ සාමාන්‍ය වාර්ෂික ඵලදා අනුපාතය (%) |
|---|---|---|---|
| වසරට වඩා අඩු | 193,810 | 22.5 | 14.5 |
| වසර 1-2 | 374,991 | 43.5 | 14.4 |
| වසර 3-4 | 197,615 | 22.9 | 10.6 |
| වසර 4 ට වැඩි | 94,925 | 11.1 | 12.2 |
| **එකතුව** | **861,341** | **100.0** | **13.4** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහබැංකුව

### (iii) වියදම

2010 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 824 ක් වූ අතර, එය පෙර වසරේ වියදම වූ රුපියල් මිලියන 763.1 හා සසඳන විට සියයට 8 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී (සංඛ්‍යා සටහන II-5). 2010 වසර සඳහා වූ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම එහි දළ ආදායමින් සියයට 0.68 ක් ලෙස වාර්තා විය. ඒ අනුව, අරමුදලේ සමස්ත වියදම එහි දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවීම අරමුදලේ විශේෂ ලක්ෂණයක් විය.

**සංඛ්‍යා සටහන II-5**

**මෙහෙයුම් වියදම්**

| අයිතමය | 2009 රු.මිලියන | 2010 රු.මිලියන | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| සේවක පිරිවැය | 370.2 | 414.3 | 11.9 |
| පරිපාලන වියදම් | 357.0 | 368.1 | 3.1 |
| වෙනත් වියදම් | 35.9 | 41.6 | 15.9 |
| **එකතුව** | **763.1** | **824.0** | **8.0** |
| **මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **0.70** | **0.68** | **(0.02)** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහබැංකුව

## 8.3 සාමාජික ගිණුම් ශේෂ සඳහා පොලිය ගෙවීම

අරමුදලේ සාමාජිකයන් වෙත 2010 වර්ෂය සඳහා වූ පොලිය වශයෙන් බැර කිරීමට වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 96,562 කි (සංඛ්‍යා සටහන II-6). ඒ අනුව, අරමුදලේ සාමාජිකයන් වෙත 2010 වර්ෂය සඳහා සියයට 12.5 ක පොලී අනුපාතිකයක් ගෙවීමට අරමුදල සමත් වූ අතර, එය වර්ෂය තුළ ආර්ථිකයේ පැවති අනෙකුත් පොලී අනුපාතයන් හා සසඳන විට ඉහළ අගයක් පෙන්නුම් කරන ලදී.

**සංඛ්‍යා සටහන II-6**

**සාමාජිකයන්ට ගෙවන ලද පොලී**

| අයිතමය | 2009 රු. මිලියන | 2010 රු. මිලියන | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| දළ ආදායම | 109,617 | 121,256 | 10.6 |
| මුළු මෙහෙයුම් වියදම් | 763 | 824 | 8.0 |
| ආදායම් බදු | 7,604 | 8,987 | 18.2 |
| සාමාජිකයන්ට බෙදාහැරීම සඳහා ඇති ශුද්ධ ආදායම | 101,690 | 111,463 | 9.6 |
| වසර තුළ දී සිදුකල ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය | 1,656 | 1,901 | 14.8 |
| සාමාජිකයන් වෙත බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම (වසර තුළ දී ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය අඩු කළ පසු) | 100,034 | 109,562 | 9.5 |
| සංචිත වලින් / (සංචිත වලට) මාරුකිරීම | (9,325) | (13,000) | 39.4 |
| සංචිත වලින් / (සංචිත වලට) මාරු කිරීමෙන් පසු සාමාජිකයන්ට බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම | 90,709 | 96,562 | 6.5 |
| සාමාජික ශේෂ සඳහා පොලිය | 90,691 | 96,268 | 6.1 |
| ඉදිරියට ගෙන යන ලද ශේෂය | 18 | 294 | 1,533.3 |
| සාමාජික ශේෂ සඳහා ගෙවන ලද පොලී අනුපාතය | 13.75 | 12.50 | (1.25) |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහබැංකුව

**සංඛ්‍යා සටහන II-7**

**සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතික**

| වසර | ගෙවන ලද පොලී අනුපාතිකය (%) | සඵල පොලී අනුපාතිකය[1] (%) |
|---|---|---|
| 2000 | 11.50 | 11.69 |
| 2001 | 11.50 | 11.69 |
| 2002 | 12.10 | 12.26 |
| 2003 | 12.00 | 12.07 |
| 2004 | 9.50 | 9.59 |
| 2005 | 9.00 | 9.13 |
| 2006 | 10.10 | 10.30 |
| 2007 | 11.20 | 11.40 |
| 2008 | 13.20 | 13.44 |
| 2009 | 13.75 | 13.92 |
| 2010 (අ) | 12.50 | 12.65 |

(අ) ඇස්තමේන්තුගත

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහබැංකුව

**සංඛ්‍යා සටහන II-8**

**නිවාස ණය සේවාව**

| වසර | නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව | අනුමත කළ ණය ප්‍රමාණය රු.මිලියන | අනුමත ණය දෙන ආයතන වෙත මුදාහළ මුදල, රු.මිලියන |
|---|---|---|---|
| 2000 | 12,938 | 1,648 | 262 |
| 2001 | 16,066 | 2,091 | 381 |
| 2002 | 19,502 | 2,673 | 541 |
| 2003 | 18,689 | 2,792 | 670 |
| 2004 | 14,307 | 2,452 | 735 |
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 (අ) | 13,848 | 4,512 | 2,093 |
| **එකතුව** | **160,957** | **30,543** | **10,644** |

(අ) ඇස්තමේන්තුගත

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහබැංකුව

## 8.4 සාමාජික ගිණුම් ප්‍රකාශන

2010 වසරේ පළමු අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සේවායෝජකයන් මගින් 2010 වසරේ දෙසැම්බර් මාසය තුළ දී සාමාජිකයන් වෙත නිකුත් කරන ලදී. 2010 වසරේ දෙවන අර්ධ වාර්ෂිකයට අදාළ ගිණුම් ප්‍රකාශන 2011 ජුනි මස අවසානය වනවිට නිකුත් කොට අවසන් කිරීමට කටයුතු පිළියෙල කර ඇත.

## 8.5 සාමාජිකයින් සඳහා වූ නිවාස ණය පහසුකම

අරමුදලේ සාමාජිකයන් හට සිය සේ.අ.අ. ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා ගැනීමේ යෝජනා ක්‍රමය 1998 වර්ෂයේ දී හඳුන්වා දුන් අතර, එම ණය ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන සහ මූල්‍ය සංස්ථාව, සමූපකාර ග්‍රාමීය බැංකු සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යන සහභාගිත්ව ණය දෙන ආයතන මගින් ලබා ගැනීමට හැකි වේ. එම යෝජනා ක්‍රමය යටතේ අරමුදලේ සාමාජිකයන් වෙනුවෙන් ශේෂ සහතික නිකුත් කිරීමේ කාර්යය 2010 වර්ෂය තුළ දී ද ක්‍රියාත්මක කරන ලදී. වර්ෂය තුළ දී මෙම ව්‍යාපෘතිය යටතේ ශේෂ සහතික 13,848 ක් අදාල ආයතන වෙත නිකුත් කරන ලද අතර, අනුමත කරන ලද සමස්ත නිවාස ණය ප්‍රමාණය රුපියල් මිලියන 4,512 කි (සංඛ්‍යා සටහන II-8). මෙම ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂයේ දී වූ ණය පැහැර හැරීම වෙනුවෙන් අරමුදල විසින් රුපියල් මිලියන 2,093 කට ආසන්න මුදල් ප්‍රමාණයක් සාමාජික ගිණුම් වලින් අඩුකර සහභාගිත්ව ණය දෙන ආයතන වෙත ප්‍රේෂණය කරන ලදී.

## 8.6 මහජනතාව දැනුවත් කිරීම

සේ.අ.අ දෙපාර්තමේන්තුව කම්කරු දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ඇතිව සාමාජිකයන් මුහුණ දෙන ගැටලු පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා යාපනය දිස්ත්‍රික්කයේ ජංගම සේවා දෙකක් ද, මස්කෙලිය, මඩකලපුව සහ වව්නියා යන ප්‍රදේශවල ජංගම සේවාවන් එක බැගින්ද පවත්වන ලදී. 2010 වර්ෂයේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව දැයට කිරුළ හා මානව සම්පත් සේවා සපයන්නන්ගේ ප්‍රදර්ශනය යන මහජන ප්‍රදර්ශන දෙකකට ද සහභාගි විය. ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ ජාත්‍යන්තර මානව සම්පත් සම්මන්ත්‍රණය හා මානව සම්පත් සේවා සපයන්නන්ගේ ප්‍රදර්ශනයේදී සේ.අ.අ. දෙපාර්තමේන්තුව 2010 වර්ෂයේ වඩාත්ම තොරතුරු රැගත් ප්‍රදර්ශන කුටියට හිමි සම්මානය දිනා ගැනීමට සමත් විය. තවද, 2010 වර්ෂයේ දී, ප්‍රථම වරට සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සියලුම දිස්ත්‍රික් කම්කරු නිලධාරීන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඊට සම්බන්ධ නිලධාරීන් සඳහා එක් දින වැඩමුළුවක් සංවිධානය කරන ලද අතර, සියලුම දිස්ත්‍රික් නියෝජනය කරමින් 150 කට වඩා වැඩි නිලධාරීන් පිරිසක් එයට සහභාගි විය.

## 8.7 පද්ධති සංවර්ධනය

අරමුදලෙහි දැනට පවත්නා තොරතුරු තාක්ෂණ පද්ධතිය මැදිකාලීනව ස්වයංක්‍රීය බැංකු ආකෘතියකට වෙනස් කිරීමෙන් සේ.අ.අ. සාමාජිකයන්ට හා සේවායෝජකයන්ට සපයනු ලබන සේවාවන්ගේ කාර්යක්ෂමතාවය හා සඵලතාවය වර්ධනය කිරීමේ අරමුණින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීමේ පියවර කිහිපයක් 2010 වසරේ දී ක්‍රියාත්මක කරන ලදී. මූලිකව, 2010 වසර මැද භාගයේ දී නව ලෙජර පද්ධතියක් හඳුන්වා දුන් අතර, එහි සජීවී ක්‍රියාකාරීත්වය 2011 ජනවාරි 01 දින සිට ආරම්භ කරන ලදී.

[1] සඵල පොලී අනුපාතිය = සාමාජිකයන්ට ගෙවූ පොලිය/ [ (වසර ආරම්භයේ සාමාජික ගිණුම් ශේෂය + වසර අවසානයේ සාමාජික ගිණුම් ශේෂය) / 2 ]

නව ලෙජර පද්ධතිය තුළ සියලුම ගණුදෙනු කේන්ද්‍රීයව වාර්තාගත වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. පද්ධතියේ ක්‍රියාවලිය ඉතා ඉහල මට්ටමකින් ඒකාබද්ධ කිරීමට අවශ්‍ය පහසුකම් සපයයි. මානව මැදිහත්වීම අවම වීම හේතුවෙන් මෙමඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ දත්ත නිරවද්‍යතාවය ඉහල මට්ටමකින් පවත්වා ගත හැකිවේ. එමෙන්ම සාමාජිකයා ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය මගින් හඳුනා ගැනීමේ පහසුකම ද නව පද්ධතිය විසින් සපයනු ලැබේ.

### 8.8 සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම

නව තොරතුරු තාක්ෂණ පද්ධතිය පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීම සඳහා සෑම සාමාජිකයෙකු සඳහාම ඒකීය හඳුනාගැනීමේ අංකයක් ලබා දීම මඟින් සාමාජිකයා කේන්ද්‍රගතවූ දත්ත ගබඩාවක් (Member Centric Database) පවත්වා ගැනීම වැදගත් වේ. සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධවීමෙන් සිදුකල ප්‍රධාන ව්‍යාපෘති අතරින් එකකි. එහිදී සේ.අ.අ. සාමාජිකයන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි නම සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කරන අතර, ජා.හැ.ප. අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය ලෙස භාවිතා කිරීම සිදු වේ. මෙම දත්ත ගබඩාව වැඩිදියුණු කිරීමේ ඉතා වැදගත් ලක්ෂණයක් වනුයේ ආයතන දෙකටම සේ.අ.අ. සාමාජික ගිණුම් පවත්වාගෙන යාම සඳහා පොදු දත්ත ගබඩාවක් ලෙස මෙය භාවිතා කළ හැකි වීමයි.

2010 වසර අවසන් වනවිට මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරී සාමාජිකයන් 800,000 කට ආසන්න ප්‍රමාණයකගේ ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු රැස්කර ගත් අතර, ඉන් සියයට 77 කට පමණ ඒකීය හඳුනාගැනීමේ අංකයන් ලබාදී ඇත. රැස්කරගත් සාමාජික තොරතුරු තුළින් නව සාමාජික ලේඛනයක් (පොදු දත්ත ගබඩාව) නිර්මාණය කරන ලදී. තවද, මේ දක්වා සිය ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු ඉදිරිපත් කර ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි නොවූ සාමාජිකයන්ගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා දත්ත රැස්කිරීමේ නව ක්‍රමවේදයක් ආරම්භ කරන ලදී. 2010 නොවැම්බර් මස 01 දිනෙන් පසුව සේ.අ. අරමුදලට සම්බන්ධවන සාමාජිකයන් තත්කාලීනව ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ද මේ සමඟම ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව සෑම සේවායෝජකයකුම 2010 නොවැම්බර් මස 01 දිනෙන් පසුව අලුතින් බඳවා ගන්නා සේවානියුක්තිකයන්ගේ ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු ඔවුන්ගේ ආරම්භක දායක මුදල් පිළිබඳ තොරතුරු ද සමඟ සේ.අ.අ. දෙපාර්තමේන්තුවට සැපයිය යුතු වේ.

එමෙන්ම, සාමාජිකයන්ට තමන්ට හිමි සියලුම සාමාජික ගිණුම් පිළිබඳ තොරතුරු ඒකීය හඳුනාගැනීමේ අංකයක් යටතේ විමසීම පහසුකිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය යටතේ තොරතුරු සැපයූ සාමාජිකයන්ට හිමි අර්ථසාධක ගිණුම් සියල්ලම ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංකයට සම්බන්ධ කිරීමට කටයුතු සලසා ඇත. මෙම ව්‍යාපෘතියේ අවසාන අරමුණ වනුයේ සමස්ත සාමාජිකයන්ගේ තොරතුරු එක්රැස් කර ඔවුන් ජාතික හැඳුනුම්පත් අංකය යටතේ ලියාපදිංචි කිරීම වන අතර, අක්‍රීය සාමාජිකයන්ගේ තොරතුරු එක්රැස්කිරීම ද 2011 වර්ෂයේ දී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

### 8.9 විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ව්‍යාපෘතිය

වර්තමානයේ ක්‍රියාත්මක වන 'සී' වාර්තා සහ 'සී3' වාර්තා මගින් සාමාජික දායක මුදල් ගෙවීම් සඳහා වූ තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා අදාළ තොරතුරු විද්‍යුත් මාධ්‍යයෙන් (E- Returns) ලබා ගැනීමේ විශේෂ ව්‍යාපෘතියක් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත. නව ක්‍රමය (electronic media) මගින් සාමාජික තොරතුරු සැපයීමට කැමති සියලුම සේවායෝජකයින්ට මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වීමට ආරාධනය කරනු ලැබේ. විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් තොරතුරු ලබා ගැනීමේ නව ක්‍රමය මගින් මෙතෙක් පැවති ලේඛන මගින් තොරතුරු ලබාගැනීමේ ක්‍රමයේ පැවති ගැටලු අවම කර ගැනීමට හැකියාව ලැබී ඇත. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ වන සේවායෝජකයින්ට අරමුදල වෙත කරනු ලබන ගෙවීම් සිය බැංකුව වෙත කරනු ලබන ස්ථාවර නියෝගයක් මගින් මාසිකව සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට සෘජුවම ප්‍රේෂණ කිරීමේ පහසුකම ද සලසා ඇත.

විද්‍යුත් මාධ්‍යයෙන් තොරතුරු රැස්කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව සේවායෝජකයින් දැනුවත් කිරීමේ වැඩ සටහන් 2010 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව දැනුවත් කිරීමේ වැඩසටහන් 13 ක් වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2009 වර්ෂය අවසාන වනවිට මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව සිටි සේවායෝජකයින් සංඛ්‍යාව 585 සිට 2010 වර්ෂය අවසන් වනවිට 888 ක් දක්වා වර්ධනය විය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ වී ඇති සේවායෝජකයන්, වර්තමානයේ අරමුදලෙහි සමස්ත දායක මුදල් ලැබීම් වලින් සියයට 18 ක් නියෝජනය කරනු ලැබේ. විද්‍යුත් මාධ්‍ය හරහා තොරතුරු සම්පාදනය (E-Return) සහ සෘජු ප්‍රේෂණ (Direct Debit) මගින් මුදල් ගෙවීම යන කාර්යයන් දෙකම සිදුකරනු ලබන සේවායෝජක සංඛ්‍යාව 2009 වසරේදී 202 ක් වූ අතර, 2010 වසර අවසාන වනවිට එය 246 දක්වා වර්ධනය විය. 2010 අවසාන විට සෘජු ප්‍රේෂණ මගින් අරමුදල වෙත එවන ලද දායක මුදල් ප්‍රමාණය සමස්ත දායක මුදල් ලැබීම්වලින් සියයට 2.5 ක ප්‍රමාණයක් නියෝජනය කරන ලදී.

### 8.10 ඡායාස්ථගත පිටපත් ලබා ගැනීමේ ව්‍යාපෘතිය (Image Scanning Project)

විද්‍යුත් තොරතුරු කළමනාකරණ පද්ධතියක් ඇති කිරීම සඳහා වූ ඡායාස්ථගත පිටපත් ලබා ගැනීමේ ව්‍යාපෘතියෙහි ශක්‍යතා අධ්‍යයනය 2010 වසර තුළ දී නිම කරන ලදී. 2011 වර්ෂය තුළ දී ආරම්භ කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය මගින් අරමුදලේ සාමාජික තොරතුරු විද්‍යුත් මාධ්‍යයෙන් රැස්කර තබා ගැනීමට හැකිවනු ඇත. යෝජිත ව්‍යාපෘතිය යටතේ සාමාජිකයින්ගේ ප්‍රධාන ලිපිගොනු විද්‍යුත් මාධ්‍යයෙන් ඡායාගතකොට ලේඛණාරක්ෂණය කරනු ලැබේ. මෙමගින් දත්ත ගබඩා කිරීම, හැසිරවීම, ආරක්ෂා කිරීම සහ භාවිතා කිරීම සඳහා ගතවන කාලය සහ පිරිවැය අවම කර ගත හැකි වේ.

## 9. විනිමය පාලන

1953 අංක 24 දරන විනිමය පාලන පනත (සංශෝධිත) යටතේ රජයේ නියෝජිතවරයා වශයෙන් මහ බැංකුව වෙත පවරන ලද විනිමය පාලන කටයුතු සම්බන්ධ කාර්යභාරයන් විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2010 ප්‍රතිපත්ති ඉදිරි දැක්මෙහි ප්‍රසිද්ධ කරන ලද අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා වර්ෂය තුළ විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමේ දී, එම දෙපාර්තමේන්තුව විසින් උපාය මාර්ගික යාන්ත්‍රණයක් අනුගමනය කරන ලදී. විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් තම කටයුතු සැලසුම් කිරීමේ දී රටේ ආර්ථික පරිසරයේ සංවර්ධනයන් පිළිබඳව සළකා බලන ලදී.

වර්ධනය වූ සාර්ව ආර්ථික තත්ත්වයන්, විශේෂයෙන්ම උද්ධමනයේ අඩුවීම, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයේ වර්ධනයන්, විදේශ සංචිතයන් වර්ධනය වීම සහ පොලී අනුපාතික අඩුවීම සහ දේශපාලන ස්ථායීතාවය රටේ විදේශ විනිමය පාලන ලිහිල් කිරීම සඳහා සතුටුදායක ආර්ථික පරිසරයක් නිර්මාණය කරන ලදී. ඒ අනුව, 2010 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාග්ධන ගිණුම තවදුරටත් විවෘත කිරීමට හා ජංගම ගිණුම් ගනුදෙනු මත පනවා තිබූ ඇතැම් බාධකයන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තා ලදී. ඒ අතරතුර, මෙම ලිහිල් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙළෙඳපොළ සහභාගිවන්නන් සඳහා නව විදේශ විනිමය ගිණුම් කිහිපයක් හඳුන්වා දෙන ලදී. මෙකී ක්‍රියාමාර්ගයන් රටේ ඉහළ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමටත් ජාත්‍යන්තර ආයෝජකයන්ගේ විශ්වාසය නැංවීමටත් උපකාරී වනු ඇත.

මීට අමතරව, 2010 වර්ෂය තුළ විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් එදිනෙදා කරගෙන යන කටයුතු වන බලයලත් වෙළෙඳුන් සහ විදේශ විනිමය ගනුදෙනුවල නිරතවන්නන් වෙත විධානයන්/මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම, විදේශ විනිමය ගනුදෙනු සඳහා අනුමැතීන් ප්‍රදානය කිරීම, විදේශ විනිමය ගනුදෙනු සුපරීක්ෂණය සහ විනිමය පාලන පනතේ වගන්ති උල්ලංඝනය වීම් සම්බන්ධව විමර්ශන කටයුතු සිදුකරන ලදී.

### 9.1. ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනු ලිහිල් කිරීම

**(අ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද රුපියල්වලින් මිල කරන ලද ණයකර හුවමාරු කිරීමට අවසර ලබාදීම (2010 ඔක්තෝබර් 01 දිනැති ගැසට් පත්‍ර අංක 1673/43):** විනිමය පාලකතුමා විසින් විනිමය පාලන පනතේ (423 වන අධිකාරිය) 7,10 සහ 11 වන වගන්ති යටතේ නියම කළ පරිදි, නාගරික සංවර්ධන අධිකාරියට *(UDA)* ඔවුන්ගේ සංවර්ධන කටයුතු සඳහා අරමුදල් එක්රැස් කිරීමට හැකිවනු පිණිස රුපියල්වලින් මිල කරන ලද ණයකර විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාවලට, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්ට සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයන්ට නිකුත් කිරීමට අවසරය ප්‍රදානය කරන ලදී.

**(ආ) දේශීය සමාගම් විසින් නිකුත්කරනු ලබන රුපියල්වලින් මිල කරන ලද ණයකරවල ආයෝජනය කිරීම සඳහා විදේශිකයන්ට අවසර ලබාදීම (2010 නොවැම්බර් 22 දිනැති ගැසට් පත්‍ර අංක 1681/11):** වර්ධිත බැඳුම්කර වෙළෙඳපොළෙහි වාසිදායක තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සහ ආයෝජන පදනම පුළුල් කිරීමේ මෙන්ම ද්විතීය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාව වැඩිකිරීමේ අරමුණින් යුතුව විදේශිකයන්ට රුපියල්වලින් නිකුත් කරන ලද ණයකරවල ආයෝජනය කිරීමට අවසර ලබා දීමට තීරණය කර ඇති අතර, එවන් සහභාගිත්වයක් මගින් දේශීය වෙළෙඳපොළෙහි පොලී අනුපාතිකයන්ගේ ස්ථාවර හා ක්‍රමික අඩුවීමකට දායකත්වය ද ලබාදෙනු ඇත.

ඒ අනුව, විනිමය පාලකතුමා විසින් විනිමය පාලන පනතේ (423 වන අධිකාරය) 10,11,15 සහ 30 (5) වගන්ති යටතේ නියම කළ පරිදි, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත අනුව විශේෂයෙන් සඳහන් කරන ලද ව්‍යාපාර ආයතනයක් ලෙස වර්ගීකරණය කර ඇති සමාගමක ශ්‍රී ලංකා රුපියල්වලින් නියම කර ඇති පරිවර්ත්‍ය හෝ පරිවර්ත්‍ය නොවන, ගෙවා නිදහස් කළ හැකි හෝ ගෙවා නිදහස් කළ නොහැකි ණයකර විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාවලට, අනේවාසික පුද්ගලයන්ට සහ අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට නිකුත් කිරීම සහ පැවරීම සඳහා අවසරය ප්‍රදානය කරන ලදී.

**(ඇ) සමාගම්වලට විදේශ මූලාශ්‍රවලින් ණය ලබාගැනීම සඳහා කඩිනමින් අවසර ලබාදීම:** ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ඉහළ වර්ධන වේගය ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාවට ආමුඛ විදේශ ආයෝජන ලැබීම වැඩි කරගත යුතු අතර, ඒ සඳහා සාපේක්ෂ වශයෙන් අඩු පිරිවැයක් යටතේ ව්‍යාපාරවල මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා විකල්ප මාර්ග සකස් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, විවිධාකාරයේ ව්‍යාපාර කටයුතුවල නිරත සමාගම්වලට එම සමාගම් විදේශ විනිමය උපයන්නන් වේද යන කාරණාව නොසළකා හරිමින් විදේශ මූලාශ්‍රවලින් ණය ලබාගැනීම සඳහා අවසර ලබාදෙන ලදී.

මෙම නිර්දේශය, දේශීය වෙළෙඳපොළ තුළ අරමුදල් සඳහා වන පීඩනය සමනය කරන අතර රටේ දේශීය ආර්ථික කටයුතු ප්‍රසාරණය කිරීමට හැකි අවස්ථාද වැඩි කරනු ඇත.

**(ඈ) විදේශීය සමාගම්වලට ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථාන ආරම්භ කිරීම සඳහා අවසර ලබාදීම (2010 නොවැම්බර් 22 දිනැති ගැසට් පත්‍ර අංක 1681/10):** බොහෝ විදේශීය සමාගම් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථාන පිහිටුවීමට විශාල උනන්දුවක් දක්වති. එසේම, විදේශීය සමාගමක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවීම, විනිමය පාලන පනත යටතේ නිකුත් කළ රෙගුලාසිවලට අනුකූල විය යුතු බව සමාගම් පනතේ දක්වා ඇත. කෙසේ වුවත්, එවැනි ව්‍යාපාරික ස්ථාන සංස්ථාපනය

කිරීම, නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ගෙන ඒම, අතිරික්ත අරමුදල් නැවත ඔවුන්ගේ රටවලට ගෙනයාම සහ වෙනත් බාහිර ප්‍රේෂණ කිරීම් නියාමනය කිරීම සඳහා පැහැදිලි සහ පහසු ක්‍රියාදාමයක් නොමැත.

ඒ අනුව, රටතුළට සිදුකරන සෘජු විදේශීය ආයෝජන සඳහා තවදුරටත් පහසුකම් සැලසීමේ අරමුණ පෙරදැරිව විනිමය පාලන පනතේ 48 වැනි වගන්තිය සමග කියවෙන 29 C වගන්තිය සහ 30 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තිය යටතේ, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ "විදේශීය සමාගමක්" ලෙස ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සමාගම්වලට ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා අවසරය ප්‍රදානය කරන ලදී.

### 9.2. ජංගම ගිණුම් ගනුදෙනු මත වූ බාධක ඉවත් කිරීම

**(අ) ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවල ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගැනීමට අවසරය (2010 මාර්තු 11 දිනැති ගැසට් පත්‍ර අංක 1644/26):** විනිමය පාලන පනතේ 48 වැනි වගන්තිය සමග කියවෙන 6 AA වගන්තිය සහ 8 වැනි වගන්තියේ 1 උප වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාව තුළ නේවාසිකව සිටින පුද්ගලයින්ට සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් හෝ ආයතනවලට ශ්‍රී ලංකාවෙන් පිටත ඕනෑම බැංකුවක විදේශ මුදල් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීමට හෝ එම ගිණුම් වසා දැමීමට පොදු අවසරය ප්‍රදානය කරන ලදී.

**(ආ) විදේශ මුදලින් සිදුකරන ඉදිරි ගිවිසුම් සඳහා අවසරය පුළුල් කිරීම:** ආනයන සහ අපනයන කටයුතුවල නියැලි ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීම සහ විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් වන විනිමය අවදානම්වලට ඔවුන්ගේ නිරාවරණය වීම සීමාකිරීම පිණිස, විදේශ මුදලින් සිදුකරන ඉදිරි ගිවිසුම් සඳහා පවතින සීමාවන් ඉවත් කරන ලදී.

**(ඇ) විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම *(SFIDA)*** අනේවාසිකයන්ගේ විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් *(SFIDA)* සහ එවැනි අනේවාසිකයෙකු විසින් ශ්‍රී ලංකාවේ අක්වෙරළ ඒකකවල පවත්වාගෙන යනු ලබන ගිණුම් අතර අරමුදල් හුවමාරු කිරීමට අවසරය ප්‍රදානය කරන ලදී.

**(ඈ) පූර්ව ගෙවීම් පදනම මත සිදුකරන ආනයනයන් මත වන ආන්තික තැන්පතු අවශ්‍යතා:** රටේ ඉහළ ගිය බාහිර සංචිත තත්ත්වය සලකා බැලීමෙන් අනතුරුව තෝරාගත් පාරිභෝගික භාණ්ඩ ආනයනයන්හි ඉන්වොයිස් අගය මත වන 100% ක ආන්තික තැන්පතු අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

**(ඉ) එතෙර ගමන් කරන ශ්‍රී ලාංකිකයන්ට විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම:** එතෙර ගමන් කරන ශ්‍රී ලාංකිකයන් සඳහා ලබාදෙනු ලබන ගමන් දීමනාවේ කොටසක් වශයෙන් නිකුත් කරනු ලබන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය, ඇ.එ.ජ.ඩොලර් 2000 සිට ඇ.එ.ජ.ඩොලර් 2500 හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍ය වන ප්‍රමාණය දක්වා වැඩි කරන ලදී.

**(ඊ) විනිමය පාලන පනතේ 7, 10, 11, 15 සහ 30 (5) වගන්ති ප්‍රකාර අවසරය (2010 දෙසැම්බර් 21 දිනැති ගැසට් පත්‍ර අංක 1685/2):** 2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14 දරන රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) පළකරන ලද විනිමය පාලන පනත යටතේ වූ දැන්වීමේ බැහැර කිරීම් යටතේ (iv) අයිතමයට පසුව "ආරක්ෂක කළමනාකරණය, තක්සේරුකරණය සහ තනි පුද්ගලයන්ට හෝ පෞද්ගලික ආයතනයන්ට උපදේශන සැපයීම ඇතුළු ආරක්ෂක සේවා සැපයීම" යන්න ඇතුළත් කිරීමෙන් සහ "කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම" යන වචන වෙනුවට "සුරැකුම්පත් ආයෝජන ගිණුම" යන වචන ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කෙරේ.

### 9.3. නව ගිණුම් හඳුන්වා දීම

**(අ) සුරැකුම්පත් ආයෝජන ගිණුම *(SIA)*:** ආයෝජකයන් විසින් ආයෝජන මාර්ග තෝරාගැනීමේ දී පවතින සංකීර්ණභාවය ඉවත් කිරීම පිණිස කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම *(SIERA)*, භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුම *(TIERA)*, භාණ්ඩාගාර බිල්පත් ආයෝජන බාහිර රුපියල් ගිණුම *(TIERA-2)* සහ භාණ්ඩාගාර බැඳුම්කර/බිල්පත් ආයෝජන බාහිර රුපියල් ගිණුම- දේශාභිමානී *(TIERA-D)* ඒකාබද්ධ කරමින් සුරැකුම්පත් ආයෝජන ගිණුම *(SIA)* හඳුන්වා දෙන ලදී.

**(ආ) අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයින් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් *(FCAISPE)*:** දේශීය ව්‍යවසායකයන් අභිප්‍රේරණය කිරීමට, විදේශීය පාර්ශ්වයන්ට ඔවුන්ගේ සේවාවන් සැපයීමට හා බදු සහන ලබමින් විදේශ ව්‍යවහාර මුදලින් වන ඔවුන්ගේ ඉපැයීම් රඳවා ගැනීමටත් අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් හා ඔවුන්ගේ සේවකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාම පිණිස බලයලත් වෙළෙඳුන්හට අවසරය ප්‍රදානය කරන ලදී.

**(ඇ) ආමුඛ ආයෝජන ගිණුම *(IIA)* :** 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති විදේශීය සමාගම්වලට ව්‍යාපාරික ස්ථානයක් හරහා ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතු කර ගෙන යාමට 2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/10 දරන ගැසට් පත්‍රය මගින් අවසරය ප්‍රදානය කර ඇති හෙයින් ශ්‍රී ලංකාව තුළ සිදුකරන ව්‍යාපාරික මෙහෙයුම් සඳහා විදේශීය සමාගම් වෙනුවෙන් ආමුඛ ආයෝජන ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන්හට අවසරය ප්‍රදානය කරන ලදී.

**(ඈ) සංචාරක හෝ ව්‍යාපාරික කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් විවෘත කිරීම සඳහා අවසර ලබා දීම:** සංචාරකයින්ගේ පැමිණීම වැඩිවීමත් සමග සංචාරක අංශය සැලකිය යුතු ලෙස පුළුල්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යාපාරික කටයුතු සඳහා ලංකාවට පැමිණෙන, අනේවාසික විජාතිකයන් සංඛ්‍යාවද සැලකිය

යුතු ලෙස ඉහළ යාමට ඉඩ ඇති බව පෙනී යයි. පෙරාතුව තාවකාලික සංචාර සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂා කරන විජාතිකයන්ට විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් පහසුකම් ලබාදී නොමැති බැවින් ඔවුන් සැලකිය යුතු අපහසුතාවයකට පත්ව ඇත.

එබැවින්, ශ්‍රී ලංකාවේ වාසය කරන හෝ ශ්‍රී ලංකාවට පැමිණීමට බලාපොරොත්තු වන අනේවාසික විජාතිකයන්ට විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් විවෘත කිරීමටත් ඒවා පවත්වාගෙන යාමටත් ඉඩ ලබා දීම පිළිබඳව අවධානය යොමුකරන ලදී. ඉහත සඳහන් කරන ලද අනේවාසිකයන්ට ඔවුන් ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාලය තුළ ඔවුන්ගේ ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂිතව සිදු කිරීමටත්, රටේ සංචාරක කර්මාන්තය හා ව්‍යාපාරික ක්‍රියාකාරකම් පුළුල් කිරීමට දායකත්වය ලබාදීම සඳහාත්, මෙම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මගින් පහසුකම් සළසනු ඇත. ඒ අනුව, බලයලත් වෙළෙඳුන්හට තාවකාලික සංචාර සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂා කරන අනේවාසික විජාතිකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් විවෘත කිරීමට සහ පවත්වා ගැනීමට අවසරය ප්‍රදානය කරන ලදී.

**(ඉ) මැණික් හා ස්වර්ණාභරණ ආනයනකරුවන්ට විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් ආරම්භ කිරීමට අවසර ලබාදීම:** ශ්‍රී ලංකාව මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදනය, වෙළෙඳාම සහ ප්‍රතිනිර්මාණය සඳහා ජනප්‍රිය මධ්‍යස්ථානයකි. සංචාරකයන් පැමිණීමේ අපේක්ෂිත වර්ධනය මැණික් හා ස්වර්ණාභරණ සඳහා වන ඉල්ලුම ප්‍රසාරණය වීමට බලපානු ඇත.

ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි අපනයනකරුවන් දිරි ගැන්වීමේ උපාය මාර්ගයක් වශයෙන් ඔවුන්ගේ විදේශ විනිමය අවශ්‍යතා සඳහා පහසුකම් සැළසීම පිණිස මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට 2008 දී අවසර ලබා දෙන ලදී. මැණික් ආනයනය, ප්‍රධාන වශයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදු කිරීම් මත සිදු කෙරෙන බැවින් මෙම පහසුකම මැණික් හා ස්වර්ණාභරණ වක්‍ර අපනයනකරුවන් සහ ආනයනකරුවන් සඳහා ද දීර්ඝ කිරීමට තීරණය කරන ලදී. මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳුන් මැණික් ආනයනය කොට එම මැණික් කැපීම, ඔප දැමීම සහ ස්වර්ණාභරණ නිර්මාණය තුළින් එහි අගය වැඩිකරනු ලැබේ. මෙම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ඉහත කාණ්ඩයන්ට අයත් ආනයනකරුවන්ට ඔවුන්ගේ ගනුදෙනු සුමට කිරීමට පහසුකම් සළසන අතරම කර්මාන්තයේ වර්ධනයට ද උපකාරී වනු ඇත.

ඒ අනුව, බලයලත් වෙළෙඳුන්හට මැණික් සහ/හෝ ස්වර්ණාභරණ අපනයනය, මැණික් සහ/හෝ ස්වර්ණාභරණ ආනයනය හෝ අපනයනකරුවන්ට නිමි හෝ නොනිමි මැණික් සහ/හෝ ස්වර්ණාභරණ සැපයීමෙහි නිරත පුද්ගලයන්, ආයතන සහ සමාගම් සඳහා "මැණික් සහ ස්වර්ණාභරණ වෙළෙඳුන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්" විවෘත කිරීමට සහ පවත්වා ගැනීමට අවසරය ප්‍රදානය කරන ලදී.

**(ඊ) ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය දූත කාර්යාල, ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සහ පවුලේ සාමාජිකයින් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හා ශ්‍රී ලංකා රුපියල්වලින් ඇතැම් බැංකු කටයුතු කිරීම සඳහා අවසර ලබාදීම:** ශ්‍රී ලංකාව විදේශයන් සමග ද්විපාර්ශ්වීය සහ බහු පාර්ශ්වීය වශයෙන් සුහද සබඳතා පවත්වා ඇති අතර, මෙම සබඳතා පවතින ආර්ථික තත්ත්වයන් යටතේ තවදුරටත් පුළුල් වෙමින් පවතී. වර්තමානයේ දී, විනිමය පාලන අරමුණු සඳහා විදේශ රාජ්‍ය දූත කාර්ය මණ්ඩල එනම් තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, කොන්සල් කාර්යාල, යුරෝපීය සංගමයේ හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ස්ථිර දූත මෙහෙයුම් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල අනේවාසිකයන් ලෙස සළකනු ලබන අතර, විදේශ ව්‍යවහාර මුදලින් ඇතැම් බැංකු ගනුදෙනුවල නිරත වීමේදී ඔවුන් විසින් විශේෂ අවසරයක් ලබා ගැනීම අවශ්‍ය කෙරේ.

ඒ අනුව, බලයලත් වෙළෙඳුන්හට ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය දූත කාර්යාල, රාජ්‍ය දූතයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFA) සහ රාජ්‍ය දූත රුපියල් ගිණුම් (DRA) විවෘත කිරීමට සහ පවත්වා ගැනීමට අවසරය ප්‍රදානය කරන ලදී.

## 9.4. විදේශයන් හි ආයෝජනය හා විදේශයන්ගෙන් ණය ලබාගැනීම සඳහා අනුමැතිය

විදේශයන් හි ආයෝජනය කිරීමට හා විදේශීය ණය ලබාගැනීම සඳහා අයදුම්පත් 76 ක් ඉදිරිපත් වී තිබූ අතර, විනිමය පාලන පනතේ අදාළ වගන්ති ප්‍රකාරව, එම අයදුම්පත් අතුරින් අයදුම්පත් 30 ක් සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අනුමැතිය පහත දැක්වෙන පරිදි ලබාදෙන ලදී.

(අ) නේවාසික සමාගම් 18 කට ප්‍රධාන වශයෙන් ආයෝජන බැංකු, වෙළෙඳාම්, භාණ්ඩ නැව්ගත කිරීම්, සිල්ලර වෙළෙඳ කටයුතු සහ සේවක මනාප කොටස් යෝජනා ක්‍රම යන ක්ෂේත්‍රයන් හි විදේශ රටවල ආයෝජනය සඳහා අවසර ලබාදෙන ලදී. එසේ අවසර ලබාදෙන ලද ආයෝජනයන්ගේ සම්පූර්ණ වටිනාකම ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 38.55 ක් විය.

(ආ) නේවාසික සමාගම් 12 ක් සඳහා දළ වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 67.21 ක ප්‍රමාණයක විදේශීය ණය මුදල් ලබාගැනීම සඳහා අවසර ලබාදෙන ලදී.

## 9.5. භාණ්ඩ නැව්ගත කරන්නන් *(Freight Forwarders)*, විදේශ විනිමය හුවමාරු කරන ආයතන *(Money Changers)* හා සීමිත බලයලත් වෙළෙඳුන්හට *(Restricted Dealers)* අවසර පත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම

පහත දැක්වෙන පරිදි භාණ්ඩ නැව්ගත කරන්නන්, විදේශ විනිමය හුවමාරු කරන ආයතන සහ සීමිත බලයලත් වෙළෙඳුන්හට බලපත්‍ර නිකුත් කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

(අ) නව සමාගම් 40 ක් භාණ්ඩ නැව්ගත කරන්නන් ලෙස ලියාපදිංචි වූ අතර, ඒ අනුව 2010 වර්ෂය අවසාන වන විට භාණ්ඩ නැව්ගත කරන්නන් ලෙස ලියාපදිංචි වූ සමාගම්වල එකතුව 341 ක් විය.

(ආ) විදේශ විනිමය මිලදී ගැනීම සඳහා නව බලපත්‍ර 08 ක් ලබා දුන් අතර, ඒ අනුව මුළු විදේශ විනිමය හුවමාරු කරන ආයතන ගණන 83 දක්වා ඉහළ යන ලදී. තවද, එ.ජ.ඩොලර් මිලියන 4 ක් වන වාර්ෂික විදේශ විනිමය මිලදී ගැනීමේ කඩඉම ඉක්මවා ගිය විදේශ විනිමය හුවමාරු කරන ආයතන 11 කට විදේශ විනිමය විකිණීම සඳහා අවසර ලබාදෙන ලදී. විදේශ විනිමය හුවමාරු කරන ආයතනවල බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ දී සලකා බලන එම ආයතන විසින් වාණිජ බැංකුවල තැන්පත් කළ යුතු අවම වාර්ෂික පිරිවැටුම් අවශ්‍යතාවය ඇ.එ.ජ.ඩොලර් 600,000 සිට ඇ.එ.ජ.ඩොලර් මිලියන 1 දක්වා 2010 ජනවාරි 01 දින සිට බලපවත්වන පරිදි වැඩි කරන ලදී.

(ඇ) තීරු බදු රහිත වෙළෙඳසැල්, සංචාරක හෝටල්, සංචාරක ආපනශාලා, සංචාරක නියෝජිතවරුන් හා මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳසැල් යනාදීන් ගෙන් සමන්විත වූ අනෙකුත් සීමිත බලයලත් විදේශ විනිමය වෙළෙඳුන් සඳහා නව බලපත්‍ර 42 ක් 2010 වසර තුළ නිකුත් කළ අතර, බලපත්‍ර 3 ක් අහෝසි කරන ලදී. ඒ අනුව, එම සීමිත බලයලත් වෙළෙඳුන් මුළු ගණන 786 දක්වා ඉහළ යන ලදී.

### 9.6 විනිමය පාලන පනතේ වගන්ති උල්ලංඝනය වීම් සම්බන්ධ විමර්ශන කටයුතු

විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ නිසි ක්‍රියාකාරිත්වය සහ විදේශ විනිමය වෙළෙඳපොළෙහි කාර්යක්ෂමතාව තහවුරු කිරීමට, එම විදේශ විනිමය වෙළෙඳුන් වෙත විනිමය පාලන පනත යටතේ නිකුත් කර ඇති නියෝග කඩ කිරීම් හා විවිධ පාර්ශ්වයන් විසින් විනිමය පාලන පනතේ විධි විධාන උල්ලංඝනය කිරීම්වලට එරෙහිව විමර්ශන කටයුතු පවත්වන ලදී.

ඒ අනුව 2010 වසර තුළ දී හේතු දක්වන ලෙස දැනුම් දීමේ ලිපි 59 ක්, දඩ මුදල් ගෙවන ලෙස දැනුම් දීමේ ලිපි 28 ක්, නියෝග කිරීමේ ලිපි 27 ක් සහ අවවාද කිරීමේ ලිපි 28 ක් නිකුත් කෙරුණු අතර විමර්ශනයන් 114 ක් අවසන් කර, වැරදිකරුවන්හට පනවන ලද දඩ මුදල් ලෙසට රු.8,942,555.37 අයකර ගන්නා ලදී. එම විමර්ශනයන් බොහොමයක් අනවසරයෙන් විදේශ මුදල් භාරගැනීම හා මිලදී ගැනීම, විනිමය පාලන පනතේ ලබා දී ඇති අවසරයන්හි දක්වා ඇති කාර්ය පටිපාටිය උල්ලංඝනය කරමින් අනේවාසිකයන්ට සුරකුම් නිකුත් කිරීම හා ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් අනේවාසිකයන්ට අනවසර විදේශ විනිමය ගෙවීම් කිරීම ආදිය හා සම්බන්ධ විය. තවදුරටත් මහජනයා වෙතින් කෙරෙන විමසීම් සහ පැහැදිලි කිරීම් 675 ක් වෙනුවෙන් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය විසින් 2010 වසරේ දී දායකත්වය සපයන ලදී.

### 9.7 වෙනත් ක්‍රියාකාරකම්

බැංකු මාර්ග හරහා විදේශ විනිමය ප්‍රේෂණය කරන්නන්ගේ විදේශ මුදල් ප්‍රේෂණය කිරීමේ කටයුත්ත ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් බලයලත් වෙළෙඳුන්හට, එකී අරමුණ සඳහා වඩාත් පහසු, කාර්යක්ෂම සහ අවම පිරිවැයක් යටතේ යාන්ත්‍රණයක් ඇති කිරීමට ඔවුන් පෙළඹවීම පිණිස වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. විනිමය පාලන රෙගුලාසීන් තවදුරටත් ලිහිල් කිරීම නිවේදනය කිරීම සඳහා පුවත්පත් සාකච්ඡාවක් පවත්වන ලදී. තවදුරටත්, මෙම ලිහිල්කරන ක්‍රියාමාර්ග පිළිබඳ බලයලත් වෙළෙඳුන් දැනුම්වත් කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් රැස්වීම් පවත්වන ලදී. විනිමය පාලනය සම්බන්ධ කටයුතු පිළිබඳ පුහුණු වැඩ සටහන් සහ සම්මන්ත්‍රණයන් සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දේශනයන් පවත්වන ලදී.

## 10. මූල්‍ය බුද්ධි ඒකකය

**2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ප්‍රකාරව, මූල්‍ය බුද්ධි ඒකකය 2006 වසරේදී පිහිටුවනු ලැබූ අතර, 2007 වසරේදී එහි පරිපාලනය මුදල් මණ්ඩලය වෙත පවරන ලදී.** මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යවලට, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදී කටයුතුවලට අරමුදල් සම්පාදනය කිරීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අනිතිකයයි නිර්වචනය කර ඇති කටයුතුවලට සම්බන්ධ විය හැකි අවස්ථාවන් අනාවරණය කර ගැනීම පිණිස මුදල් ගනුදෙනුවලට අදාල තොරතුරු රැස්කිරීම හා ලබා ගැනීම, සැක කටයුතු මුදල් ගනුදෙනුවලට අදාල විමර්ශණ සිදු කිරීම, නෛතික/බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම සඳහා අදාල නියාමන හා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට විමර්ශන සම්බන්ධ තොරතුරු හා විස්තර ලබාදීම සහ ගනුදෙනුකරු සම්බන්ධ සුපරීක්ෂාකාරී වීමට අදාළව නියමයන් හා රෙගුලාසි නිකුත් කිරීම අයත් වෙයි. 2010 වසර තුළ මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

### 10.1 තොරතුරු එක්රැස් කිරීම හා විමර්ශනය

විවිධ ආයතන විසින් වාර්තා කරන ලද තොරතුරු/දත්ත ලබා ගැනීම හා විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගන්නා මූල්‍ය බුද්ධි ඒකකය සතු මාර්ග ගත දත්ත කළමනාකරණ පද්ධතිය වන ලංකාෆින් (LankaFIN) වෙත බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය සමාගම්, කොටස් තැරැව්කාර සමාගම් හා රක්ෂණ සමාගම් විසින් මූල්‍ය බුද්ධි ඒකකය මගින් පනවන ලද අවශ්‍යතාවයන්ට අනුකූලව, එනම් රුපියල් මිලියනය සහ ඊට වැඩි හෝ විදේශ ව්‍යවහාර මුදලින් ඊට සමාන මුදල් ප්‍රමාණයක් වන මුදල් ගනුදෙනු හෝ විද්‍යුත් මුදල් ප්‍රේෂණ (ලැබෙන සහ

යැවෙන) වාර්තා කරන ලදී. ඒ අනුව පසුගිය වසර තුළදී මිලියන තුනකට වැඩි මුදල් ගනුදෙනු හෝ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා සංඛ්‍යාවක් වාර්තා වූ අතර සැක කටයුතු ගනුදෙනු වාර්තා 246 ක් වාර්තා විය. මූලික පරීක්ෂණවලින් අනතුරුව සැක කටයුතු ගනුදෙනු වාර්තා 33 වැඩිදුර විමර්ෂණය සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට හා නියාමන අධිකාරීන්ට යොමු කරන ලදී. 2010.12.31 දින වනවිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් සිදුකරණ ලද පරීක්ෂණයන් පදනම් කරගෙන නීතිපති දෙපාර්තමේන්තුව විසින් මුදල් විශුද්ධිකරණය සම්බන්ධව අධිචෝදනා පත්‍ර 2 ක් ද ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ වරද සම්බන්ධව අධිචෝදනා පත්‍ර 3 ක් ද ගොනු කරන ලදී.

### 10.2 නියාමන රාමුවේ ප්‍රවර්ධනය

අන්තර්ජාතික ප්‍රමිතීන්ට සමගාමීව, පවත්නා නීතිමය රාමුව, තවදුරටත් ශක්තිමත් කිරීමේ අදිටනින්, මූල්‍ය බුද්ධි ඒකකය අනෙකුත් පාර්ශ්වකරුවන් සමග එක්ව 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ සම්මුති පනත සහ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම ආරම්භ කොට ඇත. මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැලැක්වීම පිළිබඳ ජගත් ප්‍රමිතීන් සැලසුම් කරනු ලබන ආයතනය වන මූල්‍ය කටයුතු කාර්ය සාධන බලකාය (Financial Action Task Force) මගින් නිකුත් කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව සිදු කෙරෙන මෙම සංශෝධනයන් අදාළ නීතිමය හා නියාමන පද්ධතීන් වර්ධනය කිරීම සඳහා ඉලක්ක කර ඇත.

### 10.3 වෙනත් කටයුතු

**i) අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම**

සැක කටයුතු ගනුදෙනුවලට අදාළ විමර්ශන කටයුතු සහ චෝදනා ගොනු කිරීම උදෙසා තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය පහසු කර ගැනීමට, මූල්‍ය බුද්ධි ඒකකය 2010 වසරේදී බෙල්ජියානු මූල්‍ය තොරතුරු සැකසුම් ඒකකය (Financial Information Processing Unit of Belgium), ඕස්ට්‍රේලියානු ගනුදෙනු වාර්තා හා විශ්ලේෂණ මධ්‍යස්ථානය (AUSTRAC), බංගලාදේශ, ඉන්දියානු, සොලමන් දූපත් මූල්‍ය බුද්ධි ඒකක සහ ශ්‍රී ලංකා රේගුව යන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් 6 ක් අත්සන් කරන ලදී. ඒ අනුව, 2010 වසර අවසානයේදී අත්සන් කර ඇති මුළු අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 12 දක්වා ඉහළ යන ලදී.

**ii) ආයතනික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම හා දැනුවත් කිරීමේ වැඩ සටහන්**

බලපත්‍රලාභීවාණිජබැංකු, බලපත්‍රලාභීවිශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය සමාගම්, පොලිස් දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ආයතන හා සාමාන්‍ය පොදු ජනතාව නියෝජනය කරමින් 1100 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන්, බස්නාහිර හා මධ්‍යම පළාත් ආවරණය වන පරිදි පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩ සටහන් 15 ක් පවත්වන ලදී. මෙවන් වැඩ මුළු 5 ක් සඳහා ඕස්ට්‍රේලියානු මූල්‍ය බුද්ධි ඒකකයේ *(AU STRAC)* සහාය ලබා දුනි. මෙම වැඩ සටහන් මඟින් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම විශ්ලේෂණය කිරීම හා වාර්තා කිරීම සම්බන්ධයෙන් දැනුවත් කරන ලදී. තවද, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ (Sri Lanka Judges Institute) සහයෝගය සහිතව මූල්‍ය බුද්ධි ඒකකය 2010 වසරේදී අධිකරණ විනිසුරුවරුන් සඳහා විශේෂ වැඩමුළුවක් පැවැත් වූ අතර, ඒ සඳහා විනිසුරුවරුන් 61 දෙනෙකු සහභාගි විය.

**iii) ජාත්‍යන්තර සම්බන්ධතා**

**(අ) එග්මොන්ට් කණ්ඩායම (Egmont Group)**

මූල්‍ය බුද්ධි ඒකකයේ විමර්ශන කටයුතු සඳහා අවස්ථා 12 කදී එග්මොන්ට් කණ්ඩායමේ (මූල්‍ය බුද්ධි ඒකක 118 ක් සාමාජිකත්වය දරන සංවිධානයකි) සාමාජිකයන්ගේ සහාය ලබා ගන්නා ලදී. එලෙසම එග්මොන්ට් කණ්ඩායමේ සාමාජික රටවල් විසින් තම විමර්ශන කටයුතුවලට අදාළ සාක්ෂි එක්රැස් කිරීම සම්බන්ධයෙන් කරනු ලැබූ ඉල්ලීම් 9 ක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් පිළිගන්නා ලදී.

**(ආ) ආසියානු ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායම (Asia Pacific Group on Money Laundering)**

ආසියානු ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායමෙහි ආරම්භක සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව 2010 වසරේදී සිංගප්පූරුවේදී පැවැති 13 වන වාර්ෂික සමුළුවට සහභාගි විය. එමෙන්ම බංගලාදේශයේ පැවති ලාභ අරමුණු කර නොගත් සංවිධානයන්හි අවදානම් සහගතභාවය සහ මිනිස් ජාවාරම් ඉලක්ක කරමින් පැවති 13 වන වාර්ෂික වැඩමුළුවට ද මූල්‍ය බුද්ධි ඒකකය සහභාගි විය.

**iv) එතැන් පරීක්ෂණ පැවැත්වීම (On-site Examination)**

ගනුදෙනු වාර්තාකරණ ආයතන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සහ මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රකාශිත අනෙකුත් නියාමනවලට අනුකූල නොවීම් සහ එම ආයතනයන් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම් කටයුතුවලට පාත්‍රවීමේ අවදානම සොයා බලනු වස් මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2010 වසරේ දී එතැන් පරීක්ෂණ 3 ක් පවත්වන ලදී. ඒ අනුව අදාල විධිවිධානයන්ට පටහැනිව ගනුදෙනු වාර්තා කරන ලද එක් ආයතනයකට එරෙහිව ක්‍රියා මාර්ග ගන්නා ලදී.

# II. මූල්‍ය පද්ධති ස්ථායිතාව

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු වලින් එකක් වූ මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වාගෙන යාම සඳහා, 2007 වර්ෂයේ දී මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, සාර්ව විචක්ෂණ අවේක්ෂණ පැවැත්වීම, වාර්ෂික මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම සකස් කිරීම සහ මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ හා මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කමිටුවේ වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීම ආදිය වේ. 2010 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් කරන ලද ප්‍රධාන කාර්යයන් පිළිබඳ ලුහුඬු විස්තරයක් පහත දක්වා ඇත.

## II.1 සාර්ව විචක්ෂණ අවේක්ෂණය

මූල්‍ය අංශය කෙරෙහි ඇති පද්ධතිමය අවදානම් හඳුනා ගැනීම සහ එම අවදානම් සඳහා මුහුණ දීමට එම අංශයට ඇති හැකියාව තක්සේරු කිරීම සඳහා සාර්ව විචක්ෂණ අවේක්ෂණය පැවැත්වීම මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ. සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළෙඳපොළ වර්ධනයන් විශ්ලේෂණය සහ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනයන්හි අවදානම් අනාවරණය විශ්ලේෂණය කිරීම මේ සඳහා ඇතුළත් වේ. ප්‍රධාන මූල්‍ය ආයතනවල ශක්තිමත්භාවය සලකා බැලීම සඳහා, කාලීන පදනමක් මත විස්තීර්ණ මූල්‍ය ශක්තිමත්භාව දර්ශක සමූහයක් මූල්‍ය ස්ථායිතා දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී. බැංකුවේ අභ්‍යන්තර ප්‍රයෝජනය සඳහා වූ මූල්‍ය අංශයේ අවදානම තක්සේරු කරන වාර්තා ද මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලදී. සංස්ථාපිත අංශයේ ණය ගැතියන්ගේ මූල්‍ය ශක්තිමත්භාවය සහ ණය ආපසු පියවීමේ හැකියාව තක්සේරු කිරීම උදෙසා එම අංශය සඳහා වූ දත්ත ගබඩාවක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු ද ආරම්භ කරන ලදී. මූල්‍ය පද්ධතිය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළ හැකි සංවර්ධනයන් පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි සුපරීක්ෂාකාරීභාවය සඳහා ඉවහල් වන මූල්‍ය අංශ සහ මූල්‍ය වෙළෙඳපොළවල් ආවරණය කරගත් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් පිළියෙල කිරීම සඳහා ද මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව දායකත්වය ලබාදෙනු ලැබීය.

## II.2 ප්‍රකාශන

2009 වසරට අදාළ මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම 2010 ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. 2010 වසරට අදාළ මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම, 2010 වසරේ අවසාන කාර්තුවේ දී පිළියෙල කරනු ලැබූ අතර, එය 2011 වසරේ පළමු කාර්තුවේදී ප්‍රකාශයට පත්වීමට නියමිතය. එය මූල්‍ය පද්ධති ස්ථායිතා සමස්ත ඇගයීම සහ අවදානම් අවම කර ගැනීමේ ක්‍රම, විදේශීය සහ දේශීය සාර්ව ආර්ථික වර්ධනයන්, දේශීය මූල්‍ය වෙළෙඳපොළවල කාර්ය සාධනය, බැංකු අංශයේ කාර්ය සාධනය සහ අවදානම්, අනෙකුත් මූල්‍ය ආයතනවල වර්ධනයන් සහ අවදානම් සහ ප්‍රධාන ගෙවීම් පියවීම් පද්ධති සහ නියාමන රාමුවේ ක්‍රියාකාරීත්වය යනාදිය ආවරණය කරන පරිච්ඡේද හයකින් සහ විශේෂ සටහන් පහකින් සමන්විත වේ.

මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව 2009 මහ බැංකු වාර්ෂික වාර්තාවේ සහ "මෑතකාලීන ආර්ථික ප්‍රවණතා 2010" වාර්තාවේ මූල්‍ය අංශයේ වර්ධනය සහ ස්ථායිතාව සඳහා වූ පරිච්ඡේදයන් සකස් කිරීමේ කටයුතුවලට ද දායකත්වය ලබාදෙමින් සම්බන්ධීකරණ කටයුතුවල නියැලුණේය.

## II.3 මූල්‍ය පද්ධති ස්ථායිතාවට අදාළ කමිටුවල කටයුතු සම්බන්ධීකරණය

මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ සහ මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් 2010 වර්ෂයේ දී ද මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව නොකඩවා කටයුතු පවත්වාගෙන යන ලදී.

### (අ) මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව

මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ සභාපති වනුයේ මූල්‍ය පද්ධති ස්ථායිතාව භාරව කටයුතු කරන නියෝජ්‍ය අධිපති තුමාය. 2010 වසරේදී ප්‍රති නිර්මාණය කළ කමිටුවෙහි සාමාජිකයින් දහ අටක් සිටින අතර, එම සාමාජිකයින්, මිල ස්ථායිතාව භාරව කටයුතු කරන නියෝජ්‍ය අධිපතිතුමා, මූල්‍ය පද්ධති ස්ථායිතාව, මිල ස්ථායිතාව සහ ගෙවීම් හා පියවීම් යන අංශයන් භාරව කටයුතු කරන සහකාර අධිපතිවරුන් තිදෙනා සහ මූල්‍ය පද්ධති ස්ථායිතා, බැංකු අධීක්ෂණ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ, ගෙවීම් සහ පියවීම්, ආර්ථික පර්යේෂණ, රාජ්‍ය ණය, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු, දේශීය මෙහෙයුම් කටයුතු, තොරතුරු තාක්ෂණ, සංඛ්‍යාණ, විනිමය පාලන සහ මූල්‍ය බුද්ධි යන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් සමන්විත වේ. මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව යනු මූල්‍ය අංශය කෙරෙහි බලපාන අවදානම් හඳුනාගැනීම, එම අවදානම් අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග සාකච්ඡා කිරීම සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව වැඩි දියුණු කිරීමේ උත්සාහයන් සම්බන්ධීකරණය සඳහා වූ අන්තර් දෙපාර්තමේන්තු සාකච්ඡා වටයකි. 2010 වර්ෂයේ දී මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව රැස්වීම් වාර හතක් පවත්වා ඇත.

### (ආ) මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කමිටුව

මුදල් මණ්ඩලය විසින් 2008 වසරේ පිහිටුවනු ලැබූ මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කමිටුව, මූල්‍ය අංශයෙහි ගැටළු පිළිබඳ අදහස් සහ උපදෙස් මහ බැංකුව වෙත ලබාදීම සඳහා පෞද්ගලික අංශයේ පළපුරුදු නිලධාරීන්ගෙන් සමන්විත වේ. කමිටුවෙහි වර්තමාන සාමාජික සංඛ්‍යාව දහයක් වන අතර, 2010 වසරේ දී රැස්වීම් වාර 11 ක් පවත්වනු ලැබීය. මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කමිටුව විසින් ණය කාඩ්පත් සඳහා වන මාර්ගෝපදේශයන් මූල්‍ය සමාගම් සඳහා වන නීතිරීති, මූල්‍ය උපකරණ සඳහා වන බදුකරණයන්, අන්තර්ජාල වංචා වැළැක්වීම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මූල්‍ය සහන ලබාදීම, බැංකු තැන්පතු ග්‍රාමීය ප්‍රදේශවල නැවත ආයෝජනය, ජීවිත රක්ෂණ අංශයේ වර්ධනය සඳහා නව නිපැයුම් ක්‍රම, ඒකක භාර හා මුදල් වෙළෙඳපොළ අරමුදල් සහ කොටස් වෙළෙඳපොළ සංවර්ධනයන් යනාදිය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

## 12. අධිපති ලේකම්

ලේකම් කටයුතු, සන්ධාන කාර්යයන්, අධිපතිතුමා විසින් පවරන ලද කාර්යයන්හි පසු විපරම් කටයුතු හා ආයෝජන ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන කටයුතු යනාදිය ඉටු කිරීම තුළින් අධිපතිතුමාට අවශ්‍ය සහාය ලබාදෙමින් අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිය කටයුතු මෙම වසර තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ අනෙකුත් කාර්යයන් අතර අධිපතිතුමා හමුවීමට පැමිණෙන නිලධාරීන් හා අමුත්තන් සඳහා මුණ ගැසෙන කාල වේලාවන් වෙන් කිරීම සිදු කෙරේ. ගරු අමාත්‍යවරු, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, තානාපතිවරු, බැංකුවල හා අනෙකුත් මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන්, මාධ්‍ය ආයතන ප්‍රධානීන්, ව්‍යාපාරිකයින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ආයතනවල විදේශීය නියෝජිතයින් සමඟ මහ බැංකු අධිපතිතුමා විසින් රැස්වීම් ගණනාවක් පවත්වන ලදී. එවැනි සියළුම රැස්වීම් හා හමුවීම් සම්බන්ධීකරණය කරමින්ද ඒවාට අදාළව පසුව පැන නැගුණු කරුණු අදාළ පාර්ශ්වයන්ට සන්නිවේදනය කරමින්ද අධිපතිතුමාගේ කාර්යයන් වඩාත් පහසු ලෙස ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලදී.

අධිපතිතුමාට, එතුමාගේ විශේෂිත අමුත්තන්ට මෙන්ම බැංකුවේ විශේෂිත ආරාධිත අමුත්තන්ට සන්ධාන සේවාවන් ලබාදීමට අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී. එමෙන්ම අධිපතිතුමාගේ දේශීය හා විදේශීය නිල සංචාරයනට අදාළ සියළුම කටයුතු සංවිධානය කිරීම ද සිදු කරන ලදී. රටපුරා පිහිටි ආර්ථික වශයෙන් වඩාත් වැදගත්කමක් ඇති ස්ථාන වෙත ක්ෂේත්‍ර චාරිකාවන්ට ද අධිපතිතුමා සහභාගි විය. උතුරු හා නැගෙනහිර පළාත්වල නව සංවර්ධන වැඩ සටහන් නිරීක්ෂණය හා නව බැංකු ශාඛා හා මූල්‍ය ආයතන විවෘත කිරීම්, ව්‍යාපාරික ප්‍රජාව හා රජයේ නිලධාරීන් මුණ ගැසීම වැනි කාර්යයන් සඳහා ද අධිපතිතුමා සහභාගි විය. එවැනි සියලු සංචාරයන් සඳහා වන සන්ධාන කටයුතු හා සම්බන්ධීකරණ කාර්යයන් ඉටුකිරීමද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. මෙයට අමතරව, ශ්‍රී ලංකාවේ පැවති විවිධ රැස්වීම් හා සම්මන්ත්‍රණවල මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, විදේශීය ආයෝජන ප්‍රවර්ධන රැස්වීම් වැනි ඉහළ තලයේ ජාත්‍යන්තර රැස්වීම්වලද ප්‍රධාන ආරාධිතයා හෝ දේශකයා වශයෙන් අධිපතිතුමා සහභාගි වූ අතර, එබඳු නිල සංචාරයන් සඳහා අධිපතිතුමාගේ ගමන් සංවිධානය කිරීම හා ඒවායෙහි සාර්ථකත්වය සඳහා අවශ්‍ය තොරතුරු වාර්තා ලබාදීමද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. අධිපතිතුමා රටෙන් බැහැරව සිටින අවස්ථාවලදී මුදල් වෙළෙඳපල, විදේශීය විනිමය වෙළෙඳපල හා ආර්ථිකය පිළිබඳ සංවේදී අනෙකුත් තොරතුරු හා දත්ත කලට වේලාවට ලබාදීමට අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. එයට අමතරව, අධිපතිතුමා හා නියෝජ්‍ය අධිපතිවරුන් විසින් දායකත්වය සපයන නිල උත්සව සංවිධානය කිරීමද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

බැංකුව විසින් ප්‍රතිස්ථාපනය කර ඇති කමිටු සඳහා අධිපතිතුමා ඉල්ලා සිටින අවශ්‍ය කරන තොරතුරු ලබාදීමට අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. මෙයට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2011 - 2015 උපාය මාර්ගික සැලසුම සකස් කිරීම හා ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා ද අධිපතිතුමාට අවශ්‍ය සියලුම මෙහෙයුම් සේවාවන් ලබාදෙන ලදී. අධිපතිතුමා බැංකුවෙන් පිටත රැස්වීම් නියෝජනය කරන විට ඒවාට අවශ්‍ය දත්ත සැපයීම සඳහා ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. එලෙසම වර්ෂය තුළදී විදේශීය ආයෝජකයින් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් ඔවුන් සඳහා අවශ්‍ය ආර්ථිකය පිළිබඳ කාලීන තොරතුරු සැපයීමට අධිපති ලේකම් දෙපාර්තමේන්තුව ක්‍රියා කළේය.

වර්ෂය තුළදී දේශීය හා විදේශීය පුවත්පත් සාකච්ඡා සහ මාධ්‍ය සම්මුඛ සාකච්ඡා ගණනාවකට අධිපතිතුමා සහභාගි වූ අතර, ඒ සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කරමින් එම කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලදී.

අධිපතිතුමා විසින් අනෙකුත් දෙපාර්තමේන්තු වෙත නිකුත් කරනු ලැබූ උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න ඉතා සමීප ලෙස පසු විපරම් කිරීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එලෙසම, මූල්‍ය සමාගම්, සේවක අර්ථ සාධක අරමුදල හා බැංකු කටයුතු සම්බන්ධ මහජන විමසීම් හා ආර්ථිකය සම්බන්ධව මහජනතාව විසින් සිදු කරන ලද විමසීම්වලට පිළිතුරු සැපයීමට අධිපති ලේකම් දෙපාර්තමේන්තුව සහාය විය.

## 13. මානව සම්පත් කළමනාකරණය

පසුගිය වසරවල දී මෙන්ම 2010 වසර තුළදී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව නව කුසලතා හා දැනුම අත්පත් කර දීම තුළින් මානව සම්පත සවිබල ගැන්වීමටත්, වෘත්තීයමය හා තාක්ෂණික කුසලතාවයන් ශක්තිමත් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ අරමුණින් ඊට අවශ්‍ය පුහුණුවීම් ලබාදීමට මෙන්ම මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සපුරාගැනීම සඳහා අවශ්‍ය සේවක දායකත්වය වැඩිදියුණු කිරීම සඳහා යොමු විය. මේ සම්බන්ධයෙන්, 2010 වසර තුළදී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද මූලික කාර්යයන් අතර, නව බඳවා ගැනීම්, පුහුණුවීම් ලබාදීම, බුද්ධිමය හැකියාවන් වර්ධනය කිරීම, ඉහළ ඵලදායිතාවයක් උදෙසා සිය කාර්ය මණ්ඩලයේ ආකල්පමය වෙනසක් ඇති කිරීම, උසස්වීම් ලබාදීම, කාර්ය සාධන කළමනාකරණය, සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම, අනුප්‍රාප්ති සැලසුම් සකස් කිරීම හා සේවක අභිප්‍රේරණය යනාදිය ඇතුළත් විය. 2010 වසර තුළ සිදු කරන ලද නව බඳවා ගැනීම්වලින් අනතුරුව බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,497 ක් දක්වා ඉහළ ගිය අතර, එය 2009 වසරේ සමස්ත සේවක සංඛ්‍යාව වූ 1,263 හා සසඳන කල සියයට 19 ක වර්ධනයක් විය. විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම් හේතුවෙන් වූ සේවකයන් ඉවත් වීමේ අනුපාතය 2010 වසර තුළදී සියයට 1.9 ක් වූ අතර 2009 වසරේ දී එම අනුපාතය සියයට 3.6 ක් විය.

### 13.1 මානව සම්පත් ව්‍යුහය

නව සේවකයන් 265 දෙනෙකු බඳවා ගැනීමත් සමඟ 2010 දෙසැම්බර් වනවිට මහ බැංකු සේවයේ යෙදී සිටි සමස්ත සේවක සංඛ්‍යාව 1,497 ක් වූ අතර, මෙම සමස්ත සේවක මණ්ඩලය, මාණ්ඩලික පන්තියේ සේවකයන් 654 ගෙන්ද, මාණ්ඩලික නොවන පංතියේ සේවකයන් 666 ගෙන් ද,

සුළු සේවකයන් 169 ගෙන් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන් 08 දෙනෙකුගෙන්ද සමන්විත විය. ඒ අනුව 2009 වසරේදී අවුරුදු 45 ක් ව පැවති මහ බැංකු කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය වයස් ප්‍රමාණය 2010 දෙසැම්බර් මස අවසානය වනවිට අවුරුදු 41 දක්වා අඩු විය. එමෙන්ම අංක II-9 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි මාණ්ඩලික පංතියේ නිලධාරීන්ගෙන් සියයට 80 ක් පමණ ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධියක් හෝ වෘත්තීය සුදුසුකමක් හෝ ලබා තිබිණි. 2010 වසර තුළදී සේවකයින් 09 දෙනෙකු බැංකු සේවයෙන් ඉල්ලා අස් වූ අතර, තවත් සේවකයින් 20 දෙනෙකු බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

### 13.2 බඳවා ගැනීම්

හඳුනාගත් නිපුණතා අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව සිය සාමාන්‍ය බඳවා ගැනීම් ප්‍රතිපත්තිය යටතේ 2010 වසරේ දී පිළිවෙලින් ජූනි හා සැප්තැම්බර් මාසවලදී කළමනාකරණ පුහුණුවන්නන් 96 දෙනෙකු බැංකු සේවයට බඳවා ගන්නා ලදී. ඊට අමතරව සුළු සේවකයන් 71 දෙනෙක් හා බැංකු සහායකයන් 94 දෙනෙක් ද, පිළිවෙලින් 2010 වසරේ ජූනි හා සැප්තැම්බර් මාසවලදී බැංකු සේවාවට බඳවා ගන්නා ලදී. එමෙන්ම බැංකුවේ විශේෂිත අවශ්‍යතා සඳහා අවශ්‍ය විශේෂඥ වෘත්තීයමය සේවාවන්ගේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන බැංකුවේ පාර්ශ්වික බඳවා ගැනීම් ප්‍රතිපත්තිය යටතේ 2010 වසර තුළදී විදුලි ඉංජිනේරුවෙක්, සිවිල් ඉංජිනේරුවෙක්, සහකාර ආරක්ෂක පාලකවරයෙක් සහ ජ්‍යෙෂ්ඨ සහකාර ආරක්ෂක පාලකවරයෙක් බැංකු සේවාවට බඳවා ගන්නා ලදී.

බැංකු වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා වෛද්‍ය නිලධාරියෙකුගේ හා හෙද නිලධාරිනියකගේ සේවය සහ කායවර්ධන මධ්‍යස්ථානය සඳහා උපදේශකවරයෙකුගේ සේවය බාහිර සේවා සැපයුම්කරුවන් වෙතින් ලබා ගැනීමට ද 2010 වසර තුළ දී කටයුතු කරන ලදී. මේ අතර, ආරක්ෂක සේවා දෙපාර්මේන්තුවේ සහ භෝජනාගාර සේවයේ ඇතැම්

**සංඛ්‍යා සටහන II - 9**

**2010.12.31 දිනට මානව සම්පත් ව්‍යුහය**

| සේවක පංතිය | සේවකයින් සංඛ්‍යාව | | | සාමාන්‍ය වයස (අවුරුදු) | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | මුළු සංඛ්‍යාව | | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | පශ්චාත් උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| 1. මාණ්ඩලික පංතිය | | | | | | | | | | |
| (i) IV ශ්‍රේණිය සහ ඉහළ ශ්‍රේණි | 51 | 17 | 68 | 52 | 13 | 45 | 02 | 04 | 04 | 0 |
| (ii) III ශ්‍රේණිය | 69 | 19 | 88 | 52 | 08 | 40 | 01 | 03 | 36 | 0 |
| (iii) II ශ්‍රේණිය | 92 | 88 | 180 | 44 | 06 | 26 | 03 | 29 | 87 | 08 |
| (iv) I ශ්‍රේණිය | 85 | 137 | 222 | 45 | 0 | 12 | 01 | 06 | 109 | 0 |
| (v) කළමනාකාර පුහුණු | 38 | 58 | 96 | 27 | 0 | 05 | 01 | 37 | 37 | 16 |
| 2. මාණ්ඩලික නොවන පංතිය | | | | | | | | | | |
| (i) V ශ්‍රේණිය | 26 | 46 | 72 | 55 | 0 | 0 | 0 | 0 | 19 | 01 |
| (ii) IV ශ්‍රේණිය | 77 | 52 | 129 | 50 | 0 | 0 | 0 | 0 | 09 | 01 |
| (iii) III ශ්‍රේණිය | 71 | 14 | 85 | 50 | 0 | 0 | 01 | 0 | 01 | 03 |
| (iv) II ශ්‍රේණිය | 108 | 82 | 190 | 33 | 0 | 0 | 0 | 0 | 06 | 03 |
| (v) I ශ්‍රේණිය | 95 | 02 | 97 | 45 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (vi) බැංකු සහායක | 40 | 53 | 93 | 23 | 0 | 0 | 0 | 0 | 11 | 02 |
| 3. සුළු සේවක පංතිය | | | | | | | | | | |
| (i) I, II සහ III ශ්‍රේණි | 155 | 14 | 169 | 31 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 4. කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගත් නිලධාරීන් | | | | | | | | | | |
| (i) සියලුම කාණ්ඩයන් | 04 | 04 | 08 | 45 | 01 | 01 | 01 | 0 | 0 | 0 |
| මුළු සංඛ්‍යාව | 911 | 586 | 1497 | **41** | **28** | **129** | **10** | **79** | **319** | **34** |

සේවාවන්ට අවශ්‍ය සේවකයන් ද බාහිර සේවා සැපයුම්කරුවන් වෙතින් ලබා ගන්නා ලදී.

එමෙන්ම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද දිළිඳුකම පිටු දැකීම සඳහා වන සුළු පරිමාණ ව්‍යාපෘතියේ II වන අදියර සඳහා අවශ්‍ය සේවකයන් බඳවා ගැනීම සඳහා ද මානව සම්පත් දෙපාර්තමේන්තුව පහසුකම් සලසා දෙන ලදී. ඒ අනුව, ණය උපදේශකවරයෙක්, පුහුණු කටයුතු විශේෂඥයෙක්, අලෙවි විශේෂඥයෙක් හා මෙහෙයුම් විශේෂඥයෙක් බඳවා ගැනීමට ද මානව සම්පත් දෙපාර්තමේන්තුව පහසුකම් සපයන ලදී.

## 13.3 කාර්යසාධන කළමනාකරණ ක්‍රමය

මහ බැංකුවේ සමස්ත මෙහෙවර හා දැක්ම ලඟාකර ගැනීම සඳහා ලබාදෙන දායකත්වය අනුව එක් එක් නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගැයීමට හැකිවන අයුරින් බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ක්‍රමය සකස් කර ඇත. ඒ අනුව වර්ෂය ආරම්භයේදීම සේවකයින් තම අධීක්ෂණ නිලධාරීන් සමග සාකච්ඡා කර සුදුසු බර තැබීමකින් යුක්තව තම ඉලක්ක සකස් කිරීම මගින් කාර්යසාධන ඇගැයීම් ක්‍රමය ආරම්භ කරනු ලබයි. මෙම ඉලක්ක මත පදනම්ව සේවකයන් විසින් එක් එක් ඉලක්කය සඳහා කාර්යසාධන මට්ටම් ඉදිරිපත් කරමින් කාර්යසාධන ඇගැයීම් පත්‍රිකාවේ ස්වයං ඇගැයීමේ කොටස සම්පූර්ණ කරනු ලබන අතර, කාර්යසාධන මට්ටම් පිළිබඳව අවසාන තීරණයකට එළඹීම සඳහා අදාල සේවකයා හා අධීක්ෂණ නිලධාරියා අතර කාර්ය සාධන ඇගැයීම් සාකච්ඡා පවත්වනු ලබයි. මීට අමතරව, සේවකයින් විසින් අධ්‍යයන, පුහුණු හා වෘත්තීය සංවර්ධන සැලසුම් ද, කාර්යසාධන ඇගැයීම් පත්‍රිකාව සමග අධීක්ෂණ නිලධාරීන්ගේ ඇගැයීම් සඳහා ඉදිරිපත් කරනු ලබයි. උසස්වීම් ලබා දීමේදී සැලකිල්ලට ගනු ලබන නිර්ණායකයන් අතර එක් නිර්ණායකයක් ලෙස අවසන් කාර්යසාධන ඇගැයීම් මට්ටම් භාවිතා කරනු ලබයි.

ඒ අනුව සියළුම බැංකු සේවකයන් සඳහා වූ 2009 වසරේ කාර්යසාධන ඇගැයීම්, ඉලක්කගත කාලච්ඡේදය තුළදීම සම්පූර්ණ කරන ලදී. වර්ෂය ආරම්භයේදී ඉලක්කගත කළ කාලසීමාවලට සමගාමීව සේවකයන්ගේ හා දෙපාර්තමේන්තු වල 2010 වසර සඳහා වූ ඉලක්ක සකස් කිරීම ද සිදු කරන ලදී.

## 13.4 උසස් කිරීම්

බැංකුවේ ඉතා වැදගත් තනතුරු සියල්ල සුදුසු කුසලතාවයන්ගෙන් යුතු නිලධාරීන්ගෙන් සම්පූර්ණ කිරීම තහවුරු කිරීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව 2010 වසරේ දී පියවර ගන්නා ලදී. ඒ අනුව එක් සහකාර අධිපතිවරයෙකු නියෝජ්‍ය අධිපති ධුරයට ද, දෙපාර්තමේන්තු ප්‍රධානීන් 4 දෙනෙකු සහකාර අධිපතිවරුන් ලෙස මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට ද, මාණ්ඩලික පංතියේ III ශ්‍රේණියේ නිලධාරීන් 16 දෙනෙකු නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස ද, උසස් කිරීමට අවශ්‍ය පහසුකම් සලසමින් සියළු ප්‍රධාන තනතුරු සඳහා පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. ඊට අමතරව, 2010 වසර තුළ දී සේවකයන් 156 දෙනෙකුට ශ්‍රේණි, පංති සහ තනතුරු උසස්වීම් ලබා දීම ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

## 13.5 පුහුණු කටයුතු හා සංවර්ධනය

කුසලතා මූලික කොටගත් ආයතනයක් තුළ ඉහළ කාර්ය සාධනයක් අත්පත් කරගැනීමෙහිලා පුහුණුවීම්වල වැදගත්කම හඳුනාගනිමින් මානව සම්පත් දෙපාර්තමේන්තුව බැංකු කාර්ය මණ්ඩලයේ පුහුණු කටයුතු හා සංවර්ධනය සඳහා දේශීය හා විදේශීය පුහුණු ආයතන මගින් පවත්වන ලද පුහුණු පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ හා අර්ධකාලීන පාඨමාලා අවස්ථාවන් සපයා දීමට අවශ්‍ය පහසුකම් අඛණ්ඩව සලසන ලදී. 2009 වසර තුළදී ලබාදුන් පුහුණු අවස්ථා 1,170 ට සාපේක්ෂව 2010 වසර තුළදී මානව සම්පත් දෙපාර්තමේන්තුව දේශීය හා විදේශීය පුහුණු අවස්ථා 1,641 ක් ලබා දී ඇති අතර, ඒවා ආර්ථික විද්‍යාව, මූල්‍ය පද්ධති ස්ථායිතාවය, අවදානම් කළමනාකරණය, බැංකු අධීක්ෂණය, සංචිත කළමනාකරණය යන ක්ෂේත්‍ර ආවරණය කරන ලදී. 2010 වසර තුළදී විදේශීය හා දේශීය පුහුණුවීම් සඳහා සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 190 ක් හා 1,451 ක් විය.

**සංඛ්‍යා සටහන II - 10**

**කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා - 2010**

| ක්ෂේත්‍රය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|
| ආර්ථික විද්‍යාව හා ආර්ථික ප්‍රතිපත්ති | 47 |
| මූල්‍ය රෙගුලාසි හා පද්ධති ස්ථායිතාව | 46 |
| අවදානම් කළමනාකරණය | 34 |
| මූල්‍යය | 4 |
| තොරතුරු තාක්ෂණය හා ගෙවීම් පද්ධති | 6 |
| රාජ්‍ය ණය කළමනාකරණය | 6 |
| මහ බැංකු කටයුතු | 13 |
| මානව සම්පත් කළමනාකරණය | 25 |
| වෙනත් | 9 |
| **එකතුව** | 190 |

### (අ) විදේශීය පුහුණු කටයුතු

2010 වසර තුළදී ලබා දුන් විදේශ පුහුණු අවස්ථා සංඛ්‍යාව 190 ක් වූ අතර, එය 2009 වසරේ දී ලබා දුන් විදේශ පුහුණු අවස්ථා සංඛ්‍යාව වූ 141 ට සාපේක්ෂව සියයට 35 ක වර්ධනයක් විය. මෙම නිලධාරීන් පිළිගත් විදේශීය පුහුණු ආයතන මගින් පවත්වනු ලැබූ පුළුල් පරාසයක විහිදුනු පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු හා සමුළු සඳහා සහභාගි වන ලදී.

පුහුණු වැඩසටහන් තුළින් ලබාගත් දැනුම ඵලදායි ලෙස යොදා ගැනීම තහවුරු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන්වලට සහභාගි වීම තුළින් ලබාගත් දැනුම පදනම් කරගෙන විශේෂ පැවරුම් සම්පූර්ණ කිරීමට, නව ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට හෝ දැනට

බැංකුවේ පවත්නා ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා දායක වන ලෙස මෙම වැඩසටහන්වලට සහභාගි වූ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින ලදී. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා ස්ථාපිත කර ඇති පුහුණු කටයුතු පිළිබඳ උප කමිටුව 2010 වසර තුළදී විදේශ පුහුණු පාඨමාලා සඳහා සහභාගි වූ නිලධාරීන් සමග පෙර හා පසු පුහුණු සාකච්ඡා 25 ක් පවත්වා ඇත. ඒ අනුව එකඟ වූ විශේෂ පැවරුම් 74 අතරින් වසර අවසන් වනවිට පැවරුම් 18 ක් සම්පූර්ණ කර තිබිණි.

### (ආ) පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු

දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් තුළින් සේවකයන් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික යොමුවට අමතරව බැංකු සේවකයන් තුළ බුද්ධිමය හැකියාව ඉහළ නැංවීම අරමුණු කොටගත් සිය ශිෂ්‍යත්ව වැඩසටහන ද බැංකුව විසින් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. 2010 වසර තුළ දී එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය හා ඕස්ට්‍රේලියාව යන රටවල පිළිගත් විශ්ව විද්‍යාලවල විද්‍යාපති හා ශාස්ත්‍රපති උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කළ නිලධාරීන් සංඛ්‍යාව 15 ක් වූ අතර, නිලධාරීන් දෙදෙනෙකු ආචාර්ය උපාධිය සඳහා වූ සිය අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. විද්‍යාපති හා ශාස්ත්‍රපති උපාධි අධ්‍යයන කටයුතු අවසන් කළ නිලධාරීන් 6 දෙනෙකු සහ ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු අවසන් කළ එක් නිලධාරියෙකු 2010 වසර තුළදී බැංකු සේවයට වාර්තා කරන ලදී.

### (ඇ) දේශීය පුහුණු කටයුතු

2010 වසර තුළදී දේශීය පුහුණු අවස්ථා 1,451 ක් ලබාදුන් අතර, එය 2009 වසර තුළදී ලබාදුන් දේශීය පුහුණු අවස්ථා 1,029 ට සාපේක්ෂව සියයට 41 ක වර්ධනයක් විය. මේ අතරින් වැඩිමනත් නිලධාරීන් සංඛ්‍යාවක් බැංකු විදු පියෙස මගින් පවත්වන ලද පුහුණු පාඨමාලා සඳහා සහභාගි වූහ. බැංකු විදු පියෙස හා වෙනත් පිළිගත් දේශීය පුහුණු ආයතන මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 976 ක් හා 475 ක් විය. දේශීය පුහුණු වැඩසටහන් ලබා දීමේ දී තොරතුරු තාක්ෂණ, සන්නිවේදන, මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ, බැංකු අධීක්ෂණ, සාර්ව ආර්ථික විශ්ලේෂණ, අභ්‍යන්තර විගණන, කළමනාකරණ ආදී ක්ෂේත්‍ර සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලදී.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව බැංකු කාර්ය මණ්ඩලයට සිය දෙමළ භාෂා දැනුම වැඩිදියුණු කර ගැනීම සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහනක්ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලදී. සිංහල භාෂාව ව්‍යවහාර කරන නිලධාරීන් 200 ක් පමණ මෙම වැඩසටහන සඳහා සහභාගි වූ අතර, වැඩසටහන අවසානයේ දී රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ලිඛිත හා වාචික පරීක්ෂණ සඳහා නිලධාරීන් 114 දෙනෙක් පෙනී සිටියහ. එමෙන්ම බැංකු සේවකයන්ගේ භාෂා හැකියාව වැඩිදියුණු කිරීම සඳහා දෙමළ භාෂාවෙන් විවාද තරඟ මාලාවක් සංවිධානය කිරීමට ද මානව සම්පත් දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

## 13.6 ස්ථාන මාරුකිරීම්

ස්ථාන මාරුවීම් වැඩසටහනේ අංශයක් ලෙස බහුවිධ කුසලතාවයන්ගෙන් පිරිපුන් සේවක පිරිසක් බිහිකර ගැනීමේ හා බැංකුවේ සමස්ත ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමේ අරමුණින් යුක්තව එක් දෙපාර්තමේන්තුවක වසර 5 කට වඩා සේවය කළ සේවකයන්ට, ඔවුන් තුළ පවතින නිපුණතා මට්ටම් හා විවිධ දෙපාර්තමේන්තුවල පවතින නිපුණතා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් වෙනත් දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී. මේ යටතේ 2010 වසර තුළදී සේවකයන් 20 දෙනෙකුට මාරුවීම් ලබා දීමට කටයුතු කරන ලදී.

## 13.7 සේව්‍ය - සේවක සම්බන්ධතා

2010 වසර තුළදී ද වෘත්තීය සමිති හා කළමනාකාරිත්වය අතර සමීප සංවාදයක් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. අවශ්‍ය අවස්ථාවලදී වෘත්තීය සමිතිවලට කළමනාකාරිත්වය හමු වී සාකච්ඡා කිරීමේ අවස්ථාවන් ද සලසා දෙන ලද අතර, ඒ අනුව එවැනි සාකච්ඡා වාර 10 ක් පවත්වන ලදී. මෙම සංවාදය තුළින් බැංකු කළමනාකාරිත්වයට නව බඳවා ගැනීම්, උසස් කිරීම්, පුහුණු කටයුතු, සුභසාධන හා බැංකුවේ සාමාන්‍ය පරිපාලනය ආදී කටයුතු සම්බන්ධව පැවති ගැටළුකාරී තත්ත්වයන් ද මඟහරවා ගැනීමට හැකියාව ලැබුණු අතර, 2010 වසර තුළදී බැංකුව තුළ කිසිදු කාර්මික ආරවුලක් ඇති නොවිණ.

### අධිපතිතුමා සහභාගි වූ රැස්වීම්

1. පෙබරවාරි මාසයේ දී ලන්ඩනයේ දී පැවති සමාජ ආර්ථික අන්තර් ක්‍රියාකාරිත්ව වැඩසටහන.
2. පෙබරවාරි - මාර්තු මාසවලදී කාම්බෝජයේ දී පැවති 45 වැනි සියසන් (SEACEN) අධිපතිවරුන්ගේ සමුළුව හා 29 වන සියසන් අධිපතිවරුන්ගේ මණ්ඩලයේ රැස්වීම සහ බැංකොක් හි පැවති රැස්වීම්.
3. අප්‍රේල් මාසයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී. හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුවේ වසන්ත ඍතුවේ රැස්වීම් (Spring Meetings).
4. මැයි මාසයේදී, නිව්යෝර්ක් හා වොෂින්ටන් හි දී එක්සත් ජනපද රාජ්‍ය නිලධාරීන්, ව්‍යාපාරික ප්‍රජාව හා මාධ්‍ය සමග පැවති රැස්වීම් හා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික අවස්ථා පිළිබඳ සම්මන්ත්‍රණ මාලාව සහ සිංගප්පූරුවේ දී පැවති ජේ.පී. මෝර්ගන් හි නැගී එන වෙළෙඳපොලවල් පිළිබඳ ආසියානු සමුළුව.
5. මැයි මාසයේ දී ඉන්දියාවේ දී පැවති ආයෝජක රැස්වීම්.
6. මැයි මාසයේ දී හොංකොං හා සිංගප්පූරුවේදී පැවති ආයෝජකයන්ගේ සැසිය හා රැස්වීම.

7. සැප්තැම්බර් මාසයේ දී නිව්යෝර්ක් හිදී පැවති ආයෝජක රැස්වීම්.

8. නොවැම්බර් මාසයේ දී පිලිපීනයේ දී පැවති "ගෝලීය අර්බුදය මගින් ආසියාවට ඇති වූ බලපෑම, උගත් පාඩම්, ප්‍රතිපත්තිමය දර්ශනය හා ඉදිරි දැක්ම" පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුවේ කලාපීය සැසිය.

9. නොවැම්බර් මාසයේ දී සිංගප්පූරුවේ දී පැවති ලෝක බැංකු - සිංගප්පූරු යටිතල පහසුකම් මූල්‍ය සමුළුවේ, මූල්‍ය හා නාගරික නායකයින්ගේ රැස්වීම.

**උසස් කිරීම්/පත්කිරීම්**

1. අතිගරු ජනාධිපතිතුමා විසින් එන්.ඒ.උමගිලිය මහතා 2010 මැයි 25 දින සිට බලපැවැත්වෙන පරිදි මුදල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරන ලදී.

2. පහත සඳහන් උසස් කිරීම් හා පත්කිරීම් 2010 වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

   (i) පී.ඩී.ජේ.ප්‍රනාන්දු මහතා 2010 ජනවාරි 5 දින සිට නියෝජ්‍ය අධිපතිවරයකු වශයෙන් පත් කරන ලදී.

   (ii) වයි.ඒ. ද සිල්වා මහතා මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කර 2010 ජූනි 15 දින සිට සහකාර අධිපතිවරයකු වශයෙන් පත් කරන ලදී.

   (iii) ආචාර්ය ඩබ්.එම්.හේමචන්ද්‍ර මහතා මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කර 2010 ජූනි 15 දින සිට සහකාර අධිපතිවරයකු වශයෙන් පත් කරන ලදී.

   (iv) එස්.ලංකාතිලක මහතා මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කර 2010 ජූනි 15 දින සිට සහකාර අධිපතිවරයකු වශයෙන් පත් කරන ලදී.

   (v) සී.ජේ.පී.සිරිවර්ධන මහතා මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කර 2010 ජූනි 15 දින සිට සහකාර අධිපතිවරයකු වශයෙන් පත් කරන ලදී.

3. වැටුප් රහිත නිවාඩු මත සිට 2010 පෙබරවාරි 01 දින නැවත සේවයට වාර්තා කළ අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානී ආර්.ධීරසිංහ මහත්මිය 2010 පෙබරවාරි 01 දින සිට ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් ද, 2010 ජූනි 21 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩබලන අධිකාරී වශයෙන් ද, 2010 දෙසැම්බර් 21 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධිකාරී වශයෙන් ද පත් කරන ලදී.

4. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ කේ.ඩී.රණසිංහ මහතා 2010 පෙබරවාරි 11 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හා ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ වශයෙන් පත් කරන ලදී.

5. මූල්‍ය බුද්ධි ඒකකයේ වැඩබලන අධ්‍යක්ෂ ඩී.එම්. රූපසිංහ මහතා 2010 පෙබරවාරි 11 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

6. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මහත්මිය 2010 පෙබරවාරි 11 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

7. දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ආර්.ඒ.ඒ. ජයලත් මහතා 2010 පෙබරවාරි 11 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

8. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ කේ.බී. දිසාකරුණා මහතා 2010 පෙබරවාරි 11 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

9. වැඩබලන විනිමය පාලක පී.එච්.ඕ. චන්ද්‍රවංශ මහතා 2010 පෙබරවාරි 11 දින සිට විනිමය පාලක වශයෙන් පත් කරන ලදී.

10. කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.අයි. සුරියාන් මහතා 2010 ජූනි 21 දින සිට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

11. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කේ.එම්.ඒ.එන්.දවුලගල මහත්මිය 2010 ජූනි 21 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

12. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එස්.එස්. රත්නායක මහතා 2010 ජූනි 21 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී සහ ලේඛකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

13. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී එම්.ජේ.එස්. අබේසිංහ මහතා 2010 ජූනි 21 දින සිට ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

14. පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ යූ.එච්.ඊ. සිල්වා මහතා 2010 ජූනි 21 දින සිට පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ වශයෙන් ද, 2010 දෙසැම්බර් 21 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් ද පත් කරන ලදී.

15. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඒ.ආර්.කේ. විජේසේකර මහතා 2010 ජූනි 21 දින සිට මානව සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ වශයෙන් ද, 2010 දෙසැම්බර් 21 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් ද පත් කරන ලදී.

16. කළමණාකාරීත්ව විගණන දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ඒ.එම්.එන්. ගුණවර්ධන මහතා 2010 ජූනි 21 දින සිට කළමණාකාරීත්ව විගණන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ වශයෙන් ද, 2010 දෙසැම්බර් 21 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් ද පත් කරන ලදී.

17. බැංකු විදු පියසෙහි අතිරේක අධ්‍යක්ෂ කේ.පී.එන්.එස්. කරුණාගොඩ මහතා 2010 ජූනි 21 දින සිට සුභසාධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

18. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ එස්.එම්.ඒ. සිරිවර්ධන මහතා 2010 ජූනි 21 දින සිට පළාත් කාර්යාල නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

19. පළාත් කාර්යාල නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ එච්.අමරතුංග මහතා 2010 ජූනි 21 දින සිට කළමණාකාරීත්ව විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

20. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධිකාරී ඩබ්.ආර්.ඒ. ධර්මරත්න මහතා 2010 ජූනි 21 දින සිට මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

21. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ එච්.පී.ටී. විජේසූරිය මහත්මිය 2010 ජූනි 21 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී වශයෙන් පත් කරන ලදී.

22. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආර්.බී. වීරසිංහ මහත්මිය 2010 සැප්තැම්බර් 26 දින සිට ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ වශයෙන් ද, 2010 දෙසැම්බර් 26 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් ද පත් කරන ලදී.

**විශ්‍රාම ගැනීම්**

1. නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩී.එස්. විජේසිංහ මහතා 2010 පෙබරවාරි 01 දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.
2. සහකාර අධිපතිනි පී. ලියනගේ මහත්මිය 2010 ජනවාරි 28 දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.
3. සහකාර අධිපතිනි සී.කේ. නානායක්කාර මහත්මිය 2010 මැයි 25 දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.
4. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ.බී. දිසාකරුණා මහතා 2010 සැප්තැම්බර් 26 දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.
5. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ පී.ජී. ජයසූරිය මහතා 2010 දෙසැම්බර් 24 දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

**මුදාහරිනු ලැබ සිටි නිලධාරීන්**

1. සහකාර අධිපති ආචාර්ය පී.එන්. වීරසිංහ මහතා විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.
2. මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියේ එස්.ආර්. ආටිගල මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
3. මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියේ කේ.එම්.එම්. සිරිවර්ධන මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
4. මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියේ සී.එන්. විජයසේකර මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
5. මාණ්ඩලික පන්තියේ III ශ්‍රේණියේ බී. ලොකුරණමුක මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
6. මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ එච්.පී.එම්. වසන්ත කුමාර මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
7. මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ යූ.වී. පෙරේරා මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
8. මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ එම්. මහින්ද සාලිය මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
9. මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ ඩී.එම්. වන්නිනායක මහතා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත.
10. මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ ඩබ්.එච්.එම්. කුමාර මහතා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත.
11. මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණියේ එච්.පී.ඒ. ප්‍රියශාන්ති මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
12. මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණියේ (පරිවාස නිලධාරි) ජේ.ඒ.ඒ. ප්‍රියන්ත මහතා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත.
13. මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණියේ ඩී.කේ. උයන්ගොඩගේ මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.
14. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ නීති නිලධාරිනි එච්.එම්.එන්.එස්. ගුණවර්ධන මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

## 14. තොරතුරු තාක්ෂණ

තොරතුරු තාක්‍ෂණ දෙපාර්තමේන්තුව, බැංකුවේ උපාය මාර්ගික අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ ලා, ඒකාබද්ධ සහ පෘතුල තාක්‍ෂණික විසඳුම් සපයමින්, ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු විශිෂ්ඨ ලෙස පවත්වා ගැනීමට ස්වකීය ක්‍රියාශීලී දායකත්වය අඛණ්ඩව සපයන ලදී. සිය ඉලක්ක සපුරා ගැනීමේදී, දෙපාර්තමේන්තුව, ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් ඔස්සේ ක්‍රියත්මක විය.

1. තීරණාත්මක ව්‍යාපාරික පද්ධතිය නිර්මාණය සහ නඩත්තුව
2. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ යටිතල පහසුකම් වර්ධනය
3. අවදානම් කළමනාකරණය
4. අගය එකතු කල සේවාවන් සැපයීම

### (අ) තීරණාත්මක ව්‍යාපාරික පද්ධති නිර්මාණය සහ නඩත්තුව

2010 වසරේදී බැංකුවේ තේමා පාඨය වූ "සෞභාග්‍ය කරා නව ජවයකින්" යන්න බල ගැන්වීම සඳහා, තොරතුරු

තාක්ෂණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධ සහ නව්‍ය ව්‍යාපාරික නිර්මාණ විවිධ දෙපාර්තමේන්තු කටයුතු ආවරණය පරිදි ස්ථාපනය කරන ලදී. මේ මගින් පද්ධතිවල කාර්යක්ෂමතාවය, තොරතුරු සුරක්ෂිතතාවය හා ඵලදායිතාවය වර්ධනය සමග විනිමය පාලන, සේවක අර්ථ සාධක, රාජ්‍ය ණය කළමනාකරණය සහ මූල්‍ය බුද්ධි අංශය වැනි ඒජන්සි සේවා කටයුතු මෙන්ම සාංගමික සේවා අංශය සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධති වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය නොකඩවා සැපයීය.

**වසර තුළ සම්පූර්ණ කරන ලද ප්‍රධාන මෘදුකාංග පද්ධති කිහිපයක් පහත දැක්වේ.**

- ආනයන/අපනයන දත්ත වාර්තාකරණය සඳහා වූ ඉ-වෙළෙඳ දත්ත පදනම - ශ්‍රී ලංකා රේගුව හා සෘජුව සම්බන්ධවන මෙම පද්ධතිය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ දත්ත විශ්ලේෂණ කටයුතු සඳහා මෙන්ම වෙළෙඳ දර්ශකය ගණනය කිරීමේදී උපයෝගී කරගනු ඇත.

- අන්තර් බැංකු විනිමය ගනුදෙනු වාර්තාකරණය සඳහා භාවිතයේ පැවැති පද්ධතිය වෙබ් තාක්ෂණය යොදා ගනිමින් ප්‍රතිනිර්මාණය කිරීම. මේ මගින් විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම සහ නිසි තොරතුරු මත පදනම්වූ තීරණ ගැනීමේ පහසුව සැලසෙනු ඇත.

- විනිමය පාලන දෙපාර්තමේන්තුව විදේශ විනිමය මිලදී ගැනීම්/විකුණුම් වාර්තා කිරීම සඳහා භාවිතා කරනු ලබන "ForexNet" වෙබ් පද්ධතිය, ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ විදේශ විනිමය මිලට ගැනීම් පිළිබඳ තොරතුරු රැස්කර ගැනීමේ අවශ්‍යතා සඳහාත් කොටස් වෙළෙඳපොළ ආයෝජන ගිණුම් වාර්තාකරණය කිරීමේ අවශ්‍යතාවය සඳහාත් විනිමය පාලන ලිහිල්කරණ ප්‍රතිපත්ති යටතේ වැඩි දියුණු කරනු ලැබීය.

- දේශීය මූල්‍ය වෙළෙඳපොළ තොරතුරු එක් රැස් කර ගැනීම හා වාර්තා කිරීම සඳහා අන්තර් ජාතික මෙහෙයුම් කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම.

- රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගත වෙමින්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ප්‍රසාද පොලී ගෙවීම් පරිගණකගතකොට වාර්තා කිරීම උදෙසා, මෘදුකාංග යෙදවුමක් සංවර්ධනය කොට ක්‍රියාවට නැංවීම.

- ඉහළ තාක්ෂණය සහ ඒකාබද්ධ ආරක්ෂක උපක්‍රම යොදා ගනිමින් ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය නවීකරණය කරන ලදී. මේ මගින් අධික ධාරිතාවයකින් යුතු ගනුදෙනු නිශ්කාෂණ මාර්ග සහ T+0 පියවීම් පහසුකම් බැංකු ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.

- SWIFT පද්ධතිය, වඩාත් නවීකරණය කිරීම තුළින් පරිගණක පද්ධති අතර මූල්‍ය දත්ත සෘජු හුවමාරුව සඳහා පහසුකම් සැලසීම.

- බැංකුවට ඇතුළුවන අමුත්තන් පිළිබඳ තොරතුරු කාර්යක්ෂමව හැසිරවීම සඳහා "අමුත්තන් සඳහා අවසර දීමේ" පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීම.

- බැංකුවේ සමස්ත ප්‍රතිසම්පාදන ක්‍රියාවලියට පහසුකම් සැලසෙන අයුරින්, ඒකාබද්ධ පරිගණක පද්ධතියක් ක්‍රියාවට නැංවීම.

- රාජ්‍ය සේවය හා සම්බන්ධ මූලික දත්ත, ශ්‍රම බලකායේ ප්‍රබලතාව සහ නැඹුරුවීම් විශ්ලේෂණය කිරීම සඳහා "රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය" යනුවෙන් වෙබ් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

**වසර තුළ මුදුන් පමුණුවා ගතහැකි වූ ප්‍රධානතම ඉලක්ක සඳහා පහත සඳහන් දෑ ඇතුළත් වේ.**

- සාමාජිකයින්ගේ අරමුදල් ආපසු ගෙවීම් කඩිනම් කිරීම සහ ආයෝජන සඳහා, මනා පරිසරයක් ගොඩ නැංවීම අරමුණු කරගත් ප්‍රතිනිර්මාණය කරන ලද අර්ථසාධක අරමුදල් පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

- සහභාගිත්ව ආයතන සඳහා දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා ස්වයං කළමනාකරණයට අවශ්‍ය පහසුකම් සලසමින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි ජාතික ගෙවීම්/පියවීම් පද්ධතිය නවීකරණය කිරීම.

අභ්‍යන්තරව නිර්මිත සියළු පරිගණක පද්ධති අදාල ප්‍රමිතීන්ගෙන් යුතුව නඩත්තු කරන අතරම, බාහිර ආයතන වෙතින් මිලට ගත් මෘදුකාංග පද්ධති, අදාල සේවා කොන්දේසි වලට අනුකූලව නඩත්තු කරනවාද යන්න විමර්ශනය කිරීමද කරන ලදී. මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීමෙහිලා තීරණාත්මක කාර්යයන්, ඉටු කරනු ලබන ගෙවීම්/පියවීම් පද්ධති වාර්ෂික උපයෝජ්‍යතාවය 99.7% පවත්වා ගනිමින් අනෙකුත් සියළු පරිගණක පද්ධති 100% වාර්ෂික උපයෝජ්‍යතාවයකින් යුතුව පවත්වා ගන්නා ලදී.

**(ආ) තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය**

විවිධ පරිගණක යෙදුම් සහ නව සේවා හඳුන්වා දෙමින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව දියුණු කිරීමට දෙපාර්තමේන්තුව දායක විය. අන්තර්ජාල රැහැන් ධාරිතාව 6Mbps සිට 10Mbps දක්වා වර්ධනය කිරීම තුළින්, ආර්ථික සහ මූල්‍ය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සහ කුසලතා වර්ධනයට උරදුන් අතර, මේ මගින් වෙබ් තාක්ෂණය පදනම් කරගෙන නිර්මිත මෘදුකාංග පද්ධති සඳහා වඩාත් කාර්යක්ෂම ප්‍රවේශ පහසුකම් සැලසිණි. අභ්‍යන්තර/පුළුල් පැතුරුම් ජාල, බාහිර/ අභ්‍යන්තර තර්ජන වලින් ආරක්ෂා කරගැනීමේ පියවර රැසක් ස්ථාපනය කරන ලදී.

**(ඇ) තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය**

තීරණාත්මක ව්‍යාපාරික කටයුතු සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක ඇති වැදගත්කම වටහා ගනිමින්, බැංකුවේ ව්‍යාපාරික අඛණ්ඩතා සැලස්ම නිරන්තර විමර්ශනයකට ලක් කරමින් වැඩි දියුණු කරන ලදී. අදාල දෙපාර්තමේන්තු, වාණිජ බැංකු, ප්‍රාථමික වෙළෙඳුන් සහ ලංකා ක්ලියර් පෞද්ගලික සමාග මේද සහභාගිත්වය ඇතිව, වසර තුළ දෙවතාවක් බැංකුවේ දෛනික ව්‍යාපාරික කටයුතු ද්විතීයික පරිගණක අංශයේ සිට සිදු කරන ලදී. අවදානම් කළමණාකරණයේ තවත් පියවරක් වශයෙන් වඩා වැදගත් ගෙවීම්/පියවීම් පද්ධතිවල මෙහෙයුම් සමාලෝචනය සඳහා තාක්ෂණික සහය ලබාදෙන ලදී.

**(ඇ) තොරතුරු තාක්‍ෂණික අගය එකතු කල සේවාවන්**

තොරතුරු තාක්‍ෂණික මෙහෙයුම් කටයුතු සහ අදාල ප්‍රතිසම්පාදන කටයුතු සඳහා දෙපාර්තමේන්තුව අඛණ්ඩව තාක්‍ෂණික උපදෙස් සැපයීමේ නිරත විය. විදේශ විනිමය වෙළෙඳ ගනුදෙනු කාර්යක්‍ෂමව සහ ඵලදායි ලෙස මෙහෙයවීම සඳහා නව පරිගණක පද්ධතියක් මිලට ගැනීමේ කටයුතු වලදී දෙපාර්තමේන්තුව, අදාල ටෙන්ඩර් ලිපි ලේඛණ සැකසීම සහ ලංසු ඇගයීම සඳහා සිය තාක්‍ෂණික උපදෙස් සැපයීය.

බැංකු සේවකයින් සඳහා උපකාරක සේවා අඛණ්ඩව සැපයීම සඳහා තොරතුරු තාක්‍ෂණ උපකාරක අංශය පැය 0700 සිට පැය 1830 දක්වා දෛනිකව ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘති අතර, අන්තර්ජාලය සහ ජංගම දුරකථන හරහා කරනු ලබන බැංකු කටයුතු, රජයේ සේවා ගාස්තු, ඉලෙක්ට්‍රොනික කාඩ්පත් මගින් කරනු ලබන ගෙවීම් වැනි ජාතික තලයේ ව්‍යාපෘති සඳහා තාක්‍ෂණික උපදෙස් මාලාවන් සකස් කිරීම සහ ලියාපදිංචි මූල්‍ය සමාගම්හි තොරතුරු පද්ධති ස්ථාපනයේදී අනුගමනය කලයුතු උපදෙස් මාලාවක් සම්පාදනය කරන ලදී.

තොරතුරු තාක්‍ෂණ ආයතනයේද සහයෝගය ඇතිව මූල්‍ය අංශය සඳහා පරිගණක ආරක්‍ෂණ බිඳ වැටීම් වාර්තාකරණය සහ ප්‍රතිචාර දැක්වීමේ ආයතනයක් ස්ථාපනය කිරීමට මූලික පියවර ගන්නා ලදී.

තොරතුරු තාක්‍ෂණ දැනුම වර්ධනය කිරීම සඳහා අඛණ්ඩ පුහුණු අවස්ථා බැංකු සේවකයන්ට සපයන ලදී. තොරතුරු තාක්‍ෂණ සම්පත් නිසි ලෙස භාවිතය බලාත්මක කිරීම සඳහා "තොරතුරු තාක්‍ෂණ සම්පත් ඵලදායි භාවිතය" සඳහා වූ ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කරන ලදී. තොරතුරු තාක්‍ෂණ ආරක්‍ෂණය සඳහා දැඩි අවධානය යොමු කරමින්, විශේෂිත දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පවත්වන අතරම, අභ්‍යන්තර සහ බාහිර විගණනයන් සඳහා අවශ්‍ය සහය දක්වන ලදී.

## 15. ජාත්‍යන්තර මෙහෙයුම්

ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීමේ කාර්යය, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු (ජා.මෙ.ක) දෙපාර්තමේන්තුවට පැවරී ඇත. 2010 වසරේ දී ද ජා.මෙ.ක. දෙපාර්තමේන්තුව විදේශ සංචිත ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම මගින් ආයෝජන සඳහා ප්‍රශංසනීය මට්ටමක ඉහළ ඵලදායී අනුපාතයක් අත්කරගනු ලැබීය. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ අධීක්ෂණයෙහි වගකීම ද ජා.මෙ.ක. දෙපාර්තමේන්තුව සතු වගකීමක් වන බැවින් සලකා බලනු ලබන කාලය තුළ දී ගන්නා ලද නිසි ක්‍රියා මාර්ග මගින් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයෙහි සුමට බව තහවුරු කරන ලදී.

### 15.1 ජාත්‍යන්තර සංචිත කළමනාකරණය

මෑත කාලීන ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය, ගෝලීය සංචිත කළමනාකරණය කෙරෙහි අභියෝගයන් රැසක් ඇති කරනු ලැබීය. 2010 වසරේ මුළු ලෝකය පුරාම පැතිරී ගිය යුරෝ ණය අර්බුදයෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන මුදල් වර්ගවල සහ බැඳුම්කර අනුපාතයන් හි සැලකිය යුතු විචලනයන් ඇති විය. මෙම පසුබිම යටතේ අවදානම අවම කර ගනිමින් හා ඵලදායීතාව උපරිම කරගනිමින් විචක්ෂණශීලීව ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීමේ අභියෝගාත්මක වගකීම ඉටු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. ජා.මෙ.ක. දෙපාර්තමේන්තුව මගින් ගන්නා ලද කාලෝචිත ක්‍රියාමාර්ග, විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ කටයුතු සහ විවිධාංගීකරණ ක්‍රමවේදයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ ආයෝජනයන් හි අගය ආරක්ෂා කරගැනීමට සහාය විය. ඒ අනුව, විචලනයකින් යුත් වෙළෙඳපොළවල කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයෝජනවලට අදාළව කාලෝචිතව ගන්නා ලද අවදානම් ලිහිල් කිරීමේ ක්‍රියා මාර්ග නිසා, යුරෝ ණය අර්බුදයෙන් ඇතිවිය හැකිව තිබූ දැඩි බලපෑම අඩු විය.

රට තුළ වසර 30 ක් මුළුල්ලේ පැවැති අරගලය අවසන් වීමත්, පවත්නා ස්ථාවර ආර්ථික හා දේශපාලනික පසුබිමත් සමග වර්ධනය වූ ආයෝජන විශ්වාසය නිසා රටෙහි විදේශ සංචිත සැලකිය යුතු ඉහළ මට්ටමකට ළඟා විය. 2010 වසර අවසාන භාගය වන විට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 6.6 ඉක්මවමින් ඓතිහාසික ඉහළ මට්ටමකට ශ්‍රී ලංකාවේ සංචිත ළඟා වීමට ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සම්පස්ථ ණය පහසුකම ද විශාල වශයෙන් දායක විය.

සලකා බලනු ලබන කාලය තුළ ජාත්‍යන්තර සංචිත ආයෝජනය, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද විදේශ විනිමය කළමනාකරණ මග පෙන්වීම්වලට අනුකූලව සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ අධීක්ෂණයට යටත්ව කරන ලදී. එක්සත් ජනපද ඩොලර්, යූරෝ, ස්ටර්ලින් පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර් බඳු විදේශ මුදල්වලින් හා රන්වලින් සමන්විත ජාත්‍යන්තර සංචිත ප්‍රධාන වශයෙන්, ස්ථාවර ආදායම් සුරැකුම් හා මුදල් වෙළෙඳපොළ උපකරණ යන වත්කම් කාණ්ඩ දෙවර්ගයෙහිම ආයෝජනය කරන ලදී. ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජනයන් ඉහළ ඇගයුමකින් යුතු රාජ්‍යයන් විසින් නිකුතු සුරැකුම්පත්, රාජ්‍ය ඇපවීමක් සහිත සුරැකුම්පත්, රාජ්‍ය නියෝජිත ආයතන සහ ප්‍රමුඛ ජාත්‍යන්තර ආයතන මගින් නිකුත් කළ සුරැකුම්පත්වලින් සමන්විතය. ස්ථාවර ආදායම් සුරැකුම්පත් හා මුදල් වෙළෙඳපොළ ආයෝජන යන දෙවර්ග යටම අදාළ ආයෝජන කටයුතු වත්කම්වල සුරක්ෂිතභාවය, ද්‍රවශීලතාවය හා ප්‍රතිලාභ සම්බන්ධ නිසි අවධානය යොමු කරමින් ඉහළ ඇගයුමකින් යුක්ත, කළමනාකාරිත්වය අනුමත කළ ගනුදෙනුකාර පාර්ශ්වයන් සමග පමණක් සිදුකරන ලදී. ආයෝජනය කළයුතු වත්කම් සහ මුදල් වර්ග සංයුතිය තීරණය කිරීමේදී ද්‍රවශීලතා අවශ්‍යතාවයන්, විදේශ ණය ආපසු ගෙවීම්, අවදානම් කළමනාකරණ නිර්ණයන්, ආදායම් ඉපැයීමේ හැකියාවන් සහ මුදල් මණ්ඩලයේ විශේෂිත නියමයන් මූලික වශයෙන් සැලකිල්ලට ගන්නා ලදී.

බැංකුවේ සමස්ත සංචිත කළමනාකරණ මෙහෙයුම්වලින් ඇ.එ.ජ.ඩොලර් මිලියන 338 (රුපියල් බිලියන 37) ක ශුද්ධ විනිමය ආදායමක් 2010 වසර තුළදී උපදවන ලදී. සංසන්දනාත්මකව අඩු පොලී මට්ටමක පැවැති වෙළෙඳපොළ

පරිසරයක් තුළ වුවද, වෙළෙඳපොළ උච්චාවචනයන්ගෙන් උපරිම ලෙස ප්‍රයෝජන ගනිමින් විදේශ විනිමය ගනුදෙනු මගින් හා ස්ථාවර ආදායම් සුරැකුම්පත්වලින් ප්‍රාග්ධන ප්‍රතිලාභ මගින් අභියෝගාත්මක පරිසරයක් තුළ ඇති වූ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. ඊට අමතරව, මුළු විනිමය ආදායම ඉහළයාම සඳහා වෙළෙඳ ද්‍රව්‍ය වෙළෙඳපොළෙහි වූ අසමසම මිල උච්චාවචන මත ජාත්‍යන්තර රන් වෙළෙඳපොළෙහි ගනුදෙනු මගින් ඉහළ මට්ටමක ප්‍රතිලාභ ලබාගැනීම විශාල ලෙස දායක විය.

විදේශ සංචිතයන්හි වර්ධනයත් සමග, විදේශ සංචිත කළමනාකරණ කටයුතුවල විෂය පථය හා පරිමාව වැඩිකර ජා.මෙ.ක.දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ඉහළ දැමීමට තීරණය කරන ලදී. මේ සඳහා කාර්ය මණ්ඩලය වැඩි කිරීම, භෞතික පසුබිම නවීකරණය කිරීම, බහු වැඩමුර ඇති කිරීම, ආයෝජන අවකාශය වෙනස්කිරීම් සහ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් මිලට ගැනීමේ වැඩ කටයුතු ඇතුළත් වේ. ඒ අනුව සලකා බලනු ලබන කාලය තුළ දී ජා.මෙ.ක දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ විනිමය ගනුදෙනු කාර්ය මණ්ඩලය 11 සිට 20 දක්වා වැඩි කිරීමත්, නිසි ලී බඩු මෙවලම් සහ උපකරණ සහිත නවීන භාණ්ඩාගාර ඒකකයක් පිහිටුවීම, වැඩ කරන සේවා කාලය වැඩි කිරීම, නැගී එන වෙළෙඳපොළවලටද ආයෝජන මාරු කිරීම සහ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් සැපයීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීම ආදිය සිදුකරන ලදී. මෙම කටයුතුවලින් විදේශ සංචිත ඵලදායීව කළමනාකරණය කිරීමටත්, ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සඳහා යොදාගන්නා පද්ධතීන් හා ක්‍රියා පටිපාටීන්වල කාර්යක්ෂමතාව ඉහළ දැමීමටත් අපේක්ෂා කෙරේ.

## 15.2 අවදනම් කළමනාකරණය

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ මැදි කාර්යාලය, සලකා බලනු ලබන වසර මුළුල්ලේම ජාත්‍යන්තර සංචිත ආයෝජනය හා බැඳුන අවදානම මැනීමෙහි හා අධීක්ෂණයන්හි නිරත විය. ජාත්‍යන්තර සංචිත ආයෝජනය විවිධ ආකාරයේ අවදානම්වලින් සමන්විත වන අතර විනිමය අනුපාත අවදානම, පොලී අනුපාත අවදානම, ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ මෙහෙයුම් අවදානම මෙයින් ප්‍රධාන අංග ලෙස සැලකේ. විනිමය අනුපාත අවදානම නැතහොත් විදේශ මුදල්වල අගය වෙනස්වීමෙන් වන අවදානම, විදේශ ආයෝජන විවිධාංගීකරණය කිරීම මගින් හා විදේශ මුදල් වගකීම්වලට අනුකූල ලෙස විදේශ මුදල් සංයෝජනය මගින් ඵලදායීව කළමනාකරණය කෙරිණි. පොලී අනුපාත අවදානම යනු පොලී අනුපාත වෙනස්වීම හේතුකොටගෙන පොලී හිමිකම ඇති වත්කම්වල අගය වෙනස් වීමේ අවදානමයි. පොලී අනුපාත ඉහළ යන විට ස්ථාවර අනුපාත සහිත බැඳුම්කරවල මිල පහත වැටෙන අතර අනෙක් අතට පොලී අනුපාත අඩුවන විට බැඳුම්කර මිල ඉහළ නගී. ස්ථාවර ආදායම් සහිත ආයෝජනවල කාලය හා වෙනත් අනුමත මුදල් වර්ගවලින් සමන්විත මුදල් වෙළෙඳපොළ උපකරණ විවිධාංගීකරණය කිරීම මගින් මෙම අවදානම, සමනය කරන ලදී. ජා.මෙ.ක. දෙපාර්තමේන්තුව, එහි ගනුදෙනුවලට සම්බන්ධිත පාර්ශවයනට අදාළ ණය අවදානම් කළමනාකරණය සඳහා වෙළෙඳපොළ අවධානම, ණය ඇගයුම් හා මූල්‍ය සංරචක පදනම් කරගෙන විස්තරාත්මක ඇගයීම් කිරීමට පහසුකම් සලසන, බැංකුව අභ්‍යන්තරිකව සංවර්ධනය කරන ලද පාර්ශවකාර ණය අවදානම් කළමනාකරණ පද්ධතිය යොදා ගන්නා ලදී. ප්‍රමාණවත් තරම් වත්කම් ප්‍රමාණයක් අධි ද්‍රවශීල වත්කම් වශයෙන් පවත්වා ගන්නා අතරතුර මුදල් ප්‍රවාහ පුරෝකතන හා වත්කම් සහ වගකීම්වල කල්පිරීමේ ආකාරය විග්‍රහ කිරීම මගින් ද්‍රවශීල අවධානම කළමනාකරණය කරන ලදී. ද්‍රවශීල අවදානම් කළමනාකරණයේ දී ආතති පරීක්ෂණයද විශාල කාර්යභාරයන් ඉටු කෙරුණි. කාර්යයන්හි නියුතු පුද්ගලයන්, පද්ධතීන් හා අනෙකුත් ක්‍රියාවලීන් තුළින් මතුවන මෙහෙයුම් අවදානම, ආයෝජන මග පෙන්වීම් යාවත්කාලීන කිරීම, ගනුදෙනු කරන පද්ධති වැඩි දියුණු කිරීම හා නිවැරදිතාව පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම තුළින් කළමනාකරණය කරන ලදී.

## 15.3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රගතිය

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මනා ක්‍රියාකාරිත්වයකින් පවත්වා ගැනීම වැඩි දියුණු කිරීමත්, ශ්‍රී ලංකා රුපියලේ විදේශ විනිමය අනුපාතිකය ක්‍රමවත්ව පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහාත් ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතුවලට එහි ගනුදෙනු සහ එක් එක් වාණිජ බැංකු දෛනිකව පවත්වා ගන්නා විදේශ විනිමය ප්‍රමාණයන් සමීපව අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

2010 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල ප්‍රතිප්‍රමාණය වීම සඳහා ප්‍රධාන වශයෙන්ම රට තුළට පැමිණි විදේශ මුදල් ප්‍රවාහයන්ගේ ඉහළයාම (අපනයන ලැබීම්, ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව හා කොටස් වෙළෙඳපොළ සම්බන්ධ අභ්‍යන්තර ප්‍රේෂණ) දායක විය. ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව ක්‍රමිකව ප්‍රතිප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියලෙහි විනිමය අනුපාතයෙහි විචලනයන් සමනය කිරීම සඳහා 2010 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාකාරී මෙහෙයක නිරත විය. 2010 වසර තුළ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 820 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මුදා හරින ලද අතර එක්සත් ජනපද ඩොලර් මිලියන 753 ක් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් අවශෝෂණය කර ගන්නා ලදී. ඒ අනුව 2010 වසර තුළ දී දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මුදාහරින ලද ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 67 ක් විය.

2010 වසර තුළදී ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයට එරෙහිව සියයට 3.10 න් ප්‍රතිප්‍රමාණයවිය. 2009 වසර අවසානයේ දී රු.114.38 ක් වූ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරය, 2010 වසර අවසාන වන විට රු.110.95 දක්වා අඩු විය. 2009 වසරේ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 10.96 ක් වූ අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය 2010 වසරේ දී සියයට එකකින් වැඩි වෙමින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 11.06 දක්වා ඉහළ නැගුණි. වෙනත් වර්ෂ තුළදී මෙන්ම ශ්‍රී ලංකා රුපියලට එරෙහිව අනෙකුත් විදේශ මුදල් සඳහා වූ විනිමය අනුපාත සම්බන්ධ තොරතුරු රජයේ දෙපාර්තමේන්තුවලට, සංස්ථාවලට, දේශීය හා විදේශීය නියෝජිත ආයතන සහ වෙනත් පාර්ශවයන්ට සැපයීම ද අඛණ්ඩව සිදුකරන ලදී.

**සංඛ්‍යා සටහන II-11**

**අන්තර් බැංකු විදේශ විනිමය ගණුදෙනු පරිමාව - 2010**

ඇ.එ.ජ.ඩොලර් මිලියන

| මාසය | එතැන් | පසුදින | එදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 320.48 | 151.45 | 104.19 | 257.53 | 833.65 |
| පෙබරවාරි | 273.55 | 150.78 | 40.75 | 213.64 | 678.72 |
| මාර්තු | 449.98 | 172.08 | 99.50 | 353.53 | 1075.09 |
| අප්‍රේල් | 409.65 | 83.95 | 111.85 | 225.72 | 831.17 |
| මැයි | 338.05 | 81.20 | 76.75 | 220.96 | 716.96 |
| ජූනි | 420.85 | 110.70 | 99.45 | 291.01 | 922.01 |
| ජූලි | 457.94 | 138.80 | 84.45 | 555.10 | 1236.29 |
| අගෝස්තු | 385.40 | 154.15 | 112.73 | 418.82 | 1071.10 |
| සැප්තැම්බර් | 423.08 | 94.90 | 92.12 | 295.51 | 905.61 |
| ඔක්තෝබර් | 529.46 | 92.50 | 64.15 | 290.83 | 976.94 |
| නොවැම්බර් | 337.35 | 132.90 | 52.75 | 221.31 | 744.31 |
| දෙසැම්බර් | 574.45 | 88.78 | 106.45 | 304.25 | 1073.93 |
| එකතුව | 4920.24 | 1452.19 | 1045.14 | 3648.21 | 11065.78 |

මූලය : ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන II-12**

**ශ්‍රී ලංකා මහ බැංකුව මගින් විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් - 2010**

ඇ.එ.ජ.ඩොලර් මිලියන

| මාසය | මිලට ගැනීම් | විකුණුම් | ශුද්ධ මිලට ගැනීම් |
|---|---|---|---|
| ජනවාරි | 27.25 | 34.15 | (6.90) |
| පෙබරවාරි | 28.50 | 80.85 | (52.35) |
| මාර්තු | 44.55 | 4.00 | 45.00 |
| අප්‍රේල් | 199.40 | 79.65 | 119.75 |
| මැයි | 62.50 | - | 62.50 |
| ජූනි | 59.50 | 25.85 | 33.65 |
| ජූලි | 101.10 | 9.75 | 91.35 |
| අගෝස්තු | 87.00 | 65.40 | 21.60 |
| සැප්තැම්බර් | 37.50 | 106.60 | (69.10) |
| ඔක්තෝබර් | 35.50 | 324.40 | (288.70) |
| නොවැම්බර් | - | 89.35 | (89.35) |
| දෙසැම්බර් | 70.40 | - | 70.40 |
| එකතුව | 753.20 | 819.80 | (66.60) |

මූලය : ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 16. කළමනාකාරිත්ව විගණන

ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු වඩාත් ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමෙහිලා එහි මෙහෙයුම් කටයුතුවලට වටිනාකම් එකතු කිරීම සහ එහි අභ්‍යන්තර පාලන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා තහවුරු කිරීමේ සේවාවන් හා උපදේශන සේවාවන් සපයමින් කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව 2010 වර්ෂය තුළදී ද කටයුතු කරන ලදී. ඒ අනුව කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්නා මෙහෙයුම් පද්ධති සහ ඒවායෙහි අභ්‍යන්තර පාලන ක්‍රම, අවදානම් කළමනාකරණ ක්‍රම සහ යහ පාලන ක්‍රියාවලීන් ඇගයීමට භාජනය කළ අතර, අවශ්‍ය අවස්ථාවලදී ඒවායෙහි වැඩි දියුණුව සඳහා යෝජනා සහ නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී.

තහවුරු කිරීමේ සේවාවන් හා උපදේශන සේවාවන් සැපයීමේදී ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් හා මනා පරිචයන්ට අනුව විගණන කටයුතුවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම ඉතා වැදගත් පූර්ව අවශ්‍යතාවයක් වේ. මේ සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් පදනම් කර ගනිමින් කොලම්බස් ඇඩ්වයිසරි ආයතනය (Columbus Advisory Sdn. Bhd.) මැලේසියානු අභ්‍යන්තර විගණනකයින්ගේ ආයතනය හා එක්ව සිදුකරනු ලැබූ කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතුවල ගුණාත්මකභාවය සමාලෝචනය කිරීමේ (Quality Assessment Review) වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් සිය විගණන පැවරුම් සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කිරීමේදී අභ්‍යන්තර විගණකයින්ගේ ආයතනය විසින් ප්‍රකාශිත විගණන ප්‍රමිතීන්ට අනුව කටයුතු කරන ලදී.

එසේම දෙපාර්තමේන්තුවේ කටයුතු සාම්ප්‍රදායික විගණන ක්‍රමවේදය වෙනුවට අවදානම් පදනම් කරගත් විගණන ක්‍රමවේදයක් සඳහා යොමු කරවීම පිණිස විවිධ පියවරයන් දියත් කරන ලදී. අවදානම් පදනම් කරගත් විගණන ක්‍රමයක් සඳහා පරිවර්තනය වීමේ මුල් පියවරක් ලෙස 2010 සඳහා වූ වාර්ෂික විගණන සැලැස්මෙහි කොටසක් එකී සිද්ධාන්තයන්ට අනුව සකස් කොට ක්‍රියාත්මක කරන ලදී.

තවද, කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව 2010 වසර අගදී මෙතෙක් සිදුකළ ඇතැම් පූර්ව විගණන කටයුතුවලින් සම්පූර්ණයෙන්ම මිදී බැංකුවේ එකී කළමනාකාරිත්ව කටයුතුවල නිරතවීම අත්හිටුවන ලදී. විගණන කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා උපයෝගී වන ප්‍රමිතීන් හා මනා පරිචයන්ට අනුව සෑම විගණන කටයුත්තකටම පසු, විගණනයට භාජනය වූ අදාළ දෙපාර්තමේන්තුව සමඟ සමාලෝචන රැස්වීමක් පවත්වා විගණන නිරීක්ෂණයන් දැනුම් දී ඉන් අනතුරුව විගණන වාර්තාව නිකුත් කිරීම 2010 වසර තුළදී ක්‍රියාවට නැංවූ තවත් සුවිශේෂී පියවරකි.

දෙපාර්තමේන්තුව විසින් තම සේවක මණ්ඩලයේ නිපුණතා මට්ටම වැඩි දියුණු කිරීම සඳහා 2010 වර්ෂය තුළදී ද අඛණ්ඩව කටයුතු කරන ලදී. තවද, ඉහළ කළමනාකාරිත්වයේ හා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව දෙපාර්තමේන්තුවට නව නිලධාරීන් කිහිපදෙනෙක් අනුයුක්ත කරගන්නා ලදී. එමෙන්ම අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධි හා යහපාලන ක්‍රම පිළිබඳව කාර්ය මණ්ඩලයෙහි දැනුම වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවන්ට නිලධාරීන් යොමු කරන ලදී. තවද, කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හට භාණ්ඩාගාර මෙහෙයුම් හා කළමනාකරණය, මූල්‍ය ප්‍රතිපත්ති, ගිණුම්කරණය, කාර්යාල ක්‍රමවේදයන් හා අදාළ වෙනත් විෂයයන් සම්බන්ධයෙන් බැංකුව විසින් පැවැත්වූ පුහුණු පාඨමාලාවන්ට සහභාගිවීමේ අවස්ථාව ලබාදෙන ලදී.

2010 වර්ෂය තුළදී කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් තොරතුරු පද්ධති විගණන කාර්යයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සතු සම්පත් සහ නිපුණතාවයන් වර්ධනය කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවන් සඳහා නිලධාරීන් යොමුකළ අතර විගණන මෘදුකාංගයක් වන ACL (Audit Command Language) ආධාරයෙන් පරිගණකගත පද්ධතිවල තොරතුරුවලට ප්‍රවේශවීමට හා ඒවා විශ්ලේෂණය කිරීමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට අවශ්‍ය පුහුණුව ලබාදීම මීත් ප්‍රධාන ක්‍රියාමාර්ග කිහිපයක් වේ.

මේ අතර 2011 වර්ෂය වෙනුවෙන් අවදානම් පදනම් කරගත් විගණන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් බාහිර විගණක සමාගමක සේවය ලබා ගන්නා ලදී. මෙකී කටයුත්තට බාහිර පාර්ශවයක් සම්බන්ධ කර ගැනීමට මූලික හේතුව වන්නේ දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු, අවදානම් පදනම් කරගත් ක්‍රමවේදය වෙත පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවයයි.

2010 වර්ෂය තුළදී විගණන ක්‍රියාවන්හි ඉහත සඳහන් කළ වර්ධනයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ 2010 - 2014 උපාය මාර්ගික සැලැස්මෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඵලදායී ලෙස සහාය වීම සඳහා අනුමත වාර්ෂික විගණන සැලැස්ම අනුව විගණන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. එමගින් අනෙකුත් දෙපාර්තමේන්තුවල ක්‍රියාවලීන් හා පාලන පද්ධතීන් සම්බන්ධව ස්වාධීන තහවුරු කිරීම් සහ උපදේශන සේවා සැපයීම මගින් එම දෙපාර්තමේන්තුවල කටයුතුවලට වටිනාකම් එකතු කිරීමක් සිදුකරන ලදී.

තවද, 2010 වර්ෂයේ වාර්ෂික විගණන සැලැස්මෙහි අඩංගු විගණන පැවරුම්වලට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශුද්ධ ජාත්‍යන්තර සංචිත සහ සංචිත මුදල් පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත දත්ත වාර්තාකරණය කිරීමේ ක්‍රමවේදයෙහි නිරවද්‍යතාවය සහතික කිරීම පිණිස මෙම දෙපාර්තමේන්තුව විසින් විස්තීර්ණ ක්‍රියාවලි අධ්‍යයනයක් සිදු කරන ලදී. එම විශේෂ අධ්‍යයනය මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වාර්තා කරන දත්තයන්හි වලංගුභාවය තවදුරටත් සහතික කරනු ලැබීය. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් 2010 මාර්තු, ජූනි හා සැප්තැම්බර් මාස අවසානයට නියමිතව තිබූ පරීක්ෂණ දිනයන්හිදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වාර්තා කරන ලද දත්තයන්හි නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා කටයුතු කරන ලදී.

2010 වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන විගණන පැවරුම් අතර පාර්ශවකරුවන්ගේ අවදානම් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදය අධීක්ෂණය කිරීම, ජාතික ගෙවීම් පද්ධතිය අධීක්ෂණය, නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් පද්ධතිය හා මධ්‍යම තැන්පතු ක්‍රමය සම්බන්ධව අන්තර්ජාතික පියවීම් බැංකුව මගින් නිකුත් කළ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය නිරීක්ෂණය කිරීම යන්න ප්‍රමුඛ වේ. තවද, විදේශ සංචිතවල වර්ධනයත් සමගම ගෙවීම් හා පියවීම් කටයුතු අධීක්ෂණය සඳහා විගණන නිලධාරීන් පූර්ණ කාලීනව ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ සේවය සඳහා යොදවන ලදී. තවද, විදේශ සංචිත කළමනාකරණය සම්බන්ධ විවිධ විගණන පැවරුම් රාශියක් 2010 වර්ෂය තුළදී ක්‍රියාවට නංවන ලදී. එමෙන්ම තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය, මෘදුකාංග නිර්මාණය, වැටුප් හා වේතන පද්ධතිය සහ ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමේ සැලසුම යනාදිය තොරතුරු පද්ධති විගණන කාර්යය යටතේ විමර්ශනය කරන ලදී. ඊට අමතරව, විගණන පැවරුම් සිදු කිරීමේදී පරිගණකගත පද්ධතිවල තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා ACL මෘදුකාංගය භාවිතා කරන ලදී.

2008, 2009 හා 2010 වර්ෂයේ මුල් හය මාසය තුළදී සිදු කළ විගණන පැවරුම් පසු විපරම් කරමින් අදාළ දෙපාර්තමේන්තු මගින් විගණන නිර්දේශ කාර්යක්ෂමව හා එකඟ වූ කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා පශ්චාත් විගණන පරීක්ෂාවන් ද සිදුකරන ලදී. එමෙන්ම, ඉහළ කළමනාකරණය විසින් පවරන ලද විශේෂිත විගණන පැවරුම්වලට යොමුවීම හා සුභසාධන දෙපාර්තමේන්තුවට සහ ලේකම් දෙපාර්තමේන්තුවට අදාළ පූර්ව විගණන කටයුතු සිදු කිරීම 2010 වර්ෂය තුළදී සිදුකළ අනෙකුත් ක්‍රියාකාරකම් කිහිපයකි.

තවද, අභ්‍යන්තර විගණනයේදී ඉතාම වැදගත් සේවාවක් වන විගණනයන්හි නිරීක්ෂණ හා යෝජිත නිර්දේශයන් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අධිපතිතුමා, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව හා මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලද අතර, අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

## 17. ගෙවීම් සහ පියවීම්

ශ්‍රී ලංකාව තුළ ගෙවීම් සහ පියවීම් හා සම්බන්ධ යටිතල පහසුකම්වල සුරක්ෂිත බව, කාර්යක්ෂම බව, තරඟකාරී බව සහ ස්ථායීතාවය සහතික කිරීමේ අරමුණ ඇතිව ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය සඳහා මෙන්ම ජාතික ගෙවීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා ද අවශ්‍ය නීතිමය බලය 2005 අංක 28 දරණ ගෙවීම් සහ පියවීම් පද්ධති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇත. මෙම අරමුණු ළඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ආරක්ෂිත, ස්ථායී සහ කාර්යක්ෂම ගෙවීම් සහ පියවීම් පද්ධතියක් පවත්වා ගෙනයාමේ මෙහෙවර ඉටුකරනු ලබන්නේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගිනි. ඒ අනුව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පද්ධතිමය වශයෙන් වැදගත් ඉහළ වටිනාකමෙන් යුතු අන්තර් බැංකු ගෙවීම් සහ පියවීම් සඳහා වන තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාමත්, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විදේශ සංචිත කළමනාකරණය කිරීමට අවශ්‍ය ගෙවීම් සහ පියවීම් දත්ත සැකසීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීමත්, විවට වෙළෙඳ කටයුතු පිළිබඳ ගනුදෙනු පියවීමත්, ස්විෆ්ට් සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීමත්, තවදුරටත් නොකඩවා සිදුකරන ලදී. එමෙන්ම, ගෙවීම් සහ පියවීම් පද්ධතියේ නිසි ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමත්, ගෙවීම් පද්ධතිවල ස්ථායීතාවයට බලපෑ හැකි අවදානම් අවම කිරීමත් සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ අවේක්ෂණය කිරීමේ බලය ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට පවරා ඇත. මීට අමතරව කලාපීය රටවල් සමග පවත්නා අන්‍යෝන්‍ය සහයෝගිතාවය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව ආසියානු නිෂ්කාශන සංගමයේ සාමාජික රටවල් අතර ගනුදෙනු පියවීමට පහසුකම් සැලසීමත්, සාක් ගෙවීම් ප්‍රවේශයෙහි ලේකම් කාර්යාලය ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පවත්වා ගෙනයාමත් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

## 17.1 තත්කාලීන දළ පියවීම් පද්ධතිය මෙහෙයවීම

ලංකාසෙට්ල් පද්ධතිය මගින්, මූල්‍ය වෙළෙඳපොළෙහි කාල සංවේදී අන්තර් බැංකු ගෙවීම් මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් ද, තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීමට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. වැඩිවන ගනුදෙනු අවශ්‍යතා සහ තාක්ෂණික දියුණුවට ගැලපෙන ලෙස පද්ධතියට අවශ්‍ය වැඩි දියුණු කිරීම් කටයුතු ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ගතවූ වසර තුළදී සිදුකරන ලදී. පද්ධතියෙහි මෙහෙයුම් සිදුවන කාලය තුළදී සහභාගිත්ව ආයතනවලට අවශ්‍ය වන උපකාරක සේවා ලබාදීම ද 2010 වර්ෂය තුළදී සිදු කරන ලදී. මෙම වර්ෂය තුළදී තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ සිදුකල ගනුදෙනු සංඛ්‍යාව 246,824 ක් වූ අතර එම ගනුදෙනුවල මූල්‍යමය වටිනාකම රුපියල් ට්‍රිලියන 47 ක් විය. 2010 වර්ෂය තුළදී තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ එක් දිනකදී වාර්තා කළ වැඩිම ගනුදෙනු සංඛ්‍යාව 1,729 ක් ද, වැඩිම මූල්‍ය වටිනාකම රුපියල් බිලියන 446 ක් ද විය. වර්ෂය තුළ සිදුකල ගනුදෙනු සංඛ්‍යාවේ සහ මූල්‍ය වටිනාකම්වල දෛනික සාමාන්‍යය පිළිවෙලින් 1,024 ක් සහ රුපියල් බිලියන 198 ක් විය. ලංකාසෙට්ල් පද්ධතිය මගින් පියවෙන ගනුදෙනු ප්‍රවාහයෙහි සුමට ක්‍රියාකාරිත්වය පවත්වාගැනීම සඳහා, දෛනිකව ලබාදෙන ද්‍රවශීලතා පහසුකම ඉල්ලා සිටි තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වෙත දෛනිකව රුපියල් බිලියන 11.4 ක් නිදහස් කිරීම සහ ඒවා නිරීක්ෂණය කිරීම සඳහා ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

2010 වර්ෂය අවසානයේ දී තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වූයේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු 22 ක්, බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන් 6 ක්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවේ මධ්‍යම තැන්පතු පද්ධතිය යන ආයතනයන්ය. ප්‍රාථමික වෙළෙන්දෙකුව සිටි සෙලාන් බැන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ආයතනය, සෙලාන් බැංකුව සමග ඒකාබද්ධ වීම නිසා 2010 වර්ෂය අවසානය වන විට ලංකා සෙට්ල් පද්ධතියේ සහභාගිත්ව ආයතන සංඛ්‍යාව 31 දක්වා අඩු විය. කාර්යසාධන දර්ශකයක් ලෙස ගත් විට තත්කාලීන දළ පියවීම් පද්ධතියේ ක්‍රියාකාරී පැවැත්ම 2010 වර්ෂය තුළ දී සියයට 99.72 ක් ලෙස පවත්වා ගැනීමට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට හැකි විය. හදිසි අවස්ථාවක දී පද්ධතියෙහි ක්‍රියාකාරී පැවැත්ම සේවා බිඳ වැටීමකින් තොරව පවත්වාගත හැකි බව තහවුරු කර ගැනීම සඳහා ප්‍රතිප්‍රාප්ති වැඩබිම්මෙහි සිට දෙවතාවක්ම සජීවී මෙහෙයුම් කටයුතු සාර්ථකව සිදුකරන ලද අතර, ප්‍රතිප්‍රාප්ති වැඩ බිමෙහි කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම ද සිදුකරන ලදී. සහභාගිත්ව ආයතනවල ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති විධි විධානයන්ට අනුව වැඩි දියුණු කිරීමට උනන්දු කරවනු ලැබීය.

සහභාගිත්ව ආයතනවල ඉල්ලීම මත සපයන ලද දෛනිකව ලබාදෙන ද්‍රවශීලතා පහසුකම, 2010 පෙබරවාරි මස සිට සහභාගිත්ව ආයතනවල අභිමතය පරිදි දවස තුළ ඕනෑම වේලාවක දී සලසා ගත හැකි වන ආකාරයට එම පහසුකම ක්‍රියාත්මක කෙරෙන ක්‍රමවේදය වැඩිදියුණු කරන ලදී. තවද, පූර්ව දැනුම් දීමකින් තොර නිවාඩු දිනයන් යෙදුන විට ලංකාසෙට්ල් පද්ධතියෙහි දෛනික ගනුදෙනු පියවීම සඳහා ක්‍රමවේදයක් 2010 වර්ෂයේ දී හඳුන්වා දෙන ලදී. එමෙන්ම වියදම අයකර ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා ගත් තීරණය මත පදනම්ව, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ ගනුදෙනුවක් සඳහා අය කරන ගාස්තුව, 2010 මැයි මස 01 වැනිදා සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 400 සිට රුපියල් 420 දක්වා ඉහළ දමන ලදී.

## 17.2 විදේශ විනිමය සංචිත කළමනාකරණයට අදාළ ගනුදෙනු පියවීම

2010 වර්ෂය තුළදී ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ගනුදෙනු සඳහා භාණ්ඩාගාර ගනුදෙනු කළමනාකරණ ක්‍රමය මගින් සුමට හා විශ්වසනීය පියවීම් ක්‍රමවේදයක් සපයා දෙමින් විදේශ විනිමය, රන් සහ විදේශ සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ පසු මෙහෙයුම් කාර්යාල කටයුතු සැලසීම, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදුකරන ලදී. ඒ අනුව, 2010 වර්ෂය තුළ දී ඩොලර් බිලියන 139.45 ක වටිනාකමකින් යුත් ගනුදෙනු 19,030 කට අදාළ ගෙවීම් පියවන ලදී. 2009 වර්ෂය හා සසඳන විට දී දැකිය හැකි වූ සුවිශේෂී ලක්ෂණයක් වූයේ 2010 වර්ෂයේ දී සිදුකරන ලද ගනුදෙනුවල ප්‍රමාණය සියයට 165 කින් වැඩි වීමයි.

මෑත කාලයේ දී රටෙහි විදේශ වත්කම්වල සිදුවූ සැලකිය යුතු වර්ධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද විදේශ විනිමය, රන් සහ විදේශ සුරැකුම්පත් හා සම්බන්ධ ගනුදෙනුවල වැඩිවීමක් සිදුවූ අතර, එම වර්ධනය ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ගනුදෙනු මෙහෙයුම් මැදිරියේ (Dealing Room) කටයුතු නවීකරණය කිරීමෙහි ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට හේතුපාදක විය. මෙම නවීකරණය තුළින් ඉදිරියේ දී වැඩි වේ යැයි අපේක්ෂිත ගනුදෙනු සඳහා සේවා සැපයීමටත්, ගනුදෙනු මෙහෙයුම් මැදිරියේ බහු වැඩ මුර ක්‍රමයට අනුබලයක් දීමටත්, වෙළෙඳ කළඹෙහි පරිමාව විස්තාරණය කිරීමටත්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත වීමටත් බලාපොරොත්තු වේ.

මෙම වර්ධනයට සාපේක්ෂව ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් වැඩිවන ගනුදෙනුවලට සරිලන පරිදි පසු මෙහෙයුම් කාර්යාල ගනුදෙනු ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මානව සහ මෙහෙයුම් ධාරිතාවය වැඩි දියුණු කරන ලද අතර පියවීම් ක්‍රියාවලියේ දී ඇතිවන ගැටළු නිරාකරණය කරගැනීම සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරන ලදී. මීට අමතරව, පසු මෙහෙයුම් කාර්යාලයේ තාක්ෂණික අවශ්‍යතාවයන් පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමත්, තෝරාගත් තාක්ෂණික සේවා සපයන්නන් විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික විසඳුම් ඇගයීමේ ක්‍රියාවලියට සහභාගිවීමත් තුළින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ගනුදෙනු මෙහෙයුම් මැදිරියේ නවීකරණ කටයුතු හා ක්‍රියාශීලීව සම්බන්ධ විය. තවද යූරෝක්ලියර් පද්ධතියේ ඇති කරන ලද වර්ධනයන්ට සමගාමීව යමින් පවත්නා භාණ්ඩාගාර ගනුදෙනු කළමනාකරණ ක්‍රමය තවදුරටත් නවීන ක්‍රමෝපායයන්ට අනුගත වන අයුරින් දියුණු කිරීමේ කාර්යයටද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සහභාගි විය.

### 17.3 විවට වෙළෙඳ කටයුතු පිළිබඳ ගනුදෙනු පියවීම

සහභාගිත්ව ආයතන සමග කරන ලද විවට වෙළෙඳ ගනුදෙනුවලට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සුරැකුම්පත් කළඹෙන් සහභාගිත්ව ආයතන වෙත සුරැකුම්පත් වෙන්කර දීමේ වගකීම තවදුරටත් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලදී. 2010 වර්ෂය තුළදී වටිනාකම රුපියල් බිලියන 10,723 ක් වූ ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 8,201 ක් ද වටිනාකම රුපියල් බිලියන 13.3 ක් වූ ස්ථිර පදනමක් මත කරන ලද විකුණුම් ගනුදෙනු 37 ක් ද වටිනාකම රුපියල් බිලියන 1,467 ක් වූ මහ බැංකු සුරැකුම්පත් ගනුදෙනු 1,270 ක් ද සඳහා පියවීම් කටයුතු සිදුකරන ලදී. ස්ථිර පදනමක් මත කරන ලද මිලදී ගැනීම් කටයුතු මෙම වසර තුළදී සිදු නොකෙරිනි. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් විවට වෙළෙඳ කටයුතු සඳහා තම පසු මෙහෙයුම් කාර්යාල පහසුකම තවදුරටත් වැඩි දියුණු කරමින්, දෛනිකව ලබා දෙන ද්‍රවශීලතා පහසුකම ලබාදීමත්, එම ද්‍රවශීලතා පහසුකම පියවනු ලබන ආකාරය නිරීක්ෂණය කිරීමත් සිදුකරන ලද අතර 2010 වර්ෂය තුළදී වටිනාකම රුපියල් බිලියන 2747.3 ක් වූ ගනුදෙනු 7,427 ක් සඳහා පහසුකම් සපයන ලදී.

### 17.4 ස්විෆ්ට් සන්නිවේදන කටයුතු

පාලන ක්‍රමවේද ව්‍යුහකරණ ක්‍රියාදාමයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පිළිවෙත් යනාදිය පිළිබඳව ස්විෆ්ට් මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාදාමයන්ට අනුකූලව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් සන්නිවේදන පද්ධතිය කළමනාකරණය කරන ලදී.

2010 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යවන ලද සහ ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබුණු ස්විෆ්ට් පණිවුඩ සංඛ්‍යාව පිළිවෙලින් 1,538,588 ක් සහ 816,060 ක් විය. 2010 වර්ෂයේ ලැබුණු මුළු පණිවුඩ සංඛ්‍යාවෙන් 212,480 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනුවලට අදාළ ඒවා වූ අතර, ඉතිරිය තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ සුරැකුම්පත් ආශ්‍රිත ගනුදෙනු හා සම්බන්ධ පණිවුඩ විය.

### 17.5 ආසියානු නිෂ්කාශන සංගමයේ (ආ.නි.සං.) ගනුදෙනු

ශ්‍රී ලංකාව ආ.නි.සං. යාන්ත්‍රණය හරහා කරන ලද මුළු ගනුදෙනුවල වටිනාකම 2009 වර්ෂයේ දී රුපියල් බිලියන 190.7 සිට 2010 වර්ෂයේ දී රුපියල් බිලියන 309.8 ක් දක්වා සියයට 62 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. එයට ප්‍රධාන හේතුව වූයේ ආ.නි.සං. යාන්ත්‍රණය හරහා ඉරානයෙන් ආනයනය කරන තෙල් සඳහා ගෙවීම් නැවත ආරම්භ කිරීමයි. 2010 වර්ෂය තුළ දී ආ.නි.සං. යාන්ත්‍රණය හරහා සිදුකරන ලද මුළු ගනුදෙනු ප්‍රමාණය සියයට 16 ක වර්ධනයක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස ආ.නි.සං. යාන්ත්‍රණය හරහා කරන ලද ශුද්ධ පියවීම්වල රුපියල් වටිනාකම 2009 වර්ෂයේ දී බිලියන 158.5 සිට 2010 වර්ෂයේ දී බිලියන 265.2 දක්වා වර්ධනය විය.

**සංඛ්‍යා සටහන II-13**

**ආසියානු නිෂ්කාශන සංගමයේ සාමාජික රටවල් සමග ශ්‍රී ලංකාවේ ආ.නි.සං. ගනුදෙනු වටිනාකම (රුපියල් බිලියන)**

| අයිතමය | 2009 | 2010 |
|---|---|---|
| ආ.නි.සං. හරහා සිදුකරන ලද මුළු ගනුදෙනු | 190.7 | 309.8 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං. රටවලට කරන ලද අපනයන | 67.0 | 85.0 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං. රටවලින් කරන ලද ආනයන | 339.6 | 428.4 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං. රටවල් සමග කරන ලද මුළු වෙළෙඳ ගනුදෙනු | 406.6 | 513.4 |
| ආ.නි.සං. ගනුදෙනුවල ශුද්ධ පියවීම් | 158.5 | 265.2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

38 වන ආ.නි.සං. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගන්නා ලද තීරණයකට අනුව මාලදිවයින් ජනරජය වෙත ආ.නි.සං.හි සාමාජිකත්වය පිරිනමන ලද අතර එහෙයින් මාලදිවයින් මූල්‍ය අධිකාරිය මගින් 2010 ජනවාරි මස සිට ආ.නි.සං. මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව, ආ.නි.සං. හි සාමාජික රටවල් ගණන 9 දක්වා ඉහළ ගියේය. 39 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 2010 ජූනි මාසයේ දී භූතානයේ දී පැවැත්වුනු අතර එහි දී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ ඉන්දියානු මහ බැංකුව (Reserve Bank of India) විසින් කැඳවන ලද තාක්ෂණික කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ කෙරෙහිය. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පහත සඳහන් නිර්දේශ ඒකමතිකව සම්මත කරන ලදී.

1. සම්මන්ත්‍රණ මගින් වාණිජ බැංකුවල, වෙළෙඳ ආයතනවල සහ වාණිජ මණ්ඩලවල සේවකයින් දැනුම්වත් කිරීම, ආ.නි.සං. ගනුදෙනු සම්බන්ධයෙන් රටවල් අතර ඇති වන ආරවුල් බේරුම් කිරීම සඳහා ක්‍රමවේදයන් සහ ක්‍රියාපටිපාටි පිහිටුවීම සහ පණිවුඩ හුවමාරුව, ගිණුම්ගත කිරීම සහ ගිණුම් සැසඳීම සඳහා ආ.නි.සං. සාමාජික රටවලට සහ ආ.නි.සං. ලේකම් කාර්යාලයට අන්තර්ජාලය පදනම් කරගත් පරිගණක පද්ධතියක් ඇති කිරීම මගින් ආ.නි.සං. යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම.

2. දැනට පවත්නා මාස දෙකක පියවුම් හුවමාරු කරගැනීමේ පහසුකම තවදුරටත් පවත්වා ගෙන යාම; ගනුදෙනු සඳහා දේශීය මුදල් වර්ග භාවිතා කිරීමේ යෝග්‍යතාවය සහ ශක්‍යතාවය සොයා බැලීම; මූල්‍යමය සහයෝගිතාවය වැඩි දියුණු කිරීම සඳහා ආ.නි.සං. වෙළෙඳ සහ සංවර්ධන බැංකුවක් පිහිටුවීම සහ වෙළෙඳ මූල්‍යකරණ ක්‍රම හඳුන්වා දීම යන අරමුණු ඇතිව ආ.නි.සං.හි විෂය පථය පුළුල් කිරීම.

එමෙන්ම ආ.නි.සං.හි විෂය පථය පුළුල් කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනා පිරික්සීමට තාක්ෂණික කමිටුවක් පත්කිරීමට ද තීරණය විය. ආ.නි.සං. හි 40 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 2011 වර්ෂයේ දී ඉන්දියාවේ දී පැවැත්වීමට නියමිතය. වසරෙන් වසර මාරුවීමේ මූලධර්මය අනුගමනය කරමින් වර්ෂ 2011 දී ආ.නි.සං. සභාපතිත්වය ඉන්දියානු මහ බැංකුවේ අධිපතිවරයා විසින් ද උප සභාපතිත්වය ඉරාන ඉස්ලාමීය ජනරජයේ මහ බැංකු අධිපතිවරයා විසින් ද දරනු ඇත.

## 17.6 ගෙවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ අධීක්ෂණය

ගතවූ වර්ෂය පුරා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පද්ධති ස්ථායීතාවය ආරක්ෂා කිරීමේ අරමුණු ළඟාකර ගැනීම සඳහා ගෙවීම් සහ පියවීම් පද්ධති ස්ථායීතාවය පවත්වා ගැනීමට අවශ්‍ය නියාමන සහ අධීක්ෂණ කටයුතු නොකඩවා සිදුකරන ලදී. ගතවූ දශකයෙහි අවසාන භාගය තුළදී ගෙවීම් සහ පියවීම් පද්ධති අධීක්ෂණයේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරන ලද්දේ විද්‍යුත් මාර්ගයෙන් කෙරෙන සුළු පරිමාණ ගෙවීම් පද්ධති කෙරෙහිය. නියාමනය නොකරන ලද ගෙවීම් කාඩ්පත් කර්මාන්තයෙහි ඇති අවදානම් සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවය කෙරෙහි ඇති විය හැකි ඍණාත්මක බලපෑම් සැලකිල්ලට ගනිමින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් නියාමනය සහ අධීක්ෂණය සඳහා නීතිමය බලතල හිමිවන ආකාරයට 2009 අංක 1 දරණ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මෙම නියෝගවලට අනුව ශ්‍රී ලංකාව තුළ ගෙවීම් කාඩ්පත් කර්මාන්තයෙහි රැඳී සිටීමට නම් සෑම ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවෙකුම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් වාර්ෂිකව බලපත්‍රයක් ලබා ගත යුතුය. ඒ අනුව සේවා සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ඇගයීමෙන් පසු 2010 වසර තුළ දී සේවා සැපයුම්කරුවන් 17 දෙනෙකුට තම ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී. එමෙන්ම නියාමන, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ යනාදිය නිකුත් කිරීමට මෙම නියෝග මගින් දී ඇති බලය අනුව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් 2010 මාර්තු මස 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි 2010 අංක 1 දරණ ණය කාඩ්පත් මෙහෙයුම් උපදෙස් මාලාව නිකුත් කරන ලද අතර ඒ අනුව දුරස්ථ අධීක්ෂණ කටයුතු ද ආරම්භ කරන ලදී. මෙම මෙහෙයුම් උපදෙස්වල ප්‍රධාන අරමුණ වන්නේ සුරක්ෂිත, ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ණය කාඩ්පත් ව්‍යාපාරයක් ඇති කිරීමත් කාඩ්පත් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත්ය. මෙයට අමතරව ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස්වලට අනුව ශ්‍රී ලංකා ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරික සංගමය විසින් ණය කාඩ්පත් නිකුත්කරන්නන් සඳහා චර්යාධර්ම මාලාවක් සකස් කරමින් සිටී. මෙම චර්යාධර්ම මාලාව පිළියෙල කිරීම 2011 වර්ෂයේ දී අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර, එය කාඩ්පත් හිමියන් සමග ගනුදෙනු කිරීමේ සේවා නියමයන් පිළිබඳ මිණුම් දණ්ඩක් ලෙසද කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

එපමණක්ද නොව මූල්‍ය වෙළෙඳපොළ තුළ ජංගම දුරකථන පදනම් කරගත් ගෙවීම් ක්‍රමවලට නැඹුරුවීමේ ප්‍රවණතාව සැලකිල්ලට ගනිමින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් මෙම ගෙවීම් ක්‍රමවලට සුරක්ෂිත වාතාවරණයක් ඇති කිරීම සඳහා එම ගෙවීම් ක්‍රම නියාමනයට මෙහෙයුම් උපදෙස් මාලාවක් කෙටුම්පත් කරන ලදී. ජංගම දුරකථන පදනම් කරගත් ගෙවීම් ක්‍රම සඳහා වූ මෙහෙයුම් උපදෙස් කෙටුම්පත මහජනතාවගේ අදහස් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි පළකරන ලද අතර එම මෙහෙයුම් උපදෙස් මාලාව 2011 පළමු කාර්තුව තුළදී නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.

ජාතික ගෙවීම් කවුන්සිලයේ පෙර දැක්මෙහි පැවැති ප්‍රධාන මෙහෙයුමක් ක්‍රියාවට නංවමින් ලංකාක්ලියර් සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන දැනට පවතින ප්‍රධාන සුළු පරිමාණ ගෙවීම් පද්ධතියක් වන ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය ගනුදෙනු කරන දිනයේම පියවිය හැකි මාර්ගගත ගෙවීම් පද්ධතියක් දක්වා වැඩි දියුණු කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියේ මෙහෙයුම්කරු සහ සහභාගිත්ව ආයතන විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් සකස් කරන ලද අතර, 2011 මුල් භාගය තුළදී එය නිකුත් කිරීමට නියමිතය.

පද්ධතිමය වශයෙන් වැදගත් ගෙවීම් පද්ධතියේ මෙහෙයුම් කටයුතුවල විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ සියළුම සහභාගිත්ව ආයතනවල ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීම නොකඩවා සිදුකරන ලදී. ඒ අනුව ව්‍යාපාර අඛණ්ඩතා ඇගයීමේ දෙවන අදියර ලෙස ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනවල ප්‍රතිප්‍රාප්ති වැඩබිම් පරීක්ෂා කිරීමත්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් වැඩි දියුණු කිරීමට පළමුවන අදියරේ දී දෙන ලද උපදෙස් පිළිපැදීමත් අධීක්ෂණය කරන ලදී. 2010 වර්ෂය තුළදී සහභාගිත්ව ආයතන 18 ක ප්‍රතිප්‍රාප්ති වැඩබිම් පරීක්ෂා කරන ලද අතර ඒවා තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා උපදෙස් ලබාදෙන ලදී.

ඡායාගත චෙක්පත් පිළිඹිබු නිෂ්කාශන පද්ධතිය හඳුන්වාදීමත් සමග ශ්‍රී ලංකාව පුරාම චෙක්පත් නිෂ්කාශන කාලය T+1 දක්වා අඩු වීමක් බලාපොරොත්තු විය. චෙක්පත් නිෂ්කාශන ක්‍රියාවලිය සහ චෙක්පත් නිෂ්කාශනයට ගතවන කාලය පිළිබඳ ගනුදෙනුකරුවන්ගේ අදහස් දැනගැනීම පිණිස ජාතික ගෙවීම් කවුන්සිලයේ උපදෙස් මත ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල උපකාර ඇතිව උතුරු නැගෙනහිර ප්‍රදේශ හැර අනෙකුත් සියළු ප්‍රදේශ ආවරණය වන පරිදි සමීක්ෂණයක් 2009 වර්ෂයේ දී පවත්වන ලදී. 2010 දී අවසන් කරන ලද එම සමීක්ෂණ වාර්තාව අනුව චෙක්පත් නිෂ්කාශන ක්‍රියාවලියත් චෙක්පත් නිෂ්කාශනයට ගතවන කාලය පිළිබඳවත් ගනුදෙනුකරුවන්ට පැහැදිලි අවබෝධයක් නොමැති බව හෙළිදරව් විය. එම නිසා ඡායාගත චෙක්පත් පිළිඹිබු නිෂ්කාශන ක්‍රමය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුව කටයුතු කරන ලෙසට සහ ගනුදෙනුකරුවන් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගන්නා ලෙසටත් සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකුවලට උපදෙස් දෙන ලදී.

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු ප්‍රචාරණය කිරීම සඳහා නිකුත් කරනු ලබන කාර්තුමය ගෙවීම් සඟරාව ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි පළකිරීම 2010 වර්ෂය තුළදී ද කරගෙන යන ලදී.

එමෙන්ම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය ජනතාව සහ වාණිජ බැංකු කාර්ය මණ්ඩල, ගෙවීම් පද්ධති සහ අනෙකුත් අදාළ කරුණු පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### 17.7 සාක් ගෙවීම් ප්‍රවේශය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සාක් ගෙවීම් ප්‍රවේශයෙහි ලේකම් කාර්යාලයේ කටයුතු 2010 වසරේ දී නොකඩවා සිදුකරන ලදී. සාක් ගෙවීම් ප්‍රවේශයේ වෙබ් අඩවිය, අදාල තොරතුරු සහ ප්‍රගතිය පිළිබඳ කරුණු ඇතුළත් කරමින් යාවත්කාලීන කෙරිණි. 2010 වර්ෂය තුළදී සාක් ගෙවීම් විවරණිකාවේ 4 වන සහ 5 වන වෙළුම ප්‍රකාශයට පත්කරන ලදී. බංග්ලාදේශයේ දී සහ ඉන්දියාවේ දී සාක් ගෙවීම් කවුන්සිලයේ 7 වන සහ 8 වන රැස්වීම් පවත්වන ලද අතර, ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු හා ලේකම් කාර්යාල කටයුතු සිදු කරමින් අදාළ සාමාජික රටවලට සහාය දක්වනු ලැබීය.

## 18. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කරන ප්‍රතිපත්ති පිළිබඳව සමාලෝචන, පර්යේෂණ හෝ අධ්‍යයනයන් කිරීම සහ මහ බැංකු ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳව වූ විද්‍යුත් පුස්තකාලය අඛණ්ඩව යාවත්කාලීන කිරීම, උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම සහ ඉදිරි වර්ෂ 5 ක කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම වාර්ෂිකව යාවත්කාලීන කිරීම, උපාය මාර්ගික සැලසුම් වැඩමුළුව සහ සමීක්ෂණය පැවැත්වීම සහ මහ බැංකු දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම් සම්බන්ධ ප්‍රගතිය ත්‍රෛමාසිකව නිරීක්ෂණය කිරීම යන කාර්යයන්වල නියුක්ත වේ.

#### (1) ප්‍රතිපත්ති සමාලෝචනයන් සිදුකිරීම

කළමණාකාරිත්වයේ එකඟත්වය සහිතව ප්‍රතිපත්ති සමාලෝචන සහ අධ්‍යයන කිහිපයක් වර්ෂය තුළදී සිදු කරන ලද අතර ඒවා පදනම් කොටගත් ප්‍රතිපත්ති නිර්දේශ කළමණාකාරිත්වයට ඉදිරිපත් කරන ලදී. මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීමෙන් පසු ණය සැපයුම, ගැටුම්වලින් පසු උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි සංවර්ධන විභවතාවයන්, සහ යුද්ධයෙන් සංචාරක කර්මාන්තයට වූ බලපෑම යනාදිය මෙම සමාලෝචන සහ අධ්‍යයනවලට ඇතුළත් විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරන ලද විධානයන්, උපදෙස් සහ ප්‍රකාශන එක් කිරීමෙන් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳව වූ විද්‍යුත් පුස්තකාලය වර්ෂය තුළදී යාවත්කාලීන කරන ලදී. ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳව වූ විද්‍යුත් පුස්තකාලයට ශ්‍රී ලංකා මහ බැංකුවේ විද්‍යුත් තැපැල හරහා පිවිසිය හැකිය.

#### (2) 2010 - 2014 උපාය මාර්ගික සැලසුම ක්‍රියාවට නැංවීම

2010 - 2014 උපාය මාර්ගික සැලසුම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලුම නිළධාරීන් දැනුවත් කිරීමේ දෙදින වැඩමුළුවක් 2010 ජනවාරි මස පළමු සතියේදී පැවැත්විණි. ශ්‍රී ලංකා මහ බැංකු කාර්යයන් වඩා ඵලදායි ලෙස ඉටුකිරීමට සක්‍රියව දායක වීම අරභයා උපාය මාර්ගික සැලසුම ක්‍රියාවට නැංවීමේදී තම කාර්යය මනාව අවබෝධ කර ගැනීමට උපකාරී වන ලෙසින් වැඩමුළුවේ සැසි වාර, පර්ෂද මට්ටමින් සංවිධානය කෙරිණි. උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන කරුණු පිළිබඳ උසස් දැනුමක් බැංකුවේ කාර්යය මණ්ඩලය සතුව ඇති බව වැඩමුළුවේ අංගයක් ලෙස පවත්වන ලද සමීක්ෂණයෙන් ලත් තොරතුරුවලින් දැක්විණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික වැඩ මුළුව වාර්ෂිකව පැවැත්වීම යෝග්‍ය බවද සමීක්ෂණයෙන් අනාවරණය විණි.

"සෞභාග්‍යය කරා වේගවත්ව" යන තේමාව යටතේ සැකසූ ශ්‍රී ලංකා මහ බැංකුවේ සිව්වන උපාය මාර්ගික සැලසුම 2010 වර්ෂය තුළදී සාර්ථකව ක්‍රියාත්මක විය. බැංකුවේ, දෙපාර්තමේන්තු සහ පළාත් කාර්යාල එක්ව 2010 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂා කල කාර්ය භාරයෙන් සියයට 91 ඉක්ම වූ කාර්ය සාධන සාමාන්‍යයක් වාර්තා කරන ලදී. බැංකුවේ කාර්යයන්හි ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් සෑම දෙපාර්තමේන්තුවක්ම සිය ප්‍රධාන කාර්යයන් ඉලක්ක කල කාලය තුළ සම්පූර්ණ කිරීමට සමත්ව තිබිණි. උපාය මාර්ගික සැලසුමේ අරමුණු හා වගකීම් පිළිබඳ මනා අවබෝධයත්, කාර්ය මණ්ඩලයේ කැපවීමත්, මෙම ඉහළ කාර්ය සාධන මට්ටම සාක්ෂාත් කරගැනීමට ඉවහල් විය.

දෙපාර්තමේන්තුවල කාර්ය සාධනය ඇගයීම සඳහා නියමිත කාල සටහන පරිදි දෙපාර්තමේන්තු සමඟ ත්‍රෛමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විණි. එකී කාර්ය සාධන ඇගයීම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහළ කළමණාකාරිත්වයෙන් සැදුම්ලත් උපාය මාර්ගික සැලසුම් නිරීක්ෂණ කමිටුව වෙත වාර්තා කරන ලදී. උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේදී සිදුව ඇති අඩුපාඩු සහ පසුබෑසීම් හඳුනාගැනීමටත්, ඒවාට නිසි ප්‍රතිකර්ම යෙදීමට අවශ්‍ය පියවර ගැනීමටත්, කළමණාකරණයට එමගින් හැකි විය.

#### (3) 2011 - 2015 උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම

''නව යුගය සමඟින් පෙළ ගැසෙමු අළුතින්'' යන තේමා පාඨය යටතේ ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව එහි පස්වැනි උපාය මාර්ගික සැලසුම් කථිකාවත සාර්ථකව නිම කරන ලදී. මෙම තේමාව ශ්‍රී ලංකාවේ නව යුගයක නව අරුණළු ඉස්මතු කරමින් දශක තුනක දීර්ඝ කාලයක් පැවති ගැටුම් නිමාවත් සමඟ රටේ ආර්ථිකයේ ඉදිරි ගමන වඩා වේගවත් කිරීම සඳහා පෙර නොවූ විරූ ආකාරයේ අවස්ථාවන් හා අවකාශයන් ඇති බව අවධාරණය කරන අතරම ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු ලඟා කරගනිමින් ශ්‍රී ලංකා ආර්ථිකය නව සොයා ගැනීම්, නව දිශානති සමඟ පෙළ ගැස්වීමේ අවශ්‍යතාවයද ඉස්මතු කරයි. දෙදින උපාය මාර්ගික කථිකාවත සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ, ඔවුන්ගේ නියෝජිතයින්ගේ සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ සහභාගිත්වයෙන් 2010 ඔක්තෝබර් මස 1 සිට 3 දක්වා කණ්ඩලම, හෙරිටන්ස්හිදී පැවැත්විණි. 2016 වර්ෂය වන විට ඒක පුද්ගල ආදායම දෙගුණ කිරීමේ රජයේ ප්‍රකාශිත අරමුණ හා අනුකූල වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන උපාය මාර්ගික සැලසුම 2011 - 2015 වර්ෂ 5 ක කාලයකට යාවත්කාලීන කිරීම මෙම කථිකාවතේ මූලික අරමුණ විය. දෙපාර්තමේන්තු උපාය මාර්ගික සැලසුම්වල, උපාය

මාර්ගික සැලසුමේ තේමාව මනාව පිළිඹිබු වී ඇති දැයි සහතික කර ගැනීම සඳහා කටිකාවත පැවැත්වීමට ප්‍රථමයෙන් ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව සියලුම දෙපාර්තමේන්තු සමග වෙන් වෙන් වශයෙන් සාකච්ඡා පවත්වන ලදී.

## 19. පරිශ්‍ර

2010 වසර තුළදී ආරම්භ කරන ලද ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති කිහිපයක කටයුතුවල නිරතවීමට අමතරව මහ බැංකු පරිශ්‍රය නඩත්තු කිරීම සහ මනා ලෙස පවත්වාගෙන යාම මෙන්ම දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සියලුම වැදගත් සේවාවන් බාධාවකින් තොරව පවත්වාගෙන යාමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට පරිශ්‍ර දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී. වායු සමීකරණ, ජල සැපයුම සහ සන්නිවේදනය වැනි ඉතා වැදගත් සේවා සියයට සියයක විශ්වාස මට්ටමකින් යුතුව සැපයීම තුළින් පරිශ්‍ර දෙපාර්තමේන්තුව 2010 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම පවත්වාගෙන යාමට දායක විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 60 වන සංවත්සරය සැමරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා රාජගිරියෙහි පිහිටි බැංකු විදුපියස නවීකරණය කිරීමේ ප්‍රධාන ව්‍යාපාතියක් 2010 දී ආරම්භ කරන ලදී. ඒ අනුව වාස්තු විද්‍යාත්මක මූලධර්ම පදනම් කර ගනිමින් අභ්‍යන්තර අලංකරණ කටයුතු හඳුන්වාදුන් අතර බැංකු විදු පියසෙහි ශ්‍රවණාගාරය නවීන පහසුකම් සහිතව උසස් තත්ත්වයකට නවීකරණය කරන ලදී. ප්‍රධාන ගොඩනැගිල්ල සහ එහි අවට පරිසරයෙහි බාහිර පෙනුම වැඩි දියුණු කිරීම, සනීපාරක්ෂක පහසුකම් පුළුල් කිරීම, භූමි අලංකරණය, තීන්ත ආලේපනය, මාබල් ඇතිරීම ආදී කටයුතු තුළින් සිදු කරන ලද වැඩි දියුණු කිරීම් නිසා බැංකු විදු පියස නවීන වූ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානයක තත්ත්වයට ගෙන ඒමට හැකි විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම්වලට අළුතින් එක් වූ ලොයිඩ් ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් කිරීම සඳහා අමතර සේවකයන් ප්‍රධාන කාර්යයන් සඳහා යොදා ගන්නා ලදී. මෙම ගොඩනැගිල්ලේ ඓතිහාසික ස්වරූපය එම ආකාරයෙන් ආරක්ෂා කර ගැනීම සහ ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව ගොඩනැගීමේ කටයුතු සිදු කිරීම සඳහා බැංකුවේ වෘත්තිකයන්ගේ සහ බාහිර පාර්ශවයන්ගේ දායකත්වය ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපසින් පිහිටා ඇති නැෂනල් මියුචුවල් ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ සැලසුම 2010 දී නිම කරන ලද අතර එහි ප්‍රතිසංස්කරණ කටයුතු 2011 වසරෙහි දී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

පරිශ්‍ර දෙපාර්තමේන්තුව විසින් 2010 වසර තුළ දී සෝමාවතිය ජාතික වනෝද්‍යානය තුළ නව නිවාඩු නිකේතනයක් ඉතා සාර්ථක ලෙස ඉදි කරන ලදී. තවද නුවරඑළිය, කතරගම හා අනුරාධපුර යන ස්ථානවල ඇති නිවාඩු නිකේතනවල පහසුකම් වැඩි දියුණු කිරීම් කටයුතු 2010 වසරේ ආරම්භ කරනු ලැබූ අතර, එම කටයුතු 2011 වසරේ ප්‍රථම කාර්තුව තුළ දී අවසන් කිරීමට බලාපොරොත්තු වේ. උතුරු මැද පළාත් කාර්යාලයේ පිහිටා ඇති අවුරුදු 25 කට වඩා පැරණි ශ්‍රවණාගාරය නවීන පෙනුමක් සහිතව අළුත්වැඩියා කිරීමේ කාර්ය ආරම්භ කිරීමේ කටයුතු සැලසුම් කර ඇති අතර, මධ්‍යම පළාත් කාර්යාලයේ පිහිටි ශ්‍රවණාගාරය ද වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීම වැනි කාර්යයන් තුළින් වැඩි දියුණු කර ඇත. එසේම ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු තවදුරටත් පුළුල් කරමින් උතුරු හා නැගෙනහිර පළාත්වල ද පළාත් කාර්යාල පිහිටුවාලීමට කටයුතු කරන ලදී. එහිදී මෙම ප්‍රදේශවලින් අවශ්‍ය ගොඩනැගිලි සැපයීම සහ අනෙකුත් පහසුකම් සැපයීම තුළින් එම කාර්යාල පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සකස් කර දීමේ ප්‍රධාන භූමිකාවක් පරිශ්‍ර දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.

පරිශ්‍ර දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලයේ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ගණනාවක්ම සිදුකරන ලදී. ඒ අතර ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ගනුදෙනු කාර්යාලයේ (Dealing Room) නවීකරණය හා පුළුල් කිරීමත් මහ බැංකු සම්මන්ත්‍රණ ශාලා අංක 3 (C3) නවීකරණය සැලසුම් කිරීමත් ප්‍රධාන කොට දැක්විය හැකිය. එසේම මහ බැංකු ප්‍රධාන කාර්යාලයට යාබදව තට්ටු හයකින් යුතුව ඉදිකිරීමට සැලසුම් කර ඇති රථගාලෙහි සියළු මූලික කටයුතු අවසන් කර ඇත. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතුවල පුළුල්වීමත් සමග වැඩි වන නිල ගමන් සඳහා වන වාහන ඉල්ලුමට සරිලන අයුරින් රථවාහන ප්‍රමාණය වැඩි කිරීමට ද පසුගිය වසර තුළ දී කටයුතු කර ඇත.

2010 වසර තුළ දී පරිශ්‍ර දෙපාර්තමේන්තුවට නවක වෘත්තිකයන් බඳවා ගැනීමට කටයුතු කළ අතර, ඊට සමගාමීව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුහුණු පාඨමාලාවන්වලටද සහභාගි කරවන ලදී. සපයන සේවාවන්වල තත්ත්වය සහතික කරමින් මෙහෙයුම් අවධානම අවම කර ගැනීම සඳහා වෘත්තීය ප්‍රවීණතාව ප්‍රගුණ කිරීම ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාවට නංවා ඇත.

## 20. පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු

### පළාත් කාර්යාලයන්හි කටයුතු මෙහෙයවීම

2009 වර්ෂයේ පිහිටුවන ලද පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව (ප.මෙ.දෙ.) මහ බැංකුවේ ප්‍රතිපත්තිමය අරමුණුවලට අනුකූලව පළාත් කාර්යාලවල කටයුතු මෙහෙයවීම 2010 වර්ෂය තුළදී ද තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය. තවද, දශක කිහිපයක් පුරා පැවැති ගැටුම්කාරී තත්ත්වය නිමාවීමත් සමග උතුරු හා නැගෙනහිර පළාත්වල ආරම්භ කරන ලද ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මූල්‍ය හා අනෙකුත් උපකාරක සේවා සැපයීමේ අරමුණින් මුදල් නීති පනතේ 7 වන වගන්තියට අනුකූලව 2010 වසරේදී උතුරු හා නැගෙනහිර පළාත් කාර්යාල යාපනය හා ත්‍රිකුණාමලය යන නගරවල පිහිටුවන ලදී.

පළාත් කාර්යාල පිහිටුවීමේ එක් උපාය මාර්ගික අරමුණක් වනුයේ පළාත්බද තුලිත ආර්ථික සංවර්ධනයක් ඇති කරවීම සඳහා ඵලදායී ආර්ථික අංශයන් උදෙසා මූල්‍යමය උපකාරක සේවා ව්‍යාප්ත කිරීමයි. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් හඳුන්වා දී ඇති විශේෂ ණය යෝජනා ක්‍රම පළාත් මට්ටමින් ක්‍රියාත්මක

කිරීම සඳහා තම ක්‍රියාකාරී දායකත්වය ලබාදීම මගින් ප්‍රාදේශීය සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට පළාත් කාර්යාල කටයුතු කර ඇත. තවද, යෝග්‍ය ව්‍යවසායකයින් ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ හා නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමත්, අඩු ආදායම්ලාභීන් විධිමත් වූ මූල්‍ය අංශ වෙත සම්බන්ධ කරවීම මගින් ඔවුන්ගේ ආදායම් උත්පාදන කටයුතු වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබාදීමත් පළාත් කාර්යාල මගින් සිදු කෙරේ.

### විශේෂිත පළාත් සංවර්ධන ක්‍රියාකාරකම්

පළාත්බදව ජීවත්වන විවිධ ජන කොටස්වල නිෂ්පාදන හැකියාව හා ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා උචිත වූ නව ආර්ථික සංවර්ධන ක්‍රමවේදයන් හා ඒ ඒ ප්‍රදේශයන්ට විශේෂිත වූ නව ව්‍යාපෘති හා වැඩසටහන් හඳුනාගැනීම පිළිබඳව පළාත් කාර්යාලයන්හි අඛණ්ඩ අවධානය යොමු වී පවතී. බඩ ඉරිඟු වගාව සඳහා ප්‍රදානය කරන ලද වගා ණය ආපසු අයකරගැනීම සඳහා උතුරු - මැද පළාත් කාර්යාලය සහභාගිත්ව මූල්‍ය ආයතනවලට පුළුල් සහයෝගයක් ලබාදෙන ලද අතර, එමගින් 2008/2009 වගා කන්නයේ පැවැති සියයට 67 ක් වූ වගා ණය ආපසු අයවීම් අනුපාතය 2009/2010 වගා කන්නය තුළදී සියයට 82 දක්වා ඉහළ නැංවීමට හැකියාව ලැබිණි. තවද, ගිවිසුම්ගත සාධාරණ මිලකට තම නිෂ්පාදන ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය යටතේ අලෙවි කිරීම සඳහා බඩ ඉරිඟු ගොවීන්ට අවශ්‍ය පහසුකම් සැපයීමද සිදුකරන ලදී. එම වැඩ පිළිවෙළ යටතේ උඳු, මුං ඇට හා සෝයා වැනි ධාන්‍ය වර්ග සඳහා ද අලෙවි පහසුකම් සැලසීමට මෙම වර්ෂය තුළ කටයුතු කර ඇත. මධ්‍යම හා උතුරු මැද පළාත් කාර්යාල, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ඇතිව දේශීය ලොකු ළූණු බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. එමෙන්ම ඉතා උසස් තත්ත්වයේ වගා ක්‍රම හඳුන්වාදීම මගින් කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව අදාළ කටයුතු සියලුම පළාත් කාර්යාල මගින් සම්බන්ධීකරණය කරනු ලැබීය. ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් හඳුන්වා දෙන ලද කෘෂි බෝග හා දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා ද පළාත් කාර්යාලවල දායකත්වය ලැබුණි.

### දැනුවත් කිරීමේ හා නිපුණතා සංවර්ධන වැඩසටහන්

පළාත්බද සාමාන්‍ය ජනතාව සඳහා මෙන්ම පළාත් මට්ටමේ සංවර්ධන කටයුතුවල නියුතු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පළාත් කාර්යාල මගින් පවත්වනු ලැබ ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් හඳුන්වා දී ඇති සංවර්ධන ණය යෝජනා ක්‍රම හා ඉදිරි වෙළෙඳ ගිවිසුම් වැඩ පිළිවෙල පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට මෙන්ම රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම, ඉතිරි කිරීමේ පුරුදු වර්ධනය කිරීම, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම, නීති විරෝධී මූල්‍ය ව්‍යාපාර සහ වෙනත් පොදු හා කාලීන වූ මූල්‍යමය කරුණු ඇතුළත් මාතෘකා පිළිබඳව විශේෂ සම්මන්ත්‍රණ පළාත් කාර්යාල මගින් සංවිධානය කරනු ලැබිණි. එමෙන්ම, දියුණු වගා ක්‍රම භාවිතය, විද්‍යාත්මක කිරිගව පාලනය, ගෙවතු වගාව, බිම්මල් වගාව, කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදන, මී මැසි පාලනය, මල් හා විසිතුරු පැළෑටි වගාව හා පසු අස්වනු තාක්ෂණය වැනි වඩාත් පුළුල් වූ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි නිපුණතා සංවර්ධන වැඩසටහන් රාශියක් ඒ ඒ පළාත්වල අදාළ ආයතනයන්හි සහයෝගය ඇතිව පළාත් කාර්යාල මගින් පවත්වනු ලැබිණි. 2010 වර්ෂය තුළදී පැවැත් වූ එවැනි වැඩසටහන්වල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

**සංඛ්‍යා සටහන II - 14**
**පළාත් කාර්යාල විසින් 2010 වසර තුළ පවත්වන ලද වැඩසටහන්වල ප්‍රගතිය**

| පළාත් කාර්යාලයේ නම | දැනුවත් කිරීමේ වැඩසටහන් | | නිපුණතා සංවර්ධන වැඩසටහන් | |
|---|---|---|---|---|
| | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
| දකුණු පළාත | 205 | 6,225 | 18 | 641 |
| උතුරු - මැද | 100 | 6,825 | 33 | 1,001 |
| මධ්‍යම | 190 | 4,108 | 43 | 1,282 |
| උතුර | 38 | 1,089 | - | - |
| නැගෙනහිර | 08 | 100 | - | - |

### උපකාරක/ප්‍රවර්ධන සේවා

පළාත් කාර්යාල මගින් මහ බැංකුවේ වෙනත් දෙපාර්තමේන්තුවල කටයුතු සඳහා දක්වන ලද අනුග්‍රහයනට විවිධ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගිවීම, සම්මන්ත්‍රණ හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය, සේවක අර්ධසාධක අරමුදල් සම්බන්ධ කටයුතු, බැංකු ප්‍රකාශන හා සමරු කාසි අලෙවිය, 60 වන සංවත්සරයට සමගාමීව පවත්වන ලද දැනුම මිණුම තරඟයේ කටයුතු පළාත් මට්ටමින් සංවිධානය කිරීම සඳහා දායකත්වය ලබාදීම ආදිය ඇතුළත් විය. එමෙන්ම විවිධ දෙපාර්තමේන්තු මගින් පවත්වන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ, සමීක්ෂණ හා ප්‍රාදේශීයව සිදු කෙරෙන අනෙකුත් කටයුතු සඳහා පළාත් කාර්යාලවලට අනුබද්ධිත කාර්ය මණ්ඩලය යෙදවීම මගින් සහාය ලබාදී ඇත.

## 21. රාජ්‍ය ණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව (රා.ණ.දෙ.) විසින් 2010 වසර තුළදී ද රාජ්‍ය ණය කළමණාකරණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙනයනු ලැබිණි. ඒ සඳහා ඉටුකළ යුතු ප්‍රමුඛතම කාර්යභාරය වනුයේ අවදානම විචක්ෂනශීලී මට්ටමක පවත්වාගනිමින් සහ නියමිත කාලයේදී ණය සේවාකරණය කරමින් අවම පිරිවැයක් යටතේ රජයේ මූල්‍ය අවශ්‍යතාවන් සපුරාලීමය. මෙම කටයුතු ඵලදායීලෙස පවත්වාගෙනයාම පිණිස, තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම ඉහළ නැංවීමට සහ ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ඇඩි ස්ථාවරත්වයක පවත්වාගෙන

යාමටද රාජ්‍ය ණය කළමනාකරණය වැඩිදියුණු කිරීමට ද දේශීය ණය වෙළෙඳපොල සංවර්ධනය කිරීම පිණිස උත්සාහ දරමින් රාජ්‍ය ණය ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය තුළදී විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. 2010 වර්ෂයේ ණය කළමනාකරණ උපායමාර්ග යොමුකර තිබුනේ අවදානම් කළමනාකරණ ශිල්පීක්‍රම ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට සහ මැදිකාලීන රාජ්‍ය ණය කළමනාකරණයෙහි උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී පිරිවැය කාර්යක්ෂමතාව ළඟාකර ගැනීමටත්ය.

රජයේ ණය අවශ්‍යතාවන් සපුරාගැනීම පිණිස මුදල් මණ්ඩලය මගින් අනුමත කරනු ලැබූ ණය කළමනාකරණ උපායමාර්ගය 2010 වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ඵලදායි ලෙස ක්‍රියාවට නංවනු ලැබිණි. ඒ අනුව වෙළෙඳපොළෙහි විවිධ ස්ථරයන් සහ ආයෝජකයන්ගේ රුචිකත්වයන් සැළකිල්ලට ගනිමින් අනුමත කරණු ලැබූ සීමාව තුළ ණය ලබාගැනීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් විවිධ ණය උපකරණ භාවිතා කරණු ලැබිණි. රටතුළ පැවති හිතකර සාර්ව ආර්ථික වර්ධනයන් මගින් වැඩි දියුණු වූ ආයෝජකයන්ගේ විශ්වාසය හේතු කොටගෙන විදේශ ණය ගැනීම පහසුවීම නිසා දේශීය හා විදේශීය වශයෙන් ලබාගත් සාපේක්ෂ ණය ප්‍රමාණයන් යම් තරමකට වෙනස් විය. වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කෙටිකාලීන, මැදිකාලීන සහ දිගුකාලීන (වසර 10 දක්වා) සුරැකුම්පත් නිකුත් කරණු ලැබිණි. හිතකර පොලී අනුපාතික පසුබිමක් පැවති බැවින් වෙළෙඳපොලෙහි දිගුකාලීන සුරැකුම්පත් බහුල කිරීම සඳහා වසර 10 කින් කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරයක් නිකුත් කරනු ලැබිණ. වර්ෂයේ අවසාන භාගයේ දී ඇ. එ. ජ. ඩොලර් දශලක්ෂ 1,000 ක වටිනාකමෙන් යුත් තෙවන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැදුම්කරය නිකුත් කරනු ලැබිණි. මෙහිදී ණය වර්ගීකරණ නියෝජිත ආයතන මගින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය වර්ගීකරණය ඉහළ දැමීම ජාත්‍යන්තර වෙළෙඳපොළින් අඩු පිරිවැයකට ණය ලබාග ැනීම සඳහා උපකාරී විය. වර්ෂය තුළදී ස්වෛරීත්ව ණය වර්ගීකරණ කමිටුව තාක්ෂණික අවයවයක් ලෙස ක්‍රියා කරමින් ද ණය වර්ගීකරණය විමර්ශනය කිරීමේ කටයුතු සඳහා පහසුකම් සපයමින්ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලැබිණ. එයට අමතරව, ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර නිකුත්කිරීම මගින් ද ඇ.එ.ජ. ඩොලර් දශලක්ෂ 628 ක් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් දේශීය වෙළෙඳපොලින් රැස්කරගන්නා ලදී.

ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ස්ථාවරව හා බාධා රහිතව ක්‍රියාත්මක වීම තහවුරු කරගැනීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රජයේ සුරැකුම් පත් සම්බන්ධ ප්‍රාථමික අලෙවිකරුවන් පිළිබඳ දුරස්ථ - අධීක්ෂණය සහ එතැන් පරීක්ෂණයන් වර්ෂය තුළදී අඛණ්ඩව සිදුකරණු ලැබිණි. වෙළෙඳපොලට සහභාගි වන්නන් සමග සම්බන්ධතා ශක්තිමත් කරගැනීමට ද වෙළෙඳපොල සම්බන්ධයෙන් පැනනගින ගැටළු සහ සංවර්ධනයන් පිළිබඳ සාකච්ඡා කරගැනීමට අවස්ථාවක් සලසා ගැනීමටද අළුතින් හඳුන්වා දෙනු ලබන ප්‍රතිපත්තීන් සන්නිවේදනය කිරීමට හා අදහස් හුවමාරු කරගැනීමට ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් සමග සෑම මාසයකදී රැස්වීම් පවත්වනු ලැබිණි. එයට අමතරව වර්ෂය තුළදී ප්‍රාථමික අලෙවි කරුවන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සඳහා විදේශ අධ්‍යයන චාරිකා, සම්මන්ත්‍රන සහ වැඩමුළු, විදේශීය අධ්‍යයන කණ්ඩායම් මුණගැසීම් ආදිය ඇතුළත් විවිධ මාධ්‍යයන් මගින් දැනුම වර්ධනය කරගැනීම පිණිස අවස්ථාව සලසනු ලැබිණ.

රාජ්‍ය ණය කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස 2010 වර්ෂය තුළ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ණය කළමනාකරණ උපායමාර්ග ඵලදායි ලෙස ක්‍රියාවේ යෙදීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරණු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ථ රාජ්‍ය ණය කළඹෙහි සාමාන්‍ය කාල පරාසය 2009 වසරේ පැවති වසර 4.20 සිට 2010 දී වසර 4.31 දක්වා ඉහළ ගිය අතර, ණය කළඹෙහි සාමාන්‍ය කල්පිරීමේ කාලය 2009 දී වසර 5.29 සිට 2010 දී වසර 5.25 දක්වා පහත වැටිණි.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය තුළදී ද ඉතා සුළු ප්‍රමාණයකින් හෝ කිසිදු ණය පැහැර හැරීමකින් තොරව නියමිත කාලයට දේශීය සහ විදේශීය ණය සේවාකරණය අඛණ්ඩව සිදුකරමින් රාජ්‍ය ණය පැහැර නොහැරීම පිළිබඳව මෙතෙක් පවත්වාගෙන එමින් තිබූ වාර්තාව අඛණ්ඩව පවත්වාගන්නා ලදී.

රාජ්‍ය ණය කළමනාකරණ කටයුතු විනිවිද භාවය, වගකීම සහ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් වෙළඳපලට යාවත්කාලීන තොරතුරු අඛණ්ඩව ලබාදීම පිණිස විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබිණ. ප්‍රශස්ථ ණය කළමනාකරණ ක්‍රමයක් සංවර්ධනය කිරීම සඳහා මෙම ලක්‍ෂණයන්ගේ වැදගත්කම යළි අවධාරණය කරමින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය අඛණ්ඩව යාවත්කාලීන කරන ලද අතර මාසික දත්ත ප්‍රකාශනය ද එහි වාර්ෂික ප්‍රකාශනය වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය ද ආයෝජකයන් සහ වෙළෙඳපොල සහභාගිවන්නන් වෙත නිකුත් කරණ ලදී.

සියළුම රජයේ සුරැකුම්පත් ගනුදෙනු නියමිත අවස්ථාවේදීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන මධ්‍යම තැන්පතු ක්‍රමය තුළ වාර්තාගතවීම සහතික කරගැනීම පිණිස මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් පවත්වාගෙන යනු ලබන සියළුම වාර්තාගත කිරීම් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ඉතා සමීපව අධීක්ෂණය සහ නිරීක්ෂණය කරනු ලැබිණි. සියළුම ආයෝජකයන්ට 2010 වර්ෂය තුළදී වාරික ගිණුම් ප්‍රකාශන නිකුත් කිරිමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට හැකි විය. වඩාත් තරඟකාරී, ගතික සහ ද්‍රවශීලතාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපලක් සංවර්ධනය කිරීමේ අරමුණින් යුතුව ආයෝජක පදනම පුළුල් හා විවිධාංගීකරණය කිරීම පිණිස වර්ෂය තුළදී වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින්, විවිධ උත්සාහයක් දරණු ලැබිණ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳව මහජනතාවගේ දැනුම වර්ධනය කිරීම සඳහා පවත්වාගෙන යනු ලැබූ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිණි.

## 2010 වසර තුළ සංවර්ධනය

### (අ) ණය එක්රැස් කිරීමේ ඉලක්ක සහ ක්‍රමෝපායය

2010 අංක 7 දරණ විසර්ජන පනත යටතේ, 2010 වසර වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු දළ ණය සීමාව (පොත් අගය) රුපියල් බිලියන 980.0 ක් විය. මෙම ප්‍රමාණයෙන් රුපියල් බිලියන 685.3 ක් දේශීය ප්‍රභවයන්ගෙන් ලබාගත් අතර ශේෂය වූ රුපියල් බිලියන 294.7 විදේශීය ප්‍රභවයන්ගෙන් උපයා ගැනීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වුවද, වසර තුළදී ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ යාම හේතුවෙන්, විදේශ අරමුදල් රට තුළට ගලා ඒමේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුනු අතර විදේශීය ප්‍රභවයන්ගෙන් ලබා ගත් ණය ප්‍රමාණය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ ගියේය. එමෙන්ම දේශීය ප්‍රභවයන්ගෙන් රැස් කරණු ලැබූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 594.2 දක්වා අඩු වූ අතර විදේශ ප්‍රභවයන්ගෙන් ලබා ගත් ණය රුපියල් බිලියන 327.9 දක්වා ඉහළ ගියේය.

2010 දෙසැම්බර් අවසානයේ රුපියල් වලින් සමන්විත රජයේ සුරැකුම්පත් වල (භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර) විදේශ ආයෝජනය රුපියල් බිලියන 240.9 ක් (මුහුණත් අගයෙන්) බවට පත්වෙමින් 2010 වසර තුළදී විදේශ ආයෝජන රුපියල් බිලියන 55.3 කින් ඉහල ගියේය. තවද 2010 ඔක්තෝබර් මාසයේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 1,000 ක (රුපියල් බිලියන 112) වටිනාකමකින් යුක්තව සියයට 6.25 ක පොලී අනුපාතිකයක් හා වසර 10 ක පරිණත කාලයක් සහිතව ශ්‍රී ලංකාවේ තෙවන ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සිදු කරන ලදී. ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව මගින් සාපේක්ෂව අඩු පිරිවැයක් සහිත අරමුදල් එක්රැස් කර ගැනීමට හැකිවීම නිසා, අධික පිරිවැයක් සහිත කෙටිකාලීන ණය සැලකිය යුතු ප්‍රමාණයක් පියවීම තුළින් රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට හැකිවිය. සහනදායී ප්‍රභවයන්ගෙන් එක්රැස් කරණ ලද ණයද ඇතුළත්ව (ව්‍යාපෘති / වැඩසටහන් ණය) 2010 වර්ෂයේ අනෙකුත් විදේශ ණය රැස් කිරීම රුපියල් බිලියන 163.9 ක් විය.

වසරේ මුල් මාස කිහිපයතුළ වෙළෙඳපොළ තුළ පැවති ඉහළ උද්ධමන අපේක්ෂාවන් නිසා පොලී අනුපාතික ඉහළ ගියේය. කෙසේ වුවද, ආර්ථික ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාවට නංවන ලද මූල්‍ය ප්‍රතිපත්ති, ආයෝජකයන්ගේ උද්ධමන අපේක්ෂාවන් පහත වැටීම, රජයේ සුරැකුම්පත් වලට විදේශ ආයෝජන ගලා ඒම, හේතුවෙන් විදේශ විනිමය රට තුළට ගලා ඒම වෙළෙඳපොල තුළ වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වය සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන ලද විචක්ෂණශීලී ණය කළමනාකරණ උපාය මාර්ගයන් හේතුවෙන්, වසරේ අවසාන භාගයේදී ඵලදා වක්‍රයේ පහතට නැඹුරු වීමක් දක්වමින් පොලී අනුපාතික ක්‍රමානුකූලව අඩු විය. මෙම අඩු වීම, වසර තුළදී ඵලදා වක්‍රයේ මාස 3 සිට වසර 6 දක්වා පරිණතීන් සහිත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වල පොලී අනුපාතිකයන් පාදකාංක 37-262 දක්වා වූ පරාසයකින් පහත වැටීම මගින් පිළිබිඹු වේ.

වසරේ පළමු මාස කිහිපයේදී වූ ඉහළ උද්ධමන අපේක්ෂාවන් හේතුවෙන් ආයෝජකයින් මධ්‍ය හා දිගුකාලීන දේශීය ණය උපකරණ වල ආයෝජනය කිරීමට දැක්වූ පසුබෑම නිසා දේශීය වෙළඳපොලේ කෙටිකාලීන ණය උපකරණ මගින් රැස්කල අරමුදල් ප්‍රමාණය ඉහළ ගියේය. මේ හේතුවෙන් 2010 වසරේදී භාණ්ඩාගාර බිල්පත් මගින් රැස් කල ණය ප්‍රමාණය රුපියල් බිලියන 82.8 දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, වසරේ අවසාන කාලච්ඡේදයේදී පැවති හිතකර තත්ත්වය නිසා රුපියල් බිලියන 433.6 ක වටිනාකමකින් යුත් මධ්‍ය හා දිගුකාලීන පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට හැකි විය. මීට අමතරව, 2010 වසරේදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළින් එක්සත් ජනපද ඩොලර් මිලියන 628 ක් (රුපියල් බිලියන 71.2) රැස්කර ගන්නා ලදී. දේශීය ණය තොගයෙහි පවතින වෙළෙඳපොලාභිමුක නොවන ණය තොගය අඩු කිරීමේ පිළිවෙත තව දුරටත් පවත්වා ගනිමින් 2010 වසරේදීත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රුපියල් ණය නිකුත් නොකරන ලදී.

2010 වර්ෂයේදී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මාසික ණය ඒකරාශී වීමේ පීඩනය අවම කිරීමේ උපක්‍රමය අඛණ්ඩව ක්‍රියාවට නගමින් දින 91 සහ දින 182 භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සීමා කල අතර, දින 364 භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම ඉහළ දමන ලදී. එමගින්, 2010 වසරේදී මාස 3 ට අඩු කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම භාණ්ඩාගාර බිල්පත් මුළු නිකුතුවෙන් සියයට 19 ක් දක්වා පහත දැමීමට හැකි විය. 2009 වසරේදී මෙම අගය සියයට 21 ක් විය. දින 182 කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 2009 වූ සියයට 35 සිට සියයට 34.5 දක්වා සුළු වශයෙන් පහත දමන ලදී. අළුතින් නිකුත් කරණ ලද දින 364 පරිණත කාලය සහිත භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 2009 හි වූ සියයට 43.6 සිට 2010 වසරේදී සියයට 46.3 දක්වා ඉහළ නංවන ලදී. 2010 වර්ෂයේ මුල් මාස කිහිපය තුළ වෙළෙඳපොලෙහි පැවති ඉහළ උද්ධමන අපේක්ෂාවන් සමග, මධ්‍ය හා දිගු කාලීන පරිණතකාලය සහිත භාණ්ඩාගාර බැඳුම්කර වැඩිපුර නිකුත් කිරීමේ ක්‍රමෝපායය ක්‍රියාත්මක කිරීම අභියෝගයක් විය. කෙසේ වුවද, වසර 5 සහ 5 ට වැඩි පරිණතකාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම, මුළු භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු ප්‍රමාණයෙන්, 2009 හි වූ සියයට 33.5 සිට සියයට 37.9 දක්වා වැඩි කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට හැකි විය. තවද වසර 8 සහ වසර 10 පරිණතකාලය භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින්, වසර 10 දක්වා වූ දිගුකාලීන පාදක ඵලදා වක්‍රය සක්‍රිය කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට හැකි විය.

### (ආ) ණය උපකරණ භාවිතා කිරීම

කලින් වර්ෂයේදී මෙන්ම භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිණිස වෙන්දේසි සහ සෘජු නිකුතු ප්‍රවේශයන් භාවිතයෙන් සිදුකරන ලදී. භාණ්ඩාගාර බිල්පත් වැඩසටහන යටතේ, 2010 වසරේ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 1,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරන ලදී. එම මුළු අගයෙන් රුපියල් බිලියන 910 ක් පරිණත වන භාණ්ඩාගාර බිල්පත් නැවත නිකුත් කිරීම් වූ අතර, අවශේෂ රුපියල් බිලියන 90 ම නව නිකුතුන් විය. වසර තුළදී භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 53 ක් පැවැත්වූ අතර එම වෙන්දේසි මගින් රුපියල් බිලියන 520 ක් රැස්කරන ලද අතර රුපියල් බිලියන 346 ක් නිකුතු මගින් වෙළෙඳපොළ සහභාගීකරුවන් වෙතින් රැස්කරන ලදී. භාණ්ඩාගාර බිල්පත් වැඩසටහන සඳහා විදේශ ආයෝජකයින්ගේ සහභාගීත්වය රුපියල් බිලියන 17 ක් විය.

භාණ්ඩාගාර බැඳුම්කර වැඩසටහන යටතේ 2010 වසරේදී රැස්කරන ලද මුළු අරමුදල් ප්‍රමාණය රුපියල් බිලියන 509 ක් විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් වසර තුළ වෙන්දේසි 17 ක් සාර්ථකව පවත්වමින් ඒ මගින් රුපියල් බිලියන 46 ක් රැස් කරන ලද අතර සෘජු නිකුතු හරහා රුපියල් බිලියන 462 ක් රැස් කරන ලදී. භාණ්ඩාගාර බැඳුම්කර වැඩසටහන සඳහා විදේශ ආයෝජකයින්ගේ සහභාගීත්වය රුපියල් බිලියන 38 ක් විය.

පරිණත වන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ප්‍රතිමූල්‍ය කිරීමේ අරමුණින් රා.ණ.දෙ. විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන්දේසි 3 ක් පවත්වන ලදී. වෙන්දේසි සහ සෘජු නිකුතු හරහා රැස් කළ මුළු අරමුදල් ප්‍රමාණයෙහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 628 ක් විය. මෙම අරමුදල් සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පන අනුපාතිකය (LIBOR) සහ පාදකාංක 350 සිට 395 දක්වා පරාසයකින්, යුත් පොලී අනුපාතයක් සහිතව, අවුරුදු දෙක සහ තුන යන පරිණත කාල පරිච්ඡේදයන් ගෙන් සමන්විත බැඳුම්කර නිකුත් කිරීම මගින් රැස් කරගන්නා ලදී.

දේශීය වෙළෙඳපොළ මත ඇතිවන බලපෑම අවම කිරීම සඳහා ණය කළඹ විවිධාංගීකරණය කිරීම සහ විදේශ වෙළෙඳපොළේ පවතින අවම අර්පන අනුපාතිකයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා 2010 වසර තුළදී රුපියල් මිලියන 1,000 ක, වසර 10 ක පරිණත කාලයකින් යුක්ත ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සියයට 6.25 ක ස්ථාවර කූපන් ආන්තිකයක් සහිතව නිකුත් කරන ලදී. ප්‍රධාන වශයෙන් යුද්ධය අවසන් වීමේ ප්‍රතිඵලයක් ලෙස ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිය ඉහළ නැංවීම සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ණය රැස් කිරීමේ පිරිවැය අවම කිරීමට ඇති කැප වීම මෙම ස්වෛරීත්ව බැඳුම්කරයේ කූපන් ආන්තිකය මීට පෙර බැඳුම්කර සමග සැසඳීමේ දී සියයට 6.25 ක් වැනි මට්ටමකට අවම කිරීමට රුකුලක් විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල කූපන් අනුපාතිකයන් 2007 වසරේ පැවති පළමු නිකුතුවේදී සියයට 8.40 ක් සහ 2009 වසරේ පැවති දෙවැනි නිකුතුවේදී සියයට 7.25 ක් විය.

### (ඈ) ණය සේවාකරණ ගෙවීම්

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය තුළදී සේවාකරණය කරන ලද සමස්ත දේශීය හා විදේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 820 කි. සේවාකරණය කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් බිලියන 352 ක් පොලී ගෙවීම් වන අතර, රුපියල් බිලියන 468 ක් ණය ආපසු ගෙවීම් විය. 2010 වසර තුළදී දේශීය ණය සඳහා මුළු ගෙවීම් රුපියල් බිලියන 687 ක් වූ අතර විදේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 133 ක් (එ.ජ. ඩොලර් මිලියන 1,197 ක්) විය. මෙයට අමතරව, වර්ෂය තුළදී කල් පිරුණු භාණ්ඩාගාර බිල්පත් නැවත නිකුත් කිරීම රුපියල් බිලියන 844 ක් විය.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එදිනෙදා සිදු කරනු ලබන ණය සේවාකරණ කාර්යයට අමතරව, ණය සේවාකරණ කාර්යයන් විධිමත් කිරීම සඳහා දෙවන වරටත් පූර්ණ කළමනාකරණ විගණනයක් සිදු කරන ලදී. විගණන අධිගමනයන් මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත.

### (ඇ) ඵලදා අනුපාතිකය සහ ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය

වසර තුළදී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වල මාස 3 සිට අවුරුදු 6 දක්වා පරිණත කාලය සඳහා ඵලදා අනුපාතිකය පාදකාංක 30-270 පරාසයකින් පහත වැටුණි. බිහිවෙමින් පවතින සාර්ව ආර්ථික වාතාවරණයට ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගන්නා ලද මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයන්ට අනුගතව මෙම පහත වැටීම සිදු විය. ඵලදා වක්‍රයේ කෙටිකාලීන අන්තය එනම්, මාස 3 සිට අවුරුදු 1 දක්වා කාල පරිච්ඡේදය තුළ ඵලදා ආන්තිකය පාදකාංක 30-180 දක්වා ද අවුරුදු 2 ක පරිණත කාලය සඳහා ඵලදා ආන්තිකය පාදකාංක 270 කින් සියයට 8.23 දක්වා ද අවුරුදු 4 ක පරිණත කාලය සඳහා ඵලදා ආන්තිකය පාදකාංක 213 කින් සියයට 9.39 දක්වා ද අවුරුදු 6 ක පරිණත කාලය සඳහා ඵලදා ආන්තිකය පාදකාංක 262 කින් සියයට 9.40 දක්වාද පහත වැටුණි. ඒ අනුව අවුරුදු 10 ක පරිණත කාලයකින් යුක්ත නව භාණ්ඩාගාර බැඳුම්කරයක් සියයට 9.30 ක ඵලදා ආන්තිකයක් සහිතව නිකුත් කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සමත් විය.

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර දෙකින්ම සමන්විත මුළු ගනුදෙනු වල සැලකිය යුතු වැඩි වීමක් 2010 වසර තුළදී දක්නට ලැබිණ. ද්විතීය වෙළෙඳපොළේ රාජ්‍ය ණය උපකරණ වල පිරිවැටුම් අනුපාතය 2009 වසරේ දී 16.1 සිට 2010 වසරේදී 22.5 දක්වා වර්ධනය වී ඇත. 2009 වසර සමග සැසඳීමේදී, මෙම සැලකිය යුතු වර්ධනය, නිත්‍ය පදනමක් මත වන ගනුදෙනු සහ ප්‍රතිමිළදී ගැනීමේ ගනුදෙනු ක්‍රම යන ද්විතීය වෙළෙඳපොලේ ගනුදෙනු ක්‍රම දෙකේම ඉහළ යාම හේතු විය.

### (ඉ) නිර්ලේඛන සුරැකුම්පත් පියවුම් ක්‍රමය (SSSS) සහ මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) ලංකාසෙකියෝ

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2010 වසරේදී එහි සහභාගිකරුවන් වශයෙන් ඇතුළත්වන්නාවූ බලපත්‍රලාභී වාණිජ බැංකු 22, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 6 සහ සෘජු ගනුදෙනුකරුවන් නොවන ප්‍රාථමික අලෙවිකාර සහභාගිකරුවන් 2 කොටස් වෙළෙඳපොලෙහි සීමාසහිත මධ්‍යම තැන්පතු ක්‍රම (පෞද්ගලික) සමග ලංකාසෙකියෝ මෙහෙයුම් පවත්වාගත යාමට සමත් විණි. නිර්ලේඛණ සුරැකුම්පත් ක්‍රමය තුළින් සිදුවූ ගනුදෙනුවල වටිනාකම රුපියල් මිලියන 32.69 දක්වා සියයට 25.5 කින් වර්ධනය විය. මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි මෙහෙය වන ලද ගිණුම් සංඛ්‍යාව 2009 වසර අවසානයේ සිට 2010 වසර අවසානය වන විට 64,680 සිට 73,396 දක්වා සියයට 13.5 කින් ඉහල ගියේය. ලංකාසෙකියෝ මගින්, රජයේ සුරැකුම්පත්හි ආයෝජකයන්හට ගනුදෙනු සාරාංශ ගෙවීම ප්‍රකාශන හා ශේෂ ප්‍රකාශන වශයෙන් වර්ග තුනක ප්‍රකාශන වර්ෂය තුළ දී නිකුත් කරනු ලැබේ. මාසයේ පළමු සතිය ඇතුළත ගනුදෙනු සාරාංශයද අදාල පොලී හා කූපන් ගෙවීමෙන් අනතුරුව කළ පසු සතියක් ඇතුළත ගෙවීම් ප්‍රකාශනයද හා මාස 6 කට පසු සති 3 ක් ඇතුළත ශේෂ තහවුරු කිරීමේ ප්‍රකාශය ගනුදෙනුකරුවන්

වෙත නිකුත් කරනු ලැබේ. ගනුදෙනු සාරාංශ 116,962 ක්ද, ගෙවීම් ප්‍රකාශන 69,847 ක් ද හා සක්‍රීය සහභාගිකරුවන් වෙත ශේෂ තහවුරුකිරීමේ ප්‍රකාශන 51,701 ක් වශයෙන් 2010 වසරේදී ආයෝජකයින් වෙත නිකුත් කරණ ලදී.

2010 වසර අවසානයේදී, ලංකාසෙකියෝහි වාර්තාගත වූ නිර්ලේඛන සුරැකුම්පත්හි වටිනාකම රු. බිලියන 2,399.2 විය. රුපියල් බිලියන 571.8 ක වටිනාකම සහිත නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත්වලින් සහ රු.බිලියන 1,837.4 ක වටිනාකම සහිත නිර්ලේඛන බැඳුම්කර වලින් මෙම නිර්ලේඛන සුරැකුම්පත් වටිනාකම සමන්විත විණි.

2010 වර්ෂයේදී ලංකාසෙකියෝ පද්ධතියෙහි ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම් රාශියක් ස්ථාපනය කරන ලදී. සහභාගිකරුවන්ට හැසිරවිය හැකි එක්දින ද්‍රවශීලතා පහසුකම (ILF) සහ ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු (Repo) ස්වයංක්‍රිව ගනුදෙනුකරුවන්වෙත නැවත පැවරීමේ පහසුකම යන ප්‍රධාන වැඩිදියුණු කිරීම් දෙකක් වශයෙන් දැක්විය හැකිය. ඔවුන්ගේ මූල්‍ය ආයතන මගින් අනෙකුත් සහභාගීකාර මූල්‍ය ආයතන සඳහා වන ගෙවීම් කිරීමට ද්‍රවශීලතාවය අවශ්‍ය වූ විටදී, සහභාගීකරුවන් විසින් කළමනාකරණය කරනු ලබන එක් දින ද්‍රවශීලතා (ILF) පහසුකම බහුවාර ගණනාවක් ලබාදීම මගින් ව්‍යාපාර දිනය ඇතුළත සහභාගීකාර ආයතනවල මෙහෙයුම් පද්ධතියේ කටයුතු සඳහා එක් දින ද්‍රවශීලතා පහසුකම් ඉල්ලීම් හා ප්‍රතිවර්තන කර ගෙන යාමට ඉඩ සලසන ලදී. ප්‍රතිමිලදී ගැණුම් ගනුදෙනුවක් කල් පිරීමේදී සිදු කරන ප්‍රතිවර්තනය, ප්‍රතිමිලදී ගැනීම් සඳහා වන ස්වයංක්‍රීය ප්‍රතිවර්තන පහසුකම මගින් ස්වයංක්‍රීය අයුරින් එය සිදු කිරීම වලක්වන ලදී.

### (ඊ) ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය

ප්‍රාථමික අලෙවිකරු පද්ධතියෙහි විශ්වසනීයත්වය සහ ස්ථායිතාව පවත්වාගැනීමේ අරමුණෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය තුළදීත් එතැන් සහ දුරස්ථ පරීක්ෂා මගින් ප්‍රාථමික වෙළෙඳුන් අධීක්ෂණය නොකඩවා සිදුකරන ලදී. ඒ අනුව ප්‍රාථමික වෙළෙඳ කටයුතු කරගෙන යාමේදී මුහුණදීමට සිදුවන වෙළෙඳපොල අවදානම, ද්‍රවශීලතා අවදානම, සහ මෙහෙයුම් අවදානම වැනි අවදානම් ඉලක්ක කර ගනිමින් පුළුල් එතැන් පරීක්ෂාවන් 3 ක් සහ විශේෂ එතැන් පරීක්ෂා 2 ක් වර්ෂය තුළදී සිදුකරන ලදී. එතැන් පරීක්ෂාවලට අමතරව එක් එක් ප්‍රාථමික වෙළෙඳුන් සඳහා අඛණ්ඩ දුරස්ථ පරීක්ෂණද සතිපතා හා මාසික වාර්තා පදනම් කරගනිමින් පවත්වන ලදී.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව හා වෙළෙඳපොල සාමාජිකයන් අතර ඍජු සන්නිවේදන සම්බන්ධතාවක් ගොඩනැගීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන විධායක නිළධාරීන් සඳහා රැස්වීම් 8 ක් පවත්වන ලද අතර මෙහිදී දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොල සහ ආර්ථිකයෙහි නවතම ප්‍රවනතාවයන් පිළිබඳව තොරතුරු සන්නිවේදනය කරන ලදී. සමස්ථ ප්‍රාථමික වෙළෙඳ කාර්ය සාධනයද මෙහිදී ඉදිරිපත් කෙරුණු අතර මූල්‍ය දර්ශකවල දක්නට ලැබෙන අහිතකර වර්ධනයන් හා නැඹුරුතා පිළිබඳවද පොදුවේ සාකච්ඡාවට ලක් කෙරිණි.

අධීක්ෂණ කටයුතු වලට අමතරව, 2010 වසර තුළදී වෙළෙඳපොළ සාමාජිකයන්ගේ දැනුම වර්ධනය කිරීමේ කටයුතු ද සිදුකරන ලදී. 2010 මාර්තු මාසයේදී සංවර්ධිත ණය වෙළෙඳපොළක ක්‍රියාත්මක ප්‍රතිපත්ති හා පද්ධති පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීමේ අරමුණින් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන විධායක අලෙවි නිළධාරීන්ට ඕස්ට්‍රේලියාවට අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරන ලදී. අධ්‍යයන චාරිකාවේදී ප්‍රධාන විධායක නිළධාරීන්ට ඕස්ට්‍රේලියානු මහ බැංකුව, ඕස්ට්‍රේලියානු මූල්‍ය කළමනාකරණ කාර්යාලය සහ ඕස්ට්‍රේලියානු සුරැකුම්පත් හුවමාරුව ආදී රාජ්‍ය ආයතන කිහිපයකම සංචාරය කිරීමට අවස්ථාව උදාවිය. තවද ඔවුන්ට මූල්‍ය වෙළෙඳපොල සංගමයෙහි සහ ණය සහ ප්‍රාග්ධන වෙළෙඳපොළවල සාමාජිකයින් කිහිප දෙනෙකු සමග සාකච්ඡා කිරීමට ද අවස්ථාව සැලසුනි. 2010 මැයි මාසයේදී ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන අලෙවිකරුවන් හා නිළධාරීන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ට දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොල හා ආර්ථිකයේ නවතම ප්‍රවනතාවයන් පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබාදීම සඳහා එක්දින වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුවේදී රජයේ සුරැකුම්පත් සම්බන්ධව ප්‍රාථමික වෙළෙඳුන්ගේ කාර්යභාරය ද අවධාරණය කරන ලදී.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී ශ්‍රී ලංකාවේ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි මෙහෙයුම් සහ ප්‍රාථමික වෙළෙඳකරු පද්ධතිය පිළිබඳව ඝානා මහ බැංකුව, කෙන්යානු රජය සහ බංගලාදේශ ප්‍රාථමික වෙළඳකරු සංගමය යන අධ්‍යයන කණ්ඩායම් තුන සඳහා වැඩමුළු පවත්වන ලදී.

### (උ) රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් සහ රජයේ සුරැකුම්පත්වල ආයෝජක පදනම පුළුල් කිරීමේ අරමුණෙන්, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරාම පවත්වාගෙනු යනු ලබන ආයෝජකයන් දැනුවත් කිරීමේ වැඩසටහන 2010 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව වසර තුළ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් 18 ක් ද, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාවන් වන රුහුණු සේවය, රජරට සේවය සහ කඳුරට සේවය ඔස්සේ වැඩසටහන් 61 ක් ද, අධ්‍යාපනික වැඩසටහන් 2 ක් ද, රූපවාහිනී සාකච්ඡා 12 ක් ද පැවැත්වීය. ඊට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව රජයේ සුරැකුම්පත්වල ආයෝජන පිළිබඳ මහජනතාවගේ හා පාසල් දරුවන්ගේ දැනුම දියුණු කිරීම සඳහා ''දැයට කිරුළ ප්‍රදර්ශනය'' සඳහා ද සහභාගී විය.

රජයේ සුරැකුම්පත්වල ද්වීතියික වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ අදහසින්, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ද්වීතියික වෙළෙඳාම සඳහා විද්‍යුත් වෙළෙඳාම් වේදිකාවක් නැවත හඳුන්වා දීමේ හැකියාව සොයා බැලීය. මෙම අරමුණෙහි පළමු පියවරත් ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් Blooomberg හි සහාය ඇතිව, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ හා බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් සහ භාණ්ඩාගාර කාර්ය මණ්ඩල දැනුවත් කිරීම සඳහා විද්‍යුත් වෙළෙඳාම් වේදිකාවක ප්‍රතිලාභ සහ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

# 22. ප්‍රාදේශීය සංවර්ධන

ශ්‍රී ලංකා රජය හා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද දායක අරමුදල් හෝ රජයේ අනුග්‍රාහකත්වය මගින් මූල්‍යනය වන සංවර්ධන ණය වැඩ සටහන් යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා සංවර්ධනයට අවශ්‍ය මුදල් සැපයුමෙහි නියුතුවීම අරමුණු කොටගෙන, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය තුළදී කෘෂිකාර්මික පශු සම්පත් හා ක්‍ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යන අංශ සම්බන්ධීකරණය කිරීමේ හා ඒවාට අවශ්‍ය ණය පහසුකම් සැපයීම සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව පහත අරමුණු ඉටුකර ගැනීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ණය සැපයීමේ නියුතු විය.

(අ) ප්‍රාදේශීය විභව ආර්ථික කටයුතුවල ආයෝජනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ප්‍රාදේශීය සංවර්ධනය වැඩි දියුණු කිරීම.

(ආ) දිළිඳුකම ආශ්‍රිත ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීම හා විධිමත් මූල්‍ය ක්ෂේත්‍රය තුළට ප්‍රාදේශීයව වෙසෙන අඩු ආදායම්ලාභී ජනතාව අන්තර්ගතකරවීම මගින් දිළිඳුකම අඩු කිරීම.

(ඇ) උගත් තරුණ පිරිස්, රැකියා විරහිත කාන්තාවන් සහ ස්වයං සේවා නියුක්තිකයන් සඳහා විධිමත් මූල්‍ය ක්ෂේත්‍රය තුළින් ණය ලබා ගැනීමට සහ ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කර ගැනීමට අවශ්‍ය දැනුම හා තාක්ෂණික කුසලතා ලබා ගැනීමට පහසුකම සැලසීම මගින් ඔවුන් සේවා නියුක්ත කරවීම.

(ඈ) ස්වාභාවික හා මිනිසුන් විසින් නිර්මිත විපත් මගින් හානියට පත් ප්‍රදේශවල ව්‍යාපාර හා ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම.

(ඉ) ස්වයංපෝෂිතභාවය තුළින් ජනතාව පරිභෝජනය කරන ආහාරවල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්, 2010 වර්ෂය තුළදී සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රති මූල්‍ය හෝ පොලී සහනාධාර සැපයීම හා අවශ්‍යතාවය පැන නැඟුණු අවස්ථාවන්හිදී ණය උපකාරක සේවා සැපයීම මගින් පහත සඳහන් ණය යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීම/සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී.

### 22.1 ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශ සංවර්ධනය

දශක තුනක් පුරා සංවර්ධන ප්‍රයත්නයන්ට බාධා පමුණුවමින් යුධ වාතාවරණයන් උද්ගත වී පැවති උතුරු නැගෙනහිර පළාත්වල සංවර්ධනය ආශ්‍රිත ගැටළු කෙරෙහි සලකා බලන වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව අවධානය යොමු කරන ලදී. නිදහස ලැබීමෙන් පසුව මෙම පළාත්වල ජනතාවගේ සහ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ජීවනෝපාය සහ ආර්ථික කටයුතුවලට සහයවීමේ සහ ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය වැඩි දියුණු කිරීමේ අරමුණ සහිතව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් "පිබිදෙන උතුර" හා "නැගෙනහර නවෝදය" වැනි විශේෂ ණය යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රම 2 මගින් උතුරු නැගෙනහිර පළාත්වල කෘෂි ආර්ථික කටයුතු, පශු සම්පත්, ධීවර කටයුතු, ක්‍ෂුද්‍ර හා සුළු ව්‍යවසාය, වෙළෙඳ සහ වෙනත් ස්වයං ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම සඳහා මූල්‍ය සහාය සපයන ලදී.

"පිබිදෙන උතුර" ණය යෝජනා ක්‍රමය යටතේ, සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් රුපියල් මිලියන 1,240 ක් වටිනා ණය 9,108 ක් ප්‍රදානය කරන ලදී. මෙහිදී වැඩිම වටිනාකම (රුපියල් මිලියන 460) සහ වැඩිම ණය ප්‍රමාණය (2,938) වෙළෙඳ හා ස්වයං රැකියා කටයුතු සඳහා ලබාදුන් අතර රුපියල් මිලියන 322 ක් වටිනා ණය 2,526 ක් කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ක්‍රියාකාරකම්වලට ප්‍රදානය කරන ලදී. තවද ක්‍ෂුද්‍ර ව්‍යාපාර (ණය ප්‍රමාණය 954) සහ ධීවර අංශයේ කටයුතු (ණය ප්‍රමාණය 689) සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 150 ක් හා රුපියල් මිලියන 84 ක් වශයෙන් ද පශු සම්පත් අංශය සඳහා රුපියල් මිලියන 226 ක් වටිනා ණය 2001 ක් ද ප්‍රදානය කරන ලදී. "නැගෙනහිර නවෝදය" ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභලාභීන් 5,155 සඳහා රුපියල් මිලියන 752 ක වටිනාකමකින් යුතු ණය ප්‍රදානය කරන ලදී. මෙම ණයවලින් වැඩිම ණය ප්‍රමාණය (2,755) හා වැඩිම ණය වටිනාකම (රුපියල් මිලියන 433) වෙළෙඳ, සංචාරක හා වෙනත් ස්වයං රැකියා කටයුතු සඳහා ප්‍රදානය කළ අතර සෙසු ණය ප්‍රමාණය නැගෙනහිර පළාතේ බහු වාර්ෂික බෝග වගාව (රුපියල් මිලියන 235 ක් වටිනා ණය 1,660 ක්), පශු සම්පත් සංවර්ධනය (රුපියල් මිලියන 70 ක් වටිනා ණය 610 ක්) සහ ධීවර ආශ්‍රිත කටයුතු (රුපියල් මිලියන 13 ක් වටිනා ණය 127 ක්) සඳහා යොදවන ලදී.

වර්ෂය තුළ පැවති සාමකාමී වාතාවරණය යටතේ, සෙසු සංවර්ධන ණය යෝජනා ක්‍රමයන් ද මෙම පළාත් දෙක තුළ ක්‍රියාවට නංවනු ලැබීය. මේ වර්ෂයේදී සහභාගීත්ව මූල්‍ය ආයතනවල සහාය ඇතිව දිළිඳුකම පිටු දැකීමේ ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය (ප්‍රබෝදිනී) යටතේ මෙම පළාත් දෙකෙහි වෙසෙන දිළිඳු පවුල් වෙත අවධානය යොමු කිරීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. 2009 වර්ෂය අවසානය වනවිට ප්‍රබෝදිනී ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි වූ නැගෙනහිර පළාතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10,302 ක් ලෙස වාර්තා විය. මෙවා අතරින් ප්‍රතිලාභීන් 5,837 ක් සඳහා ප්‍රදානය කරන ලද්දේ මුළු වටිනාකම රුපියල් මිලියන 258 ක් වූ ක්‍ෂුද්‍ර ණය ප්‍රමාණයකි. තවද, 2010 වර්ෂයේදී හඳුන්වාදෙන ලද නව ණය යෝජනා ක්‍රම 2 ක් වන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය සහ ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය යටතේ ද පළාත් දෙකෙහි යෝග්‍ය ප්‍රතිලාභලාභීන් සඳහා ණය පහසුකම් සපයන ලදී.

නැගෙනහිර පළාතේ ගැටුම් මගින් හානියට පත් අභ්‍යන්තර අවතැන්වූවන් 378 ක් සඳහා වූ සමාජ සංවර්ධන වැඩ සටහනකට ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහභාගි විය. මෙම ව්‍යාපෘතිය සඳහා ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් ඔවුන්ගේ වැඩ සටහන යටතේ අරමුදල් සපයන ලදී. ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ශ්‍රී ලංකා හමුදා ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකාය සහ සර්වෝදය

ව්‍යාපාරය වැනි විධිමත් ආයතනවල සහාය ඇතිව නැවත පදිංචි වූ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හානියට පත් නිවාස පිළිසකර කිරීම සහ ඔවුන්ගේ ජීවනෝපාය කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා සහාය වීමට ගත් සහයෝගිතා ප්‍රයත්නයක් ලෙස මෙම වැඩ සටහන ක්‍රියාත්මක විය. මඩකලපුව ප්‍රදේශය තුළ මෙම ව්‍යාපෘතිය සාර්ථක වීමෙන් පෙනී යන්නේ ප්‍රජා සහභාගීත්වය යටතේ අවම පිරිවැයකින් හානියට පත් පිරිස් යළි නගා සිටුවීම සඳහා මෙම ක්‍රමවේදය සෙසු ප්‍රදේශ සඳහා ද යෙදවිය හැකි බවයි.

## 22.2 ප්‍රදේශවලට විශේෂ වූ සංවර්ධන වැඩ සටහන්

උතුරු හා නැගෙනහිර පළාත්වලට අමතරව, සෙසු දිස්ත්‍රික්කවල ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය මගින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් එම දිස්ත්‍රික්කවලටද ප්‍රාදේශීය වශයෙන් විශේෂ වූ ණය යෝජනා ක්‍රම ඇති කරන ලදී. මේ අනුව සලකා බලන වර්ෂය තුළදී වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩ සටහන, "භාග්‍ය" (මොණරාගල, කුරුණෑගල, බදුල්ල සහ අනුරාධපුර දිස්ත්‍රික්ක), කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන (මැද රට ප්‍රදේශය සහ මොණරාගල දිස්ත්‍රික්කයේ අන්තර්කලාපීය ප්‍රදේශයන්), මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය සහ සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ණය ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන් ක්‍රියාවට නංවන ලදී.

## 22.3 කෘෂිකාර්මික හා සත්ව පාලන අංශය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් රටේ දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම ප්‍රධාන වශයෙන් අරමුණු කරගත් කෘෂි සත්ව පාලන ණය යෝජනා ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරමින් වර්ෂය තුළදී යෝග්‍ය ණය ගිණුම්කරුවන් සඳහා ණය සපයන ලදී. මේ යටතේ කිරි ගොවීන්ට අමතරව, පෞද්ගලික අංශයේ මධ්‍යම පරිමාණ ආයෝජකයින්ද කිරි සැකසුම් සහ කෘෂි-සැකසුම් කර්මාන්ත වලට ගබඩා/කර්මාන්තශාලා ආදිය ඉදිකිරීම, සහ යන්ත්‍ර/උපකරණ මිලයට ගැනීම සඳහා ණය පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් ලබයි. වර්ෂය තුළදී, මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ණයගැනුම්කරුවන් සඳහා රුපියල් මිලියන 442 ක මුදලක් ප්‍රදානය කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතනවලට හැකි විය. කිරි ගොවීන් අතර යහපත් පරිචය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කිරි නිෂ්පාදන කළමණාකරනය පිළිබඳ අත් පොතක් පළ කරන ලදී. තවද, ගොවීන්ගේ කිරිදෙනුන් මිලට ගැනීම හා විකිණීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා හොරණ, මාදම්පේ, කැකිරාව සහ කුරුණෑගල ප්‍රදේශවල කිරි සම්පත් මධ්‍යස්ථාන 5 ක් විවෘත කරන ලදී.

2010 වර්ෂයේදී, කෘෂිකාර්මික බෝග වගා කිරීම සඳහා ගොවීන්ට පහසුකම් සැලසීමේලා නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක විය. 2009/10 මහ කන්නය තුළදී, ගොවීන් 41,950 ක් සඳහා රුපියල් මිලියන 2,016 ක ණය ප්‍රදානය කරන ලද අතර, එය පසුගිය වර්ෂයේ එම කන්නයට සාපේක්ෂව සියයට 5.3 ක වර්ධනයක් විය. යල කන්නයේදී, ප්‍රධානිත ණය ප්‍රමාණය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 55 කින් වර්ධනය වූ අතර, ණයවල මුළු වටිනාකම රුපියල් මිලියන 1,568 ක් විය. මුදාහල ණය ප්‍රමාණයේ වැඩිවීම වී සහ අනෙකුත් බෝග වගාකළ භූමි ප්‍රදේශය මගින් ද පිළිබිඹු විය. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මගින් මුදාහල ණය ප්‍රමාණයෙන් සියයට 60 ක් වී සඳහා යෙදවුණු අතර, සෙසු ණය ප්‍රමාණය බඩ ඉරිඟු, අර්තාපල් , ලූනු සහ වෙනත් හේන් බෝග සඳහා යෙදවිණි. පොළොන්නරුව, අනුරාධපුරය, යාපනය සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලට නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ වැඩිම ණය ප්‍රමාණයක් සපයනු ලැබීය. මේ අතර, කෘෂි නවෝදය ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් රජයේ පොලී සහනාධාර අනුග්‍රහය සහිතව ක්ෂුද්‍ර හා සුළු ව්‍යවසාය සඳහා මැදි හා දිගුකාලීන ණය ප්‍රදානය කරන ලදී. මෙම වර්ෂය තුළදී කෘෂි නවෝදය ව්‍යාපෘතිය යටතේ ණය සුළු ප්‍රමාණයක් උතුරු හා නැගෙනහිර පළාත් සඳහා ද මුදා හරින ලදී.

## 22.4 සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය මූල්‍යකරණය හා සේවා නියුක්ති ප්‍රවර්ධනය

2010 වර්ෂය තුළදී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්ට සහ උවදුරු මගින් හානියට පත් එවැනි ව්‍යවසායයන්ට පහසුකම් සැපයීමේ අරමුණ සහිතව සෞභාග්‍ය නමින් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මුළු දිවයිනම ආවරණය කරන මෙම ණය යෝජනා ක්‍රමය මගින් අළුතින් ආරම්භ කරන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්ට රුපියල් 500,000 ක උපරිමයකට යටත්ව හා උවදුරු මගින් හානියට පත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් සඳහා රුපියල් මිලියන 20 ක උපරිමයකට යටත්ව ණය සපයනු ලැබේ. මෙහිදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් උපරිමයන්ට යටත්ව සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් සපයනු ලබන ණය සඳහා සියයට 100 ක ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 2010 වර්ෂයේදී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ වෘත්තීය සහ තාක්ෂණික පුහුණු අමාත්‍යාංශයේ සහාය ඇතිව වෘත්තීමය සුදුසුකම් ලත් තරුණ පිරිස් අතර ස්වයං සේවා නියුක්තිය ප්‍රචලිත කිරීම සඳහා ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය නමින් නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙමගින් රටේ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලත් තරුණ පිරිස් සඳහා ඔවුන් ස්වයං සේවා නියුක්ති ව්‍යාපෘති පිහිටුවීමට අවශ්‍ය මූල්‍යමය සහාය සපයනු ලැබේ.

අළුතින් හඳුන්වා දුන් යෝජනා ක්‍රමවලට පරිබාහිරව, 2010 වර්ෂයේදී වෙනත් ණය යෝජනා ක්‍රමයන් මගින් ද ඉලක්ක ගත ජන කොට්ඨාශ සඳහා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රවර්ධනය හා සේවා නියුක්ති උත්පාදනය කිරීම අරමුණු කොට තුළ ක්‍රියාත්මක කරන ලදී. වර්ෂය තුළදී යුරෝපා ආයෝජන බැංකුවේ පශ්චාත් සුනාමි ණය (ගිවිසුම බී) යටතේ රුපියල් මිලියන 87 ක් වටිනා ණය ප්‍රමාණයක් ප්‍රදානය කරන ලද අතර, ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘති සතුටුදායක ලෙස සාර්ථකත්වයට පත්වෙමින් රුපියල් මිලියන 268 ක් වටිනා ණය ප්‍රමාණයක් ප්‍රදානය කිරීමට සමත් විය. සබරගමු පළාත්

**සංඛ්‍යා සටහන II-15**

**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය සංවර්ධන ණය යෝජනා ක්‍රමවල ප්‍රධාන ලක්ෂණ**

| | ව්‍යාපෘතිය හා එය ක්‍රියාත්මක වන කාලසීමාව | අරමුදල් සපයන ලද ආයතනය | පුළුල් අරමුණ | අරමුදල් යෙදවීම | ණයකරුවන් ගෙවිය යුතු පොලී අනුපාතිකය | ආපසු අයවීමේ අනුපාතිකය |
|---|---|---|---|---|---|---|
| 1.<br>1.1 | <u>කෘෂිකාර්මික අංශය</u><br>දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය (SPCDPRF)<br>(2006 - 2014) | ශ්‍රී ලංකා රජය | බහුවාර්ෂික බෝග අංශයේ වාණිජකරණය, නිෂ්පාදනය දියුණු කිරීම, පැල තවාන් දැමීම, පසු අස්වනු මෙහෙයුම් කටයුතු, නිෂ්පාදන සැකසීම හා වෙළෙඳපොළ පහසුකම් ලබාදීම. | රුපියල් බිලියන 1.2 | 9% | 90%<br>(ආසන්න වශයෙන්) |
| 1.2 | තේ සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය (TDPRF)<br>(2006 - 2018) | -එම- | කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළෙඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. මේ යටතේ මූලික වශයෙන් HACCP සහතිකය ලබාගැනීම සඳහා තේ කර්මාන්ත ශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයිය හැකිය. | රුපියල් බිලියන 1.1 | 9% | 90%<br>(ආසන්න වශයෙන්) |
| 1.3 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS)<br>(අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | සුළු ගොවීන් සඳහා මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම.<br>● කෙටිකාලීන නිෂ්පාදන ණය<br>● බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය<br>● ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය යටතේ කෘෂිකාර්මික ද්‍රව්‍ය මිලට ගැනීම | සහභාගිත්ව මූල්‍ය ආයතන තමන්ගේම අරමුදල් මගින් ණය ප්‍රදානය කෙරේ. | 12% | 95%<br>(ඉක්මවා ඇත.) |
| 1.4 | කෘෂි සත්ව පාලන ණය යෝජනා ක්‍රමය | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | කිරි හරක් පාලනයේදී පහත දැක්වෙන ප්‍රාග්ධන වියදම් සඳහා<br>● ගව නිවහන තැනීමට<br>● එළදෙනුන් මිලදී ගැනීමට<br>● ආහාර මිලදී ගැනීම, පශු වෛද්‍ය සේවා හා ඖෂධ ආදිය සඳහා<br>● සත්ව ආහාර වගා කිරීම සඳහා<br>● ජීව වායු ටැංකි ඉදිකිරීමට<br>● පශු වෛද්‍යවරු විසින් නිර්දේශ කරනු ලබන අනෙකුත් කවර හෝ අවශ්‍යතාවයන් සඳහා<br>දියර කිරි සැකසුම් කර්මාන්ත හා කෘෂිකර්මාන්තය පදනම් කරගත් කර්මාන්තවලට පහත දැක්වෙන අරමුණු සඳහා අරමුදල් සැපයීම<br>● කාර්මික ගොඩනැගිලි ඉදිකිරීම/ නවීකරණය කිරීම<br>● නවීන යන්ත්‍ර සහ උපකරණ මිලයට ගැනීමට<br>● ගබඩා පහසුකම්, ශීත කාමර හා ප්‍රවාහන සේවා<br>● අනෙකුත් අවශ්‍ය සේවා, ප්‍රමිති කළමනාකරණයට අවශ්‍ය උපකරණ සඳහා | සහභාගිත්ව මූල්‍ය ආයතන සිය අරමුදල් මගින් ණය ලබාදේ. රුපියල් මිලියන 5,000 ක් මෙමගින් ලබාදීමට අපේක්ෂිතය | කුඩා කිරි පට්ටි ණය ව්‍යාපෘති සඳහා 12%<br><br>කිරි සහ භෝග සැකසීම සඳහා 14% | 90% |
| 1.5 | කෘෂි නවෝදය ණය වැඩසටහන | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත, ක්ෂුද්‍ර හා බිංදු වාරි පද්ධති ඇතුළුව කෘෂිකාර්මික හා සත්ව පාලන අංශයට අදාල කටයුතු වලට මැදිකාලීන ණය සැපයීම. | ණයදෙන ආයතන තම සම්පත් උපයෝගී කොටගෙන ණය ප්‍රදානය කරයි. ණය ක්‍රමය ක්‍රියාත්මක වන කාලය තුළදී රුපියල් මිලියන 3,000 ක් මුදාහැරීමට අපේක්ෂා කෙරේ. | 12% | 90%<br>(ආසන්න වශයෙන්) |
| 2.<br>2.1 | <u>සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය</u><br>මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන (චක්‍රීය අරමුදල්) ව්‍යාපෘතිය (MREAPRFS)<br>(2007 - 2009) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලල (IFAD) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ආධාර සැපයීමෙන් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම ඉහළ නැංවීම. | රුපියල් මිලියන 77 | 10% | 87% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2.2 | සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්)ණය ව්‍යාපෘතිය (SPIRDPRF) (2007 - 2010) | ශ්‍රී ලංකා රජය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය තුළ ජනතාවගේ ආදායම් උත්පාදන කටයුතු තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම. | රුපියල් මිලියන 100 | 10% | 93% |
| 2.3 | යුරෝපා ආයෝජන බැංකුවේ පශ්චාත් සුනාමි ණය යෝජනා ක්‍රමය (ගිවිසුම B)(EIB) (2006 - 2014) | යුරෝපා ආයෝජන බැංකුව (EIB) | සුනාමි ව්‍යසනයට ගොදුරු වූ ප්‍රදේශ වල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යළි නගා සිටුවීම. | යුරෝ මිලියන 10 | 9% | 90% ඉක්මවා ඇත. |
| 2.4 | සුසහන ණය යෝජනා ක්‍රමය (අදියර 2) | ශ්‍රී ලංකා මහ බැංකුව | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සහාය වීම | රුපියල් මිලියන 500 | 6% | ණය මුදල් සහන කාලය තුළ පවතී |
| 2.5 | ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය (2007-2015) | ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය (AFD) | පශ්චාත් සුනාමි ඉදිකිරීම් කටයුතුවල යෙදෙන, ඉදිකිරීම්, වාණිජ හා සංවර්ධන ආයතනය විසින් අනුමත සමාගම් වෙත යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | යුරෝ මිලියන 10 | 9% | 90% ඉක්මවා ඇත |
| 2.6 | පිබිදෙන උතුර විශේෂ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | අභ්‍යන්තර අවතැන් වූවන් සහ අනෙක් පුද්ගලයන් පළාත් තුළ පදිංචි කරවීමට සහ ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමට සහාය වීම. | රුපියල් බිලියන 3 | 9% | ණය මුදල් සහන කාලය තුළ පවතී |
| 2.7 | "නැගෙනහිර නවෝදය" නැගෙනහිර පළාත සංවර්ධනය සඳහා වන චක්‍රීය අරමුදල | ශ්‍රී ලංකා මහ බැංකුව | අභ්‍යන්තර අවතැන් වූවන් සහ අනෙක් පුද්ගලයන් පළාත් තුළ පදිංචි කරවීමට සහ ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමට සහාය වීම. | රුපියල් බිලියන 1 | 9% | ණය මුදල් සහන කාලය තුළ පවතී |
| 3.<br>3.1 | <u>ක්ෂුද්‍ර මූල්‍ය අංශය</u><br>වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන (2006 - 2012) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මොණරාගල, කුරුණෑගල, බදුල්ල හා අනුරාධපුර වැනි තෝරාගත් දිස්ත්‍රික්කවල දිළිඳු ගොවීන්ගේ ජීවන තත්ත්වය සහ ආදායම් ප්‍රවර්ධනය කිරීම සඳහා | රුපියල් මිලියන 200 | 10% | ණය මුදල් සහන කාලය තුළ පවතී |
| 3.2 | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (2007 - 2015) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිත ආයතනය. (USAID) | මැදරට ප්‍රදේශයේ තේ සහ බහු වාර්ෂික බෝග වගා කරන කුඩා වතු හිමියන්ගේ සහ මොණරාගල ප්‍රදේශයේ අන්තර් කලාපීය ප්‍රදේශයන්හි උස්බිම් වල ආහාර බෝග වගා කරන රබර් වගාව සඳහා යොමු වීමට කැමති ගොවීන්ගේ ජීවන තත්වයන් නංවාලීම. | විශේෂ ගැණුම් හිමිකම් 15.25 | 9% | ණය මුදාහැරීමට නියමිතය |
| 3.3 | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් මූල්‍යකරණ පහසුකම් සැපයීම සඳහා ඵලදායී ණය මුදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම. | රුපියල් මිලියන 267 | 16%-20% | 90% ඉක්මවා ඇත |
| 3.4 | දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය PAMP (RF) 2009 - 2013 | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් මූල්‍යකරණ පහසුකම් සැපයීම සඳහා ඵලදායී ණය මුදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම.<br>හඳුනාගත් ණය ගැනුම්කරුවන් අතර ආදායම් ඉපැයීමේ ක්‍රම හඳුන්වාදීමෙන් දිළිඳුබව දුරැලීම.<br>සංවිධිත මූල්‍ය අංශය හා සම්බන්ධවීම සඳහා අඩු ආදායම්ලාභී කුඩා කණ්ඩායම් සංවිධානය කිරීම | රුපියල් මිලියන 1,385<br>ජපන් යෙන් මිලියන 2,100 | 16% | 90% ඉක්මවා ඇත |
| 3.5 | දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘතිය II (PAMP II) | ශ්‍රී ලංකා රජය | -එම- | | උපරිම 15.5% | ණය මුදල් සහන කාලය තුළ පවතී. |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ණය ව්‍යාපෘතිය (SIRDP-RF) සහ මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය (MREAP-RF) ද 2010 වර්ෂයේදී අදාල දිස්ත්‍රික්කවල තවදුරටත් ක්‍රියාත්මක විය. වර්ෂය තුළදී සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ණය ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 42 ක් වටිනා ණය සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලද අතර මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 54.9 ක් වටිනා ණය සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලදී.

### 22.5 දිළිඳුකම පිටුදැකීම හා සේවා නියුක්තිය ඇති කිරීම

ජපන් අන්තර් ජාතික සහයෝගිතා සංවිධානය (JICA) මගින් මූල්‍යනය වන දිළිඳුකම පිටු දැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය (ප්‍රබෝදිනී) 2010 වර්ෂයේදී තෝරාගත් දිස්ත්‍රික්ක 14 ක් තුළ තවදුරටත් ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම හා නිපුණතා සංවර්ධන පුහුණු වැඩ සැපයීම මගින් දිළිඳුකම පිටුදැකීමට දායකත්වය සපයමින් දිළිඳු ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම හා ඔවුන් විධිමත් මූල්‍ය සේවාවන් තුළට අන්තර්ග්‍රහනය කරවීමයි. වර්ෂය තුළදී ප්‍රබෝදිනී ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 40,384 ක් ලෙස වාර්තා විය. මේ අතරින් ප්‍රතිලාභීන් 19,860 ක් සඳහා රුපියල් මිලියන 865 ක් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා ප්‍රදානය කරනු ලැබීය. මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රාදනිත ණය ප්‍රමාණයේ සියයට 17 ක වැඩිවීමකි.

මේ අතර, ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථික තත්ත්වය හා පොදු සුභසාධනය වැඩි දියුණු කිරීමේ අරමුණ සහිතව සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘති යෝජනා ක්‍රමය ප්‍රතිලාභීන් 5,753 දෙනෙකු සඳහා රුපියල් මිලියන 140 ක් වටිනා ණය ප්‍රදානය කරමින් 2010 වර්ෂය තුළදී සාර්ථකත්වයට පත් විය. අනුරාධපුර, බදුල්ල, මොණරාගල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ආන්තික සුළු ඉඩම් හිමියන් හා දිළිඳු උඩරට ආහාර බෝගල වැවිලිකරුවන්ගේ ජීවනෝපාය සංවර්ධනය අරමුණු කරගත් වියලි කලාපීය ජීවනෝපාය සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩ සටහන මගින් රුපියල් මිලියන 47 ක් වටිනා ණය ප්‍රතිලාභීන් 909 දෙනෙකු සඳහා ප්‍රදානය කරන ලදී.

### 22.6 ණය අතිරේකකරණය

2010 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ණය අතිරේකකරණ යෝජනා ක්‍රම 12 ට අදාලව, වාර්ෂික වාරික එකතු කිරීම, හිමිකම් පෑමේ අයදුම්පත් කළමනාකරණය කිරීම, අයදුම්පත් ගෙවීම සඳහා යොමු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ ගෙවීම් නැවත අය කරගැනීම යන ණය අතිරේකකරණයට අදාල මෙහෙයුම්වල අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2010 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රම යටතේ එකතු කරන ලද මුළු වාරික වටිනාකම රුපියල් මිලියන 53 ක් වූ අතර, ණය ඇප ආවරණ හිමිකම් පෑම් සඳහා ගෙවූ මුළු වටිනාකම රුපියල් මිලියන 184 ක් ලෙස වාර්තා විය.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ ගොවි ප්‍රජාවගේ යහපත සඳහා නව ණය ඇප ආවරණ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් කෙටිකාලීන භෝග වගා කරන ගොවීන්ට ලබා දුන් ණය සඳහා මෙම ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ඇප ආවරණ සපයන ලදී. මෙම ඇප ආවරණ ක්‍රමයේ අරමුණ වන්නේ ගැටුම් පැවැති කාල වකවානුව තුළදී ඔප්පු සහ වෙනත් ලියකියවිලි විනාශ වීම හෝ නැතිවීම හේතුවෙන් වගාකරන ලද ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට අපොහොසත් වූ මුලතිව්, කිලිනොච්චි හා මන්නාරම් දිස්ත්‍රික්කවල ගොවීන් සඳහා ණය පහසුකම් ලබා ගැනීමට සහාය වීමයි. මෙම ඇප ආවරණ යෝජනා ක්‍රමය මගින් අයිති තහවුරු කිරීමට නොහැකි ඉඩම් ඇපයට ලබාදුන් ණය හේතුවෙන් අලාභ ලැබූ සහභාගීත්ව මූල්‍ය ආයතන වලට වන්දි ලබාදෙනු ලැබේ.

## 23. ලේකම්

**ලේකම් දෙපාර්තමේන්තුව 2010 වසරේ දී කලට වේලාවට භාණ්ඩ හා සේවාවන් සැපයීමෙන් ද, මෙහෙයුම් ක්‍රමවේදයන් සහ ක්‍රියාපිළිවෙත් නිරන්තර ඇගයීමකට ලක් කිරීමෙන් සහ වැඩිදියුණු කිරීමෙන් ද, නිවාඩු, විශ්‍රාම වැටුප් අරමුදල්, දේශීය හා විදේශීය ගමන් සම්බන්ධ නීති හා නියෝග ක්‍රියාවට නගමින් ද, බැංකුවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා දායක විය.**

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ටෙන්ඩර් පටිපාටිය මූලික කර ගනිමින් රුපියල් දශ ලක්ෂ 208.9 ක වටිනාකමින් යුත් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවාවන්, ගුණාත්මක භාවයෙන් යුතුව තරඟකාරී මිල ගණන් යටතේ කලට වේලාවට සපයන ලදී. පෙර වර්ෂයේ දී මෙන්ම මහ බැංකුවේ මිල දී ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම තුළින් දෙපාර්තමේන්තුවල භාණ්ඩ හා සේවා අවශ්‍යතා කලට වේලාවට සැපයීම කඩිනම් කිරීමේ අරමුණින් මිලදී ගැණුම් සැලසුම් කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාවට නගනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවේ සමස්ථ මිලදී ගැනීමේ අවශ්‍යතාවලින් සියයට 92 ක ප්‍රමාණයක් ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමට මෙම වර්ෂය තුළදී ලේකම් දෙපාර්තමේන්තුවට හැකි විය. මීට අමතරව, බැංකුවේ සියළුම දේපල සඳහා සඵල විස්තීර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. මහ බැංකු විශ්‍රාම යෝජනා ක්‍රමයේ වැන්දඹු සහ අනත්දරු අරමුදලේ සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු අරමුදලේ පාලන කටයුතු ද, ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. මෙම යෝජනා ක්‍රමයන් යටතේ වර්ෂය අවසාන වන විට විශ්‍රාමිකයන් 1987 දෙනෙකු ලියාපදිංචි වී සිටින අතර, විශ්‍රාම අරමුදල් මුදාහැරීමේ කටයුතුවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදෙමින්, අරමුදලේ දත්ත පද්ධතිය පරිගණක ගත කිරීමේ කටයුතු වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී.

2010 වර්ෂය තුළදී ද ලේකම් දෙපාර්තමේන්තුව බැංකුව සඳහා අවශ්‍ය නීතිමය සේවාවන් අඛණ්ඩව සපයා දීමෙහි නිරත විය. බැංකුවේ කටයුතු උත්ප්‍රේරණය කිරීම සඳහා අවශ්‍ය සුපුරුදු නීතිමය කටයුතුවල සිට ප්‍රතිපත්ති සැලසුම් කිරීම දක්වා වූ පුළුල් පරාසයක් තුළ මෙකී සේවාවන් සපයන ලදී.

අධිකරණමය කටයුතු මෙහෙයවීමේ දී පූර්ව ක්‍රියාකාරි පියවර අනුගමනය කිරීම තුළින් බැංකුවේ අයිතිවාසිකම් තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම සිදු විය. බැංකුව හමුවේ ඇති අභියෝග යන්ට සාර්ථකව මුහුණදීම සඳහා, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයට අදාල නීති සහ අනුනීති සැකසීමේ දී ක්‍රියාකාරි සහයෝගය ලබා දෙන ලදී.

2010 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ සේවා තිළිණ ප්‍රදානය හා නිදහස් දින උත්සවය වැනි වාර්ෂික උත්සවයන් ද විවිධ ආගමික උත්සවයන් ද සම්බන්ධීකරණය සහ සංවිධානය කරන ලදී.

## 24. ආරක්ෂක සේවා

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂාව, තවදුරටත් තහවුරු කිරීම සඳහා, ආරක්ෂක හමුදාවන්ගේ සහ පොලීසියේ සහාය සහිතව මහ බැංකුවේ සේවකයින්, ගොඩනැගිලි, වත්කම්, අමුත්තන් හා අතර මැදි මුදල් තොග ප්‍රවාහන කටයුතු ආරක්ෂා කිරීම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. අමුත්තන් හා මහ බැංකු පරිශ්‍රයට ගෙන එන සියළු භාණ්ඩ විනාඩි 03 ක් ඇතුළත පරීක්ෂා කර නිදහස් කිරීමේ කාර්යය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අමුත්තන් කළමනාකරණ සහ සුපරීක්ෂණ ජාලගත ක්‍රමයක් අලුතින් හඳුන්වා දෙන ලදී. අලුතින් ස්ථාපනය කරන ලද යාපනය හා ත්‍රිකුණාමලය පළාත් කාර්යාලවල ආරක්ෂක කටයුතු සඳහා අමතර 15 දෙනෙකුගෙන් යුත් ආරක්ෂක නිලධාරීන් කණ්ඩායමක් අතුරු ගිවිසුම් මත සේවයට බඳවාගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ කේන්ද්‍රගත සංකලිත ආරක්ෂක ක්‍රමය යාවත්කාලීන කිරීමේ හා සමාලෝචනය කිරීමේ ආරක්ෂක කටයුතු ආරම්භ කරන ලදී. (Turnstiles පැමිණීමේ හා පිටවීමේ ක්‍රමය හා ද්වාර ප්‍රවේශ පාලන ක්‍රමය). රාජගිරිය විදු පියස ජාත්‍යන්තර පුහුණු ආයතනයක තත්ත්වයට පරිවර්තනය කිරීමේ වැඩසටහනට සමගාමීව එහි ආරක්ෂක (CCTV)කැමරා පද්ධතියක් හා පටිගත කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කරන ලදී.

ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ශක්තිමත්ව කිරීමේ අරමුණින් හමුදාමය පසුබිමක් සහිත නිලධාරීන් දෙදෙනෙකු මාණ්ඩලික ශ්‍රේණියට අලුතින් බඳවා ගන්නා ලදී. නවීනතම වාණිජමය ආරක්ෂක දැනුම ලබාදීම අරමුණු කරගෙන මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු සති දෙකක පුහුණුව සඳහා (උසස් ආරක්ෂක කළමනාකරණය පුහුණුව සඳහා) මැලේසියාවට යවන ලදී. තවදුරටත් ආරක්ෂක හා කාර්යාල කළමනාකරණ කටයුතු වැඩි දියුණු කරවනු වස් විවිධ ආරක්ෂක පුහුණු කටයුතු සඳහා මාණ්ඩලික නිලධාරීන් 11 දෙනෙකු ද මාණ්ඩලික නොවන නිලධාරීන් 184 දෙනෙකු ද සහභාගි කරවන ලදී.

ගිනි නිවීම, ගිනි වැළැක්වීම හා ප්‍රථමාධාර සහිත දින දෙකක සංක්ෂිප්ත පුහුණු වැඩසටහනක් පළාත් කාර්යාල ද ඇතුළුව සෑම දෙපාර්තමේන්තුවකින් තෝරාගන්නා ලද ගිනි සහායක නිලධාරීන් සඳහා පවත්වන ලද අතර වාර්ෂික ගිනි නිවීමේ පෙරහුරුවක් හා ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් ශ්‍රී ලංකා මහ බැංකුවේ සියළුම සේවා නියුක්තියන් සඳහා පවත්වන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව, කොළඹ ගිනි නිවීමේ ඒකකය හා ශාන්ත ජෝන් ගිලන් රථ සේවාවේ සහාය ලබාගන්නා ලදී.

2010 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂක සේවාවේ නියුතු සියළුම නිලධාරීන් සඳහා අවි පුහුණුවක් හා සජීව වෙඩි තැබීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් පවත්වන ලදී. එමෙන්ම ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේ සැලසුම අනුව අවදානම් අංශ පවත්වාගෙන යාම සඳහා වන අභ්‍යාසයන්ට ද සම්බන්ධ විය. මේ අනුව ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට තවදුරටත් කිසිදු ආරක්ෂක හිදැසකින් තොර සාර්ථක වර්ෂයක් පවත්වාගෙන යාමට හැකි විය.

## 25. සංඛ්‍යාන හා ක්ෂේත්‍ර සමීක්ෂණ

2010 වසරේදී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ජාතික ගිණුම්, මිල, වැටුප්, ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ අනෙකුත් සමාජ ආර්ථික අංශයන් පිළිබඳ දත්තයන් එක්රැස් කිරීම, සම්පාදනය කිරීම, එම දත්ත විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීම යන ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලැබීය. තොරතුරු බෙදා හැරීමේ කාර්ය තුළින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, පුවත්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා තෝරාගත් ආර්ථික දර්ශක සතිපතා සහ මාසිකව නිකුත් කිරීම මගින් සමාජ ආර්ථික දත්ත සහ තොරතුරු ද, මාසික පුවත්පත් නිවේදන මගින් පාරිභෝගික මිල දර්ශකයේ හැසිරීම පිළිබඳව තොරතුරු ද මහජනතාව වෙත ලබා දෙන ලදී.

මෙයට අමතරව, වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බැංකුව මගින් සංවිධානය කළ බොහොමයක් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස තම දායකත්වය ලබා දුණි. සමස්ත ඵලදායිතාවය වර්ධනය කර ගැනීමේ අභිලාෂයෙන් වසර තුළ දී දෙපාර්තමේන්තුව තම කාර්ය මණ්ඩලයේ බොහෝ මාණ්ඩලික ශ්‍රේණියේ සහ මාණ්ඩලික නොවන ශ්‍රේණියේ නිලධාරීන් දේශීය සහ විදේශීය පුහුණුව සඳහා අඛණ්ඩව යොමු කරනු ලැබීය.

### 25.1 සංඛ්‍යාන සමීක්ෂණ

2006 වසරේ අග භාගයේ ආරම්භ කරන ලද මාසික උද්ධමන අපේක්ෂාවන් පිළිබඳ සමීක්ෂණය තවදුරටත් අඛණ්ඩව සිදු කරනු ලැබීය. ප්‍රතිචාර දක්වන්නන් 300 ක ගෙන් පමණ සමන්විත නියදියක් මෙමගින් ආවරණය වූ අතර, එහිදී ඍජු සම්මුඛ සාකච්ඡා සහ විද්‍යුත් තැපැල් මාර්ගික ක්‍රම මගින් ඔවුන්ගේ ප්‍රතිචාර එකතු කර ගැනීම සිදු කෙරිණි. සෑම මාසික සමීක්ෂණයකම ප්‍රතිඵල ඊළඟ මාසය තුළ දී පවත්වනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ සහ මූල්‍ය ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ රැස්වීම්වලට ඉදිරිපත් කරනු ලැබීය. 2006 වසරේදී ආරම්භ ලද ඉඩම් මිල පිළිබඳ සමීක්ෂණය ද අඛණ්ඩව සිදු කරන ලද අතර, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් දත්තයන් භාවිතා කරමින් ද ඉඩම් මිල පිළිබඳ දර්ශකය ගණනය කරනු ලැබීය.

මෙයට අමතරව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව යාපනය දිස්ත්‍රික්කය ආවරණය කරමින් නියැදි සමීක්ෂණයක් ද පවත්වනු ලැබීය. ජනතාවගේ ජීවන තත්ත්වය, ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වය, කුටුම්භ ක්‍රියාකාරකම් සහ ජනතාවගේ අපේක්ෂාවන් පිළිබඳව පුළුල් පරාසයක පැතිරුණු තොරතුරු ඒකරාශී කිරීම මෙම සමීක්ෂණයේ අරමුණ විය. යාපනය දිස්ත්‍රික්කයේ නගරබද සහ ග්‍රාමීය අංශවලින් කුටුම්භ 600කින් පමණ සමන්විත වන නියදියක් මේ සඳහා තෝරා ගන්නා ලදී. මීට අමතරව, අරගලකාරී වාතාවරණය නිමවූ පසුව ජනතාවගේ ජීවන තත්ත්වය සහ සමාජ ආර්ථික තත්ත්වයේ වෙනස්වීම් පිළිබඳව සමීක්‍ෂණයට සහභාගිවූවන්ගේ අපේක්ෂාවන් සම්බන්ධ තොරතුරු එක්රැස් කරන ලදී.

යෝජිත පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණය 2011/12 පිළිබඳ මූලික කටයුතු ද වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණයේ දී උතුරු පළාත ද ඇතුළුව මුළු දිවයිනම ආවරණය කිරීමට අපේක්ෂිත අතර, මෙය 1981/82 සමීක්ෂණයට පසුව මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වනු ලබන ප්‍රථම සමීක්ෂණය ද වන්නේය. තව ද, වසර තුළ සිදු කරනු ලැබූ තවත් ප්‍රධාන කාර්යයක් වූයේ ශ්‍රී ලංකාවේ සහ එහි පළාත්වල සෞභාග්‍යය මැනීම සඳහා සංශෝධිත සෞභාග්‍ය දර්ශකය ගණනය කිරීමයි.

## 25.2 ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම

2010 වසරේ දී දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ "ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමේ පහසුව පිළිබඳ ශ්‍රේණිගත කිරීම" වැඩිදියුණු කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය. මෙම අභිමතාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා මූලික පියවරක් ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් සහ උසස් නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණයක් සංවිධානය කළ අතර, මෙහිදී ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම ඉහළ නංවා ගැනීම සඳහා උපාය මාර්ගය සකස් කිරීම සිදු කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමට "පියවරෙන් පියවර මාර්ගෝපදේශනය" (A Step by Step Guide for Doing Business in Sri Lanka) නම් වූ තොරතුරු ඇතුළත් අත් පොතක් ද වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබිණි.

## 25.3 දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ

1978 දී ඇරඹි දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල, කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදන මිල සහ අවිධිමත් අංශයේ වැටුප් පිළිබඳ තොරතුරු ක්‍රමවත්ව එක්රැස් කරමින් අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබිණි. උතුරු හා නැගෙනහිර පළාත්වල මධ්‍යස්ථාන 18 ක් ඇතුළුව දිවයින පුරා ක්‍රියාත්මක වන දත්ත රැස් කිරීමේ මධ්‍යස්ථාන 102 ක් සඳහා දත්ත සමීක්ෂකවරුන් ලෙස යොදවා ගනු ලැබූ රජයේ පාසල් ගුරුවරුන් හරහා දත්ත රැස් කිරීම සිදු කෙරිණි. මෙම වැඩපිළිවෙළ යටතේ එක්රැස් කරනු ලබන දත්ත මිල දර්ශක ගණනය කිරීම, ප්‍රතිපත්ති තීරණ සඳහා අවශ්‍ය වන මිල විචලනයන් පිළිබඳ පුරෝකථන, ප්‍රතිපත්ති වෙනස් කිරීම් හේතුවෙන් මිල ගණන් මත ඇති වන බලපෑම තක්සේරු කිරීම සහ ජාතික වියදම හා ආදායම ඇස්තමේන්තු කිරීම සඳහා පුළුල්ව යොදා ගැනේ. මෙම දත්ත, මිල ගණන් සහ වැටුප්වල සෘතුමය වෙනස් වීම්, උච්චාවචනයන් සහ ප්‍රාදේශීය වෙනස්කම් විශ්ලේෂණය සඳහා ද උපකාරී වේ. වර්ෂය ආරම්භයේ පිළියෙළ කළ වාර්ෂික වැඩසටහනකට අනුව මධ්‍යස්ථානවල සිදු කළ ක්‍රමවත් ක්ෂේත්‍ර අධීක්ෂණයන් හරහා දත්තවල නිරවද්‍යතාවය තහවුරු කෙරිණි. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණෙන් තෝරා ගන්නා ලද දත්ත රැස් කිරීමේ මධ්‍යස්ථානයන්හි අධීක්ෂණ කටයුතු විමධ්‍යගත කර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ පළාත් කාර්යාල වෙත පැවරිණි.

වසර 31 ක් පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වූ දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ සඳහා දායක වූ දත්ත සමීක්ෂක ගුරුභවතුන් විසින් කරන ලද අගනා සේවය සනිටුහන් කිරීමේ අදහසින් 2010 ජනවාරි මාසයේ දී රට පුරා සිටින දත්ත සමීක්ෂක ගුරුභවතුන් සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්විණි. එකම සාකච්ඡා මණ්ඩපයක දී, වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අදාළ පොදු ගැටළු සාකච්ඡා කිරීමට සහ පොදුවේ වැදගත් වන කරුණු පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමට, මෙමගින් අවස්ථාව සැලසිණි. තව ද, උතුරු හා නැගෙනහිර පළාත්වල පසුගිය වසර කිහිපය පුරා පැවති සිවිල් අරගල හේතුවෙන් මෙවැනි අවස්ථාවන් නොලද දමිළ භාෂාව කථා කරන එම ප්‍රදේශයන්හි දත්ත සමීක්ෂක ගුරුභවතුන්ට ද ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට මෙමගින් අවස්ථාවක් සැලසිණි. මෙයට අමතරව, දත්ත රැස් කිරීමේ නිරවද්‍යතාවය, ගුණාත්මක බව, කාර්යක්ෂමතාවය සහ කාලීන බව වැඩිදියුණු කිරීම සඳහා දත්ත රැස් කරන්නන්හට වැඩිදුර පුහුණුවක් ලබාදීමේ අරමුණෙන් 2010 වසරේ දී මාතර, අනුරාධපුර සහ මහනුවර ප්‍රාදේශීය සම්මන්ත්‍රණ 3 ක් පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණවල දී සිදු කළ සාකච්ඡා සැසි ප්‍රධාන වශයෙන් ම, රට තුළ පශ්චාත් යුද සංවර්ධනයන් සහ ඒවා මිල ගණන් හා වැටුප් මත ඇති කළ බලපෑම ඇගයීම අරමුණු කොට පැවැත්විණි. තව ද, ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම, මිල මට්ටම හා උද්ධමනයෙහි විචලනය, සහ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය වැනි මාතෘකා පිළිබඳ විශේෂ දැනුවත් කිරීමේ සැසි ද පවත්වනු ලැබිණි. එබඳු වැඩසටහන්වල ඵලදායිතාවය දත්ත සමීක්ෂක ගුරු භවතුන්ගේ දැනුවත් බව වර්ධනය වීම සහ ඔවුන් දැක්වූ උද්‍යෝගය තුළින් පිළිබිඹු විය. අනාගතයේ දී දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ, ඉතා සූක්ෂම උද්ධමන පුරෝකථනයන් ලබා දීම සඳහා නිෂ්පාදනය, මිල වර්ධනයන් පිළිබඳ පූර්ව දැනුම්දීම් පද්ධතියක අංගයක් ලෙස යොදා ගැනීමට ද තීරණය විය.

## 25.4 මිල, වැටුප් හා සේවානියුක්තිය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2002=100) පදනම් කරගනිමින් පාරිභෝගික මිල ගණන්වල හැසිරීම විශ්ලේෂණය කිරීම සහ ඒ පිළිබඳ මාසික පුවත්පත් නිවේදන නිකුත් කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මේ අතර, සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා උපකාරී වන මිල වර්ධනයන් පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම ද සිදු කෙරිණි. මිල විචලනයන්හි ඉදිරි හැසිරීම තීරණය කිරීමට මගපෙන්වනු ලබන දර්ශකයක් ලෙස යොදා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කෙටි හා මැදිකාලීන උද්ධමන පුරෝකථනයන් සකස් කරන ලදී. එමෙන්ම, 2010 දී විශේෂිත අයිතමයන්හි අනුරූප මිල වෙනස්වීම් සහ බදු

වෙනස්කම් ආදිය කෙරෙහි සංවේදී වන පරිදි පැතුරුම් පත්‍රි (Spread Sheets) කො.පා.මි.දර්ශක පුරෝකථනයන් පිළියෙළ කෙරිණි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2006/07 වර්ෂයන්හි දී පවත්වන ලද කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණයෙන් පිළිබිඹු කෙරෙන පාරිභෝගික වියදම් රටාවට අනුව කො.පා.මි. දර්ශකයේ පදනම සංශෝධනය කිරීම සඳහා වූ යෝජිත ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට එම දෙපාර්තමේන්තුව සමඟ වර්ෂය තුළ දී රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

පළාත් සංවර්ධනයේ දී පළාත් මට්ටමෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය සපුරාලීමේ අදහසින් 2003/04 වර්ෂයන්හි සිදු කළ පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය පදනම් කරගත් පළාත් පාරිභෝගික මිල දර්ශකයන් ගණනය කිරීම, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කෙරිණි. මෙයට අමතරව, ජාතික තලයේ මිල මට්ටම්වල හැසිරීම් පිළිබිඹු කෙරෙන, 2003/04 වර්ෂයන්හි සිදු කළ පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය පදනම් කරගත්, මුළු රටම ආවරණය වන පරිදි සැකසූ සංයුක්ත පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කරන ලදී. මෙම දර්ශක ගණනය කිරීම සඳහා අවශ්‍ය මිල ගණන් ප්‍රධාන වශයෙන්ම දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ හරහා ලබා ගැනිණි.

දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ යටතේ රැස්කරන ලද වැටුප් දත්ත පදනම් කරගනිමින් ශ්‍රී ලංකාව සඳහා අවිධිමත් අංශයේ වැටුප් ගණනය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරිණි. මෙම වැඩපිළිවෙළ යටතේ වී, තේ, රබර් හා පොල් වගාව, කුඩා පරිමාණ කර්මාන්ත, ඉදිකිරීම් හා සේවා යන උප අංශ ආවරණය වන පරිදි වැටුප් දත්ත රැස්කෙරේ. මෙයට අමතරව, මධ්‍යම රජයේ විධායක නොවන ශ්‍රේණි හා සුළු සේවක ශ්‍රේණි සහ රජයේ පාසල් ගුරුවරුන් ආවරණය වන පරිදි රාජ්‍ය අංශය සඳහා වූ වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එමෙන්ම, කම්කරු දෙපාර්තමේන්තුව මගින් කෘෂිකර්ම, කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශ සඳහා ගණනය කරනු ලබන අවම වැටුප් ප්‍රමාණ දර්ශක හරහා විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් තොරතුරු අධීක්ෂණය කිරීම ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරිණි.

මේ අතර, ප්‍රාථමික වෙළඳපොළ මට්ටමෙහි මිල හැසිරීම් විශ්ලේෂණය කිරීම සඳහා තොග මිල දර්ශකය ගණනය කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. දැනට භාවිතාවන තොග මිල දර්ශකයේ පවතින ප්‍රධාන දුර්වලතා සඳහා පිළියම් ලෙස ජාත්‍යන්තර පරිචයන් අනුව යමින්, වත්මන් තොග මිල දර්ශකය සංශෝධනය කිරීමේ හෝ නව නිෂ්පාදන මිල දර්ශකයක් හඳුන්වා දීමේ ශක්‍යතාව විමසීම සඳහා 2010 වසරේ දී අධ්‍යයනයක් සිදු කරන ලදී. ඒ අනුව, නිෂ්පාදන මිල දර්ශකයක් සැකසීම සඳහා දත්ත රැස් කිරීමේ කටයුතු 2010 වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි මට්ටම් හා උපනතිය නිශ්චය කිරීමේ අපේක්ෂාවෙන් 2001 වසරේ දී දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සහ කාර්තුමය සමීක්ෂණ 2010 වර්ෂයේ දී ද අඛණ්ඩව පවත්වන ලදී. මෙම දත්ත, කාර්තුමය ජාතික ආදායම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා ද උපයෝගී කර ගැනිණි. 2009 වසරේ සිදු කළ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයෙහි වාර්තා වූ සේවකයන් 1000 ට වැඩි මධ්‍යම රජයේ ආයතන, පළාත් පාලන ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන සියල්ලම කාර්තුමය සමීක්ෂණය තුළින් ආවරණය කෙරුණු අතර, මීට පළාත් සභාවලට අයත් ආයතන ඇතුළත් නොවිණි. මෙම සමීක්ෂණවලින් එක්රැස් කරගත් තොරතුරු රජයේ වත්මන් සේවා නියුක්ති ප්‍රතිපත්තියෙහි ඵලදායිතාවය ඇගයීම සඳහා උපකාරීවන අතරම රාජ්‍ය අංශයේ ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ මානයක් ලෙස ද යොදා ගැනේ. විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා හා ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ සහ ශ්‍රම ඵලදායිතාවය යන අංශයන් ආවරණය වන පරිදි ශ්‍රම බලකාය සහ ශ්‍රම වෙළඳපොළ පිළිබඳව රැස් කළ තොරතුරු විශ්ලේෂණය කිරීම ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

## 24.5 ජාතික හා ප්‍රාදේශීය ආදයම

ශ්‍රී ලංකා ආර්ථිකයේ මූර්ත අංශයේ ඇති වන සංවර්ධනයන් සුපරීක්ෂණය කිරීමත් ජාතික ආදායම පිළිබඳ අදාළ පුරෝකථනයන් සැකසීමත් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරනු ලැබිණි. මීට ප්‍රාථමික හා ද්විතීයික දත්ත එක්රැස් කිරීමත්, ආර්ථිකයේ සංවර්ධනයන් පිළිබඳ විශ්ලේෂණය කිරීමත්, රටේ නිෂ්පාදනය, පරිභෝජනය, ඉතුරුම් හා ආයෝජන පිළිබඳ ඉදිරි ප්‍රවණතා පුරෝකථනය කිරීමත් ඇතුළත් වේ.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, රටේ ජාතික ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ නිල වගකීම දරන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වී කටයුතු කරමින් තොරතුරු හුවමාරු කර ගැනීම මගින් ආයතන දෙකෙහිම ක්‍රියාකාරකම් සාර්ථක කර ගැනීමට සැලකිය යුතු මට්ටමකින් දායක විය.

පසුගිය වසර තුළ දී මෙන්ම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වසරක කාලපමාවක් ද සහිතව 2009 වසර සඳහා පළාත් අනුව වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම, විශ්ලේෂණය කිරීම සහ මුදාහැරීම සිදු කරන ලදී. 1996 සිට 2009 දක්වා කාලපරාසයක පැතිරුණු පළාත් දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යාති මහජනතාවට ලබා ගැනීමේ හැකියාව පවතී. මෙම සංඛ්‍යාති ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රාදේශීය විෂමතාවයන් සහ රටෙහි වර්ධන කාර්යසාධනයන් හඳුනා ගැනීමට සහ විශ්ලේෂණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ට පුළුල් පරාසයක දත්ත සපයනු ලබයි.

## 25.6 සංඛ්‍යා තොරතුරු බෙද හැරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වර්ෂය තුළ දී එහි වාර්ෂික ප්‍රකාශනයන් වන ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාන 2010 (වෙළුම XXXII) සහ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත (වෙළුම XXXIII) පිළිවෙළින් 2010 අප්‍රේල් සහ ජූනි මාසවලදී නිකුත් කරනු ලැබීය. මීට අමතරව, බැංකුවේ 2011 සාක්කු දින පොතේ සංඛ්‍යාන වගු යාවත්කාලීන කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වර්ෂය තුළදී බැංකුවේ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ප්‍රකාශන සඳහා තම අඛණ්ඩ දායකත්වය දක්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය, දෙපාර්තමේන්තු අභ්‍යන්තර වෙබ් අඩවිය සහ අභ්‍යන්තර ජාලය තුළ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය නිරතුරුව යාවත්කාලීන කරන ලදී.

## 26. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

ලියාපදිංචි මුදල් සමාගම් නියාමනයට සහ අධීක්ෂණයට අදාළ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ විධිවිධානවලින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා, 1988.12.12 වන දින බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර නියාමනය සහ අධීක්ෂණය සඳහා වූ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත බලාත්මක වීමත් සමඟ මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථය තවදුරටත් පුළුල් විය. විචක්ෂණශීලී අවශ්‍යතාවයන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, ලියාපදිංචි මුදල් සමාගම් අඛණ්ඩව අධීක්ෂණය කිරීම හා කාලීන ව්‍යවස්ථාපිත පරීක්ෂණ සිදුකිරීම, විශේෂිත කාර්යයන් සඳහා අවසර ලබාදීම, අධීක්ෂණයට යටත්ව දුර්වල සමාගම් යථා තත්ත්වයට පත්කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අවසරයකින් තොරව ක්‍රියාත්මක වන මුදල් ව්‍යාපාර සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ වගකීම්වලට ඇතුළත් වේ. 2010 වසර අවසානය වන විට, ලියාපදිංචි මුදල් සමාගම් 37 ක් සහ කල්බදු මූල්‍යකරණ සමාගම් 70 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මෙම කල්බදු මූල්‍යකරණ සමාගම් බලපත්‍රලාභී වාණිජ බැංකු 11 කින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 4 කින්, ලියාපදිංචි මුදල් සමාගම් 34 කින් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 21 කින් සමන්විත විය. මෙම ලියාපදිංචි මුදල් සමාගම්වල හා ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනවල නාම ලේඛනය II-2 ඇමුණුමෙහි දක්වා ඇත.

### 26.1 විධානයන් සහ විචක්ෂණශීලී අවශ්‍යතාවයන් හඳුන්වා දීම

මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව, නව විචක්ෂණශීලී නියමයන් සහ පැවති නිගමනයන්ට නව සංශෝධනයන් කිහිපයක් 2010 වසර තුළදී හඳුන්වා දෙන ලදී. මෙම නියමයන්ගේ සාරාංශය පහත දක්වා ඇති අතර සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්තාවේ III කොටසේ ඇතුළත් කර ඇත.

**(අ) ලියාපදිංචි මුදල් සමාගම් සඳහා වූ නියාමනයන්**

**i. තැන්පතු සඳහා පිරිනමන උපරිම පොලී අනුපාතයන් සංශෝධනය කිරීම:**

එතෙක් තැන්පතු සඳහා ප්‍රදානය කරනු ලබන පොලී අනුපාතයන් තවදුරටත් එලෙසම පවත්වාගෙන යාම හේතුකොට ආයතන තුළ දිගුකාලීනව සිදුවිය හැකි අහිතකර තත්වයන් සැලකිල්ලට ගෙන ලියාපදිංචි මුදල් සමාගම් විසින් තැන්පතු සඳහා ගෙවනු ලබන උපරිම පොලී අනුපාතයන් සංශෝධනය කරන ලදී. ඒ අනුව අවුරුද්දක් හෝ ඊට වඩා අඩු කාලයකදී කල් පිරෙන කාලීන තැන්පතු සඳහා ගෙවන උපරිම පොලී අනුපාතිකය, දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකයට ප්‍රතිශත අංක 4 ක් එකතු කිරීමෙන් ලබාගන්නා අනුපාතික අගය ලෙස වැඩි කළ අතර, දිගු කාලීන (අවුරුද්දකට වඩා වැඩි කාලයකදී කල් පිරෙන) තැන්පතු සඳහා උපරිම පොලී අනුපාතිකය දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකයට ප්‍රතිශත අංක 5 ක් එකතු කිරීමෙන් ලබාගන්නා අගය දක්වා අඩුකරන ලදී. එසේ වුවද, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වාගෙන යන තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතිකය, ඉහත සඳහන් නියමිත පොලී අනුපාතිකයේ සිට ප්‍රතිශත අංක එකකින් (1) ඉහළ නැංවීමට ලියාපදිංචි මුදල් සමාගම් වෙත අවසර දෙන ලදී.

**ii. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය හඳුන්වා දීම:**

මූල්‍ය සුරක්ෂිතතා වැඩපිළිවෙලක් හඳුන්වා දීම සහ තැන්පතුකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනතේ විධිවිධාන යටතේ පැවරී ඇති බලතල අනුව, බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම් සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ, ලියාපදිංචි මුදල් සමාගම් 2010 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තම තැන්පතු වගකීම්, රක්ෂණය කළ යුතුවේ. මෙම යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි මුදල් සමාගමක් තම තැන්පතු වගකීමෙන් සියයට 0.15 ක වාර්ෂික වාරිකයක් මාසික පදනමක් යටතේ ගෙවිය යුතුය. මෙම ක්‍රමය යටතේ, මුදල් මණ්ඩලය විසින් 2012 ජනවාරි 01, හෝ ඉන් අනතුරුව බලපත්‍රය/ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන හෝ අවලංගු කරන ලියාපදිංචි මුදල් සමාගමක තැන්පතුකරුවකුට රු.200,000/- උපරිමයකට යටත්ව හානිපූරණයක් ලබා ගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

**iii. ලියාපදිංචි ගාස්තු ඉහළ දැමීම.**

මුදල් සමාගමක් පළමු ලියාපදිංචියේදී ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තුව රු. 50,000/- සිට රු. 500,000/- දක්වා සංශෝධනය කර ඇති අතර, රු. 50,000 ක්ව පැවති වාර්ෂික බලපත්‍ර ගාස්තුව පහත දක්වා ඇති පරිදි වැඩි කර ඇත.

| ලියාපදිංචි මුදල් සමාගමේ මුළු වත්කම් ප්‍රමාණය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව |
|---|---|
| රුපියල් බිලියන 1 හෝ ඊට අඩු | රු. 150,000 |
| රුපියල් බිලියන 1 ට වැඩි නමුත් රුපියල් බිලියන 10 හෝ ඊට අඩු | රු. 250,000 |
| රුපියල් බිලියන 10 ට වැඩි | රු. 500,000 |

**iv. ලියාපදිංචි මුදල් සමාගම් කොළඹ කොටස් හුවමාරු වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවය**

විනිවිද භාවය හා ගිණුම් කටයුතුවල නිවැරදිතාවය ඉහළ නැංවීම මෙන්ම මහජන විශ්වාසය තහවුරු කිරීම පිණිස දැනට කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත කර නොමැති සියලුම ලියාපදිංචි මුදල් සමාගම්, 2011 ජූනි මස අවසානයට පෙර කොළඹ කොටස් හුවමාරු වෙළඳපොලෙහි ලැයිස්තුගත කළ යුතු බවට දන්වන ලදී.

(ආ) ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන සඳහා වූ නියාමනයන්

**i. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා වූ අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීම:**

ආයතනයන්හි ඔරොත්තුදීමේ හැකියාව හා ශක්තිමත්භාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් පහත සඳහන් අගයන්ට නොඅඩු, ක්ෂය නොවූ මූලික ප්‍රාග්ධනයක් පවත්වා ගතයුතු වේ.

| අවම මූලික ප්‍රාග්ධනය (රු මිලියන) | බලපවත්වන දිනය |
|---|---|
| 100 | 2012.01.01 දින සිට |
| 150 | 2013.01.01 දින සිට |
| 200 | 2014.01.01 දින සිට |
| 250 | 2015.01.01 දින සිට |
| 300 | 2016.01.01 දින සිට |

**ii. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍ර ලබාගැනීමට, අයදුම්කරන සමාගම් සඳහා වූ අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීම:**

ශක්තිමත් බැංකු නොවන මූල්‍ය ආයතනයන් පවත්වා ගැනීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, කල්බදු මූල්‍යකරණ පනත යටතේ බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම් කරන පොදු සමාගමක පැවතිය යුතු අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය පහත දැක්වෙන ලෙස වැඩි කරන ලදී.

| අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය (රු මිලියන) | බලපවත්වන දිනය |
|---|---|
| 100 | 2011.01.01 දින සිට |
| 150 | 2012.01.01 දින සිට |
| 200 | 2013.01.01 දින සිට |
| 250 | 2014.01.01 දින සිට |
| 300 | 2015.01.01 දින සිට |

**iii. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කාලීන මූල්‍ය වාර්තා සැපයීම:**

අඛණ්ඩ පරීක්ෂණයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මෙන්ම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය සඳහා, සියලුම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ණය ගැනීම්, ණය පහසුකම් සැපයීම්, කල් පිරීම් පරතරය වැනි දත්ත සහිත මූල්‍ය වාර්තා මාසික/කාර්තුමය සහ වාර්ෂික පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතුය.

**iv. ශාඛා/ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම/ස්ථාන වෙනස් කිරීම/වැසීම සඳහා අවසරය ලබාදීම:**

විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ශාඛා/ව්‍යාපාර ස්ථාන, විවෘත කිරීම/ස්ථාන වෙනස් කිරීම/වැසීම සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවය ඇති කරමින්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ශාඛා/ව්‍යාපාර ස්ථාන, විවෘත කිරීම/ස්ථානය වෙනස් කිරීම/වැසීම විධිමත් කරන ලදී.

**v. ලියාපදිංචිවීම සඳහා අයදුම්පත් ගාස්තුව, ප්‍රථම වර ලියාපදිංචි කිරීමේ ගාස්තුව සහ වාර්ෂික බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව ඉහළ නැංවීම:**

ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනයක් වශයෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ ලියාපදිංචි මුදල් සමාගමක් ලියාපදිංචි වීමේදී ගෙවිය යුතු අයදුම්පත් ගාස්තුව රු. 25,000/- ක් වන අතර වෙනත් ඕනෑම පොදු සමාගමක් සඳහා මෙම ගාස්තුව රු. 50,000/- කි. සාර්ථක අයදුම් කිරීමකින් අනතුරුව ප්‍රථම ලියාපදිංචියේ දී ගෙවිය යුතු ගාස්තුව රු. 250,000/- ක් වන පරිදි හා ඉන් අනතුරුව ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව කල්බදු මූල්‍යකරණ ආයතනයේ මුලු වත්කම් ප්‍රමාණය මත පදනම්ව පහත දැක්වෙන ලෙස සංශෝධනය කර ඇත.

| ආයතනයේ මුළු වත්කම් ප්‍රමාණය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව |
|---|---|
| රුපියල් බිලියන 1 හෝ ඊට අඩු | රු. 150,000 |
| රුපියල් බිලියන 1 ට වැඩි නමුත් රුපියල් බිලියන 10 හෝ ඊට අඩු | රු. 250,000 |
| රුපියල් බිලියන 10 ට වැඩි | රු. 500,000 |

## 26.2 නව මුදල් සමාගම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ නියාමන අනුමැතීන් ලබාදීම

(අ) මුළු ලියාපදිංචි මුදල් සමාගම් සංඛ්‍යාව 35 සිට 37 දක්වා ඉහළ නංවමින් 2010 වර්ෂය තුළදී, සමාගම් 2 ක් මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි විය. වර්ෂය තුළදී නව ශාඛා 98 ක් සඳහා අනුමැතිය ලබා දුන් අතර ඉන් 41 ක් උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටුවන ලදී. එමෙන්ම, ලියාපදිංචි මුදල් සමාගම්වල නම් වෙනස් කිරීම සඳහා ද අනුමැතිය ලබා දෙන ලදී. එනම්, සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියල්ටි ලිමිටඩ්, ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ලංකා ලිමිටඩ් ලෙසත්, නෙක්ස්ට් ෆිනෑන්ස් ලිමිටඩ්, කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ලෙසත්, සිල්වරින් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්, පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් ලෙසත්, කැපිටල් රීච් ලීසිං පීඑල්සී, සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී ලෙසත් නම් සංශෝධනය විය.

(ආ) මේ අතර බලපත්‍රලාභී විශේෂිත බැංකු 4 ක් ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ සමාගම් සංඛ්‍යාව වසර අවසානයේදී 70 දක්වා පහත වැටුණි. කෙසේ වුවත්, දීප ව්‍යාප්තව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හී නව ශාඛා 44 ක්, වර්ෂය තුළදී ආරම්භ කෙරුණු අතර ඉන් 15 ක්ම උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටුවන ලදී.

## 26.3 මූල්‍ය ආයතන අඛණ්ඩව අධීක්ෂණය කිරීම

ලියාපදිංචි මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් කාලීනව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු විශ්ලේෂණය කිරීම මඟින් එම ආයතන දුරස්ථ අධීක්ෂණයට ලක්කරනු ලැබීය. මෙම විශ්ලේෂණයන්, මෙම සමාගම්වල අහිතකර තත්ත්වයන් ඇතිවීමේ පූර්ව අවදානම් හඳුනා ගැනීම සඳහාත් තවදුරටත් පරීක්ෂණ හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීම සඳහාත්, අවශ්‍ය පදනම සපයන ලදී. මෙවන් අහිතකර තත්ත්වයන් විසඳා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවන්වලදී, එම ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ විගණකවරුන් සමඟ ද රැස්වීම් පවත්වන ලදී. ලියාපදිංචි මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණින් සෑම කාර්තුවකම මහ බැංකු අධිපතිතුමා එම ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ රැස්වීම් පවත්වන ලදී. මෙම රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලැබූ ප්‍රධාන කරුණු අතර ඇතැම් ආයතන මුහුණ පා ඇති ද්‍රවශීලතා ගැටලු නිරාකරණය කර ගැනීම, නිශ්චල දේපල සඳහා අධික ලෙස නැඹුරු වීමෙන් ඇතිවන අවධානම අවම කරගැනීම, ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලදී යහපාලන ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීම, ලියාපදිංචි මුදල් සමාගම් කොළඹ කොටස් වෙළඳපොලෙහි ලියාපදිංචි කිරීම සහ මූල්‍ය ඔම්බුඩ්ස්මන් ආයතනයේ සාමාජිකත්වය ලබාගැනීම යනාදිය ඇතුළත් විණි.

## 26.4 මූල්‍ය ආයතන පරීක්ෂණ

මූල්‍ය ආයතනවල ද්‍රවශීලතාවය, වත්කම්වල ගුණාත්මකභාවය, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය, කළමනාකරණ කාර්යක්ෂමතාවය, ඉපැයීම්, ලාභදායිත්වය, පද්ධති හා පාලන විධි සහ ආයතනික යහපාලන විධි සම්බන්ධයෙන් ඇගයීමක් ලබාගැනීම සඳහා කාලීන එතැන් පරීක්ෂණ සිදුකරනු ලැබීය. අවදානම් හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය කිරීම සහ අවදානම් අඩු කිරීමට සම්පත් තක්සේරු කිරීම ඉලක්ක කරගත් අවදානම පදනම් කරගත් ප්‍රවේශයක් මෙම පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා යොදා ගන්නා ලදී.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්, 2010 වර්ෂය තුළදී, ලියාපදිංචි මුදල් සමාගම් 7 ක සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 5 ක මෙසේ එතැන් පරීක්ෂණයන් සිදුකරන ලදී. මෙම පරීක්ෂණවලදී හඳුනාගත් අවදානම් සහ ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය නිර්දේශයන් අදාළ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදී. මෙයට අමතරව, ලියාපදිංචි මුදල් සමාගම් 4 ක සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 4 ක ද්‍රවශීලතාවය, ණය කළමනාකරණය, වත්කම් කළඹ, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ පද්ධති හා පාලන විධි යන සීමිත විෂය පථයන් ආවරණය වන පරිදි පරීක්ෂණ සිදුකරන ලදී. වඩාත් සැලකිලිමත් විය යුතු යැයි හඳුනාගත් කරුණු සම්බන්ධයෙන් අදාළ ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙත වාර්තා කරන ලද අතර නියම කරන ලද කාල පරාසයන් තුළ අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා ඔවුන්ගේ දැඩි කැපවීමේ අවශ්‍යතාවය දන්වන ලදී. මෙහිදී අවධානයට ලක්කළ ප්‍රධාන කරුණු අතර වඩා හොඳ අවදානම් කළමනාකරණයක් සඳහා අවශ්‍ය යහපාලනය පිළිබඳ විධානයට අනුකූල නොවීම, අවදානම් යහපත්ව කළමණාකරණය පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග යන් හා සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු කිරීමේදී විචක්ෂණශීලී ලෙස කටයුතු නොකිරීම යනාදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

## 26.5 අර්බුදයට ලක්වූ ලියාපදිංචි මුදල් සමාගම් නැවත ගොඩනැංවීමේ ව්‍යාපාරික සැලසුම්

වර්ෂය තුළදී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් ද්‍රවශීලතා ගැටලුවට මුහුණපෑ ලියාපදිංචි මුදල් සමාගම් 6 ක් සහ එක් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් නැවත යථා තත්ත්වයට පත්කිරීම සඳහා යෙදවීමට සිදුවිය. පසුගිය වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ආයතනයන්ගේ කළමනාකාරිත්වය මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද කළමනාකරණ නියෝජිතයන් විසින් සිදුකරන ලදී. මූල්‍ය අර්බුදයන්ට ලක් වූ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ කළමනාකරණ නියෝජිතයන් හා අපේක්ෂිත ආයෝජකයන් සමඟ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව නිරන්තර රැස්වීම් පැවැත්වීම මඟින් මෙම සමාගම්වල ක්‍රියාකාරිත්වය සමීපස්ථ අධීක්ෂණයට ලක් කරන ලදී. තැන්පතුකරුවන්ගේ අයිතීන්හි සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය තහවුරු කිරීම පෙරදැරිව මෙම සමාගම් නැවත යථා තත්ත්වයට පත්කිරීමේ ව්‍යාපාරික සැලසුම් අගයන ලද අතර මේ සඳහා 2009 වර්ෂයේ කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද සාමාජිකයන් සිව් දෙනෙකුගෙන් සමන්විත විශේෂිත උපදේශක මණ්ඩලයේ වෘත්තීය සහයෝගය ලැබිණ. ඒ අනුව යෝජිත ව්‍යාපාරික සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල සමාගම්වලට අනුමැතිය ලබා දෙන ලදී. අර්බුදයට ලක්වූ ඇතැම් සමාගම් සඳහා මුදල් මණ්ඩලය සතු නීතියෙන් පවරන ලද බලතලවලට අනුකූලව නැවත ප්‍රාග්ධනීකරණය කිරීමේ උපාය මාර්ගයන් සඳහා විධානයන් ලබා දෙන ලදී. එම සැලසුම් තුළ මහජනයා වෙත අලුතින් කොටස් නිකුත් කිරීම, පුද්ගලික ආයෝජන, නිශ්චල දේපල විකිණීම, තැන්පතු වගකීම්වලින් කොටසක් කොටස් හිමිකාරිත්වයට පරිවර්තනය කිරීම වැනි නැවත

ප්‍රාග්ධනීකරණ ක්‍රමයන් එකක් හෝ කිහිපයක් ඇතුළත් විය. ඒ අනුව 2010 වර්ෂය අවසානය වන විට අර්බුදයට ලක්වූ එක් සමාගමක් තම ව්‍යාපාර කටයුතු සාර්ථකව යථා තත්ත්වයට පත්කරගෙන මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි සිදුකිරීම ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස එම සමාගම සඳහා පත්කරන ලද කළමනාකරණ නියෝජිතයාද වර්ෂය අවසානය වන විට මුදාහරින ලදී. 2010 අවසානය වන විට අනෙකුත් අර්බුදයට ලක්වූ සමාගම් ද සිය ව්‍යාපාර කටයුතු යථා තත්ත්වයට පත්කිරීමේ අවසාන අදියරයන්ට ළඟා වී තිබුණි.

## 26.6 වෙනත් ක්‍රියාකාරකම්

### (අ) යෝජිත නව පනත් කෙටුම්පත්වල ප්‍රගතිය

2010 මැයි මාසයේදී, කැබිනට් මණ්ඩලය විසින් 1988 මුදල් සමාගම් පනත අහෝසි කර මුදල් ව්‍යාපාර නියාමනය කිරීම සඳහා නව පනතක් කෙටුම්පත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මුදල් ව්‍යාපාර නියාමනය සඳහා යෝජිත නව පනත මඟින් දැනට බලපැවැත්වෙන නීතිය යාවත්කාලීන කර විචක්ෂණ ව්‍යාපාර ක්‍රම අනුගමනය කිරීම

ඇමුණුම **II-2**

## ලියාපදිංචි මුදල් සමාගම් සහ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන (2010 වර්ෂය අවසානයට)

| මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ සමාගම් | කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි වූ ආයතන |
|---|---|
| **ලියාපදිංචි මුදල් සමාගම්** | **ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන** |
| 1. අබාන්ස් ෆයිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්<br>2. එලායන්ස් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී<br>3. ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං ලිමිටඩ්<br>4. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පීඑල්සී<br>5. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් ලිමිටඩ්<br>6. ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්<br>7. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්<br>8. බාර්ට්ලීට් ෆිනෑන්ස් ලිමිටඩ්<br>9. බිම්පුත් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්<br>10. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී<br>11. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්<br>12. චිලව් ෆිනෑන්ස් ලිමිටඩ්<br>13. සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී<br>14. කොමර්ෂල් ක්‍රෙඩිට් ලිමිටඩ්<br>15. එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්<br>16. ග්‍රාමීන් මයික්‍රො ක්‍රෙඩිට් කම්පනි ලිමිටඩ්<br>17. ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ්<br>18. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර නෙක්ස්ට් ෆිනෑන්ස් ලිමිටඩ්)<br>19. ලංකා ඔරික්ස් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්<br>20. එල් බී ෆිනෑන්ස් පීඑල්සී<br>21. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්<br>22. මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්<br>23. නන්දා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්<br>24. පීපල්ස් ලීසිං ෆිනෑන්ස් පීඑල්සී<br>25. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ් (පෙර සිල්වරීන් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්)<br>26. සෙංකඩගල ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්<br>27. සිංගර් ෆිනෑන්ස් (ලංකා) ලිමිටඩ්<br>28. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී<br>29. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී (පෙර කැපිටල් රීච් ලීසිං පීඑල්සී)<br>30. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්<br>31. ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පනි ලිමිටඩ්<br>32. ද ෆිනෑන්ස් කම්පනි පීඑල්සී<br>33. ද මල්ටි ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්<br>34. ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ලංකා ලිමිටඩ් (පෙර සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියලිටි ලිමිටඩ්)<br>35. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්<br>36. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී<br>37. ටී කේ එස් ෆිනෑන්ස් ලිමිටඩ් | (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු<br>1. ලංකා බැංකුව<br>2. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී<br>3. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී<br>4. එම්සීබී බැන්ක් ලිමිටඩ්<br>5. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී<br>6. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී<br>7. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී<br>8. මහජන බැංකුව<br>9. සම්පත් බැන්ක් පීඑල්සී<br>10. සෙලාන් බැන්ක් පීඑල්සී<br>11. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්<br><br>(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු<br>1. එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ් (පෙර සෙලින්කෝ සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්)<br>2. ඩීඑෆ්සීසී බැංකුව<br>3. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්<br>4. සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්<br><br>(ඇ) බිම්පුත් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්, ග්‍රාමීන් මයික්‍රො ක්‍රෙඩිට් කම්පනි ලිමිටඩ් සහ ටී කේ එස් ෆිනෑන්ස් ලිමිටඩ් හැර ඉහත සඳහන් සියලුම ලියාපදිංචි මුදල් සමාගම්<br><br>(ඈ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්<br>1. ඒෂියා කොමර්ස් ලිමිටඩ්<br>2. ඇසෙට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ්<br>3. සීලීස් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්<br>4. සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්<br>5. කොමර්ෂල් ලීසිං කම්පනි ලිමිටඩ්<br>6. කෝපරේටිව් ලීසිං කම්පනි ලිමිටඩ්<br>7. ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ්<br>8. ඉසුරු ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්<br>9. කළුතොට ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ලීසිං ලිමිටඩ්<br>10. කොෂීබා ලීසිං කම්පනි ලිමිටඩ්<br>11. ලංකා ඔරික්ස් ලීසිං කම්පනි පීඑල්සී<br>12. ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්<br>13. එල් ඕ එල් සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්<br>14. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී<br>15. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී<br>16. ඔරියන්ටල් ෆිනෑන්ෂියල් සර්විසස් කෝපරේෂන් ලිමිටඩ්<br>17. පීපල්ස් ලීසිං කම්පනි ලිමිටඩ්<br>18. පීපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී<br>19. සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරිං ලිමිටඩ්<br>20. එස් එම් බී ලීසිං පීඑල්සී<br>21. සොෆ්ට්ලොජික් ක්‍රෙඩිට් ලිමිටඩ් (පෙර කැපිටල් රීච් ක්‍රෙඩිට් ලිමිටඩ්) |

සඳහා පහසුකම් සැළසීම, අවසර නොලත් මුදල් තැන්පතු ලබාගන්නා ව්‍යාපාර සාර්ථකව මැඩපැවැත්වීම හා විධිමත් නියාමනය මගින් මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථායිතාවය කෙරෙහි ඇති වන අභියෝගයන්ට මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම වැනි දිගු කලක සිට පැවති අවශ්‍යතාවයන් සම්පූර්ණ වනු ඇත. යෝජිත පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2010.12.29 දින කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබිණ. මේ අතර ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සම්පාදනය කිරීමේ කටයුතු නිම කරන ලද අතර, මෙම යෝජිත නියාමන ක්‍රමවේදය යටතේ ඒ සඳහා ස්වාධීන අධිකාරියක් ස්ථාපනය කෙරෙනු ඇත. මේ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද යෝජිත ක්‍රමවේදය සලකා බැලීමෙන් අනතුරුව කැබිනට් මණ්ඩලය විසින් 2010 ජූලි මාසයේදී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය සඳහා වූ පනත කෙටුම්පත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම පනත කෙටුම්පත් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

අවසර නොමැතිව මුදල් ව්‍යාපාරවල නිරතවීම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට පහත ක්‍රියාකාරකම් ද ඇතුළත් විය.

**i.** තැන්පතු යන්නෙහි නිර්වචනය විස්තර කරමින් විවිධ නීති යටතේ තැන්පතු බාරගැනීමට අවසරලත් ආයතන සහ මහ බැංකුව විසින් තැන්පතු බාරගැනීමට අවසර දෙන ලද ආයතන ලැයිස්තුව පුවත්පත් දැන්වීම් මගින් පළ කිරීම.

**ii**. මුදල් සමාගම්වල ක්‍රියාකාරකම් සහ අවසර නොලත් මුදල් ව්‍යාපාරවල ආයෝජනය කිරීමේ අවදානම පිළිබඳව විවිධ පළාත්වලදී මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 11 ක් පැවැත්වීම.

**iii.** මහ බැංකුවේ පළාත් කාර්යාල හරහා, ''අවසර නොලත් පුද්ගලයින් සහ ආයතන මගින් මහජනතාව වෙතින් තැන්පතු ලබාගැනීම,'' යන මාතෘකාව යටතේ දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදාහැරීම.

(ඇ) අසාර්ථක මුදල් සමාගම් ඈවර කිරීම

1990 දශකයේ මුල් කාලය තුළදී, අසාර්ථක වූ මුදල් සමාගම් එකොළහෙන් (11) සමාගම් පහක (5) ඈවර කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලද අතර ඉතිරි සමාගම් හයෙහි (6) ඈවර කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. මෙම සමාගම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම්වලින් රුපියල් දශලක්ෂ 168 ක්, මෙම වර්ෂය තුළදී අයකර ගැනීමට හැකි විය.

(ඈ) අනවසරයෙන් පවත්වාගෙන ගිය මුදල් ව්‍යාපාරවලට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග

අනවසරයෙන් පවත්වාගෙන යන මුදල් ව්‍යාපාර පිළිබඳව ලැබුණු මහජන පැමිණිලිවලට අදාල ආයතන 14 ක් සම්බන්ධයෙන්, මුදල් සමාගම් පනතේ 11 වන වගන්තිය යටතේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ කටයුතු සිදුකරනු ලැබූ අතර, තවත් ආයතන 45 ක් සම්බන්ධව පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. මේ අතර ප්‍රධාන වශයෙන්ම මහජනතාවගෙන් තැන්පතු රැස්කර එම මුදල් ආපසු ගෙවීමට අපොහොසත් වීම නිසා සමාගම් දෙකකට එරෙහිව, එම සමාගම්වල මුදල් තැන්පත්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් සලකා බැලූ අධිකරණය, එම ආයතනවල මුදල් ආයෝජකයින්ගේ/ආරක්ෂිත තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පත්කරන ලද වරලත් ගණකාධිකාරිවරුන්ගෙන් සැදුම්ලත් කමිටුව වෙත, මෙම දෙපාර්තමේන්තුව, ලේකම්වරයෙකුගෙන් සැදුම්ලත් ලේකම් කාර්යාලයක් පිහිටුවීමෙන් පහසුකම් සපයන ලදී. මේ සම්බන්ධයෙන් වර්ෂය අවසාන වනවිට, ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගමේ ආයෝජකයින්/ආරක්ෂිත තැන්පත්කරුවන් 8,110 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 805.5 ක් පළමු පියවර යටතේ ගෙවා අවසන් වූ අතර මේ සඳහා ලේකම් කාර්යාල කටයුතු සඳහා රුපියල් දශලක්ෂ 37 ක වියදමක් දැරීමට සිදු විය.

## 27. සුභසාධන

**2010 වසර තුළදී සුභසාධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලාභීන් වෙත සුභසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස අඛණ්ඩව සපයන ලදී.** පහසුකම් සපයන ලද සේවා නියුක්තිකයන්, විශ්‍රාමිකයන්, වැන්දඹු, වැන්දඹු පුරුෂ සහ ලියාපදිංචි යැපෙන්නන් සංඛ්‍යාව 12,000 ඉක්මවා ඇත. සුභසාධන දෙපාර්තමේන්තුව මගින් සේවා නියුක්තිකයන් වෙනුවෙන් සළසනු ලබන පහසුකම් වලට සහනදායි ණය ක්‍රම, වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය, අභ්‍යන්තර වෛද්‍ය මධ්‍යස්ථානය මගින් වෛද්‍ය පහසුකම්, නිවාඩු දුම්රිය බලපත්‍ර, ආපනශාලා පහසුකම්, සේවානියුක්තිකයන්ට සේවා කාලයෙන් බැහැරව සිදුවන ආපදා සහ හදිසි මරණ ආදිය සඳහා සමූහ රක්ෂණ ආවරණය වැනි පහසුකම් ද, සෞඛ්‍ය සහ කාලීන මාතෘකා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ද ඇතුළත් වේ. මෙයට අමතරව, මහ බැංකුවේ 60 වන සංවත්සරය සැමරීම සඳහා මෙහෙයවන ලද වැඩසටහන සඳහා සුභසාධන දෙපාර්තමේන්තුව විසින් කැපී පෙනෙන දායකත්වයක් දක්වන ලදී.

සේවා නියුක්තිකයන්ගේ ප්‍රධාන ජීවන අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සේ.අ.අ. ණය සහ කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ වාහන ණය, පරිගණක ණය ඇතුළු අනෙකුත් ණය ලබාදීම සඳහා අදාල ලියකියවිලි සම්පූර්ණ

කර අයදුම්පත් සමග ඉදිරිපත් කළ සේවා නියුක්තිකයන් හට වැඩ කරන දින 5 ක් ඇතුළත ණය ලබාදීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. මෙම වසර තුළදී මෙවැනි ණය 1,179 ප්‍රදානය කර ඇත. තවද, නව නිවාස ණය 129 ක් වසර තුළදී අනුමත කරනු ලැබූ අතර, වාරික වශයෙන් ණය මුදා හැරීම ද වසර පුරාම සිදු කරන ලදී. සුභසාධන දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දුන් ණය අධීක්ෂණ ක්‍රමය යටතේ, සේවානියුක්තිකයන්හට නිවැරදිව ඉක්මණින් ණය මුදා හැරීමට හැකි විය.

මහ බැංකු ආපනශාලාව මගින් ස්වයං සේවා ක්‍රමය යටතේ බැංකු කාර්ය මණ්ඩලයට සහ බැංකු පරිශ්‍රය තුළ පිහිටි අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩලයට ද උදෑසන සහ දිවා ආහාර සැපයීම තවදුරටත් සිදු කරන ලදී. එමෙන්ම, සුභසාධන දෙපාර්තමේන්තුව මගින් තේ සැපයීම ද අඛණ්ඩව සිදු කරන ලදී. විශේෂ උත්සව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයෙන් සහ දෙපාර්තමේන්තුවලින් ලද ඇණවුම් වෙනුවෙන් ඔවුන්ගේ අභිමතයට ගැලපෙන පරිදි අවශ්‍ය ආහාරපාන සපයන ලදී. පසුගිය වසර සමග සැසඳීමේදී දෛනික ආදායම හා විශේෂ ඇණවුම්වලින් ලැබූ ආදායම පිළිවෙලින් රු. 14,023,576/- ක් සහ 1,678,614/- ක් විය. මෙය පිළිවෙලින් පසුගිය වසර හා සැසඳීමේදී 16% ක් සහ 46% ක වැඩිවීමකි.

සියළුම ලියාපදිංචි ප්‍රතිලාභීන් සඳහා වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය නොකඩවා ක්‍රියාත්මක වූ අතර, සේවානියුක්තිකයන් සඳහා කාර්යාල වේලාවන් තුළදී වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් සැපයීම සිදු විය. පිළිගත් ආරෝග්‍යශාලාවකින් මහ බැංකුවේ වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා වෛද්‍ය සේවය ලබා ගැනීම තුළින් එහි ගුණාත්මකභාවය වැඩි කරන ලදී. සාධාරණ මිලට බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සහ සීමිත රසායනාගාර පරීක්ෂණ පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය මගින් සැපයින. වෛද්‍ය මධ්‍යස්ථානයේ කටයුතු පරිගණකගත කරන ලද අතර, මෙම නව ක්‍රමය 2011 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙමගින් සියළුම සේවානියුක්තිකයන්ගේ වෛද්‍ය වාර්තා විද්‍යුත් ක්‍රමය තුළින් පවත්වාගෙන යාමට හැකිවේ. සේවානියුක්තිකයන්ගේ ප්‍රයෝජනය සඳහා වෛද්‍ය සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ද සුභසාධන දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.